254 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 254 - இல. 10
Volume 254 - No. 10

2017 සැප්තැම්බර් 07වන බ්‍රහස්පතින්දා
2017 செப்ரெம்பர் 07, வியாழக்கிழமை
Thursday, 07th September, 2017

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

අන්තර්ගත ප්‍රධාන කරුණු

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

දේශීය ආදායම් පනත් කෙටුම්පත :
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

பிரதான உள்ளடக்கம்

துறைசார் மேற்பார்வைக்குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

உண்ணாட்டரசிறைச் சட்டமூலம் :
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

PRINCIPAL CONTENTS

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

INLAND REVENUE BILL:
Read a Second and the Third time, and passed as amended

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2017 සැප්තැම්බර් 07වන බ්‍රහස්පතින්දා
2017 செப்ரெம்பர் 07, வியாழக்கிழமை
Thursday, 07th September, 2017

පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
2017 සැප්තැම්බර් මස 07වන බ්‍රහස්පතින්දා එනම්, අද දින අපර භාග 1.30ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීවරුන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

දේශීය ආදායම් පනත් කෙටුම්පත දැනටමත් සෑම ගරු මන්ත්‍රීවරයෙකුටම බෙදා දී ඇත. එය www.documents.gov.lk වෙබ් අඩවියේ තිබෙන බවත් මා දන්වා සිටීමට කැමැතියි. එය, එම පනත් කෙටුම්පත ගරු මන්ත්‍රීවරුන්ට ලබා ගැනීමට තිබෙන තවත් පහසුකමක් වේ.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමා සහ විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, කාරක සභා වාර්තා පිළිගැන්වීම.

තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව එම කාරක සභාවේ සභාපති ගරු සී. බී. රත්නායක මැතිතුමා වෙනුවෙන්, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරනවා ඇති.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2012 වර්ෂය සඳහා ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික වාර්තාව;
(ii) 2015 සහ 2016 වර්ෂ සඳහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;
(iii) 2015 සහ 2016 වර්ෂ සඳහා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;
(iv) 2015 සහ 2016 වර්ෂ සඳහා බුද්ධශාසන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තා;
(v) 2015 සහ 2016 වර්ෂ සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;
(vi) 2015 සහ 2016 වර්ෂ සඳහා ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා; සහ
(vii) 2015 සහ 2016 වර්ෂ සඳහා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය

සාධන වාර්තා සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)

Hon. Speaker, I present the Report of the Sectoral Oversight Committee on Education and Human Resources Development on "Orders made under Section 27(1) of the Universities Act, No. 16 of 1978" and "Orders made under Section 20(4) (b) of the Universities Act No. 16 of 1978" which were referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, බලශක්තිය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2015 වර්ෂය සඳහා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව බලශක්තිය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluvihare - State Minister of Agriculture) **

ගරු කථානායකතුමනි, මුල්ලේරියාව නව නගරය, වල්පොල, සුමේධ මාවත, අංක 29/1 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.පී.ඒ.එස්. ගයාන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සාලින්ද දිසානායක මැතිතුමා. - පැමිණ නැත.

ගරු රංජිත් අලුවිහාරේ මහතා
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)

ගරු කථානායකතුමනි, වාසල කෝට්ටේ, යටිවැහැර, අංක 244 'ඒ' දරන ස්ථානයෙහි පදිංචි එස්.පී.ඩී. සිරිල් විජේරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ප්‍රසන්න රණවීර මැතිතුමා. - පැමිණ නැත.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) වාද්දුව, මැලෑගම, ගුණතිලක වත්ත, අංක 14 දරන ස්ථානයෙහි පදිංචි බී.ඩී.බී.ආර්. සමරනායක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) රාගම, කැන්දලියද්දපාලුව, අංක 186/ඒ දරන ස්ථානයෙහි පදිංචි ටී.එම්. ගාමිණී බංඩාර මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

බදුල්ල දිස්ත්‍රික්කයේ සංවර්ධිත බස් නැවතුම් පොළ සංඛ්‍යාව : විස්තර
பதுளை மாவட்டத்தில் அபிவிருத்தி செய்யப்பட்ட பஸ் தரிப்பு நிலையங்கள்: விபரம்
BUS TERMINALS DEVELOPED IN BADULLA DISTRICT: DETAILS

1125/'16

4. ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත, 2010 වර්ෂයේ සිට මේ දක්වා බදුල්ල දිස්ත්‍රික්කය තුළ සංවර්ධනය කරනු ලැබූ බස් නැවතුම්පොළ සංඛ්‍යාව කොපමණද;

(ii) සංවර්ධනය කරනු ලැබූ බස් නැවතුම්පොළවල නම් කවරේද;

(iii) එක් එක් බස් නැවතුම්පොළ සඳහා වියදම් කරනු ලැබූ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ව්‍යාපෘතියට ඇතුළත් කිරීමට යෝජිත බදුල්ල දිස්ත්‍රික්කයේ සෙසු බස් නැවතුම්පොළවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின் நிதி ஏற்பாடுகளின் கீழ், 2010ஆம் ஆண்டு முதல் இற்றைவரை பதுளை மாவட்டத்தினுள் அபிவிருத்தி செய்யப்பட்டுள்ள பஸ் தரிப்பு நிலையங்களின் எண்ணிக்கை யாது;

(ii) அபிவிருத்தி செய்யப்பட்டுள்ள பஸ் தரிப்பு நிலையங்களின் பெயர்கள் யாவை;

(iii) ஒவ்வொரு பஸ் தரிப்பு நிலையத்துக்கும் செலவிடப்பட்டுள்ள நிதித்தொகை வெவ்வேறாக யாது;

(iv) கருத்திட்டத்தினுள் உள்ளடக்குவதற்கு உத்தேசிக்கப்பட்டுள்ள பதுளை மாவட்டத்தின் ஏனைய பஸ் தரிப்பு நிலையங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the number of bus terminals in the Badulla District which were developed from 2010 up to now on the allocations of the Ministry of Provincial Councils and Local Government;

(ii) the names of the bus terminals which were developed;

(iii) the amount of money spent on each bus terminal separately; and

(iv) the other bus terminals in the Badulla District which are proposed to be included in the project?

(b) If not, why?

ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) බස් නැවතුම්පොළ සංඛ්‍යාව 02කි.

(ii) මීගහකිවුල ප්‍රාදේශීය සභාව - මීගහකිවුල බස් නැවතුම්පොළ

හපුතලේ ප්‍රාදේශීය සභාව - දියතලාව බස් නැවතුම්පොළ

(iii)

මීගහකිවුල ප්‍රාදේශීය සභාව	මීගහකිවුල බස් නැවතුම් පොළ	රු. 22,750,512.00 (පළාත් සභා සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය මඟින්)
හපුතලේ ප්‍රාදේශීය සභාව	දියතලාව බස් නැවතුම් පොළ	රු. 1,632,767.74 (පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින්) රු. 179,260.40 (ප්‍රාදේශීය සභා පොදු අරමුදල් මඟින්)

(iv) බදුල්ල දිස්ත්‍රික්කයේ සංවර්ධනය කිරීමට යෝජිත බස් නැවතුම් පොළවල් නැත.

(ආ) බස් නැවතුම් පොළ සංවර්ධනය සම්බන්ධ යෝජනා / ඉල්ලීම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් වී නැති නිසා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු ඇමතිතුමනි, පිළිතුර සැපයීම වෙනුවෙන් ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත්, අපිත් දන්නවා, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල ක්‍රියාකාරිත්වය, යන්ත්‍රණය සිද්ධ වන ආකාරය සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් 6/2017 දරන චක්‍රලේඛය නිකුත් කළ බව. ඔබතුමා සඳහන් කර තිබෙන, ඒ කර්මාන්තවලට යෙදවෙන ඔබ අමාත්‍යාංශයේ මුදල් සියල්ල සම්බන්ධයෙන් මා දන්නා පරිදි එම චක්‍රලේඛයට අනුව අදාළ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව තුළ සාකච්ඡා කරලා, ඒවා නිවැරදි නම් අනුමත කරලා, ඒවා ක්‍රියාත්මක විය යුතුයි. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. පළාත් සභා සියල්ල එහෙම නැත්නම් ඌව පළාත් සභාවත්, 6/2017 චක්‍රලේඛය අනුව ඔබ අමාත්‍යාංශයෙන් යවන මුදල් පිළිබඳව කටයුතු කර තිබෙනවාද?

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු කථානායකතුමනි, මා ඒ චක්‍රලේඛය පිළිබඳව සලකා බලා ඒ සම්බන්ධයෙන් උත්තරයක් දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. දෙවන අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ඇත්තටම මේ ගරු සභාවේ සිටින මැති ඇමතිතුමන්ලා සියලු දෙනාගේම අතට චක්‍රලේඛ ලැබෙනවා.

එතකොට ඒ චක්‍රලේඛ අනුව කටයුතු කිරීමට ඔබතුමන්ලා බැඳී සිටිනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VI වැනි පරිච්ඡේදයේ සඳහන් වෙනවා, ආණ්ඩුවක වැඩ පිළිවෙළ සඳහා ක්‍රියාත්මක විය යුත්තේ ඔබතුමා, ජනාධිපතිතුමා, අගමැතිතුමා සහ අමාත්‍ය මණ්ඩලයත්, සෙසු රාජ්‍ය නිලධාරීන් සියලුම දෙනා කියලා. ඒ අනුව කටයුතු කිරීම සඳහා තමයි ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ඔය චක්‍රලේඛය නිකුත් කළේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ චක්‍රලේඛය ගරු ඇමතිතුමා ඉදිරිපත් කරනවා කිව්වා නේ? එම නිසා මෙය ඔබතුමාට ඉක්මනින් ලබා දෙන්න පුළුවන්.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මේ ඉදිරිපත් කරන්න හදන්නේ චක්‍රලේඛය නොවෙයි. මා සඳහන් කරන්න යන්නේ මෙයයි. එතුමා මේ චක්‍රලේඛය පරිශීලනය කරලා උත්තරය දෙනකොට අවබෝධ කර ගත යුතු තවත් කාරණා රැසක් තිබෙනවා.

මා ළඟ තිබෙනවා, 2017.07.23 දිනැති ලිපියක්. මෙතුමාගේ අමාත්‍යාංශයෙන් ඌව පළාත් සභාවට රුපියල් මිලියන 40ක් යවනවා. රුපියල් මිලියන 40ක් යවන්නේ බණ්ඩාරවෙල ආසනයේ වැඩ කටයුතුවලට. මම බණ්ඩාරවෙල ආසන සංවිධායකවරයා සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපතිවරයෙක්. මෙතුමා රුපියල් මිලියන 40ක් යවන්නේ පාරවල් සහ බස් නැවතුම්පොළ ඇතුළු ඔය කියන ඉදි කිරීම් විස්සක් සඳහායි. එම මුදල යවා තිබෙන්නේ අමාත්‍යාංශයේ සෘජු අනුමැතිය යටතේ. ගරු කථානායකතුමනි, එතකොට මට තිබෙන ප්‍රශ්නය මේකයි. මා නියෝජනය කරන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව තුළ විවිධ අමාත්‍යාංශවලින් ලැබිය යුතු මුදල්වලට මෙම කර්මාන්ත සඳහාම ඇස්තමේන්තු සකසා මුල්ගල තබා ආරම්භ කරන්නයි අවස්ථාව සලසා තිබුණේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කියන්නේ පළාත් සභාව?

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
නැහැ, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට විවිධ අමාත්‍යාංශවලින් මුදල් එනවා. විමධ්‍යගත අරමුදල් ද එනවා. මට ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙනුත් මුදල් ලැබෙනවා. ඒ කියන කාරණය දෙසැරයක් සිද්ධ වුණු නිසා තමයි, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ලිපියක් එවන්නේ අර වැදගත් කාරණය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව තුළ සාකච්ඡා කළ යුතුයි කියලා. ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් බැඳෙනවා, ගරු කථානායකතුමනි.

එසේ නොවී, ගරු ඇමතිතුමාගේ කාර්ය මණ්ඩලය සහ ඇමතිතුමා, පළාත් සභාවේ ප්‍රධාන ඇමතිතුමා සහ අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලය, ප්‍රාදේශීය සභාවේ, මහ නගර සභාවේ නිලධාරින් කියන සියලුදෙනාම ඒ චක්‍රලේඛයට පටහැනිව කටයුතු කරනවා. ඒ නිසා තමයි මේ පැහැදිලි කිරීම මම මේ පාර්ලිමේන්තුවේ කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන එතුමා අවධානය යොමු කරනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මේක වැදගත් කාරණයක්, ගරු කථානායකතුමනි. විශේෂයෙන්ම මම දකින විධියට; මට තේරෙන විධියට අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරනවා කියන්නේ එයට විරුද්ධව, පටහැනිව කටයුතු කරනවා කියන්නේ වරදක්. මේ රටේ නීතියක් තිබෙනවා. ඔවුන් ඒ නීතිය අනුව කටයුතු කර නැහැ, ගරු ඇමතිතුමනි. 6/2017 චක්‍රලේඛයට පටහැනිව කටයුතු කිරීම තුළ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම තුළ පළාත් පාලන ඇමතිතුමාට සහ ප්‍රධාන ඇමතිතුමාට විරුද්ධව ගත හැකි පියවර කුමක්ද?

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන පරිදි චක්‍රලේඛයක් උල්ලංඝනය කළාද, නැද්ද කියා මා සොයා බලනවා. ඔබතුමා මෙම කරුණු ඉදිරිපත් කිරීම පිළිබඳවත් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ සම්බන්ධව මම සොයා බලා නිසි තීන්දු තීරණ ගන්නම්. ඇමති කෙනෙකුට හෝ කිසිම රජයේ නිලධාරියකුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්න බැහැ. ඒ වාගේම යම් චක්‍රලේඛයක් උල්ලංඝනය කර තිබෙනවා නම්, ඒ ගැනත් සොයා බලා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය තීන්දු තීරණ ගන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉතා ඉක්මනින් ඒ ගැන වාර්තා කරන්න. හරි නේ, ගරු මන්ත්‍රීතුමනි. මේ ගැන දැන් විවාදයකට යන්න ඕනෑ නැහැ. ඔබතුමාගේ ඉල්ලීම කරන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ඇත්තටම සෑම දිනකම මා මතු කරන ප්‍රශ්නයක දී ගරු ඇමතිතුමා, "සොයා බලනවා." සහ "ඒ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරනවා." කියන කාරණය තමයි ඔබතුමාට පිළිතුර වශයෙන් දුන්නේ. මීට පෙරත් ප්‍රශ්න විශාල සංඛ්‍යාවකට ඒ පිළිතුර එතුමාගෙන් ලැබුණා. නමුත්, විමසීමක් කළා හෝ සොයා බලන්නම් කියන කාරණය පිළිබඳව අද මේ මොහොත වනතුරුවත් ගරු ඇමතිතුමාගෙන් නැවත මා දැනුවත් වෙලා නැහැ, ගරු කථානායකතුමනි.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ චෝදනාවට අදාළ ලේඛන ලිඛිතව මට ඉදිරිපත් කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද පාර්ලිමේන්තුවේදී ඇහුවා නේ, ගරු ඇමතිතුමනි.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ඒ අහපු ප්‍රශ්නය සම්බන්ධයෙන් මම සොයා බලන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඒක අනිවාර්යයෙන්ම කළ යුතුයි.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු කථානායකතුමනි, මම මාසයක් ඇතුළත ඔබතුමාට වාර්තාවකුත් ලබා දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. Within one month දෙන්න. පසුගිය ඒවා සම්බන්ධයෙන් නොවෙයි, මේ සම්බන්ධයෙන් මාසයක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කරන්න.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ චෝදනාව සම්බන්ධයෙන්-

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, විනාඩියක කාලයක් දෙන්නම්. මොකක්ද, කියන්න තිබෙන්නේ? ගරු ඇමතිතුමා පොරොන්දු වුණා, මාසයක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කරනවා කියලා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව තුළදී අපි විශාල අපහසුතාවකට පත් වුණා. ඌව පළාත් ප්‍රධාන ඇමතිවරයා සම සභාපතිවරයා හැටියට අනෙක් පැත්තේ වාඩි වුණා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව, ඒ චක්‍රලේඛය පරිදි කටයුතු කරන්න එතුමා එකඟ නැහැයි කියන කාරණය තමයි සඳහන් කළේ. හෙට අනිද්දා සියලු පළාත් සභාවලට මෙය ගියාම, මේ ආණ්ඩුවේ යන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සඳහා මෙය බලපානවා. ඒ නිසා තමයි මේ වැදගත් ප්‍රශ්නය ඉදිරිපත් කළේ. සියලු පළාත් සභාවල ප්‍රධාන ඇමතිවරු මේ තීන්දුව ගත්තොත්, මේ සමස්ත පාර්ලිමේන්තුව නියෝජනය කරන මැති ඇමතිවරු ක්‍රියාත්මක කරන මේ වැඩ පිළිවෙළ සියල්ල අකර්මණ්‍ය වෙනවා. ඒ නිසා මේ ගැන හොයලා බලන්න නොවෙයි, මේ වන විට ක්‍රියාත්මක වෙන්නයි ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඊළඟ පාර්ලිමේන්තු සැසි වාරයේදී එම වාර්තාව ලබා දෙන්න.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු කථානායකතුමනි, මහ ඇමතිවරුන්ගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් චෝදනාවක් මේ පාර්ලිමේන්තුවේ නැඟුවා නම්, මට ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීමක් කරන්න පුළුවන්. ආණ්ඩුකාරතුමා නිසි තීන්දු ගනියි. හැබැයි මෙතුමා දිගින් දිගටම ඌව පළාත් සභාවේ මහ ඇමතිතුමා ගැන චෝදනා නඟනවා. හැබැයි ඔබතුමා දන්නවා, මමත් දන්නවා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ඒ බලය විමධ්‍යගත වෙලා තිබෙන බව. ආණ්ඩුකාරතුමාට නිසි තීන්දු තීරණ ගන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට සහ මට දැනුවත් කිරීමක් පමණයි කරන්න පුළුවන්. ගරු කථානායකතුමනි, මෙතුමා නීතිය ගැන හරියාකාරව නොදැනුවත්වීම මගේ වැරැද්දක් වෙන්න බැහැ. හැබැයි මෙතුමා අද ඉදිරිපත් කරපු කාරණාව සම්බන්ධයෙන් මම සොයා බලා මාසයක් ඇතුළත ඔබතුමාට වාර්තාවක් ලබා දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. පුළුවන් නම් ඊළඟ පාර්ලිමේන්තු සැසි වාරයේදී වාර්තාවක් ලබා දෙන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් ලබා දෙන්න. මෙතුමා නීතිය සම්බන්ධ ජනාධිපති උපදේශකවරයෙක්; මේ රටේ වගකිව යුතු නීතිඥවරයෙක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි මේක මෙතැනින් ඉවර කරමු. එතුමා පොරොන්දුවක් දුන්නා නේ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එතුමා මට අපහාස වන විධියට කථා කළා. ඒ පිළිබඳව කථා කරන්න මට අවස්ථාවක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද අපහාසය? අපහාස කිරීමක් මට පෙනුණේ නැහැ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මුදල් කළමනාකරණය පිළිබඳ කාරණය- [බාධා කිරීම්]

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
නැහැ, මා එහෙම කිව්වේ නැහැ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධව මා කථා කරනවා නොවෙයි, ගරු කථානායකතුමනි. හැබැයි, 6/2017 චක්‍රලේඛය මේ රටේ සෑම සියලු දෙනාගේම එල ප්‍රයෝජනය සඳහා තමයි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවෙනුත් යොමු කරන්නේ. මම ඒ චක්‍රලේඛය කියවා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම නීතිය නොදන්නවා වුණත් ඒ නීතිය අනුව කටයුතු කරන්න කියන එක තමයි මා කියන්නේ. ඔබතුමා තවම ඒ චක්‍රලේඛය කියවලාවත් නැහැ.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, මම ඔබතුමන්ලා දෙදෙනාටම අවස්ථාව දුන්නා. ගරු ඇමතිතුමනි, ඊළඟ පාර්ලිමේන්තු සැසි වාරයේදී වාර්තාව ඉදිරිපත් කරන්න.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු කථානායකතුමනි, පොඩි පැහැදිලි කිරීමක් සඳහා මට විනාඩියක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් පැහැදිලි කිරීම්වලට දෙදෙනාටම මිනිත්තුව මිනිත්තුව බැගින් දීලා කාලය බොහෝ සෙයින් ගත වුණා. තව වැඩ කටයුතු රාශියක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඊළඟ පාර්ලිමේන්තු සැසි වාරයේදී එම වාර්තාව ඉදිරිපත් කරන්න ඔබතුමාට යුතුකමක් තිබෙනවා.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු කථානායකතුමනි, මෙතුමා චක්‍රලේඛයක් ගැන සඳහන් කළා. මම ඒ චක්‍රලේඛය බලලා- [බාධා කිරීම්] මොකද, මට මේ චක්‍රලේඛ අංක කියලා ඒ අනුව කටයුතු කරන්න බැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, මට තේරෙනවා.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
මෙතුමා චක්‍රලේඛ අංක ගැන කථා කරලා ඒවා කරන්නේ නැහැ කියලා ඉදිරිපත් කරන්න එපා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ඊළඟ පාර්ලිමේන්තු සැසි වාරයේදී වාර්තාව ඉදිරිපත් කරන්න. That is all.

කෝරලේපත්තු, බටහිර ඕඩ්ඩමාවඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: විස්තර
கோரளைப்பற்று ஓட்டமாவடி மேற்குப் பிரதேச செயலாளர் பிரிவு: விபரம்
ODDAMAVADI WEST DIVISIONAL SECRETARY'S DIVISION OF KORALEPATTU: DETAILS

1146/'16

5. ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)
ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4) :

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තු බටහිර ඕඩ්ඩමාවඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;
(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ පිටපතක් සභාගත කරන්නේද;
(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;
(iv) එහි ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;
(v) එම ග්‍රාම නිලධාරි වසම්වල නිල අංක හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;
(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති ග්‍රාම නිලධාරි වසම් අතරින් කිසියම් වසමක/ වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදුකරනු ලබන්නේද;
(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරි වසම්වල නාමය, නිල අංක ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தின் கோரளைப்பற்று ஓட்டமாவடி மேற்கு பிரதேச செயலாளர் பிரிவு தாபிக்கப்பட்ட திகதி யாதென்பதையும்;
(ii) அது தொடர்பாக வெளியிடப்பட்ட வர்த்தமானிப் பத்திரிகையின் பிரதியொன்றை சபையில் சமர்ப்பிப்பாரா என்பதையும்;
(iii) அப்பிரதேச செயலாளர் பிரிவின் மூலம் உள்ளடக்கப்படும் மொத்த நிலப் பரப்பளவு எவ்வளவு என்பதையும்;
(iv) அதிலுள்ள கிராம அலுவலர் பிரிவுகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்,
(v) அக்கிராம அலுவலர் பிரிவுகளின் உத்தியோகபூர்வ இலக்கங்களும் பெயர்களும் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அப்பிரதேச செயலாளர் பிரிவைத் தாபிக்கும்போது உத்தியோக பூர்வமாக எல்லைகளை நிர்ணயித்தல் நடைபெற்றுள்ளதா என்பதையும்;
(ii) ஆமெனில், அது பற்றிய விபரங்கள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) அப்பிரதேச செயலகத்திற்குரிய கிராம அலுவலர் பிரிவுகளில் ஏதேனும் பிரிவின்/பிரிவுகளின் நிருவாக நடவடிக்கைகள் அல்லது தொழிற்பாடுகள் வேறு பிரதேச செயலகங்களின் மூலம் மேற்கொள்ளப்படுகின்றனவா என்பதையும்;
(ii) ஆமெனில், அக்கிராம அலுவலர் பிரிவுகளின் பெயர்கள், உத்தியோகபூர்வ இலக்கங்கள் உள்ளிட்ட விபரங்களை சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs:

(a) Will he inform this House-

(i) the date on which the Oddamavadi West Divisional Secretary's Division of Koralepattu in the Batticaloa District was established;

(ii) whether he will table a copy of the Gazette Notification issued in this regard;

(ii) what total extent of land area is covered by that Divisional Secretary's Division;

(iii) how many Grama Niladhari Divisions are located in the Division concerned; and

(iv) what the official codes and names of such Grama Niladhari Divisions are?

(b) Will he also inform this House-

(i) whether an official delimitation mission has taken place in establishing that Divisional Secretary's Division; and

(ii) if so, what its details are?

(c) Will he state-

(i) whether administration or other operations of any of the Grama Niladhari Divisions falling under the Divisional Secretary's Division concerned are currently handled by some other Divisional Secretariats; and

(ii) if so, whether he will submit the names and official codes of such Grama Niladhari Divisions?

(d) If not, why?

ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 1997.05.29

(ii) ඔව්. ගැසට් පත්‍රයේ පිටපතක් **සභාගත*** කරමි.

(iii) ව.කි.මී. 19.79කි.

(iv) 08කි.

(v)

අනු අංකය	ග්‍රාම නිලධාරි වසම්	නිල අංකය
01	මීරාඕඩෙයි (මුස්ලිම්) බටහිර	207
02	මාන්චෝලයි	207 ඒ
03	මීරාඕඩෙයි (මුස්ලිම්) නැඟෙනහිර	207 බී
04	ඔඩ්ඩමාවඩි කොට්ඨාස අංක 03	208
05	ඔඩ්ඩමාවඩි කොට්ඨාස අංක 01 දකුණ	208 බී
06	ඔඩ්ඩමාවඩි කොට්ඨාස අංක 01 උතුර	208 බී/2
07	ඔඩ්ඩමාවඩි කොට්ඨාස අංක 02	208 සී
08	පේපර් ටවුන්	210 බී

(ආ) (i) ඔව්. සීමා නිර්ණය කිරිමක් කර ඇත.

(ii) මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා 2002.05.24ට පෙර පැවැති ග්‍රාම නිලධාරි වසම් 14ට අදාළව, අංක 983 දරන 1997 ජූලි 4වැනි සිකුරාදා දින නිකුත් කරන ලද ගැසට් පත්‍රය මඟින් සීමාවන් සඳහන් කර ඇත. (ගැසට් පත්‍රයේ පිටපත සභාගත කර ඇත.)

නමුත්, 2002.05.24ට පසුව මෙම ග්‍රාම නිලධාරි වසම් 14, ග්‍රාම නිලධාරි වසම් 8ක් බවට පරිවර්තනය වී ඇත.

(ඇ) (i) ඔව්.

(ii) ඔව්.

අනු අංකය	ග්‍රාම නිලධාරි	නිල අංකය	වර්තමානයේ දී පාලනය කරන ප්‍රාදේශීය ලේකම්
01	කල්ලිච්චෙයි	210 ඒ	කොරලේපත්තු - දකුණ (කිරාන්)
02	වාහනේරි	210	-එම-
03	වඩමුනෙයි	210 ඒ 1	-එම-
04	ඔත්තුචේනයි	210 ඒ 2	-එම-
05	පූනානි බටහිර	210 බී	-එම-
06	තියාවෙඩ්ඩුවාන්	210 ඊ	කෝරලේපත්තු- මධ්‍යම (වාලච්චේනයි)

(ඈ) අදාළ නොවේ.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)

ගරු කථානායකතුමනි, මම පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්. බොහෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අනුයුක්ත කරන ලද ග්‍රාම නිලධාරි වසම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් පාලනය වන ස්වභාවයක් පෙනෙන්නට තිබෙනවා. විශේෂයෙන් මඩකළපුව දිස්ත්‍රික්කයේ මෙම තත්ත්වය පවතිනවා. ඒකට හේතුව මොකක්ද?

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)

ගරු මන්ත්‍රීතුමනි, කාරණා දෙකක් තිබෙනවා. එකක් තමයි, එම ප්‍රදේශයේ භූගෝලීය පිහිටිම අනුව සමහර ග්‍රාම නිලධාරි වසම් එකතු කර තිබීම. ඒ එක්කම පසුගිය රජය විසින් 2012 වසරේ සීමා නිර්ණ කමිටුව පත් කර, 2014 වසරේ එහි වැඩ කටයුතු අවසන් වුණත් හේතු කිහිපයක් මත එය ගැසට් පත්රයේ පළ කරලා නැහැ. පනත අනුව අවුරුදු 5කට වරක් සීමාවන් වෙනස් කිරීමේ බලය ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සතුව තිබෙනවා.

ඒ අනුව වර්ෂ 5කට වරක් ලැබෙන බලය මෙම 2017 වර්ෂයේදී කරන්න නම්වෙලා තිබෙනවා. දැනට අපි එම කමිටුව පත් කිරීමට කටයුතු කරගෙන යනවා. 2012 සීමා නිර්ණ ගත්තාම, රටේ සමහර තැන්වල තිබෙන යම් යම් ඒවා පිළිගත හැකිව තිබෙනවා. ඒ වාගේම පිළිගත නොහැකි කාරණාත් තිබෙනවා,

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු වජිර අබේවර්ධන මහතා]

කිසිම දේශපාලන පක්ෂයක හෝ ගමේ කිසිම සංවිධානයක නියෝජිතත්වය නොමැතිව ගත් තීරණ නිසා. ඒ අනුව 2017 සීමා නිර්ණයත් සඳහා ගරු මන්ත්‍රීතුමා විසින් එම ප්‍රදේශයේ තොරතුරු ඉදිරිපත් කළොත්, අපට යම් යම් නිවැරදි කිරීම් කරලා දෙන්න පුළුවන්.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)

ගරු කථානායකතුමනි, තව එක අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. ගරු ඇමතිතුමනි, මට මතක හැටියට හිටපු අග්‍රාමාත්‍ය රත්නසිරි වික්‍රමනායක මැතිතුමා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ධුරයේ ඉන්නකොට පානම්බලම කියලා කොමිෂන් සභාවක් පත්කළා. එහිදී තීරණය කළේ, යම් යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නැවත සකස් කිරීමට සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අලුතින් නම් කිරීමටයි. ඇතැම් අවස්ථාවලදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ග්‍රාම නිලධාරි වසම් මාරුකිරීම එම පානම්බලම වාර්තාවටත් පටහැනියි. මෙම පානම්බලම කොමිසමේ නිර්දේශ අමාත්‍යාංශය විසින් සියයට 100ක් පිළිගෙන ක්‍රියාත්මක කර තිබෙනවාද කියන ප්‍රශ්නයට මා ගරු ඇමතිතුමාගෙන් පසුව හෝ උත්තරයක් බලාපොරොත්තු වෙනවා.

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)

ගරු කථානායකතුමනි, මෙතුමා කියපු කරුණ ගැන මට අවබෝධයක් තිබෙනවා. නමුත්, ප්‍රශ්නය තිබෙන්නේ 2007 සීමා නිර්ණ වාර්තාව ගැසට් කරලා අපි පිළිඅරගෙන තිබෙනවා. 2012 එකත් පිළිඅරගෙන තිබෙනවා. සීමා නිර්ණයත් පිළිබඳව අවුරුදු 5කට වරක් සොයාබලන්න පුළුවන් කියලා තමයි පනතේ සඳහන් වෙන්නේ. උදාහරණයක් හැටියට බැලුවොත්, මේ මොහොත වන විට ලංකාව තුළ ග්‍රාම නිලධාරි වසම් 14,022ක් නැහැ. මොකද, උමාඔය නිසා ග්‍රාම නිලධාරි වසම් 25ක්, 30ක් සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා තිබෙනවා.

ඒ අනුව, අර පරණ වැදගත් තීරණ සියල්ලක් අපි පිළිගෙන තිබෙන අතරේ මේ වර්ෂයේ එන අලුත් සීමා නිර්ණයත් එක්ක අපට ඒ වෙනස්කම කරලා දෙන්න පුළුවන්කම තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 - 1278/'16 - (4), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

සබරගමුව ප්‍රධාන අමාත්‍යවරයා භාවිත කරන වාහන : විස්තර
சப்ரகமுவ முதலமைச்சர் பயன்படுத்தும் வாகனங்கள்: விபரம்
VEHICLES USED BY CHIEF MINISTER OF SABARAGAMUWA PROVINCE: DETAILS

1586/'17

12. **ගරු සන්දිත් සමරසිංහ මහතා**
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා සබරගමුව ප්‍රධාන අමාත්‍යවරයා භාවිතා කරන වාහන සංඛ්‍යාව කොපමණද;
(ii) එම එක් එක් වාහනයේ වර්ගය හා අංකය කවරේද;
(iii) එම එක් එක් වාහනයේ නඩත්තු කටයුතු සඳහා වැය කළ මුදල් ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;
(iv) ප්‍රධාන අමාත්‍යවරයා විසින් වාහන අවභාවිතාවක් සිදුකර ඇත්නම්, ඒ සම්බන්ධව අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை சப்ரகமுவ முதலமைச்சர் பயன்படுத்தும் வாகனங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;
(ii) அந்த ஒவ்வொரு வாகனத்தின் வகையும் இலக்கங்களும் யாவை என்பதையும்;
(iii) அந்த ஒவ்வொரு வாகனத்தின் பராமரிப்புக்காக செலவிடப்பட்ட பணத்தொகை ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;
(iv) முதலமைச்சரினால் வாகனங்கள் தவறாகப் பயன்படுத்தப்பட்டிருப்பின், அது தொடர்பாக அமைச்சு எடுக்கும் நடவடிக்கை யாது என்பதையும்

அவர் இச்சபைக்கு தெரிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Minister of Provincial Councils and Local Government:

(a) Will he inform this House -
(i) the number of vehicles that have been used by the Chief Minister of the Sabaragamuwa Province from year 2015 to date;
(ii) the make and registered number of each of those vehicles;
(iii) separately, on per year basis, the amount of money that have been spent on maintaining each of those vehicles; and
(iv) if the Chief Minister has misused vehicles, the nature of action that will be taken against him by the Ministry?

(b) If not, why?

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සබරගමු පළාත් ප්‍රධාන ලේකම් විසින් දන්වා එවා ඇති තොරතුරු අනුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා 2015 වර්ෂයේ සිට මේ දක්වා භාවිත කරන වාහන සංඛ්‍යාව 03කි.

(ii) එම එක් එක් වාහනයේ වර්ගය හා අංකය පහත දක්වා ඇත.

අනු අංකය	වාහන අංකය	වාහන වර්ගය
01	SG KQ - 5418	Toyota ජීප් රථය
02	SG KX - 5230	Land Rover Discovery ජීප් රථය
03	SG JN - 0587	Volvo කාර් රථය

(iii) එක් එක් වාහනයේ නඩත්තු කටයුතු සඳහා වැය කළ මුදල් ප්‍රමාණය පහත දැක්වේ.

අනු අංකය	වාහන අංකය	2015 වර්ෂයේ වියදම	2016 වර්ෂයේ වියදම	2017 වර්ෂයේ වියදම
01.	SG KQ - 5418	රුපියල් 3,021,635.52 (රුපියල් තිස්ලක්ෂ විසිඑක්දහස් හයසිය තිස්පහයි ශත පනස්දෙකයි.) රුපියල් 906,297.84ක - (රුපියල් නවලක්ෂ හයදහස් දෙසිය අනූහතයි ශත අසූහතරක) මුදලක් රක්ෂණ වන්දි ලෙස ලැබී ඇත.	රුපියල් 2,045,591.68 (රුපියල් විසිලක්ෂ හතළිස්පන්දහස් පන්සිය අනූඑකයි ශත හැට අටයි.)	රුපියල් 1,587,289.90 (රුපියල් පහළොස් ලක්ෂ අසූහත්දහස් දෙසිය අසූනවයයි ශත අනූවයි.) රුපියල් 1,416,500.00ක (රුපියල් දාහතරලක්ෂ දහසයදහස් පන්සියයක) මුදලක් රක්ෂණ වන්දි ලෙස ලැබී ඇත.
02.	SG KX - 5230	රුපියල් 3,947,714.65 (රුපියල් තිස්නවලක්ෂ හතළිස්හත්දහස් හත්සිය දාහතරයි ශත හැටපහයි.) රුපියල් 2,428,621.94ක (රුපියල් විසිහතරලක්ෂ විසිඅටදහස් හයසිය විසිඑකයි ශත අනූහතරක) මුදලක් රක්ෂණ වන්දි ලෙස ලැබී ඇත.	රුපියල් 1,107,092.32 (රුපියල් එකොළොස් ලක්ෂ හැත්තෑදහස් අනූදෙකයි ශත තිස්දෙකයි.)	රුපියල් 561,308.16 (රුපියල් පන්ලක්ෂ හැටඑක්දහස් තුන්සිය අටයි ශත දහසයයි.)
03.	SG JN - 0587	රුපියල් 7,595 (රුපියල් හත්දහස් පන්සිය අනූපහයි.)	රුපියල් 159,370.39 (රුපියල් එක්ලක්ෂ පනස්නවදහස් තුන්සිය හැත්තෑවයි ශත තිස්නවයයි.)	--

(iv) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. එය මෙසේයි. 2016 විගණකාධිපති වාර්තාවේ සඳහන්ව තිබෙනවා, ප්‍රධාන අමාත්‍යවරයාට පාවිච්චි කරන්න පුළුවන් වන්නේ, ආරක්ෂක වාහනයක් සහ නිල වාහන දෙකක්ය කියා. හැබැයි මෙම වාර්තාවේ සඳහන්ව තිබෙනවා, වාහන 14ක් පාවිච්චි කර තිබෙනවා කියා. එපමණක් නොවෙයි.

2015 වසරේදී වාහන පාවිච්චි කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 9ක මුදලක් ගෙවා තිබෙනවා. ගරු කථානායකතුමනි, එම නිසා මෙතැන වාහන අවභාවිතයක් වෙලා තිබෙනවා. ඒ බව විගණකාධිපති වාර්තාවේ සඳහන්ව තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද?

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු කථානායකතුමනි, විගණකාධිපති වාර්තාවේ පිටපතක් මට ලබා දුන්නොත් මම ඒක ආණ්ඩුකාරතුමා වෙත යවන්නම්. ගරු කථානායකතුමනි, මෙතැන විශාල ප්‍රශ්නයක් තිබෙනවා. [බාධා කිරීමක්] චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා ටිකක් ඉවසන්න. ගරු මන්ත්‍රීතුමන්ලා මෙතැනදී නගන චෝදනා සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගන්න මගේ අකමැත්තක් නැහැ. සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා විගණන වාර්තාවක් ඉදිරිපත් කරමින් මෙතැනදී ප්‍රශ්නයක් නැඟුවා. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාට ටිකක් නිශ්ශබ්දව ඉන්න කියන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න. ගරු ඇමතිතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු කථානායකතුමනි, විගණන වාර්තාවක් ඉදිරිපත් කරමින් ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා සාධාරණ ප්‍රශ්නයක් නැඟුවේ. ගරු කථානායකතුමනි, ඔබතුමා මට උපදෙස් දෙන්න, දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පාර්ලිමේන්තුවේදී මෙවැනි ප්‍රශ්නයක් ඇහුවොත් මට ගත හැකි ක්‍රියා මාර්ගය මොකක්ද කියලා. ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා විගණන වාර්තාවක් ගැන සඳහන් කළා. මට ඒක කථානායකතුමාට යොමු කරන්න පුළුවන්, "වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයකදී මෙවැනි ප්‍රශ්නයක් මතු වුණා. විගණන වාර්තාවේ මෙවැනි දෙයක් සඳහන්ව තිබෙනවා, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න." කියලා. ගරු කථානායකතුමනි, මගේ වගකීම පළාත් සභාවලින් එවන වාර්තා අනුව මේ සභාව දැනුවත් කිරීමයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඉතා වැදගත් ප්‍රශ්නයක් ගරු මන්ත්‍රීතුමා ඇහුවේ. වැදගත් ප්‍රශ්නයක් අහපු නිසා අදාළ අමාත්‍යවරයා විධියට ඔබතුමා ඔබතුමාගේ ලේකම්වරයාටවත් කියලා ඒ ගැන පරීක්ෂා කර සොයා බලනවා නම් හොඳයි.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
මම ස්තුතිවන්ත වෙනවා, ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා විගණන වාර්තාවක් පදනම් කරගෙන ඉතා හරයාත්මක ලෙස යම් ප්‍රශ්නයක් මතු කිරීම ගැන. ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් මම ආණ්ඩුකාරවරයා දැනුවත් කරන්නම්.

ගරු කථානායකතුමනි, ඔබතුමා ඊට අමතරව මට යම් දෙයක් කරන්න කියනවා නම් මම කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අදාළ අමාත්‍යවරයා වශයෙන් ඔබතුමාට වාර්තාවක් ගෙන්වා ගෙන බලන්න පුළුවන් නේ.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
මන්ත්‍රීතුමනි, මම විගණන වාර්තාව ගෙන්වා ගෙන, ඒ සම්බන්ධයෙන් ආණ්ඩුකාරතුමා දැනුවත් කර අදාළ පියවර ගන්න කියන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමාට ඊළඟ සතියේ පිළිතුරක් දෙන්න.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
හොඳයි.

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

ගරු කථානායකතුමනි, එතුමාගේ ආරක්ෂාවට යන වාහනය කෑගල්ල පොලීසියේ රථවාහනයක්; Land Cruiser එකක්. ඒකේ නොම්මරය GB - 8457. මේ වාහනයේ ගංජා ගෙනයන කොට අහු වුණා. ගරු කථානායකතුමනි, මෙම වාහනයේ අයිතිය තිබෙන්නේ පළාත් සභාවටද, නැත්නම් පොලීසියටද කියලා අපට දැන ගන්න ඕනෑ.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු මන්ත්‍රීතුමනි, එවැනි ප්‍රශ්නයකට මම මෙම ගරු සභාවේ උත්තර දෙන්නේ කොහොමද? ඔබතුමා-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමා හොයලා බලලා උත්තර දෙන්න.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු කථානායකතුමනි, හොයලා බලලා මෙම ප්‍රශ්නයට පිළිතුරු දෙන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොයලා බලලා උත්තර දෙන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මටත් අවස්ථාවක් දෙන්න.

දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ගරු ඇමතිතුමා අසරණ වෙලාය කියන කාරණය අපට ඉතාම පැහැදිලියි. සමාවෙන්න ඕනෑ ඔබතුමාට-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ඒක අපි පිළිගන්නවා. මට පොඩ්ඩක් පැහැදිලි කරන්න ඉඩ දෙන්න. මම කථා කරනතෙක් ඉන්න කෝ.

ඒ ව්‍යවස්ථාව අනුව එතුමා වාර්තා ගන්න ඕනෑ ආණ්ඩුකාරතුමාගෙන්. ඒක අපි පිළිගන්න ඕනෑ. අදාළ අමාත්‍යවරයා වශයෙන් එතුමාට පුළුවන් අවධානය යොමු කරලා යම් කිසි ක්‍රියාමාර්ගයක් ගන්න. එතුමා දැන් ඒකට එකඟ වුණා නේ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
විගණන විමසුම් සහ ඒ සියලු වාර්තාවලින් හෙළිදරව් වන කාරණා අනුව, මහජන මුදල් අවභාවිතය කියන කාරණය අපි පැහැදිලිව ඔප්පු කරනවා. එහෙම නම්, කාටද හැකියාවක් තිබෙන්නේ මෙම හොරුන් පිළිබඳව ගත යුතු තීන්දු ගන්න?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආණ්ඩුකාරතුමාට. නමුත් ගරු ඇමතිතුමාට පුළුවන් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න. ඒකයි වර්තමාන තත්ත්වය.

නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාර : ආයු කාලය ඉකුත්වීම

நுரைச்சோலை நிலக்கரி மின்னுற்பத்தி நிலையம்: ஆயுட்காலம் முடிவு

NOROCHCHOLAI COAL POWER PLANTS: LIFETIME EXPIRATION

1600/'17

13.ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ ඇති බලාගාර තුනෙහි ආයු කාලය අවසන් වන වර්ෂය කවරේද;

(ii) එම බලාගාරවල ආයු කාලය අවසන් වීමෙන් පසු එම බලාගාර තුනෙන් ලැබුණු බලශක්තිය ලබා ගැනීමේ විකල්ප ක්‍රමවේදය කවරේද;

(iii) එම බලාගාරවල නිරන්තරයෙන් මතුවන තාක්ෂණික අර්බුද පිළිබඳව සලකා බැලීමේදී

නියමිත කාලයට පෙර එම බලාගාර භාවිතයෙන් ඉවත් කිරීම මඟින් සිදු විය හැකි තත්ත්වය පිළිබඳව, දිගුකාලීන ජනන සැලැසුම් සකස් කරනු ලබන සැලසුම් සම්පාදකයන්ගේ අවධානය යොමු වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நுரைச்சோலை நிலக்கரி மின்நிலையத்திலுள்ள மின் சக்தி நிலையங்கள் மூன்றினதும் ஆயுட் காலம் முடிவடையும் ஆண்டு யாது என்பதையும்;

(ii) மேற்படி மின்சக்தி நிலையங்களின் ஆயுட்காலம் முடிந்த பின்னர் அந்த மூன்று மின்சக்தி நிலையங்களிலிருந்தும் பெறப்பட்ட மின்வலுவை பெற்றுக்கொள்ளும் மாற்று வழிமுறை யாது என்பதையும்;

(iii) மேற்படி மின்சக்தி நிலையங்களில் அடிக்கடி ஏற்படுகின்ற தொழில்நுட்ப நெருக்கடிகளை ஆராயும்போது உரிய காலத்திற்கு முன்னர் அந்த மின்சக்தி நிலையங்களை மூடிவிடுவதால் ஏற்படக்கூடிய நிலைமை தொடர்பில் நீண்டகால மின் பிறப்பாக்கத் திட்டங்களை தயாரிக்கும் திட்ட வகுப்பாளர்களின் கவனம் செலுத்தப்பட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு தெரிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House-

(i) the year of the lifetime of three power plants at Norochcholai Coal Power Plant expires;

(ii) the alternative methods to be used to obtain energy generated from those three power plants after their lifetime expired; and

(iii) whether policy makers of long term power generation schemes have focused attention on the consequences of the deactivation of those power plants before the due time, after considering the frequent technical failures in them?

(b) If not, why?

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාර තුනක් තිබෙනවා. ඒ බලාගාර තුනේ ආයු කාලය අවසන්වීම පිළිබඳව අසන ලද මේ ප්‍රශ්නය ඉතාම බරපතළ ප්‍රශ්නයක්.

(අ) (i) 1 වැනි ගල් අඟුරු බලාගාරයේ ආයු කාලය 2041 වර්ෂයේදී හා 2වෙනි හා 3 වෙනි ගල් අඟුරු බලාගාරවල ආයු කාලය 2044 වර්ෂයේදී ද අවසන්වීමට අපේක්ෂිතය.

ගරු කථානායකතුමනි, මෙම ගල් අඟුරු බලාගාරවල ආයු කාලය පිළිබඳ අපි නිගමන කරලා තිබෙන්නේ ඒවායේ පිරිවිතර අනුවයි; සම්මත අනුවයි. නමුත් ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලවල මේ බලාගාරවල විටින් විට සිදුවුණු බිඳවැටීම්, තාක්ෂණික දෝෂ සහ අපේ විදුලි පද්ධතියේ ඇති ආවේණික ගැටලු සලකා බලන විට 2041 සහ 2044 කියන වර්ෂ දක්වාම මේ බලාගාර ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගෙන යෑමට හැකිද කියන ප්‍රශ්නය ස්වාභාවිකව ඕනෑම කෙනෙකුට මතු වනවා.

ඒ නිසා ඒ ප්‍රශ්නයට පිළිතුර හැටියට කිව හැක්කේ එතැන ගැටලුවක් තිබෙන බවයි.

(ii) නොරොච්චෝලේ ඉදිකර ඇති ගල් අඟුරු බලාගාර තුනෙහි ආයු කාලය අවසන් වීමෙන් පසු එම බලාගාර තුනෙන් ලැබුණු බලශක්තිය ලබා ගැනීම සඳහා නව ගල් අඟුරු බලාගාර, ස්වභාවික වායු මඟින් ක්‍රියාත්මක වන විදුලි බලාගාර, සූර්ය බලය, සුළං බලය, මුහුදු රළ වාගේම ජෛව ස්කන්ධ ඇතුළත් පුනර්ජනනීය විදුලි බලාගාර ඉදිකිරීමට ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ සහ ජනන සැලසුම් ශාඛාව විසින් සැලසුම් පිළියෙළ කර ඇත.

මේ සැලැස්ම අනුවයි අප කටයුතු කරන්නේ. ඇත්ත වශයෙන්ම මෙම බලාගාරවල ආයු කාලය අවසන් වීමෙන් පසුව නොව, අප ඒවා කල් තියාම සකස් කර ගන්නවා, ගරු මන්ත්‍රීතුමනි.

(iii) අවධානය යොමු වී ඇත.

(ආ) අදාළ නොවේ.

මෙම ප්‍රශ්නය යොමු කිරීම සම්බන්ධයෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා, ගරු මන්ත්‍රීතුමා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. නිරන්තරයෙන්ම කථා බහට ලක් වන කාරණයක් තමයි, නොරොච්චෝලේ විදුලි බලාගාරයෙන් විදුලි බලය සැපයීම ඇන හිටීම. ඉදිරි අනාගතය තුළ ඒ වෙනුවෙන් සැලැසුමක් තිබෙනවාය කියා ඔබතුමා කියනවා. නමුත් මේ නොරොච්චෝලේ විදුලි බලාගාරයේ විදුලිබල පද්ධතිය ඇන හිටියොත් මේ මුළු රටම අඳුරේ. මේකටත් අපේ රජයට තමයි බැණුම් අහන්න සිදු වෙන්නේ. නමුත් මේ බලාගාරය ඉදිකරනු ලැබුවේ පසුගිය රජය විසිනුයි. හදිසියේ මේ බලාගාරයේ නිෂ්පාදන කටයුතු ඇන හිටියොත් ඔබතුමන්ලා ඒ වෙනුවෙන් ගන්නා විසඳුම මොකක්ද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ එවැනි තත්ත්වයක් මතු වුණා.

මේ බලාගාරයේ තිබෙන මෙගාවොට් 900ක ධාරිතාවකින් යුත් මෙගාවොට් 300ක් බැගින් වූ යන්ත්‍ර තුනම එකවර බිඳ වැටුණා.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ඉතාම බරපතළ තත්ත්වයක් මතු වුණා. නමුත් අපේ ඉංජිනේරුවන් ඉතාමත්ම කල්පනාකාරීව, සැලසුම්සහගතව ඒ අවස්ථාවට මුහුණ දීලා අපේ පද්ධතිය ආරක්ෂා කර ගත්තා, දිගු කාලීන විදුලි බිඳ වැටීම වළක්වා ගත්තා. නමුත් අපට හැමදාම ඒ වාසනාව නැති වෙන්නට පුළුවන්. එහි අනතුරක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, එම නිසා අපි ඉක්මනින්ම අපේ පද්ධතියට ද්‍රවීකෘත වායු, ඒ කියන්නේ LNG මඟින් ක්‍රියාත්මක වන මෙගාවොට් 300ක විදුලි බලාගාරයක් ඉදි කරන්නට බලාපොරොත්තු වෙනවා. ඒක තමයි අපේ රජය යටතේ නොරොච්චෝලේ බලාගාරයෙන් පසුව හදන විශාලතම බලාගාරය. ඒ බලාගාරය සඳහා දැන් ටෙන්ඩර් කැඳවලා තිබෙනවා. දැන් ඒ ටෙන්ඩර් ක්‍රියාවලිය අවසාන අදියරේ තිබෙන්නේ. ඒ වාගේම මෙගාවොට් 500 බැගින් වූ බලාගාර දෙකක් ගැන අපි කල්පනා කරනවා. ඒවා ගැන තවම අවසාන තීරණය අරගෙන නැහැ. ඊට අමතරව ඉතාම වේගයෙන් සූර්ය බලය සහ සුළං බලය අපේ පද්ධතියට එකතු කරමින් යනවා. පසුගිය වසරක කාලය තුළ අපි මෙගාවොට් 116ක පමණ සූර්ය බලය අපේ පද්ධතියට එකතු කරලා තිබෙනවා, පුනර්ජනනීය බලශක්තියක් හැටියට. ඔබතුමා මේ ප්‍රශ්නය නඟන නිසාමත්, ඒ වාගේම විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරුවන් විසින් කාලයක් තිස්සේ කරන ලද අධ්‍යයනයන් පිළිබඳවත් සලකා බලා, ඕනෑම මොහොතක නොරොච්චෝලේ බලාගාරයේ ඇති යන්ත්‍ර තුනම අභිමිච්මේ අවදානම පිළිබඳවත් කල්පනා කර අපි ඒ සම්බන්ධයෙන් කටයුතු කරන බව ඔබතුමාට කියන්නට කැමැතියි.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. පසුගිය දවස්වල ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ දැවැන්ත දීප ව්‍යාප්ත වැඩ වර්ජනයක් සිද්ධ වුණු බව අපි දැක්කා. ඒ වාගේම විදුලිබල මණ්ඩලයේ වෘත්තීය සමිති ප්‍රකාශ කර සිටිනවා, ලබන සතියේ දීප ව්‍යාප්ත වැඩ වර්ජනයක් සිද්ධ කරන බව. මේ සඳහා නිමිත්ත හැටියට මම දකින්නේ ඔවුන්ගේ වැටුප් විෂමතාව.

හැබැයි, අපි එම සිද්ධියට අදාළව ඈතට ගිහින් බලමු. 2015 ජනවාරි 8 වැනි දා තමයි ජනාධිපතිවරණය පැවැත්වුවේ. ඒ හා සමඟම, ඒ මතම, ඒ උඩම කිසිම නිර්ණායකයක්, කිසිම පිළිගත හැකි ක්‍රමවේදයක් නැතුව විදුලිබල මණ්ඩලයේ ඉහළ නිලධාරින්ගේ වැටුප් වැඩි කළා. කිසිම දෙයක් නැතුව ඉතාම අධි ප්‍රමාණයකින් වැටුප් වැඩි කළා. ඒ හා සමාන්තරව පහළ සේවකයින්ගේ වැටුප් වැඩි කරන්නට බැරි තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒ හා සමඟ තමයි මේ වැටුප් විෂමතා පිළිබඳව ඔවුන්ගේ ඉල්ලීම ඇති වෙන්නේ.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, විදුලිබල මණ්ඩලයේ වෘත්තීය සමිති ප්‍රකාශ කර සිටිනවා, ලබන සතියේ දීප ව්‍යාප්ත වැඩ වර්ජනයක් කරනවා කියලා. පසුගිය රජයේ තොප්පි තමයි ඔබතුමන්ලාගේ ඔළුවලට මේ වැටෙන්නේ. ඉතින් මම ඔබතුමන්ලාගෙන් අහන්නේ පසුගිය මහින්ද රාජපක්ෂ රජය විසින් කිසිම විද්‍යාත්මක පදනමකින් තොරව සිදු කළ විදුලිබල මණ්ඩලයේ ඉහළ නිලධාරින්ගේ වැටුප් වැඩි කිරීම්වලට සමගාමීව, යම් පදනමකින් පහළ නිලධාරින්ගේ වැටුපත් වැඩි කළ හැකිද කියලායි. එහෙම නැත්නම් ඔවුන් සිදු කරන්නට හදන දීප ව්‍යාප්ත වැඩ වර්ජනය හමුවේ ඔබතුමන්ලාගේ විසඳුම මොකක්ද කියන එකත් මම දැන ගන්න කැමැතියි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, ලබන 13 වැනි දා සිදු කරන්නට යන වැඩ වර්ජනයක් පිළිබඳ දැන්වීම් වෘත්තීය සමිති ගණනාවක් විසින් අපට ලබා දීලා තිබෙනවා. විදුලිබල මණ්ඩලයේ වෘත්තීය සමිති 60කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. මෙම වෘත්තීය සමිති සියල්ලම වාගේ ඒකාබද්ධ වෙලා යම් ආකාරයක වැටුප් විෂමතාවක් පිළිබඳව දුක්ගැනවිල්ලක් ඉදිරිපත් කරනවා. එහි ඇති සාධාරණ පැතිකඩ කිහිපයක් පිළිබඳවම අපි කාලයක් තිස්සේ අවධානය යොමු කළා. ඔවුන් පවා අවස්ථා කිහිපයකදී වෘත්තීය සමිති ක්‍රියා මාර්ග අනුගමනය කරලා, ලබන 13 වැනි දාත් නැවත බරපතළ වැඩ වර්ජනයකට යොමු වන බවක් තමයි අපට පෙනෙන්න තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන් විදුලිබල මණ්ඩලයේ වැටුප් මදියි කියලා කවුරුවත් කියන්නේ නැහැ. ඔවුන් කියන්නේ විෂමතාවක් තිබෙනවා කියලායි. ඒ කියන්නේ නොගැළපීමක් තිබෙනවා, යම් අසාධාරණ තත්ත්වයක් තිබෙනවා කියලායි කියන්නේ. ඒ නිසා මේ පිළිබඳව විවිධ විද්වතුන්ගේ අදහස් සලකා බලා, ඒ වාගේම වෘත්තීය සමිතිවල අදහස් සලකා බලා පසුගිය සතියේ විදුලිබල අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය සුරේන් බටගොඩ මහතා විසින් මේ ප්‍රශ්නය විසඳීමට අමාත්‍යාංශය පැත්තෙන් ඉදිරිපත් කරන යෝජනා මාලාව සෑම වෘත්තීය සමිතියකටම ලිඛිතව දැනුම් දුන්නා. ඒ නිසා දැන් මෙම ප්‍රශ්නය විසඳීම සඳහා වන ක්‍රියාමාර්ගය පිළිබඳ සාකච්ඡාවට පදනමක් තිබෙනවා, පදනම් ලේඛනයක් තිබෙනවා. මෙම ප්‍රශ්නය ටිකක් සංකීර්ණයි.

ඒක වැටුප් ප්‍රශ්නයක් විතරක් නොවෙයි, වෘත්තීය ගරුත්වය පිළිබඳව වාගේම ශ්‍රේණිගත කිරීම් පිළිබඳවත්, වැටුප් විෂමතාවන් පිළිබඳවත් ප්‍රශ්න රාශියක් තිබෙනවා. ඒ වාගේම සේවක කණ්ඩායම් අතර තරගයකුත් තිබෙනවා. ඒකත් සාමාන්‍යයෙන් වෙනත් ආයතනවල නැති විධියේ විශේෂ තත්ත්වයක්. ඒ නිසා කාටත් සාධාරණ වන ආකාරයේ විසඳුමක් ලබා දෙන්න අපි කටයුතු කරනවා. විශේෂයෙන්ම මම රට පුරා සිටින විදුලිබල මණ්ඩලයේ සේවකයන්සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා, අපි ඒ හැම වෘත්තීය සමිතියකම නායකත් වෙත ලබා දී ඇති විසඳුම් මාලාවේ පිටපත ලබා ගෙන ඒ පිළිබඳව විධිමත්ව අධ්‍යයනය කරන ලෙස. අපි හුඟක්ම සාධාරණ විසඳුමක් තමයි ඉදිරිපත් කර තිබෙන්නේ. රට ඉතාම දුෂ්කර තත්ත්වයක ඉන්න වෙලාවේ රට වෙනුවෙන් හිතලා විසඳුමක් සඳහා එකඟ වන්න, අපට සහාය වන්නය කියා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

යුද හමුදාවට කැන්වස් සපත්තු මිලදී ගැනීම: ටෙන්ඩර් පටිපාටිය

இராணுவத்துக்கு கன்வஸ் பாதணிகள் கொள்வனவு: கேள்வி நடைமுறை

PURCHASE OF CANVAS SHOES FOR ARMY: TENDER PROCEDURE

387/'15

1. ගරු අජිත් මාන්නප්පෙරුම මහතා(ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවට)
(மாண்புமிகு அஜித் மான்னப்பெரும - மாண்புமிகு புத்திக பதிரண சார்பாக)
(The Hon. Ajith Mannapperuma on behalf of the Hon. Buddhika Pathirana)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (6):

(අ) (i) 2015 වර්ෂයේදී යුධ හමුදාවට ශාරීරික අභ්‍යාස සඳහා අවශ්‍ය කැන්වස් සපත්තු මිලදී ගැනීමට

ටෙන්ඩර් කැඳවූ අවස්ථාවේ ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ ආයතන කවරේද;

(ii) එම ආයතන ඉදිරිපත් කළ ටෙන්ඩර් වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ටෙන්ඩරය ලබාගත් ආයතනය කවරේද;

(iv) එම ආයතනයට ටෙන්ඩරය ලබාදීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේදී මෙම සපත්තු මිලදී ගැනීමට අදාළ ආරක්ෂක අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සිටි නිලධාරීන්ගේ නම් හා තනතුරු කවරේද;

(ii) මෙම නිලධාරීන් ටෙන්ඩර් මණ්ඩලයේ කොපමණ කාලයක සිට කටයුතු කරන්නේද;

(iii) 2015 වර්ෂයේදී මෙම සපත්තු මිලදී ගැනීමට අදාළ යුධ හමුදා ටෙන්ඩර් මණ්ඩලයේ සිටි නිලධාරීන්ගේ නම් හා තනතුරු කවරේද;

(iv) මෙම නිලධාරීන් ටෙන්ඩර් මණ්ඩලයේ කොපමණ කාලයක සිට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ආරක්ෂක අමාත්‍යාංශය හා යුධ හමුදා ටෙන්ඩර් මණ්ඩලවල අඛණ්ඩව සේවය කරන නිලධාරීන් ඉවත් කිරීමට රජය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයකදීද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டில் இலங்கை இராணுவத்துக்கு தேகப் பயிற்சிகளுக்குத் தேவையான கன்வஸ் பாதணிகளைக் கொள்வனவு செய்வதற்குக் கேள்விப் பத்திரங்கள் கோரப்பட்ட சந்தர்ப்பத்தில் அதற்காகக் கேள்விப்பத்திரங் களைச் சமர்ப்பித்திருந்த நிறுவனங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி நிறுவனங்கள் சமர்ப்பித்திருந்த கேள்விப்பத்திரங்களின் பெறுமதிகள் வெவ் வேறாக யாவை என்பதையும்;

(iii) கேள்விப்பத்திரத்தைப் பெற்றுக்கொண்ட நிறுவனம் யாதென்பதையும்;

(iv) மேற்படி நிறுவனத்திற்கு கேள்விப்பத்திரம் வழங்கப்பட்டமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) 2015ஆம் ஆண்டில் மேற்படி பாதணி கொள்வனவுடன் தொடர்புடைய, பாதுகாப்பு அமைச்சின் கேள்விப்பத்திரச் சபையில் இருந்த உத்தியோகத்தர்களின் பெயர்கள் மற்றும் பதவிகள் யாவை என்பதையும்;

(ii) மேற்படி உத்தியோகத்தர்கள் கேள்விப்பத்திரச் சபையில் எவ்வளவு காலமாகப் பணியாற்றுகின்றார்கள் என்பதையும்;

(iii) 2015ஆம் ஆண்டில் மேற்படி பாதணி கொள்வனவுடன் தொடர்புடைய, இராணுவத்தின் கேள்விப்பத்திரச் சபையில் இருந்த உத்தியோகத்தர்களின் பெயர்கள் மற்றும் பதவிகள் யாவை என்பதையும்;

(iv) மேற்படி உத்தியோகத்தர்கள் கேள்விப்பத்திரச் சபையில் எவ்வளவு காலமாகப் பணியாற்றுகின்றார்கள் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) பாதுகாப்பு அமைச்சின் மற்றும் இராணுவத்தின் கேள்விப்பத்திரச் சபைகளில் தொடர்ச்சியாகப் பணியாற்றுகின்ற உத்தியோகத்தர்களை நீக்குவதற்கு அரசாங்கம் நடவடிக்கை மேற்கொள்ளுமா என்பதையும்;

(ii) ஆமெனில், அது எத்திகதியில் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he state -

(i) the institutions which submitted tenders when tenders were called for the purchase of the canvas shoes required for the physical training of the Army in the year 2015;

(ii) separately the values of tenders offered by the aforesaid institutions;

(iii) the institution which obtained the tender; and

(iv) the reasons for awarding the tender to the aforesaid institution?

(b) Will he inform this House -

(i) the names and designations of the officers of the tender board of the Ministry of Defence relevant to purchase of these shoes which took place in the year 2015;

(ii) for how long these officers have been serving in the tender board;

(iii) the names and designations of the officers of the Army Tender Board relevant to purchase of these shoes which took place in the year 2015; and

(iv) for how long these officers have been serving in the Tender Board?

(c) Will he also inform this House -

(i) whether action will be taken by the Government to remove the officers who continuously serve in the tender boards of the Ministry of Defence and the Army; and

(ii) if so, on which date?

(d) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සහ (ii) ප්‍රශ්න සඳහා පිළිතුරු පහත වගුවේ දැක්වේ.

(i) මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතනය	(ii) වටිනාකම (එකතු කළ අගය මත බදු රහිතව)
සී/ස සරසවි ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම මිලියන	5218.5 රු. 521,850,000.00
සී/ස කොස්මික් ටෙක්නොලොජීස් (පුද්) සමාගම මිලියන	3997.7 රු. 399,776,253.69
සී/ස ඩී සැම්සන් ඉන්ඩුස්ට්‍රීස් (පුද්) සමාගම	4651.5 රු. 465,150,000.00
සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව	5895.3 රු. 589,539,867.13
සී/ස එස් ඩබ්. ඉන්ටර්නැෂනල්	3935.3 රු. 393,534,166.37
සී/ස ඉරෝෂා ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම	3979.5 රු. 397,950,000.00
සී/ස ඩී සැම්සන් ඇන්ඩ් සන්ස් (පුද්)සමාගම ලංසුව II	4386.7 රු. 438,672,120.08
සී/ස ඩී සැම්සන් ඇන්ඩ් සන්ස් (පුද්)සමාගම ලංසුව I	4705.5 රු. 470,553,977.78
සී/ස ගිහාෂාන් ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම	4880.8 රු. 488,088,999.52
සී/ස හර්ෂ ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම	2685.9 රු. 268,590,000.00
සී/ස සිලෝන් ලෙදර් ප්‍රඩක්ස්ට්ස් පීඑල්සී	3764.8 රු. 376,485,900.00
සී/ස ලිබර්ටි ෂූස් (පුද්) සමාගම	4737.4 රු. 473,742,163.00

(iii) ටෙන්ඩරය ලබා ගත් ආයතනය - සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව

(iv) ටෙන්ඩරය ලබා දීමට හේතු

රසායනාගාර පරීක්ෂණ වාර්තා සහ ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාවල ප්‍රතිඵලද, ලංසු කොන්දේසි ද සලකා බැලීමෙන් අනතුරුව සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද අවම ලංසුකරු ලෙස තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඉහත ආයතනය නිර්දේශ කර තිබීම හා ඒ සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබීම.

(ආ) (i) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ආරක්ෂක අමාත්‍යාංශ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සිටි නිලධාරින්

පී.බී. අබේකෝන් මහතා - ජනාධිපති ලේකම්

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි මහතා - ආරක්ෂක ලේකම්

ඉංජි. නිහාල් සෝමවීර මහතා - ලේකම්(ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය)

සී.එම්. වීරසිංහ මහතා - ප්‍රධාන මූල්‍ය නිලධාරි (කර්මාන්ත හා වාණිජ කටයුතු

අමාත්‍යඃංශය

කේ.ඩී.ආර්. ඔල්ගා මිය - අධ්‍යක්ෂ, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

(ii) 2015.09.18 දින සිට

(iii) රුපියල් මිලියන 100 ඉක්මවන මිල දී ගැනීමක් බැවින් යුද්ධ හමුදා ටෙන්ඩරය මඟින් මෙම සපත්තු මිල දී ගැනීමට අදාළ කටයුතු සිදු නොවූ අතර, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ඉහත සඳහන් ආරක්ෂක අමාත්‍යාංශ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව මඟින් මිල දී ගැනීම් කටයුතු සිදු විය.

(iv) ඉහත (ආ) (iii) හි පිළිතුර මත පැන නොනඟී.

(ඇ) (i) නැත

එහෙත් නිලධාරින් විශ්‍රාම යාම, විවිධ පුහුණු වැඩසටහන් සඳහා විදේශගත වීම හා/හෝ ස්ථාන මාරුවීම හේතුවෙන් නව නිලධාරින් පත් කරනු ලැබේ.

(ii) පැන නොනඟී.

(ඈ) පැන නොනඟී.

රාජ්‍ය සේවකයන්ට සහන මිලට යතුරුපැදි ලබාදීම: තැපැල්කරුවන් ඇතුළත් නොකිරීම

அரச ஊழியர்களுக்கு சலுகை விலையில் மோட்டார் சைக்கிள் வழங்கல்: தபாற்காரர் உள்வாங்கப்படாமை

PROVISION OF MOTORCYCLES TO PUBLIC SERVANTS AT CONCESSIONARY RATES: NON-INCLUSION OF POSTMEN

952/'16

2. ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3):

(අ) (i) රාජ්‍ය සේවකයන්ට සහන මිලට යතුරුපැදි ලබාදීමේ වැඩ පිළිවෙළ යටතේ තැපැල්කරුවන්ද යතුරුපැදි ඉල්ලා ඇති බවත්;

(ii) ඔවුන්ට මෙතෙක් යතුරුපැදි ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පිරිසට සහන මිලට යතුරුපැදි ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரச ஊழியர்களுக்கு சலுகை விலையில் மோட்டார் சைக்கிள்கள் வழங்கும் நிகழ்ச்சித்திட்டத்தின் கீழ் தபால்காரர்களும் மோட்டார் சைக்கிள்களைக் கோரியுள்ளார்கள் என்பதையும்;

(ii) இவர்களுக்கு இதுவரை மோட்டார் சைக்கிள்கள் வழங்கப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இவர்களுக்கு சலுகை விலையில் மோட்டார் சைக்கிள்களை வழங்குவதற்கு நடவடிக்கை மேற்கொள்வாரா;

(ii) அவ்வாறாயின், அது எத்திகதியிலிருந்து;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Mass Media:

(a) Is he aware that -

(i) the postmen too have requested for motorcycles under the scheme of providing motorcycles to Public Servants at concessionary rates; and

(ii) that they have not yet issued with motorcycles?

(b) Will he inform this House -

(i) whether arrangements will be made to provide motorcycles to these persons on concessionary rates; and

(ii) If so, the date it will be done?

(c) If not, why?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
The Hon. Eran Wickramaratne)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්

(ii) ඔව්

(ආ) (i) පසු ගිය රජය යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2014 අනුව ක්ෂේත්‍ර නිලධාරීන් ලෙස තැපැල්කරුවන් ඇතුළත් කර නොමැත.

මෙම වැඩසටහන 2016 අයවැය යෝජනා අනුව 2015.11.20 දින සිට ක්‍රියාත්මක නොකරන ලදී.

(ii) පැන නොනඟී

(ආ) පැන නොනඟී.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඉදිකර ඇති නිවාස: විස්තර

தேசிய வீடமைப்பு அதிகாரசபை நிர்மாணித்த வீடுகள்: விபரம்

HOUSES BUILT BY NATIONAL HOUSING DEVELOPMENT AUTHORITY: DETAILS

1101/'16

3. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3)

(අ) (i) 2015.01.08 වැනි දිනෙන් පසුව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මේ දක්වා ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත නිවාස ඉදිකිරීමේදී නිවාස ණය ලෙස ලබා දී ඇති මුදල කොපමණද;

(iv) එම නිවාස ණය, දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015.01.08 දිනෙන් පසුව අධිකාරිය විසින් මේ දක්වා ඉදිකර ඇති ආධාරලාභී නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ සඳහා වෙන් කරන ලද සම්පූර්ණ මුදල කොපමණද;

(iv) එම මුදල, දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2015.01.08 දිනෙන් පසුව අධිකාරිය විසින් මේ දක්වා ඉදිකර ඇති නිවාස ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ සඳහා වෙන් කරන ලද සම්පූර්ණ මුදල කොපමණද;

(iv) එම මුදල, දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015.01.08ஆம் திகதிக்குப் பின்னர் தேசிய வீடமைப்பு அதிகாரசபையினால் இற்றைவரை நிர்மாணிக்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) மேற்படி வீடுகளின் எண்ணிக்கை மாவட்ட அடிப்படையில் வெவ்வேறாக எத்தனையென் பதையும்;

(iii) மேற்கூறிய வீடுகளை நிர்மாணிக்கும் போது வீடமைப்புக் கடன்களாக வழங்கப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iv) அந்த வீடமைப்புக் கடன்கள் மாவட்ட அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) 2015.01.08ஆம் திகதியின் பின்னர் அதிகாரசபையினால் இதுவரை நிர்மாணிக்கப்பட்டுள்ள உதவிகள் பெறுனர்களின் வீடுகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) அந்த எண்ணிக்கை மாவட்ட அடிப்படையில் வெவ்வேறாக எத்தனையென்பதையும்;

(iii) அதற்காக ஒதுக்கப்பட்ட மொத்தப் பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iv) அந்தப் பணத்தொகை மாவட்ட அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் அவர் குறிப்பிடுவாரா?

(இ) (i) 2015.01.08ஆம் திகதியின் பின்னர் அதிகாரசபையினால் இதுவரை நிர்மாணிக்கப்பட்டுள்ள வீடமைப்புக் கிராமங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) அந்த எண்ணிக்கை மாவட்ட அடிப்படையில் வெவ்வேறாக எத்தனையென்பதையும்;

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

(iii) அதற்காக ஒதுக்கப்பட்ட மொத்தப் பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iv) அந்தப் பணத்தொகை மாவட்ட அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் மேலும் இச்சபையில் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Housing and Construction:

(a) Will he inform this House -

(i) the number of houses built by National Housing Development Authority up to now after 08.01.2015;

(ii) number of such houses in each district separately;

(iii) the amount of money granted as housing loans when building the houses; and

(iv) the amount of housing loans provided as per each district separately?

(b) Will he also inform this House -

(i) the number of beneficiary houses built by the Authority up to now after 08.01.2015;

(ii) number of such houses in each district separately;

(iii) the total amount of money allocated for that purpose; and

(iv) the amount, in district wise separately?

(c) Will he further inform this House -

(i) the number of house villages built by the Authority up to now after 08.01.2015;

(ii) such villages, in each district separately;

(iii) the total amount of money allocated for it; and

(iv) the amount, in district-wise separately?

(d) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6-1278/'16-(4), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

බාහිර උපාධි පාඨමාලා සහ විදේශ විශ්වවිද්‍යාල උපාධි පාඨමාලා: ශිෂ්‍ය සංඛ්‍යාව

வெளிவாரிப் பட்டப் பாடநெறிகள் மற்றும் வெளிநாட்டுப் பல்கலைக்கழக பட்டப் பாடநெறிகள்: மாணவர் எண்ணிக்கை

EXTERNAL DEGREE COURSES AND DEGREE COURSES IN FOREIGN UNIVERSITIES: NUMBER OF STUDENTS

1350/'16

7. **ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා(ගරු ඩලස් අලහප්පෙරුම මහතා වෙනුවට)**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில - மாண்புமிகு டலஸ் அழஹப்பெரும சார்பாக)
(The Hon. Udaya Prabhath Gammanpila on behalf of the Hon. Dullas Alahapperuma)
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) ශ්‍රී ලාංකීය ශිෂ්‍යයන්ට බාහිර උපාධි පාඨමාලා හැදෑරීම සඳහා තිබූ අවස්ථා අඩු කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

(ii) 2016 වර්ෂයේ බාහිර උපාධි පාඨමාලා සඳහා බඳවා ගැනීමට අනුමත කරනු ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව ගැහැණු, පිරිමි ලෙස සහ එක් එක් උපාධි පාඨමාලාව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2014, 2015 සහ 2016 වර්ෂයන්හිදී උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ විශ්වවිද්‍යාල සඳහා බඳවා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2014, 2015 සහ 2016 වර්ෂයන්හිදී ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක විදේශ විශ්වවිද්‍යාලවල උපාධි පාඨමාලා හදාරන ශිෂ්‍යයන් සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත (iv) සඳහන් ශිෂ්‍යයන් විසින් හදාරනු ලබන උපාධි පාඨමාලාවන් කවරේද;

(vi) එම එක් එක් පාඨමාලාව හදාරනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(vii) ඉහත (v) සහ (vi) සඳහා පිළිතුරු නොදෙන්නේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மாணவர்களுக்கு வெளிவாரிப் பட்டப் பாடநெறிகளைக் கற்பதற்கு இருந்த வாய்ப்புகளைக் குறைப்பதற்கான கொள்கைத் தீர்மானமொன்று மேற்கொள்ளப்பட்டுள்ளதா;

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

(ii) 2016 ஆம் ஆண்டில் வெளிவாரிப் பட்டப் பாடநெறிகளுக்கு அனுமதிப்பதற்காக அங்கீகரிக்கப்பட்ட மாணவர்களின் எண்ணிக்கை ஒவ்வொரு பட்டப் பாடநெறி மற்றும் ஆண், பெண் எனும் அடிப்படையில் வெவ்வேறாக யாது;

(iii) 2014, 2015 மற்றும் 2016ஆம் ஆண்டுகளில் உயர்தரம் சித்தியடைந்து பல்கலைக்கழக அனுமதிக்குத் தகைமைபெற்ற மாணவர்களின் எண்ணிக்கை மற்றும் பல்கலைக்கழகங்களுக்கு அனுமதிக்கப்பட்ட மாணவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(iv) 2014, 2015 மற்றும் 2016ஆம் ஆண்டுகளில் இலங்கையினுள் செயற்படுகின்ற வெளிநாட்டுப் பல்கலைக்கழகங்களில் பட்டப் பாடநெறிகளைக் கற்கும் மாணவர்களின் எண்ணிக்கை ஆண்டுவாரியாக வெவ்வேறாக யாது;

(v) மேலே (iv) இல் குறிப்பிடப்பட்ட மாணவர்கள் கற்கும் பட்டப் பாடநெறிகள் யாவை;

(vi) இந்த ஒவ்வொரு பாடநெறியையும் கற்கும் மாணவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(vii) மேலே (v) மற்றும் (vi) க்கு விடை அளிக்கப்படாவிடின், அது ஏன்;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House -

(i) whether a policy decision has been taken to reduce the opportunities that existed for the Sri Lankan students to study for external degree courses;

(ii) separately, the number of male and female students who have been approved to be enrolled for the external degree courses in 2016;

(iii) separately, the number of students who passed the GCE(A/L) and got qualified for the university entrance in 2014, 2015 and 2016 and the number of students who were admitted to universities;

(iv) separately, the number of students who are studying in foreign universities that are functioning in Sri Lanka in 2014, 2015 and 2016 in respect of each year separately;

(v) the degree courses followed by the students mentioned in above (iv) separately;

(vi) the number of students who follow each of the aforesaid degree courses separately; and

(vii) if answers are not given for the above (v) and (vi) the reason for that?

(b) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) බාහිර උපාධි පාඨමාලාවන් සඳහා සිසුන් තෝරා ගැනීම, ඉගෙනුම් හා ඇගයීම් ක්‍රමවේදය පාඨමාලාවන්හි ගුණාත්මකභාවය හා අදාළත්වය යනාදිය දුර්වල මට්ටමක පවතින බවට පැන නැඟුණු විවේචන හේතුවෙන් බාහිර උපාධි ක්ෂේත්‍රය විධිමත් කිරීමට සහ නව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට කරන ලද අධ්‍යයනයේ නිර්දේශ අනුව බාහිර උපාධි පාඨමාලාවන් සඳහා බඳවා ගනු ලබන උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව අභ්‍යන්තරව බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව නොඉක්මවිය යුතු බවට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත.

(ii) ඇමුණුම 01* යටතේ දක්වා ඇත.

(iii) ඇමුණුම 02* යටතේ දක්වා ඇත.

(iv) එම ආයතන විශ්වවිද්‍යාල පනතින් ආවරණය නොවේ. ඒ අනුව අදාළ තොරතුරු මෙම අමාත්‍යාංශයට වාර්තා නොවේ.

(v) ඉහත (iv) අනුව අදාළ නොවේ.

(vi) ඉහත (iv) අනුව අදාළ නොවේ.

(vii) විදේශ විශ්වවිද්‍යාල පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල පනත මඟින් නෛතික ප්‍රතිපාදන සැලසී නොමැති හෙයින් මේ පිළිබඳ විස්තර මෙම අමාත්‍යාංශය සතුව නැත.

(ආ) පැන නොනඟී.

ඇමුණුම 01

2016 වසරේ බාහිර උපාධි පාඨමාලා සඳහා බඳවා ගැනීම

උපාධි පාඨමාලාව / විශ්වවිද්‍යාලය	කලා		කළමනාකරණය		වාණිජ්‍ය		කෘෂිකර්මය		විද්‍යාව		තොරතුරු තාක්ෂණය	
	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි
කොළඹ විශ්වවිද්‍යාලය	-	-	-	-	-	-	-	-	26	65	-	-
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	768	259	48	56	-	-	-	-	-	-	-	-
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	1408	413	1311	896	751	287	-	-	-	-	-	-
මොරටුව විශ්වවිද්‍යාලය	-	-	-	-	-	-	-	-	-	-	128	152
රජරට විශ්වවිද්‍යාලය	-	-	407	274	-	-	-	-	27	20	-	-
වයඹ විශ්වවිද්‍යාලය	-	-	-	-	-	-	33	88	-	-	-	-
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය	-	-	-	-	-	-	-	-	-	-	962	1225
එකතුව	2176	672	1766	1226	751	287	33	88	53	85	1090	1377

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

ඇමුණුම 02

එක් එක් වර්ෂයන්හි විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ විශ්වවිද්‍යාල සඳහා බඳවා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව

උසස් පෙළ වර්ෂය	විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව	විශ්වවිද්‍යාල සඳහා බඳවාගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව
2013	143,740	25,200
2014	149,572	25,676
2015	155,550	29,055

ගරු කථානායකතුමනි, එතුමා ප්‍රශ්නයක් අහලා තිබෙනවා. ඒ ප්‍රශ්නයට පිළිතුර රට දැන ගන්න ඕනෑ. බාහිර උපාධි පාඨමාලාවන් සඳහා බඳවා ගනු ලබන උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව දැන් අපි දෙගුණයක් කරනවා. අපි ගත් තීරණයක් තමයි අභ්‍යන්තර ශිෂ්‍යයන්ගේ ප්‍රමාණයටම බාහිර ශිෂ්‍යයනුත් බඳවා ගන්න කියන එක. දැන් අපි බාහිර ශිෂ්‍යයන් දෙගුණයක් කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නය ඇහුවේ නැහැ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය ඇහුවා. ප්‍රශ්නය ඇහුවා නේ.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මම ප්‍රශ්නය ඇහුවා. [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා ඒ අවස්ථාව ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාට දුන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. එතුමාට ප්‍රශ්නය අහන්න අවස්ථාව දුන්නා. පිළිතුර සභාගත කළා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සභාගත කළා. පිළිතුර කියෙව්වේ නැහැ නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ, මම කැමැත්තෙන් මේ පිළිතුර කියවන්නේ. මම මේක කියවන්නේ කැමැත්තෙන්. මේක රට දැන ගන්න ඕනෑ දෙයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක පිළිතුරට අමතරව කරන පැහැදිලි කිරීමක්. [බාධා කිරීමක්] මොකක්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේක රටට බලපාන ප්‍රශ්නයක්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
රටට බලපාන ප්‍රශ්නයක් තමයි. නමුත් මම කියන්නේ මේ කාරණයයි. දෙවන වටයේ වුවත් මේ පිළිතුර ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. හැබැයි, මේ අවස්ථාව අනෙක් මන්ත්‍රීවරුන්ටත් ලබා දෙන්න ඕනෑ. බිමල් රත්නායක මන්ත්‍රීතුමා පොඩි වෙලාවක් ඔබතුමාගෙන් ඉල්ලා සිටියා. ඔබතුමා දෙන්න බැහැයි කිව්වා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට ඒක කරන්න අමාරුයි. මීට කලිනුත් මට ප්‍රශ්න ඇති වුණා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හැබැයි, දෙවැනි වටයේ - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙමනම්, හැම කෙනෙකුටම අවස්ථාව දෙන්න වෙනවා නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සමහර පිළිතුරු කියවන්නත්, සමහර පිළිතුරු සභාගත කරන්නත් ඔබතුමා ලබා දෙන තීරණය මොකක්ද? [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මෙතුමා කරන්නේ පැහැදිලි කිරීමක්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
පිළිතුරු ලබා දෙන්න එපා කියලායි ගරු මන්ත්‍රීතුමා කියන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක මගේ ප්‍රශ්නයක් නොවෙයි. මට චෝදනා කරන්න එපා. ගරු ඇමතිතුමා පිළිතුරු දෙන කොට පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍ය බව කිව්වා. [බාධා කිරීම්]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒක ඇමතිතුමාට ඕනෑ නම් කරයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම පැහැදිලි කරන්න කියලා මම කිව්වේ නැහැ. [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක වැරැදියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට දෝෂාරෝපණය කරන්න එපා. ඒක වැරැදියි. සමහර අවස්ථාවලදී ඔබතුමන්ලාටත් එහෙම ඉඩ ලබා දීලා තිබෙනවා. මේ ගැන මෙතුමා මගෙන් අවසර ඉල්ලුවා. එතකොට අනෙක් අයත් එහෙම අවසර ඉල්ලුවොත් ඒ හැම කෙනෙකුටම මට ඉඩ දෙන්න වෙනවා. ඒක නීතිවිරෝධීයි. මෙතුමා ඒ පිළිතුරට අමතරව පැහැදිලි කිරීමක් කරන්නේ. [බාධා කිරීම්] පැහැදිලි කරන්නයි එහෙම කරන්නේ. [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම කියන්නේ, ඊට පෙර සභාවේදී පිළිතුරක් ලබා දී තිබියදී නැවත පිළිතුරක් ලබා දෙන්න අවස්ථාවක් දෙන්න බැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම දන්නේ නැහැ මේ ප්‍රශ්නය මොකක්ද කියලා. එය පැහැදිලි කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, උත්තර ලබාදීම ඇමතිවරයාගේ අභිමතය. [බාධා කිරීමක්] මම සිය කැමැත්තෙන්,- [බාධා කිරීමක්]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපට එහෙම කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ වේලාව පිළිබඳ ප්‍රශ්නය නිසායි. අපට තිබුණු අයිතියක් අපි නැති කර ගෙන තිබෙන්නේ වේලාව පිළිබඳ ප්‍රශ්නයක් නිසායි. ඔබතුමා කැමැත්තෙන් උත්තර දුන්නත් වේලාව තමයි යන්නේ. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා කියන්නේ උත්තර දෙන්න එපා කියලාද? [බාධා කිරීම්]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම කියන්නේ නැහැ, උත්තර දෙන්න එපා කියලා. [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
උත්තර දෙන්න. ඒ වාගේම අපටත් අවස්ථාව ලබා දෙන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ වග කීම බව සඳහන් වෙනවා,- [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙමනම් ඔක්කෝටම දෙන්න වෙනවා නේ. ඒක මට දෙන්න බැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැන් දෙනවා නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. දෙන්නේ නැහැ. එතුමා පිළිතුර සභාගත කරලා, පැහැදිලි කිරීමක් පමණයි කරන්නේ. ඒක විතරයි කරන්නේ. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, බාහිර,- [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේ සභාවේම ප්‍රශ්නයකට පිළිතුරක් ලබා දී තිබියදී, නැවත අහලා, නැවත උත්තර දෙනවා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒක පිළිගන්නේ නැහැ. [බාධා කිරීමක්] පොඩ්ඩක් මට කථා කරන්න අවස්ථාව දෙන්න. ප්‍රශ්න දෙකක් ඇහුවා. [බාධා කිරීමක්] ඒක ඔබතුමාගේ තීරණයක්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා නැවත අවස්ථාව දුන්නා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැවත අවස්ථාව දුන්නේ නැහැ. මෙතුමා ප්‍රශ්නය ඇහුවා. උත්තරය table කළා. Table කරලා තව පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි කිව්වා. [බාධා කිරීමක්]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
සමහර මන්ත්‍රීවරු නැඟිට්ටාම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඒකයි ඇත්ත.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාටද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි ඔබතුමාට ඉතාම ගරුත්වයෙන් කථා කරනවා. නමුත්, සමහර මන්ත්‍රීවරු ඉන්නවා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක ඔබතුමා ඉල්ලා අස්කර ගන්න. ඒ කථාව ඔබතුමා ඉල්ලා අස් කර ගන්න; withdraw කර ගන්න. ඒක වැරදියි. ඔබතුමන්ලා වැදගත් පක්ෂයක පිරිසක්. එහෙම කරන්න විධියක් නැහැ නේ. [බාධා කිරීමක්] සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
බාහිර ශිෂ්‍යයන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණ කිහිප වතාවක් මේ පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කළා. ඒකයි මම මේ පැහැදිලි කිරීම කළේ. [බාධා කිරීමක්]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
උත්තර දුන්නාමත් වැරැදියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
උත්තර දුන්නාමත් වැරැදියි. [බාධා කිරීමක්] මේක පුදුම පාර්ලිමේන්තුවක්.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු කථානායකතුමනි, වෙලාව අපරාදේ.

ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව: විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම
உயிர் முறைமை தொழில்நுட்பவியல் பாடப் பிரிவு: பல்கலைக்கழகத்துக்கு மாணவர் அனுமதி
STREAM OF BIO SYSTEMS TECHNOLOGY: ADMISSION OF STUDENTS TO UNIVERSITIES

1360/'16

8. ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව හදාරා, 2015 වර්ෂයේදී ප්‍රථම වරට අ.පො.ස (උ/පෙළ) විභාගයට පෙනී සිට, ඉන් ඉතා උසස් ප්‍රතිඵල ලබා සිටින රත්නපුර දිස්ත්‍රික්කයේ ශිෂ්‍යයන් මේ දක්වා කිසිදු විශ්වවිද්‍යාලයකට ඇතුළත් කරගෙන නොමැති බවත්;

(ii) ඉහත ශිෂ්‍යයන්ට ලබාදුන් විශ්වවිද්‍යාල අත්පොතෙහි එම විෂයට අදාළ උපාධි පාඨමාලාව සඳහා සබරගමුව විශ්වවිද්‍යාලය ඇතුළත් කර තිබුණද, එම විශ්ව විද්‍යාලයටද මේ දක්වා කිසිදු ශිෂ්‍යයෙකු ඇතුළත් කරගෙන නොමැති බවත්;

(iii) මෙම ශිෂ්‍යයන්ට ලැබී ඇති තොරතුරු අනුව කොළඹ වැනි පහසුකම් සහිත දිස්ත්‍රික්කවලින් අඩු Z අගයක් යටතේ සිසුන් 80 - 90 වැනි සංඛ්‍යාවකට විශ්වවිද්‍යාල වරම් හිමි වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මෙම ශිෂ්‍යයන්ට සිදුවී ඇති අසාධාරණය පිළිබඳව ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යවරයා, අමාත්‍යවරයාට සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවටද අභියාචනා ඉදිරිපත් කළද මේ වනතෙක් කිසිදු සාධාරණයක් ඉටු වී නොමැති බව පිළිගන්නේද;

(ii) අ (i) හි සඳහන් ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உயிர் முறைமை தொழில்நுட்பவியல் பாடப் பிரிவில் கல்வி பயின்று, 2015ஆம் ஆண்டு முதற் தடவையாக க.பொ.த. (உ/த) பரீட்சைக்குத் தோற்றி, அதில் உயர்மட்ட பெறுபேறுகளைப் பெற்றுள்ள இரத்தினபுரி மாவட்ட மாணவர்கள் இதுவரை எந்தவொரு பல்கலைக்கழகத்திற்கும் அனுமதிக்கப்படவில்லை என்பதையும்;

(ii) மேற்படி மாணவர்களுக்கு வழங்கப்பட்ட பல்கலைக்கழக கைநூலில் மேற்படி பாடம் தொடர்பான பட்டப் பாடநெறிக்கு சப்ரகமுவ பல்கலைக்கழகம் உள்ளடக்கப்பட்டிருந்தபோதிலும், மேற்படி பல்கலைக்கழகத்திற்கு இதுவரை எந்தவொரு மாணவரும் அனுமதிக்கப்படவில்லை என்பதையும்;

(iii) மேற்படி மாணவர்களுக்கு கிடைத்துள்ள தகவல்களின்படி கொழும்பு போன்ற வசதிகள் மிக்க மாவட்டங்களிலிருந்து குறைந்த Z புள்ளியின் கீழ் மாணவர்கள் 80 - 90 பேருக்கு பல்கலைக்கழக அனுமதி கிடைத்துள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி மாணவர்களுக்கு ஏற்பட்டுள்ள அநீதி தொடர்பாக ஜனாதிபதி, பிரதம அமைச்சர், அமைச்சர் மற்றும் பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழுவுக்கும் மேன்முறையீடுகள் சமர்ப்பிக்கப்பட்டுள்ளபோதிலும் இதுவரை எவ்வித நீதியும் நிறைவேற்றப்படவில்லை என்பதை அவர் ஏற்றுக்கொள்வாரா;

(ii) மேலே (அ)(i) இல் குறிப்பிடப்பட்டுள்ள மாணவர்களை பல்கலைக்கழகங்களுக்கு அனுமதிப்பதற்குத் தேவையான நடவடிக்கைகளை மேற்கொள்வாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Is he aware that -

(i) the students of the District of Ratnapura who have studied in the stream of Bio Systems Technology and have obtained excellent results at the first shy sat for the G.C.E (A/L) Examination in the year 2015 have not hither to been admitted to any university;

(ii) although the University of Sabaragamuwa has been included in the university admission handbook provided to these children as the university from where the degree course relevant to the said stream can be followed, no student has been so far admitted to the said university as well; and

(iii) as per the information received by these students, around 80-90 students with lower Z-scores from districts with more facilities such as Colombo have got the opportunity to enter universities?

(b) Will he inform this House -

(i) whether it is admitted that no justice has been meted out although appeals have been sent to the President, Prime Minister, Minister and the University Grants Commission regarding this unfair situation faced by these students up to now;

(ii) whether the necessary steps will be taken to admit the students mentioned in a (i) above to universities?

(c) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I **table*** the Answer to Question No. 8.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) Forty five students from Ratnapura District have been admitted under the stream of Bio Systems Technology for the academic year 2015/2016.

(ii) Students were not admitted to the Sabaragamuwa University under the Technology Stream for the Academic Year 2015/2016 due to the issues regarding the facilities that should be provided when admitting students, and facilities required for the continuance of the course. The number of students proposed to be admitted to the Sabaragamuwa University had been admitted to other universities which conduct those courses.

(iii) Since students are admitted to the courses on all-island merit basis and on district merit basis proportionately to the population, the intake from each district differs.

Accordingly, when compare population in Colombo and Ratnapura Districts, the population in Colombo District is a greater number; therefore, 82 students have been selected from Colombo District under the stream Bio Systems Technology.

(b) (i) No unfairness has occurred as per with the existing legalized admissions policy for admitting students for universities.

(ii) In accordance with the Answer (a) (i) above, it would be clarified that there is not any possibility to fulfill this request.

(c) Does not arise.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු ඇමතිතුමනි, ඒකට මට කෙටියෙන් කිව්වොත් -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිළිතුර සභාගත කරන්න. මෙතැන අනවශ්‍ය ප්‍රශ්න ඇති කරගන්න එපා. [බාධා කිරීම්] මා මෙතුමාට කිව්වා, ඒක කරන්න බැහැයි කියලා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මා කියන්නේ ඔබතුමාට තිබෙන රීතින් අනුව වැඩ කරන්න කියලායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
රීතිය අනුව තමයි වැඩ කළේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
තව මන්ත්‍රී කණ්ඩායමකට වෙනත් විධියකට සලකනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක වැරැදියි. ඔබතුමා පක්ෂ නායකයෙක්. ඔබතුමා කියන එක වැරැදියි. මා අවස්ථාව දුන්නා. එතුමා table කළා. අදාළ අමාත්‍යවරයා කිව්වා, තව පැහැදිලි කිරීමක් ඕනෑය කියලා. ඒක ඔබතුමාගේ මතය. මේක මෙතැනින් අවසානයි. මීට පස්සේ මේ ගැන කථා කරන්නේ නැහැ. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට පිළිතුර මා සභාගත කළා. ඊට පස්සේ පැහැදිලි කිරීමක් කළේ. ජනතා විමුක්ති පෙරමුණ කිහිප වතාවක් බාහිර ශිෂ්‍යයින් බඳවා ගැනීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ප්‍රශ්න අහලා තිබෙනවා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -1388/'16 - (2), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු බන්දුල ගුණවර්ධන මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

සේවක අර්ථ සාධක අරමුදල: සක්‍රීය ගිණුම්
ஊழியர் சேமலாப நிதியம்: இயங்கும் கணக்குகள்
EMPLOYEES' PROVIDENT FUND: ACTIVE ACCOUNTS

1506/'17

10.ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2016.12.31 දිනට සේවක අර්ථසාධක අරමුදලේ සක්‍රීය ගිණුම් සංඛ්‍යාව අනුව පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය කොපමණද;

(ii) 2014.12.31 සහ 2015.12.31 දිනයන්ට සාපේක්ෂව, 2016.12.31 දිනට සේවා නියුක්තිය ඉහළ යෑම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

தொழில், தொழிற்சங்க உறவுகள் மற்றும் சப்பிரகமுவ அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016.12.31ஆம் திகதியில் ஊழியர் சேமலாப நிதியத்தின் இயங்கும் கணக்குகளின் எண்ணிக்கைக்கமைய தனியார் துறையில் தொழில் புரிவோர் எத்தனை பேர்?;

(ii) 2014.12.31 மற்றும் 2015.12.31ஆம் திகதிகளுக்கு ஒப்பீட்டளவில் 2016.12.31ஆந் திகதியிலான தொழில் புரிவோரின் அதிகரிப்பு எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Labour, Trade Union Relations and Sabaragamu Development:

(a) Will he inform this House -

(i) the private sector employment in terms of the number of active accounts of Employees' Provident Fund as at 31.12.2016;

(ii) the increase of employment as at 31. 12. 2016 relatively to 31. 12. 2014 and 31.12 .2015?

(b) If not, why?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිළිතුර සභාගත කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කම්කරු, වෘත්තීය සමිති සබඳතා සබරගමු සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2016.12.31 දිනට සේවක අර්ථසාධක අරමුදලේ සක්‍රිය සාමාජික ගිණුම් සංඛ්‍යාව - 2,609,668

2016.12.31 දිනට සේවක අර්ථසාධක අරමුදලේ සක්‍රිය සේවායෝජක ගිණුම් සංඛ්‍යාව - 73,482

(ii)

	2014.12.31 දිනට	2015.12.31 දිනට	2016.12.31 දිනට
සක්‍රිය සාමාජික ගිණුම් සංඛ්‍යාව	2,448,051	2,569,069	2,609,668
සක්‍රිය සේවායෝජක ගිණුම්	69,683	72,578	73,482

2014 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ සක්‍රිය සාමාජික ගිණුම් වැඩිවීමේ ප්‍රතිශතය - සියයට 6.6

2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ සක්‍රිය සාමාජික ගිණුම් වැඩිවීමේ ප්‍රතිශතය - සියයට 1.58

(ආ) පැන නොනඟී.

කුඩා වාරිමාර්ග සංවර්ධනය : ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
சிறியளவிலான நீர்ப்பாசன அபிவிருத்தி :திருகோணமலை மாவட்டம்
DEVELOPMENT OF SMALL IRRIGATION TANKS: TRINCOMALEE DISTRICT

1548/'17

11.ගරු මුජිබුර් රහුමාන් මහතා (ගරු ඉම්රාන් මහරූෆ් මහතා වෙනුවට)
(மாண்புமிகு முஜிபுர் ரஹுமான் - மாண்புமிகு இம்ரான் மஹ்ரூப் சார்பாக)
(The Hon. Mujibur Rahuman on behalf of the Hon. Imran Maharoof)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2012, 2013 සහ 2014 වර්ෂවලදී කුඩා වාරිමාර්ග සංවර්ධනය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට වෙන් කරන ලද ප්‍රතිපාදන, එක් එක් ගොවිජන සේවා කොට්ඨාසය සහ වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රතිපාදන යොදා ගනිමින් සංවර්ධනය කරන ලද වැව් සහ ඒ සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

(ආ) (i) මෙම සංවර්ධන කටයුතු හේතුවෙන් වී අස්වැන්නෙහි ඉහළ යෑමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

(iii) වැය කරන ලද ප්‍රතිපාදනවලට අනුව මෙම නිෂ්පාදන ඉහළ යෑම ප්‍රමාණවත් වන්නේද;

(iv) නො එසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) උක්ත වර්ෂයන්හිදී දියත් කරන ලද වැඩසටහන් නිවැරදි ආකාරයෙන් සිදු නොවූ බවට ගොවීන් විසින් චෝදනා නඟන බැවින්, මෙම සංවර්ධන කටයුතු පිළිබඳව පසු විපරම් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම විස්තර කවරේද;

(iii) නො එසේ නම්, මෙම සංවර්ධන කටයුතු පිළිබඳව පසු විපරම් කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2012, 2013 மற்றும் 2014ஆம் ஆண்டுகளில் சிறியளவிலான நீர்ப்பாசன அபிவிருத்திக்காக திருகோணமலை மாவட்டத்துக்கு ஒதுக்கப்பட்ட நிதி ஏற்பாடுகள், ஒவ்வொரு கமநல சேவைப் பிரிவு மற்றும் ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு;

(ii) அந்நிதி ஏற்பாடுகளைப் பயன்படுத்தி அபிவிருத்தி செய்யப்பட்ட குளங்கள் மற்றும் அதற்காக செலவு செய்யப்பட்ட பணத்தொகை வெவ்வேறாக எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு சமர்ப்பிப்பாரா?

(ஆ) (i) மேற்படி அபிவிருத்தியின் காரணமாக நெல் விளைச்சலில் அதிகரிப்பு ஏற்பட்டுள்ளதா;

(ii) ஆமெனில், அதன் அளவு எவ்வளவு;

(iii) செலவு செய்யப்பட்ட நிதி ஏற்பாடுகளுக்கமைய, இவ்வுற்பத்தி அதிகரிப்பு போதியதாகக் காணப்படுகின்றதா;

(iv) இன்றேல், அதற்கான காரணங்கள் யாவை;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) குறிப்பிட்ட வருடங்களில் ஆரம்பிக்கப்பட்ட வேலைத்திட்டங்கள் சரியான முறையில் நடைபெறவில்லை என விவசாயிகள் குற்றஞ்சாட்டுவதால், இவ்வபிவிருத்தி வேலைகள் தொடர்பாக பின்னாய்வு செய்யப்பட்டுள்ளதா;

(ii) ஆமெனில், அதன் விபரங்கள் யாவை;

(iii) இன்றேல், இவ்வபிவிருத்தி வேலைகள் தொடர்பாக பின்னாய்வு செய்வதற்கு நடவடிக்கை மேற்கொள்வாரா;

என்பதை மேலும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he submit to this House -

(i) the financial allocations made for the Trincomalee District for developing small irrigation tanks in 2012, 2013 and 2014, in relation to each Agrarian Service division and year separately; and

(ii) the tanks developed by utilizing those allocations and the amount of money spent on them, separately?

(b) Will he inform this House -

(i) whether there has been an increase in the paddy harvest owing to these development activities;

(ii) if so, the volume of increase;

(iii) whether this increase is commensurate with the financial allocations spent; and

(iv) if not, the reasons for that?

(c) Will he also inform this House -

(i) whether any follow up has been made on those development activities as the farmers complain that the programmes that were carried out during the above years have not been done in the proper manner;

(ii) if so, the details of such follow up; and

(iii) if not, whether steps will be taken to follow up on these development activities?

(d) If not, why?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පිළිතුර සභාගත කරන්න. [බාධා කිරීම්] You cannot have different rules. I did not allow Hon. Bimal Rathnayake. ඒ වාගේ තවත් දුන්නාම අනවශ්‍ය චෝදනා මටයි එන්නේ. [බාධා කිරීම්] පිළිතුර සභාගත කරන්න. මා කාටවත් ඉඩ දුන්නේ නැහැ. උදේ මා එතුමාට කිව්වා, එක් කෙනකුට ඉඩ දුන්නොත් සියලු දෙනාටම ඉඩ දෙන්න වනවාය කියලා. මෙහිදී සිද්ධ වුණේ මොකක්ද? පළමුවෙන් ඇසූ ප්‍රශ්නයට පිළිතුර ඔබතුමා සභාගත කළා. දෙවන පිළිතුරත් ඔබතුමා සභාගත කරලා, මගෙන් අවසර ඉල්ලුවා, intake එක double කළාය කියලා පැහැදිලි කිරීමක් කරන්න. එපමණයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

පැහැදිලි කිරීමක් කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒකට නේ විරුද්ධත්වය ප්‍රකාශ කළේ. [බාධා කිරීම්] ඔව්, ඒක හරි. දැන් මේ පිළිතුර සභාගත කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පැහැදිලි කිරීමක් ඉල්ලනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මෙහෙම කළොත් පාර්ලිමේන්තුව ගෙන යන්න බැරි වෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඇත්තම කියනවා නම් දැන් පැහැදිලි කිරීමක් කළොත් මුළු system එකම ආපසු වෙනස් කරන්න වෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අපි කියන්නේ ඔබතුමාගේ එකඟත්වය ඇතිව -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉතාම අසාධාරණ චෝදනාවක් කළේ. ඒකට මට කමක් නැහැ. මා කාටවත් භය වෙන්න ඕනෑකමකුත් නැහැ. [බාධා කිරීම්]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

අනු අංකය	ගො.සේ.ම	2012		2013		2014		වැඩිමනත් කරුණු
		ප්‍රතිපාදන	වියදම	ප්‍රතිපාදන	වියදම	ප්‍රතිපාදන	වියදම	
1	කුච්චවෙලි		1,916,264.00				9,853,703.48	
2	නිලාවේලි		5,734,864.51		14,226,351.41		6,431,227.27	
3	පුල්මුඩේ		2,941,319.00				1,881,878.00	
4	උප්පුවෙලි		972,912.00		355,692.63		32,852,575.00	
5	සාම්බල්තිවු				397,380.00		3,592,988.66	
6	කින්නියා		3397693.69		464,414.74		10,504,050.30	
7	කුරුන්වංකේනි						7,720,767.80	
8	මූතූර්		353280.82		1,657,190.00			
9	සාම්පූර්		7389458.20		97,900.00		1,960,000.00	
10	තෝප්පූර්		1982013.10		3,030,225.50		11,070,372.26	
11	කිලිවෙට්ටි		766071.00				1,382,348.00	
12	මුත්නම්පොඩිවෙට්ටි	41,628,057.58		62,798,991.71		452,278,828.07		මහා ධාරි මාර්ග
13	සේරුනුවර						18,741,916.48	
14	රීච්චලන්පත්තු						7,496,425.45	
15	තඹලගමුව				200,000.00		13,752,950.59	
16	මොල්ලිපොතාන						52,356,792.49	2014/ 2015
17	කන්තලේ				200,000.00		12,458,741.12	
18	වාන්ඇල		4,108,159.52				24,111,398.47	
19	අග්බෝපුර		2,650,706.85		2,548,593.20		18,223,503.03	
20	පදවිශ්‍රීපුර						30,445,577.20	
21	ගෝමරන්කඩවල		5,205,843.80		21,466,539.18		44,108,949.03	
22	මොරවැව		1,605,739.80		11,885,691.80		38,755,845.48	
	එකතුව	41,628,057.58	39,024,326.29	62,798,991.71	56,529,978.46	452,278,828.07	347,702,010.11	

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

දිස්ත්‍රික්ක වෙත ප්‍රතිපාදන වෙන් කිරීමේදී ඉදිරිපත්ව ඇති ප්‍රතිසංස්කරණ යෝජනා අනුව වර්ෂය තුළ දිස්ත්‍රික්කය සඳහා වෙන් කරන ලද සමස්ත ප්‍රතිපාදන ප්‍රමාණ එක් එක් මධ්‍යස්ථාන මට්ටමින් ප්‍රමුඛතාව අනුව හඳුනාගත් කර්මාන්ත සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම කරනු ලැබේ. එම ප්‍රතිපාදන ප්‍රාදේශීය සංවර්ධන කමිටු හා දිස්ත්‍රික් සංවර්ධන කමිටු තීරණ මත පවතින අවශ්‍යතාව අනුව එක් එක් ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත වෙන් කර ඇති අතර දිස්ත්‍රික්කය වෙත ලබා දී ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය නොඉක්මවන පරිදි අදාළ වර්ෂය තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කොට වියදම් දරා ඇත.

(ii) ඔව්. විස්තර ඇතුළත් ලේඛනයෙහි දැක්වේ.

(ආ) (i) සිදු වී ඇත.

(ii) වගා කළ භූමි ප්‍රමාණය හෙක්ටයාර්වලින් දක්වා ඇත.

අවුරුද්ද	2011	2012	2013	2014	2015	2016
මහ	4,615	5,622	7,464	3,632	7,186	8,636
යල	2,010	1,373	4,861	-	3,821	3,985
එකතුව	6,625	6,995	12,325	3,632	11,007	12,621

2014 / 2015 මහ කන්නයේදී වැසි අධික වීම හේතුකොටගෙන ඇති වූ ගංවතුර තත්ත්වය නිසා මහ කන්නයේදී වගාකළ කුඹුරු ඉඩම් බොහොමයක් හානියට පත් විය. 2014 මහ කන්නයේ වගා කළ භූමි ප්‍රමාණයේ පහළ යෑමට එම හේතුව එය වේ.

2013 / 2014 මහ කන්නය සහ 2014 යල කන්නය තුළදී වැසි නොලැබීම නිසාවෙන් පැවති නියං කාලගුණික තත්ත්වය නිසා යල කන්නයේදී වගා කළ කුඹුරු ඉඩම් හානියට පත් විය. 2014 වර්ෂයේ යල කන්නයේ වගා භූමි ප්‍රමාණය ශූන්‍ය අගයක් ගැනීමට හේතුව එය වේ.

(iii) ප්‍රමාණවත් වේ.

(iv) අදාළ නොවේ.

(ඇ) (i) ඉහත සඳහන් සියලු සංවර්ධන ව්‍යාපෘති ගොවි සංවිධාන හරහා සිදු කරන ලදී. ඒ අනුව අප අමාත්‍යාංශය වෙත හෝ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය වෙත හෝ දිස්ත්‍රික් කාර්යාල වෙත මෙතෙක් කිසිදු පැමිණිල්ලක් හෝ චෝදනාවක් ඉදිරිපත් කර නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 14 -1675/'17- (2), ගරු සෙය්යිඩ් අලි සාහිර් මවුලානා මහතා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, ගරු සෙය්යිඩ් අලි සාහිර් මවුලානා මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I move,

"That the proceedings on Item No. 1 of Public Business appearing on the Order Paper be exempted at this day's sitting from the provisions of the Standing Order No. 7 of the Parliament and the motions agreed to by Parliament on 08.03.2016 and 06.09.2017."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ නියෝගය පරිදි පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට මා ඇතුළු ඒකාබද්ධ විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විසින් අද දින දෙවැනි වර කියැවීමට නියමිත මේ පනත් කෙටුම්පතට සංශෝධන 33ක් ඉදිරිපත් කළා. ඒ, දැනට සතියකට කලින් මේ පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමට නියමිතව තිබුණු අවස්ථාවේදී.

එයට පිළිතුරක් වශයෙන් අපට මෙසේ දන්වා එවනවා:

"උක්ත පනත් කෙටුම්පතට අදාළව ඔබතුමා විසින් ගරු කථානායකතුමාට භාර දෙන ලද සංශෝධන අතුරින් පහත සඳහන් වගන්තිවලට හා උපලේඛනවලට අදාළ සංශෝධන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 ව්‍යවස්ථාව සමඟ කිය විය යුතු පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 133 ප්‍රකාරව කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට අවකාශ නොමැති බව ගරු කථානායකතුමාගේ උපදෙස් පරිදි කාරුණිකව දන්වා සිටිමි.

1. 9වන වගන්තිය
2. 2වන වගන්තිය
3. තුන්වන උපලේඛනයට අදාළ සංශෝධන"

[බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, මම වැඩිපුර වෙලාව ගන්නේ නැහැ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 ව්‍යවස්ථාව ගත්තොත් එහි තිබෙන්නේ ඒකාබද්ධ අරමුදල හෝ එයට සම්බන්ධ කටයුත්තක් ගැන පනත් කෙටුම්පතක් හෝ යෝජනාවක් ඉදිරිපත් කිරීම කළ හැක්කේ ඇමතිතුමාට පමණයි කියලායි. ඒ ගැන කිසිම වාදයක් නැහැ. ඇමතිතුමා අලුත්ම පනත් කෙටුම්පතක් ගේනවා. මේ අලුත්ම පනත් කෙටුම්පත තවම සම්මත වෙලා නැහැ. එම නිසා මේක වලංගු වෙලා නැහැ. එම නිසා තමයි අපි මේ පනත් කෙටුම්පත දෙවැනි වර කියැවීමේ කාරක සහා අවස්ථාවේදී

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සංශෝධන 33ක් ඉදිරිපත් කරන්න ඉල්ලීමක් කළේ. You referred to Standing Order No. 133. මම එය කියවන්න යන්නේ නැහැ. එහි හරයත්, මා කියන කාරණයත් එකයි. හරය, ඇමතිවරයෙකුට පමණයි මේ වාගේ Consolidated Fund එකට හෝ ඒ හා සම්බන්ධ බදු පිළිබඳ පනත් කෙටුම්පත් ගේන්න හෝ ඉවත් කිරීමට පුළුවන්. ඒක ඇත්ත. ඒ ගැන කිසි වාදයක් නැහැ. නමුත්, අලුතෙන් සම්මත කරන්න හදන මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අපි ගරු ඇමතිතුමාවත් හම්බ වෙලා බොහොම සුහදව සාකච්ඡා කළා. මේ ඉදිරිපත් කරන පනත් කෙටුම්පතට කාරක සභා අවස්ථාවේදී මන්ත්‍රීවරු හැටියට සංශෝධන ඉදිරිපත් කරන්න අපට තිබෙන අයිතිය හිටපු පාර්ලිමේන්තු මහ ලේකම්තුමිය වන ප්‍රියානි විජේසේකර විසින් ප්‍රකාශිත "ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ක්‍රියාදාමය" කියන පොතේ සඳහන් වනවා. ගරු කථානායකතුමනි, මෙහි 56වෙනි පිටුව මා ඔබතුමාගේ අවධානය පිණිස ගේනවා. මේක අපට කරන්න පුළුවන්. අපට මෙහෙම තහනමක් නැහැ. තහනම තිබෙන්නේ නීත්‍යානුකූල වුණාට පස්සේ. පනත් කෙටුම්පතක් හෝ සංශෝධනයක් ඉදිරිපත් කිරීමේ අයිතිය තිබෙන්නේ ඇමතිවරයෙකුට පමණයි.

එහෙම පනත් කෙටුම්පතක් තවම සම්මත වෙලා නැහැ, ගරු කථානායකතුමනි. එම නිසා මේ කරුණු ඉදිරිපත් කරන්නට අපට අවස්ථාව දෙන්නය කියා ඔබතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ආණ්ඩුව පිළිගන්නවා නම් පිළිගනීවි. මොකද, මෙය ඉතාමත් වැදගත් පනත් කෙටුම්පතක්. රටේ ජනතාවගේ හා රටේ ආදායමේ සහ මුළු රජයකම - භාණ්ඩාගාරයේම අලුත් ආදායම පිළිබඳ පනත් කෙටුම්පතක්. එවැනි පනත් කෙටුම්පතකට මන්ත්‍රීවරුන් වන අපට සංශෝධනයක් ඉදිරිපත් කරන්නට බැරි නම්; එය මම හිතන්නේ නැහැ මේ වගන්තියට එකඟයි කියා.

අපි තව ඉල්ලීමක් කරනවා, ගරු කථානායකතුමනි. You should re-canvass what I am submitting. The House can agree to allow us to proceed. If you are going to make a Ruling in the first instance, we request that the House allows the Amendments to be taken up.

අපිට ඡන්දයක් දෙන්න බැරි නම් ගරු ඇමතිතුමා ඡන්දය නොදී ඉන්න; ප්‍රතික්ෂේප කරන්න. නමුත් මන්ත්‍රීවරුන්ට සංශෝධනය submit කරන්න, සංශෝධන ගෙන එන්නටවත් අවස්ථාව දෙන්න. මොකක්ද මේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පැමිණෙන තැන?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග අනුව, -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Hon. Speaker-[*Interruption.*]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Let me speak. I allowed you to speak. Now, allow me to speak. Learn your manners. -[*Interruption.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග අනුව කරන්න බැහැ. නමුත් ගරු සභානායකතුමනි, -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ස්ථවර නියෝග අනුව ඉතාමත් පැහැදිලියි, මුදල් පනත් කෙටුම්පතකට සංශෝධන ගෙනෙනවා නම් එම සංශෝධන කැබිනට් මණ්ඩලය අනුමත කරන්නට ඕනෑය කියන එක. We cannot work against the Standing Orders. What about the Cabinet of Ministers? අපි කැබිනට් මණ්ඩලයේ අනුමතිය නැතිව පනත් කෙටුම්පත සම්මත කළොත් කැබිනට් මණ්ඩලය අපිට දෝෂාරෝපණය කරයි. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්] මෙහි තිබෙනවා, "එවැනි යෝජනාවක් , පනත් කෙටුම්පතක් හෝ පනත් කෙටුම්පතකට කරන සංශෝධනයක් ඉදිරිපත් කිරීමට පෙර, එම ඇමතිවරයා එම යෝජනාවට හෝ පනත් කෙටුම්පතට හෝ සංශෝධනයට අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇති බව පර්ලිමේන්තුවට දැන්විය යුතුය." කියා.

ගරු මංගල සමරවීර ඇමතිතුමා ගෙන එන සංශෝධන ඊයේ කැබිනට් මණ්ඩලය අනුමත කළා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාත් සංශෝධන ගේනවා නම් ඒවා අමාත්‍ය මණ්ඩලය අනුමත කරන්නට ඕනෑ. But, it is too late now.[බාධා කිරීමක්]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බිමල් රත්නායක මහතා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, 52 වන ස්ථාවර නියෝගයේ පොදුවේ මෙහෙම සඳහන් වෙනවා:

"පනත් කෙටුම්පත් පිළිබඳ කාරක සභා අවධිය.

52. අමාත්‍ය මණ්ඩලයේ ඇමතිවරයෙකු හෝ නියෝජ්‍ය ඇමතිවරයකු හෝ විසින් ඉදිරිපත් කරන යෝජනාවක් මත පනත් කෙටුම්පතක් දෙවන වර කියවා ඇති විට එම පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට යොමු කළ යුතුය.

එතකුදු වුවත් අමාත්‍ය මණ්ඩලයේ ඇමතිවරයකු හෝ නියෝජ්‍ය ඇමතිවරයකු හෝ විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් මත එසේ තීරණය කරනු ලැබුවහොත් වාර්ෂික හෝ පරිපූරක විසර්ජන පනත් කෙටුම්පතක් හැර, පනත් කෙටුම්පතක් කථානායකතුමා විසින් නම් කරනු ලබන විශේෂ කාරක සභාවකට හෝ ස්ථාවර කාරක සභාවකට හෝ යොමු කළ හැකිය."

එතකොට ගරු කථානායකතුමනි, අපට කාරක සභා අවස්ථාවේදී ආදායම් බදු පනත් කෙටුම්පත්, මුදල් කෙටුම්පත් කියා වෙනසක් නැහැ. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මා අහන්නට කැමතියි, ගරු මන්ත්‍රීතුමා සංශෝධන කීයක් ඉදිරිපත් කරනවාද කියා - [බාධා කිරීමක්] If the Hon. Minister of Finance agrees, I have no problem.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුදල් ඇමතිතුමා.

ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)
ගරු කථානායකතුමනි, මම හිතන විධියට අපි ඒ සංශෝධනවලට ඉඩදීම පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. ඒ වෙලාවට සලකා බලා පිළිගන්නට පුළුවන් ඒවා පිළිගන්නවා. පිළිගන්න බැරි ඒවා- [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, they must cooperate. [බාධා කිරීමක්] සංශෝධන ගෙන ඒමේ මුවාවෙන් මේක කඩාකප්පල් කරන්න, කාලය දීර්ඝ කරන්න - [බාධා කිරීමක්] හරි. හරි. ඔබතුමා විතරයි දන්නේ. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මේ පනත් කෙටුම්පතේ විශේෂ බදු යෝජනාවන් ඉදිරිපත් වී තිබෙනවා. අපි සාමාන්‍යයෙන් ගත්තොත් ගරු කථානායකතුමනි, අය වැය ලේඛනයක් ඉදිරිපත් කරනවිට පවා සාමාන්‍යයෙන් සිදු වන්නේ බදු දහයක පහළොවක වාගේ වෙනසක්. හැබැයි, මේ පනත් කෙටුම්පත ගත්තාම විශාල වශයෙන් බදු සංශෝධන ගණනාවක් තිබෙනවා. ඇත්ත තත්ත්වය ගත්තොත්, අය වැය ලේඛන හත අටක අඩංගු වන බදු සංශෝධන මෙහි ඇතුළත් වෙලා තිබෙනවා. දේශීය ආදායම් පනත් කෙටුම්පතේ තිබෙන විශේෂයක් තමයි, පනත් කෙටුම්පත ඇතුළටම බදු ප්‍රතිශතයන් ඇතුළත් කිරීම. සමහර පනත් කෙටුම්පත්වලින් අමාත්‍යවරයාට බලය දෙනවා. අමාත්‍යවරයා ගැසට් නිවේදනයක් නිකුත් කරනවා.

නමුත්, මේ පනත් කෙටුම්පතේ විශේෂයක් තිබෙනවා. මේ පනත් කෙටුම්පත ඇතුළටම එම බදු සංශෝධන ඇතුළත් විය යුතුයි. එම නිසා නීතියක් තහවුරු කරනවාට අමතරව, ඒ නීතිය ක්‍රියාත්මක වන අංගත් මෙහි ඇතුළත් කර තිබෙනවා. ඒක තමයි අපට පැන නැඟෙන ප්‍රශ්නය. එම නිසායි මේ සඳහා අපටත් සංශෝධන ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න කියා ඉල්ලන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි අද සවස 4.00ට ඡන්දය තියනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද සවස එකහමාරට අපි මේ ගැන සාකච්ඡා කරමු. We can discuss it.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We will not have time. වෙලාව මදි වෙයි. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා රෑ 12.00 වන තුරු ඉන්න සූදානම්ද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මේක අපි පැමිණි එකඟතාව. ඒ සංශෝධන තිබෙනවා කියන කාරණය මත තමයි එදා එකඟතාවකට ආවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සවස 4.30ට කියායි එදා කථා කළේ. අපි 4.00ට ගනිමු. අද සවස 1.30ට අප හමු වෙනවා නේ, ගරු මන්ත්‍රීතුමනි. එතැනදී කථා කරමු. We will go ahead.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු කථානායකතුමනි, ආණ්ඩුවෙන් ඉදිරිපත් කරන සංශෝධන එකසිය ගණනක්ම තිබෙනවා. ඊට අමතරව අනික් ඒවාත් ගත්තාම පැය දෙක තුනක් සංශෝධනවලටම ගත වෙන්න පුළුවන්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභානායකතුමා මුදල් ඇමතිතුමාගෙන් පොඩ්ඩක් ඉගෙන ගන්න කෝ, කොහොමද මේවා කරන්නේ කියලා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I want to explain this. ගරු කථානායකතුමනි, මම වැඩ කරන්නේ ස්ථාවර නියෝගය අනුවයි. කැමැත්තෙන් ස්ථාවර නියෝගය වෙනස් කරන්න පුළුවන්. ස්ථාවර නියෝග අනුව අප වැඩ කරන්න ඕනෑ.

දේශීය ආදායම් පනත් කෙටුම්පත
உண்ணாட்டரசிறை சட்டமூலம்
INLAND REVENUE BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[පූ.භා. 10.26]

ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)

ගරු කථානායකතුමනි, "දේශීය ආදායම් පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

අද මම බොහොම අමාරුවෙන් තමයි පාර්ලිමේන්තුවට ආවේ. මෙතැනට එන්න පැයක් විතර ගියා. මොකද, වටේ හැම පාරක්ම වාහනවලින් පිරිලායි තිබුණේ. මම හිතුවා, අපේ ඒකාබද්ධ කණ්ඩායමේ අය මොනවා හෝ විරෝධතාවක්වත් කරනවාද කියා. බලන කොට වර්ෂාව විතරයි.

ගරු කථානායකතුමනි, මේ රටේ ආදායම වැඩි කිරීම ඉතාම කාලෝචිත අවශ්‍යතාවක් බවට පත්වී තිබෙන මොහොතක, ආදායම් බදු සම්බන්ධයෙන් අද නව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්න හැකිවීම පිළිබඳව මා සතුටු වෙනවා. අපේ සභානායකතුමා කියූ ආකාරයට මමත්, අපේ රාජ්‍ය ඇමතිතුමාත් මේ කටයුත්ත භාරගෙන, හිටපු මුදල් ඇමතිතුමාගේත් අදහස් එකතු කරගෙන අප මේ පනත් කෙටුම්පත බොහොම සීරුවෙන් අධ්‍යයනය කළා. එසේ අධ්‍යයනය කිරීම තුළින්, තවත් සංශෝධන එකසිය ගණනකට ආසන්න ප්‍රමාණයක් -ප්‍රධාන සංශෝධන 23යි.- සමඟ තමයි අප අද මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ.

ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණේ, ඒකාබද්ධ විපක්ෂයේ නායකතුමන්ලා මා හමු වෙලා දුන් සියලු සංශෝධන හවසට සලකා බලා, තමුන්නාන්සේලා සියලු දෙනාගේම සහයෝගය ඇතුව මෙම ඓතිහාසික පනත් කෙටුම්පත සම්මත කර ගන්න පුළුවන් වේවා! කියා මා ප්‍රාර්ථනා කරනවා. මම එහෙම කියනකොට බිමල් රත්නායක මන්ත්‍රීතුමා නිකම් අමුතු හිනාවක් දැම්මා. කෙසේ වෙතත් අපි සියල්ලෝම එකතු වෙලා මේ රටේ ආදායම් වැඩි කරලා, අපි සියලුදෙනාම සිහින දකින, ප්‍රාර්ථනා කරන නව දේශයක් ගොඩ නඟන්න කටයුතු කරන්න ඕනෑය කියා මා හිතනවා.

ගරු කථානායකතුමනි, දැනට ක්‍රියාත්මක වන දේශීය ආදායම් පනත ස්ථාපිත වුණේ 2006 වසරේදීයි. පසුගිය අවුරුදු 11 තුළ වරින් වර එයට විවිධ සංශෝධන අටක් පමණ ඇතුළත් කිරීම තුළින් ඒ පනත ඉතාම සංකීර්ණ තත්ත්වයකට පත් වෙලා තිබුණා. රටක ආදායම් බදු නීතිය සංකීර්ණ වීම ඉතා අවාසිදායක මෙන්ම අවාසනාවන්ත තත්ත්වයක්. ඒ මඟින් බදු ගෙවන්නන් අධෛර්යවත්වීම තුළින් රජයට ලැබෙන ආදායම් බොහෝ සෙයින් අඩු වෙනවා. මම පසුව එතැනට එන්නම්.

පසුගිය කාලයේ ආදායම් අඩු වෙලා තිබෙන ප්‍රමාණය ගැන බැලුවොත්, අපට එය තේරුම් ගන්න පුළුවන්. ආයෝජකයන් අධෛර්යවත් වීම තුළින් ආර්ථිකයේ ආයෝජන සහ රැකියා උත්පාදනය අඩාළ වෙනවා; බදු අක්‍රමිකතා සිදු වීමට ඇති ඉඩකඩ බොහෝ සෙයින් වැඩි වෙනවා; රටේ බදු අනුකූලතාව දරුණු ලෙස පහළ යනවා. සමස්තයක් ලෙස ගත් විට බදු ක්‍රමයේ සාධාරණත්වය දැඩි ලෙස අභියෝගයට ලක් වෙනවා. මක්නිසාදයත්, රජයට සෘජු බදුවලින් ලැබෙන ආදායම පහළ යන විට එය ඌන පූරණය කිරීම සිදු වන්නේ වක්‍ර බදු වැඩි කිරීම තුළිනුයි. පවත්නා සංකීර්ණ ආදායම් බදු රාමුව තුළ ඉතා අවාසිදායක සහ අවදානාත්මක තත්ත්වයකයි අද රට තිබෙන්නේ. අද රට අවදානාත්මක තත්ත්වයන් රාශියකට මුහුණ දෙනවා.

දකුණු ආසියානු කලාපයේ මෙන්ම, ලෝකයේ අවම බදු ආදායම් ලබන රටවල් අතරට දැන් ශ්‍රී ලංකාව පැමිණ තිබෙනවා. 1990දී දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 19ක් වූ රාජ්‍ය බදු ආදායම අඛණ්ඩවම පහළ වැටිලා 2014 වන විට සියයට 10ක මට්ටමකට අඩු වුණා. නමුත්, පසු ගිය අවුරුදු දෙකේදී -2015 සිට මේ දක්වා බැලුවාම- යළි වතාවක් අපට රාජ්‍ය බදු ආදායම සියයට 15 දක්වා වැඩි කර ගන්න පුළුවන් වුණා. මේ නව බදු පනත ක්‍රියාත්මක වීමෙන් පසුව ඊළඟ වසර දෙකේදී රාජ්‍ය බදු ආදායම සියයට 20 මට්ටමට ගෙන යන්නට පුළුවන් වෙයි කියන විශ්වාසය අපට තිබෙනවා. එම අවම බදු ආදායම තුළ සෘජු බදු ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2ක මට්ටමකයි පවතින්නේ. එය කලාපයේ සෘජු බදු ප්‍රමාණය සමඟ සැසඳීමේදී ඉතාමත් පහළ තත්ත්වයක්. නිදසුනක් ලෙස මැලේසියාව, ඉන්දුනීසියාව, පිලිපීනය වැනි රටවල් ගත්තාම එම රටවල සෘජු බදු ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 5-7 අතර තමයි පවතින්නේ. ඒ විතරක් නෙවෙයි, සෘජු බදු ආදායම ඉතා පහළ මට්ටමක පවතින නිසාම වක්‍ර බදු ප්‍රමාණය ඉතාම ඉහළ ගිහින් තිබෙනවා. මම හිතන හැටියට මේක තමයි ඉතාම භයානක තත්ත්වය; කනගාටුදායකම තත්ත්වය; අවසානාවන්තම තත්ත්වය.

ගරු කථානායකතුමනි, මේ රටේ බදු බර දරන්නේ වෙන කවුරුවත් නොවෙයි. ඇත්ත වශයෙන්ම කිව්වොත් මේ රටේ බදු බර දරන්නේ කිරි පිටි ටිකක් ගන්න, සීනි ටිකක් ගන්න සාමාන්‍ය මනුස්සයා මිසක් මේ රටේ වැඩි ආදායම් ලබන අය නොවෙයි. මේ රටේ සෘජු බදු සහ වක්‍ර බදුවල අනුපාතය වන්නේ, 20:80යි. අපේ මුළු ආදායමෙන් සියයට 80ක්ම ලැබෙන්නේ වක්‍ර බදුවලින්. සෘජු බදු සහ වක්‍ර බදු අනුපාතය අපි 20:80 කිව්වාට, ඇත්තටම 18:82 විතර තමයි පවතින්නේ. මේ තත්ත්වය බැලුවාම මම කිව්වා වාගේ බදු ආදායම් ලබන රටවල් අතර අපි කලාපයේ අන්තිමට ඉන්නේ කියලා.

උදාහරණයක් හැටියට මැලේසියාව ගත්තොත්, එහි සෘජු ආදායම, ඒ කියන්නේ income taxවලින් ලැබෙන ආදායම සියයට 72 මට්ටමේ තිබෙන්නේ. ඉන්දියාවේ පවා සෘජු සහ වක්‍ර බදු ආදායම සියයට 50:50 තත්ත්වයට ගෙන එන්න පුළුවන් වෙලා තිබෙනවා. සිංගප්පූරුවේ සියයට 45ක් පමණයි වක්‍ර බදුවලින් ලැබෙන්නේ. පාකිස්තානය, බංග්ලාදේශය කියන අපේ අසල්වැසි රටවල් දෙක ගත්තාම, බංග්ලාදේශයේ සෘජු බදු ප්‍රමාණය සියයට 35ක් විතර වෙනවා; පාකිස්තානයේ සෘජු බදු ප්‍රමාණය සියයට 37ක් විතර වෙනවා.

ගරු කථානායකතුමනි, අපි යථාර්ථය දිහා බලන්න ඕනෑ. 2012/2013 වසරේ Household Income and Expenditure Survey එක අනුව මේ රටේ පොහොසතුන් සියයට 20, සමස්ත household income එකෙන් සියයට 52.9ක් පාලනය කරනවා. This survey was done, of course, in the height of the Rajapaksa era from 2012 to 2013. The richest 20 per cent of our population shared 52.9 per cent of the total household income. අනෙක් පැත්තෙන් දුප්පත්ම සියයට 20ට සමස්ත ආදායමෙන් කොපමණ හිමිකමක් තිබෙනවාද කියලා බැලුවොත්, දුප්පත්ම සියයට 20 හිමිකම් කියන්නේ සමස්ත ආදායමෙන් සියයට 4.5කට විතරයි. පොහොසත්ම සියයට 20, රටේ ආදායමෙන් සියයට පනස් ගණනක් පාලනය කරනවා. දුප්පත්ම සියයට 20 -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳම සියයට 1 කොපමණද?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඒක හරියට කියන්න මම දන්නේ නැහැ. හොඳම සියයට 1 කවුද කියලාත් අපි දන්නවා. අපි මේ දවස්වල ඒ ගණන් මිනුම් පිළිබඳ සොයා ගෙන යනවා; පරීක්ෂා කරගෙන යනවා. ඔබතුමන්ලා මොනවා කිව්වත් අපි ඒ පරීක්ෂණ නවත්වන්නේත් නැහැ. එම පරීක්ෂණවල ප්‍රතිඵල අපි ඉක්මනට හෙළිදරවු කරනවා.

නමුත්, වක්‍ර බදු හරහා පොහොසත් උදවියත්, දුප්පත් උදවියත් තම භාණ්ඩ හා සේවාවන්ට එකහා සමානවයි බදු ගෙවන්නේ.

දැන් බලන්න, කෝටි ගණන් උපයන ටියුෂන් ගුරුවරු ඉන්නවා. මා මිත්‍ර බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ මේ සභාවේ නැහැ. නමුත් එතුමා එක්කත් අපි එදා බොහොම සාර්ථක සාකච්ඡාවක් පැවැත්වූවා. ටියුෂන් ගුරුවරු කිව්වාම මට එතුමායි මතක් වුණේ. ටියුෂන් ගුරුවරු අද කෝටි ප්‍රකෝටි ගණන් උපයනවා. Channel services කරන දොස්තර මහත්වරු කොයි තරම් සල්ලි හම්බ කරනවාද? මෙතැන නීතිඥවරු ගොඩක් ඉන්නවා. නීතිඥවරුන් පවා තමන් ගෙවිය යුතු ආදායම් බද්ද ඒ ආකාරයට ගෙවනවාද? ඇත්ත වශයෙන්ම ඒ ආකාරයට නොගෙව්වත්, කීයක් හෝ ගෙවනවා නම් ඒක අපට ලොකු හයියක්. නමුත්, කඩයකට ගිහිල්ලා සීනි ටිකක් ගන්නකොට, පිටි ටිකක් ගන්නකොට, තව මොනවා හෝ ගන්නකොට ඒ අය ගෙවන්නේත්, මහා ව්‍යාපාරිකයා ගෙවන්නේත්, දෛනික වැටුපට වැඩ කරන කම්කරුවා ගෙවන්නේත්, සමෘද්ධි ලාභියා ගෙවන්නේත්, රටේ දුගී දුප්පත්ම ජනතාව ගෙවන්නේත් එක හා සමාන මුදලක්. අන්න ඒ නිසා තමයි අපි කියන්නේ, සෘජු ආදායම් බදු වැඩි කරන්න කටයුතු කරන්න ඕනෑ කියලා.

දේශප්‍රේමීත්වය ගැන නිතර නිතර කථා කරන රටක, සැබෑ ලෙසම රටට ආදරේ නම් ඒ හැම කෙනෙක්ම තමන්ට හැකි පමණින් ආදායම් බද්දක් ගෙවන්න ඕනෑ. ඒ අනුව "මමත් මේ රටේ සංවර්ධනයේ හවුල්කාරයෙක්" කියන කාරණයට ඒ අය සතුටු වෙන්න ඕනෑ; ආඩම්බර වෙන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, demographic characteristics and tax files of non-corporate sector පිළිබඳ බලන්න. 2012-2013 survey එක අනුව නිවාස - households - මිලියන 5.1ක් තිබෙනවා. එයින් පොහොසත්ම නිවාස සංඛ්‍යාව මිලියන 1.02ක් බවට සඳහන් වෙනවා.

නමුත්, මේ රටේ non-corporate sector එකේ tax files තිබෙන්නේ මිලියන 1.1යි. ඒ කියන්නේ, මිලියන 5.1ක් households තිබෙන සමස්ත ලංකාවේම.

According to the 2012/2013 Household Income and Expenditure Survey, the number of income receivers in the richest 20 per cent category is about 1.8 million. However, the number of tax registrants in the non-corporate sector is about 1.2 million as per the 2016 numbers. Hence, only a low percentage has registered for tax purposes. Out of that, only about 60 per cent actually pays taxes. Therefore, given the fact that the richest 20 per cent of households claim for about 53 per cent of household income in the country, their contribution to the tax system is rather unsatisfactory. මෙකයි ඇත්ත තත්ත්වය. ඒ අයගේ දායකත්වය ඉතා පහළ මට්ටමකයි තිබෙන්නේ. Income tax registration දිහා බැලුවාමත් අපි කිර්ගිස්ථානයටත් වඩා පහළින් ඉන්නේ. සියයට 14ක් වෙද්දි සිංගප්පූරුව, හොංකොං, කොරියාව, මොංගෝලියාව, මැලේසියාව ඉතා ඉහළ තත්ත්වයකයි තිබෙන්නේ.

අපි හැමෝම දන්නවා, වක්‍ර බදු ගෙවන්නන්ගේ ආදායම් මට්ටම කුමක් වුවත් ගෙවන බදු ප්‍රමාණය එක සමානයි කියලා. ඒ නිසා පහළ ආදායම්ලාභීන්ගේ ආදායමට සාපේක්ෂව ඉතා ඉහළ බදු බරක් වක්‍ර බදු මඟින් පැටවෙනවා. අන්න එය සාධාරණ බදු ක්‍රමයක ලක්ෂණයක් නොවේ. මේ නව දේශීය ආදායම් පනත් කෙටුම්පත ක්‍රියාත්මක වීමෙන් පසු රජයට ලැබෙන බදු ඉහළ යාම තුළින් වක්‍ර බදු මත රඳවා පැවතීම අවම මට්ටමකට ගෙන ඒමට හැකි වෙනවා. මුදල් ඇමතිවරයා හැටියට මගේ ප්‍රධානතම ඉලක්කය තමයි 2020 වර්ෂය වන කොට මේ සෘජු හා වක්‍ර බදු අතර තිබෙන අනුපාතය 20යි, 80 සිට 40යි, 60 දක්වා පරිවර්තනය කිරීම.

විශේෂයෙන් සඳහන් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. එනම්, ශ්‍රී ලංකාවේ ආදායම් බදු අනුකූලතාව සම්බන්ධයෙන් බරපතළ ගැටලුවක් තිබෙනවා කියන කාරණයයි. එක් අතකින්, බදු ගෙවීම සඳහා ලියා පදිංචි වන පුද්ගලයන් හා ව්‍යාපාර ආයතනවල සංඛ්‍යාව පුදුමසහගත ලෙස අවම මට්ටමක පවතිනවා. 2016 වර්ෂයේදී බදු ගෙවීම සඳහා ලියා පදිංචි වූ සමාගම් සංඛ්‍යාව 43,990ක මට්ටමකයි පවතින්නේ. එමෙන්ම බදු ගෙවීම සඳහා ලියා පදිංචි පුද්ගලයන් සංඛ්‍යාව 119,300ක් තරම් ඉතාම පහළ මට්ටමක සංඛ්‍යාවක්. එය රටේ සමස්ත ව්‍යාපාර අංශය හා ශ්‍රම වෙළඳ පොළ තත්ත්වයන් සමඟ සැසඳීමේදී කිසිසේත් ප්‍රමාණවත් නොවන බව තමුන්නාන්සේලා හැම කෙනෙකුම පිළිගනීවි කියා මම හිතනවා. අනෙක් අතට, බදු ගෙවීම සඳහා ලියා පදිංචි වූ අයගේ බදු ලිපි ගොනුවලිනුත් පෙනෙනවා, නිසි ආකාරයට බදු ගෙවීම් සිදු වනුයේ ඉතාම අවම ප්‍රතිශතයකින්ය කියා. Tax files තිබෙන අයත් ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය විවිධ හේතු නිසා - දූෂණය නිසා, වෙනත් හේතු නිසා- ගෙවන්නේ නැහැ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව අනුව, 2016 වසරේ බදු ගෙවීම සඳහා ලියා පදිංචි ව්‍යාපාර ආයතනවලින් අදාළ දිනයට බදු ගෙවා ඇත්තේ සියයට 30ක් පමණයි. Register කරපු අයගෙනුත් සියයට 30යි, ඒ කියපු දිනයට බදු ගෙවන්නේ. ඉන් මාසයකට පසුව එම ප්‍රතිශතය සියයට 46 දක්වා ඉහළ ගියද එයත් කිසිසේත් සෑහීමකට පත් වන්න පුළුවන් තත්ත්වයක් නොවෙයි. ඒ වාගේම, ආදායම් බදු ගෙවන පුද්ගලයන් ගත් විට, 2016 වසරේ අදාළ දිනයට බදු ගෙවීම් කළ ප්‍රමාණය මුළු සංඛ්‍යාවෙන් සියයට 48ක් පමණ වනවා. ඉන් මාසයකට පසුව එය සියයට 59 දක්වා වැඩි වුවත් එය තවත් බොහෝ දුරට වර්ධනය කර ගන්නේ නැතිව බැහැ.

කෙසේ වුවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරින් නිරන්තරයෙන් කරන පසු විපරම් තුළින් වර්ෂය අවසානයේදී එම ප්‍රතිශතය යම්තාක් දුරකට වර්ධනය කිරීමට සමත් වනවා. නමුත් එය එසේ විය යුතු තත්ත්වයක් නොවෙයි. බදු ගෙවීම් ප්‍රමාද වීම තුළින් රාජ්‍ය ආදායම් වියදම් කළමනාකරණයට විශාල බලපෑමක් සිදු වනවා. මෙවැනි පසු බිමක් තුළයි අප රජය කල්පනා කළේ, මෙසේ ඉතා පරිහානියට පත් වෙමින් පවතින ආදායම් බදු ක්‍රමය යළි වතාවක් -නැවතත්- සංශෝධනය කරන්න ඕනෑ කියා.

එපමණක් නොවෙයි. අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරියේදී තමුන්නාන්සේලා සමඟ සාකච්ඡා කරලා universal tax file නොම්මරයක් මේ රටේ හැම කෙනෙකුටම ලබාදෙන්න කටයුතු කරන්න. විශේෂයෙන්ම අවුරුදු 18ට වැඩි හැම කෙනෙකුටම tax

[ගරු මංගල සමරවීර මහතා]

file නොම්මරයක් තිබුණාය කියලා ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. ඒකෙන් කියන්නේ නැහැ tax ගෙවන්නම ඕනෑය කියලා. ඇත්ත වශයෙන්ම අපි බදු ගෙවන පෝරමයත් බොහොම සරල කරනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
බැජ් එකක් වාගේද?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
බැජ් එකක් වාගේ වෙන්නත් පුළුවන්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
බැජ් එකක් වාගේ ගහගෙන යන්න පුළුවන්!

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Birth certificate එකත් එක්කද දෙන්නේ?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
නමුත්, මෙය බොහොම සරල ක්‍රමයක්. ආදායමක් නැත්නම්, අවුරුද්ද අන්තිමට "ආදායමක් නැත" කිව්වාම ඇති. එච්චරයි. අපි ඒක පස්සේ දුවන්නේ නැහැ. ආදායමක් නැති විශාල පිරිසක් ඉන්නවා.

ගරු එස්.බී. දිසානායක මහතා (සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Social Empowerment and Welfare and Kandyan Heritage)
SMS එකකින් දැනුම් දෙන්නත් පුළුවන් වෙයි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
SMS එකකින් දැනුම් දෙන්නත් පුළුවන් වෙයි. අවුරුදු ගණනක් යනකොට ඒ තත්ත්වයට එන්න පුළුවන්. ඒ වාගේම අපි හිතනවා, තරුණයෙකුට බැංකු ගිණුමක් විවෘත කරන්න අවශ්‍ය නම්, ඒ වාගේ නොම්මරයක් තිබුණොත් ඒ කටයුතු වඩාත් පහසු වෙයි කියලා. ඒ වාගේම, එවැනි නොම්මරයක් තිබෙන අයට තව තවත් පහසුකම් අපි ලබා දෙන්නම්. කෞතුකාගාරයට යනවා නම් ඒ අයට නොමිලේ ඇතුළු වෙන්න දෙන්න පුළුවන්. ඒ අය සීගිරියට යනවා නම් නොමිලේ බලන්න දෙන්න පුළුවන්. Zoo එකට යනවා නම් ඒකට නොමිලේ ඇතුළු වෙන්න දෙන්න පුළුවන්. වෙනත් රටවල එවැනි ලිපි ගොනුවක් තිබෙන කෙනෙකුට හිමි විය යුතු ගෞරවය අපේ රටේ පුරවැසියන්ටත් ලබා දෙන්න අපි කටයුතු කරන්න ඕනෑ. අපේ රටේ පුරවැසියෙක් tax file or card එක පෙන්නුවාම ඔවුන්ට හිමි විය යුතු ගෞරවය ලබා දීලා අභිමානවත් පුරවැසියෙක් කරන්නයි අපේ බලාපොරොත්තුව. ඒකෙන් බලාපොරොත්තු වන්නේ නැහැ හැම කෙනෙක්ම බදු ගෙවන්න ඕනෑය කියලා. මෙවැනි සාධනීය යෝජනාවලට යම් පුද්ගලයෙකු හෝ ආයතනයක් අකැමැති වනවා නම්, ඇත්ත වශයෙන්ම එයින් පෙනී යන්නේ ඒ පුද්ගලයන් හෝ ආයතන මේ කටයුතු විනිවිදභාවයෙන් සිදු කරනවාට විරුද්ධයි කියන එකයි. දේශීය වශයෙන් ආදායම් ලබා ගෙන රට දියුණු කිරීම සඳහා වක්‍ර බදු අඩු කරන එකට කවුද විරුද්ධ? ඇත්ත වශයෙන්ම අපට මේ 60:40 අනුපාතයට 2020 වන විට යන්න පුළුවන් නම්, ඒ යන ගමනේදී සාමාන්‍ය ජනතාවට බලපාන VAT එක වාගේ ඒවා සියයට එකකින් දෙකකින් අඩු කරන්න පුළුවන්. ඒ අඩු කිරීම තමයි අපේ බලාපොරොත්තුව.

අපි බලාපොරොත්තු වෙන්නේ, මේ රට තුළ ව්‍යාපාරික පරිසරය වඩාත් ක්‍රියාශීලී හා විනිවිදභාවයකින් යුතුව පවත්වා ගෙන යෑමයි. එයින් නීතිවිරෝධී ලෙස ආදායම් රැස් කිරීම දුර්වල වෙනවා. එයින් රට තුළ පවත්නා ඍජු බදු ක්ෂේත්‍රයේ පදනම පුළුල් වනවා. ඒ මඟින් පොදු මහජනතාවට පැටවෙන වක්‍ර බදු අවම වෙනවා කියලායි මා හිතන්නේ. මම කලින් සඳහන් කළ පරිදි දැනට පවතින ආදායම් බදු ක්‍රමය ඉතා සංකීර්ණ වීම තුළ බදු පරිපාලනය ඉතා අකාර්යක්ෂම වෙලා තිබෙනවා. තවද, එම සංකීර්ණතාව සමනය කිරීම සඳහා වරින් වර කරනු ලැබූ යම් යම් සංශෝධන තුළින්, එහි සංකීර්ණ ස්වභාවය තවදුරටත් වැඩිවීමක් මිසක් සමනය වීමක් නැහැ. එය රට තුළ පවත්නා ආදායම් බදු ක්‍රමය සම්බන්ධයෙන් ඉතාම අවිනිශ්චිත තත්ත්වයක් ඇති කර තිබෙනවා. එම තත්ත්වය ආයෝජක විශ්වාසය බිඳවැටීමට බෙහෙවින් බලපානවා. එක එක වෙලාවට එක එක විධියට බදු ගැහුවා; ඇමතිවරයාට ඕනෑ විධියට බදු ගැහුවා; තවත් එක එක විධියට බදු ගැහුවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
උදේට එකක්, හවසට එකක්.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔව්. උදේට බදු ගහනවා, හවසට වෙනස් කරනවා. පසු ගිය අවුරුදු 20, 30දී අපි එවැනි තත්ත්වයක් දැක්කා. 1990 ඉඳලාම මේ රටේ ආදායම් මාර්ග ශීඝ්‍රයෙන් අඩු වෙච්ච හැටි අපි දැක්කා. අද ගෙනෙන මෙම දේශීය ආදායම් පනත් කෙටුම්පත හරහා තමයි සියලු දේ කෙරෙන්නේ. මට ඇමතිවරයා හැටියටවත් මේ පනතට පිටින් යම් යම් සහන - incentives - ලබා දෙන්න කියලා නිර්දේශ කරන්න බැහැ. මේ පනත ඒවා අනුවයි ක්‍රියාත්මක වෙන්නේ. මේ තුළින් සියලු දෙනාට level-playing field එකක් ඇති වෙයි කියලා අපි විශ්වාස කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම කියන්නේ-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමාට කථාව කරගෙන යන්න ඉඩ දෙන්න.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
බදු ගෙවීමට අදාළව ease of paying tax කියන index එකක් තිබෙනවා. ඒ සම්බන්ධ ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම තුළ රටවල් 185කින් අපට හිමි වී ඇත්තේ 158 වෙනි ස්ථානයයි. මේ ease of paying tax කියන index එකේ අපට පසුව ඉන්නේ, ඇෆ්ගනිස්ථානය, ආජන්ටිනාව, උතුරු අප්‍රිකානු රටවල් කිහිපයක්

පමණයි. මෙම තත්ත්වය පැහැදිලිවම වෙනස් විය යුතුය. එවැනි වෙනස්වීමක් තුළින් සිදු වන වාසිය, රාජ්‍ය මූල්‍ය අංශ ශක්තිමත් කිරීම පමණක් නොව සාර්ව ආර්ථික දෘෂ්ඨි කෝණයෙන් බැලීමේදී සමස්ත ආර්ථිකයේ සියලු අංශ කෙරෙහි ධනාත්මකව බලපාන ඉතා වැදගත් කරුණක්.

එවැනි සාධනීය වෙනසක් සිදු කිරීම බාහිර පාර්ශ්වයක වුවමනාවක් මත සිදු කරන්නේ යැයි මතයක් ගොඩනැඟීමට උත්සාහ කිරීම ඇත්ත වශයෙන්ම හුදු දේශපාලන කාරණයක් මිස යථාර්ථයක් නොවෙයි. සමහරු මේවා IMF යෝජනා කියනවා. නමුත් මේවා IMF යෝජනා නොවෙයි. ඇත්ත වශයෙන්ම මේ කාරණාවල අඩංගු වන්නේ, රටේ වුවමනා දෙස බලලා, අපේ රට පසුගිය කාලයේ වැටුණු ප්‍රපාතය දෙස බලලා, ඒ ගැන අපි කථා කරලා රට ගොඩනැංවීමට සැලසුම් කළ දේශීය සැලැස්මක්. නමුත් දේශීය සැලැස්මකදී වුවත් අපි international best practices මොනවාද කියා සොයා බලා, ඒ අය හොඳ දේවල් කරලා තිබෙනවා නම්, ඒවාත් එකතු කර ගන්නවා. ඒවාත් එකතු කරගෙන තමයි මේ පනත් කෙටුම්පත හදලා තිබෙන්නේ. IMF එක වුණත් හොඳ යෝජනාවක් අපට කළා නම්, අපි ඒ යෝජනාත් එකතු කරලා තිබෙනවා. එහි වරදක් මම කිසිසේත්ම දකින්නේ නැහැ. තවද මම ඍජුව ප්‍රකාශ කරන්න කැමැතියි, මෙම යෝජිත පනත් කෙටුම්පත තුළ ජාත්‍යන්තර ප්‍රශස්ත පරිචයන් - best practices - ඇතුළත් කරලා තිබෙන බව.

මෙම යෝජිත කෙටුම්පතෙහි අඩංගු යම් යම් කුඩා කුඩා කොටස් උපුටා ගනිමින් දේශපාලනමය වශයෙන් කෙටි කාලීනව ජනප්‍රියවීමට ඇතැමුන් දරන උත්සාහය ඉතා පටු ආකල්පමය තත්ත්වයකි. එමඟින් සිදුවනුයේ ජනතාවට අවැඩක් මිස යහපතක් නොවෙයි.

මා මේ අවස්ථාවේදී කැමැතියි, යෝජිත නව දේශීය ආදායම් පනත් කෙටුම්පතේ ඇති සුවිශේෂ කරුණු කිහිපයක් පෙන්වා දෙන්න. අපි මෙම පනත් කෙටුම්පතෙන් මූලින්ම අපේක්ෂා කරන්නේ ශ්‍රී ලංකාවේ ආදායම් බදු නීතිය, බදු පැනවීමේ මූලික සිද්ධාන්තවලට අනුකූලව සිදු කිරීමයි. 1776දී Adam Smith, four maxims of taxation හඳුනාගෙන තිබෙනවා. මම හිතන හැටියට ඒවා අදටත් වලංගුයි. පළමුව, බදු බැඳියාව එය ගෙවීමේ හැකියාවට අනුරූපී විය යුතුයි - burden proportionate to the ability to pay. දෙවනුව, බදු ගෙවන්නන්ට තමන් ගෙවන බද්ද පිළිබඳව නිශ්චිතතාවක් ඇති විය යුතුයි - certainty. අපි කිව්වා වාගේ වරින් වර වෙනස් නොවන ස්ථිරභාවයක් තිබිය යුතුයි. තෙවනුව, බදු ගෙවන්නන්ට තම බදු ගෙවීම පහසුවෙන් සිදු කළ හැකි විය යුතුයි - convenience. පිටු ගණන් පුරවලා, අර කවුළුවෙන් මේ කවුළුවට යවමින් බදු ගෙවීම එපා කරවන්නේ නැතුව ඍජුව, සරලව ගෙවන්න පුළුවන් ක්‍රම ඇති කරන්න ඕනෑ.

හතරවනුව, බදු එකතු කිරීම හා කළමනාකරණය කිරීම - efficiency of collection - කාර්යක්ෂම විය යුතුයි. ඇත්ත වශයෙන්ම අප කොයි තරම් හොඳ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවත් ඒ හා සමානව වෙනස්කම්වලට මුහුණ නොදුන්නොත් ඒකෙන් බලාපොරොත්තු වන ලාභයන්, අපේක්ෂාවන් ඉටු කර ගන්න බැරි වනවා. ඒ නිසා අප ඉදිරියේදී මේ පනත් කෙටුම්පත හා සමගාමීව එම කණ්ඩායම් සමඟ සාකච්ඡා කරලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළත් වෙනස්කම් කරන්නට බලාපොරොත්තු වනවා. මෙම මූලික සංකල්ප මත පිහිටුවා නව ආදායම් බදු ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී අපගේ මූලික ප්‍රමුඛතාව වනුයේ, රටේ සුළු හා මධ්‍යම පාන්තික සමාජ ස්ථාවරයන් සඳහා පහසුකම් සැලසීම, බදු බර දැරිය හැකි අංශයන්ගෙන් සාධාරණ වූ බද්දක් අය කිරීම, අවසානයේ දී රටේ මූලික ගැටලුවක් වූ ඉතා අවදානම් ලෙස පහළ යමින් පැවතුණු රාජ්‍ය බදු ආදායම් යළි ස්ථාවර කිරීමයි. මෙම යෝජිත පනතේ පවතින මූලික සාධනීය තත්ත්වය වන්නේ එමඟින් පහළ සහ මධ්‍යම පාන්තික ආදායම් ලබන පුරවැසියන්ට ආදායම් බදු බර නොපැටවීමයි. මේ පනත් කෙටුම්පත ඉතාම සාධාරණ පනත් කෙටුම්පතක්. මේ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් මට කථා කරන්න පුළුවන්. නමුත් අද අපේ කථිකයන් මේ සම්බන්ධ විවිධ අංශ ගැන කථා කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා.

මෙම පනත් කෙටුම්පතට අනුව මාසික ආදායම වශයෙන් රුපියල් ලක්ෂයකට වඩා අඩු වැටුපක් ලබන හැමෝම ආදායම් බද්දෙන් නිදහස් වනවා. [බාධා කිරීමක්] රුපියල් ලක්ෂය තමයි සීමාව.

ශ්‍රී ලංකාවේ ආදායම් බෙදී යාමේ ස්වභාවය සැලකූ විට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සමීක්ෂණ දත්තවලට අනුව රටෙහි සමස්ත පවුල් සංඛ්‍යාවෙන් පොහොසත්ම සියයට 20 -අප මුලින් කථා කරපු දේ- සැලකූ විට ඔවුන් සමස්ත ආදායමෙන් සියයට 53කට හිමිකම් කියනවා. ඉතුරු සියයට 80ක් වන පහළ සහ මධ්‍යම ආදායම් ලාභීන් සැලකූ විට ඔවුන් රටේ සමස්ත ආදායමෙන් සියයට 47කට පමණයි හිමිකම් දරන්නේ. මෙමඟින් පෙනී යන්නේ මෙම යෝජිත දේශීය ආදායම් පනත් කෙටුම්පත තුළින් පහළ හා මධ්‍යම ආදායම් ලබන සමාජ ස්ථාවරයන් සඳහා බදු ගෙවීමට යටත් වීමේ සම්භාවිතාව අවම කර තිබෙන බවයි.

විශේෂයෙන්ම සඳහන් කළ යුතු ඊළඟ කාරණය වන්නේ, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ලබා දීමට නියමිත පොලී ආදායම සම්බන්ධ සහනය පිළිබඳවයි. එහිදී ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකුගේ මාසික පොලී ආදායම, රුපියල් 125,000 දක්වා බද්දෙන් නිදහස් කරලා තිබෙනවා. මේ අපි කථා කරන්නේ පොලී ආදායම ගැනයි. සාමාන්‍ය ආදායම ගැන නොවෙයි, පොලී ආදායම ගැනයි. ඒක විශාල මුදලක්. මෙවැනි පොලී ආදායමක් ලබා ගත හැකි වන්නේ රුපියල් ලක්ෂ 150කවත් තැන්පතු සහිත පුද්ගලයකුටයි. රුපියල් ලක්ෂ 150කට වැඩි තැන්පතු තිබෙනවා නම් මේ වාගේ පොලී ආදායමක් ලැබෙනවා. එතකොට ඒ පොලී ආදායමට ආදායම් බදු ගෙවන්නට ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, ඔබතුමාගේ කාල සීමාව අවසානයි. නමුත් ඔබතුමා දිගටම කථා කරගෙන යන්න.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
But I do not want to take anyone else's time.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැනුවත් කිරීම විතරයි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මම ඉක්මනින් අවසන් කරන්නම්, ගරු කථානායකතුමනි.

තවද යෝජිත පනත් කෙටුම්පත තුළින් සුළු හා මධ්‍යම පරිමාණ ආයතන සම්බන්ධයෙන් මෙන්ම විශේෂයෙන් හඳුනා ගත් අනෙකුත් ක්ෂේත්‍ර ගණනාවක් සම්බන්ධයෙන් විශාල වශයෙන් බදු

[ගරු මංගල සමරවීර මහතා]

සහන ලබා දීලා තිබෙනවා. නිදසුනක් ලෙස ව්‍යාපාර ආයතන සඳහා පොදුවේ අදාළ වන සියයට 28ක යෝජිත ආදායම් බද්ද වෙනුවට සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරයන්ට සහ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන ව්‍යාපාර ආයතන සඳහා එම බද්ද සියයට 50කින් අඩු කොට සියයට 14ක බද්දක් යෝජනා කරලා තිබෙනවා. එම අදාළ ක්ෂේත්‍රයන් වනුයේ භාණ්ඩ හා සේවා අපනයන, තොරතුරු තාක්ෂණ, අධ්‍යාපන, සංචාරක සහ කෘෂි කර්මාන්ත වැනි අංශයි.

මෙම යෝජිත පනත් කෙටුම්පතේ තවත් මූලික සාධනීය තත්ත්වයක් වන්නේ ඉහළ ආදායම් ලාභීන් සඳහා අදාළ වන පරිදි බදු පදනම පුළුල් කොට තිබීමයි. ඒ අනුව දැනට පවත්නා බදු නිදහස් කිරීම් බොහෝ අවස්ථාවන්හි සීමා කර තිබෙනවා. වරින් වර හඳුන්වා දුන් එවැනි බදු නිදහස් කිරීම් නිසා බදු ගණනය කිරීම සහ පරිපාලනමය ක්‍රියාදාමය බෙහෙවින් අකාර්යක්ෂම වුණා. එවැනි අකාර්යක්ෂමතා යෝජිත පනත් කෙටුම්පත මඟින් මඟහැරෙනවා. තවද, ප්‍රාග්ධන ලාභ බද්දට යටත් කිරීමද හඳුන්වා දී තිබෙනවා. එමඟින් ඉහළ ආදායම් ලාභීන්ගෙන් වැඩි බදු ප්‍රමාණයක් එක්රැස් කොට සමස්ත ආර්ථිකයට ප්‍රතිඵල ගෙන දෙන ප්‍රාග්ධන ක්ෂේත්‍රයන්ගේ ආයෝජන වැඩි කිරීමට හැකි වෙනවා. ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමාගේ කථාවේ දී මේ සම්බන්ධයෙන් තවත් දීර්ඝ වශයෙන් සඳහන් කරයි.

නූතන ලෝකයේ බදු සංකල්ප ඉතා වේගයෙන් නිරන්තර වෙනස්වීම්වලට ලක් වෙමින් තිබෙනවා. නූතන ව්‍යාපාරික ලෝකයත් සමඟ ගනු-දෙනු කිරීමේදී බදු අංශයේ පවතින වෙනස්කම් සම්බන්ධයෙන් අපි නිරන්තර අවධානයකින් සිටිය යුතු වෙනවා. නොඑසේ නම් විවිධ බදු අක්‍රමිකතා සහ පැහැර හැරීමේ ප්‍රවණතාවන් සිදුවීමට බොහෝ ඉඩ කඩ තිබෙනවා.

මෙම දේශීය ආදායම් පනත් කෙටුම්පතෙහි තවත් මූලික සාධනීය තත්ත්වයක් වන්නේ, නවීන බදු සංකල්ප මෙමඟින් හඳුන්වා දීමයි. එමඟින් ජාත්‍යන්තර වශයෙන් අනුගමනය කරන බදු ක්‍රම සමඟ සමපාතවීමක් සිදු වෙනවා. එමෙන්ම, බදු ක්‍රමයේ විනිවිදභාවය ඉහළ යෑමක් සිදු වෙනවා. තවද, යෝජිත පනත් කෙටුම්පත මඟින් බදු මඟ හැරීම වළක්වාලීම සඳහා අවශ්‍ය නීති හඳුන්වා දීමක් සිදු වෙනවා. දැනට පවතින ක්‍රමවේදය තුළ බදු පැහැර හරින්නෙකු සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මකවීමේදී බොහෝ කාලයක් ගත වන අතර, එම කාලය තුළ රජයට බදු ආදායම් අහිමි වෙනවා. බදු අනුකූලතාව වර්ධනය කිරීමට නම් බදු පැහැර හරින්නන් සඳහා නීතිය අවශ්‍ය ආකාරයෙන් සහ කඩිනමින් ක්‍රියාත්මක විය යුතුයි. නොඑසේ නම්, එය අනෙක් බදු ගෙවන්නන් සඳහා සිදු වන අසාධාරණයක් පමණක් නොව, රජයේ ආදායම් වියදම් කළමනාකරණයටද එමඟින් බොහෝ ලෙස බාධා පැමිණෙනවා. බදු පැහැර හරින්නන් අධෛර්යවත් කිරීම සඳහා අපි යල් පැන ගිය දඩ මුදල් සංශෝධනය කිරීමටත්, ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා. එසේම දිගු කලක් ගත වන ආදායම් බදු සම්බන්ධ නඩු තත්ත්වයන් කෙටි කාලයක් තුළ විසඳීමට ප්‍රතිපාදන හඳුන්වා දෙනවා.

මෙම යෝජිත දේශීය ආදායම් පනත ක්‍රියාත්මක කිරීමෙන් අපිට ආර්ථිකයේ මුහුණ දීමට ඇති අභියෝග බොහෝ දුරට සමනයවීමක් සිදු වනු ඇතැයි බලාපොරොත්තු වෙනවා. මූලික වශයෙන්ම ජනතාවට අවශ්‍ය භාණ්ඩ සහ සේවා නිසි අයුරින් සැපයීම, රජය විසින් ක්‍රියාත්මක කරන සහනාධාර වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීමට හැකි වීම තුළින් ආදායම් බෙදී යෑමේ අසමතුලිතතාව හැකි තාක් දුරට අවම කිරීම, රාජ්‍ය මූල්‍ය ස්ථාවරභාවය සහ සමස්තයක් වශයෙන් සර්ව ආර්ථික ස්ථාවරතාව තවදුරටත් වර්ධනය කිරීම, පුද්ගල චර්යාව වෙනස් කිරීම සඳහා යහපත් ආකාරයෙන් බලපෑම් කිරීමත් සිදු වනවා.

නිදසුනක් ලෙස දුම්කොළ, මත්පැන්, සූදු ක්‍රියාවන් සඳහා පමණක් සියයට 40ක අධික බද්දක් ක්‍රියාත්මක වෙනවා. අවසාන වශයෙන් ආර්ථික වර්ධනය සහ ආර්ථික තරගකාරිත්වය වර්ධනය කිරීම සඳහා විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා විශේෂ බදු සහන හඳුන්වා දෙනවා.

මෙම යෝජිත පනත තුළින් ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ස්ථාවරභාවය තහවුරු කරන්නට, සමාජ ආරක්ෂිතභාවය තවදුරටත් තහවුරු කරන්නට පුළුවන් වෙයි කියලා හිතනවා. ඒ වාගේම - [බාධා කිරීමක්] ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමා මගේ හිත ඇතුළේ තිබුණු දේ කිව්වා වාගේ -telepathy - මම ඒ කොළය තමයි සොයමින් සිටියේ. [බාධා කිරීමක්] මෙතුමා කියනවා, ඔබතුමා ජේන කියන්නත් දන්නවා ලු.

මම මේ ටික කියලා නවත්වන්නම්. Estimated additional revenue එකෙන්, export servicesවලින්, Unit Trust, SMEs, Withholding Tax වලින් ඒ වාගේම පොලී ආදායම සියයට 1.5ට වඩා වැඩියෙන් ලැබෙන අයගෙන්, Withholding tax on specified fees, Pay As You Earn -PAYE-. මේ සියලුම දේවලින් රුපියල් බිලියන 45ක්, එහෙම නැත්නම් රුපියල් මිලියන 4,500කින් අපේ ආදායම වැඩි වෙනවා.

ඒ විතරක් නොවෙයි, ඇත්ත වශයෙන්ම ලබන අවුරුද්දේ මේ රටේ ආදායම් ගෙනෙන ප්‍රධාන ආයතන තුන වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, Sri Lanka Customs සහ Excise දෙපාර්තමේන්තුව තුළත් වෙනස්කම් රාශියක් ඉක්මනින් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අලුතින් Customs Ordinance එකක් හදන්නත් බලාපොරොත්තු වෙනවා. මොකද, දැනට තිබෙන Customs Ordinance එක ලංකාවට හඳුන්වා දුන්නේ 1860. තවමත් ඒ පනත තමයි ක්‍රියාත්මක වන්නේ. ඒ නිසා මේවා ඔක්කොම අලුත් කිරීම තුළින් අපේ ආදායම විශාල වශයෙන් වැඩි කර ගන්න පුළුවන් වෙනවා. ඒ වාගේම මෙම පනත කොටස් දෙකකින් ක්‍රියාත්මක වනවා. ඒ කියන්නේ ඔක්තෝබර් 30වැනිදා සිට Pay As You Earn Tax ආදිය ක්‍රියාත්මක වෙනවා. පනත සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මත වන්න් 2018 අප්‍රේල් මාසයේ 1වැනිදා සිටයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, මුළු ආදායමම රුපියල් බිලියන 45ද, නැත්නම් අර අපනයන ක්ෂේත්‍රයට අදාළ කරන ප්‍රමාණයද, මේ පනත් කෙටුම්පත තුළින් ලැබෙන ප්‍රමාණයද?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මේ පනත් කෙටුම්පත තුළින් අපට වර්ධනය වන ආදායම ගැන පමණයි කථා කළේ. මේ ඉතාමත්ම ඓතිහාසික පනත් කෙටුම්පත සඳහා ඔබතුමන්ලා සියලු දෙනාගේම සහයෝගය ලබා දෙන්නය කියා යළිත් ඉල්ලා සිටිමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා.

ඊට ප්‍රථම, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙයික්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

[පූ.භා. 11.06]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දිනයේදී ඉදිරිපත් කරන දේශීය ආදායම් පනත් කෙටුම්පතට අදාළ සංශෝධනය, ඇත්තටම පනත් කෙටුම්පතක සංශෝධනයකටත් වඩා, මුළු මහත් ආර්ථික ක්‍රියාවලියම -විශේෂයෙන්ම අපේ රටේ බදු ක්‍රියාවලියම- කණපිට හරවන ආකාරයේ සංශෝධනයක්. ගරු ඇමතිතුමාත් යම් විධියකට ඒක වෙනත් අදහසකින් ඉදිරිපත් කළා. ලංකාවේ සිටින පවුල් ලක්ෂ 51ක හැම කෙනෙකුටම බදු file එකක්, එහෙම නැත්නම් හැම කෙනෙකුටම බදු ලාංඡනයක්, හැම කෙනෙකුටම බදු හැඳුනුම්පතක් දෙන්න ඕනෑය කියන මේ පනත් කෙටුම්පතේ ප්‍රධානම අරමුණ ඉතා පැහැදිලියි. කෙටියෙන්ම කිව්වොත්, හුස්ම ගන්නා හැම කෙනාම බදු දැලට කොටු කරන වැයමක් තමයි, මේ පනත් කෙටුම්පත. කෙනෙක් ඉපදිලා ඉන්නවා නම්, කෙනෙක් හුස්ම ගන්නවා නම්, ඒ හුස්ම ගන්නා හැම කෙනාම බදු ගෙවිය යුතුය කියන පදනමෙන් තමයි මේ පනත් කෙටුම්පත හදලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට කියා ගරු ඇමතිතුමා කිව්වාට, සාමාන්‍ය මිනිසුන්ට -පුංචි මිනිසුන්ට- මෙතෙක් ලැබුණු බදු සහන, මෙතෙක් ලැබුණු දේවල් බොහොමයක් මේ පනත් කෙටුම්පතෙන් ඔබතුමන්ලා සංශෝධනය කරල, කප්පාදු කරලා තිබෙන බව මේ පනත් කෙටුම්පතේ කරුණු අනුව මම පෙන්වලා දෙන්නම්. විශේෂයෙන්ම 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ බදු සහන 218ක් ලැබුණා. 2006 ඉඳලා 2014 දක්වා පනත් සංශෝධනයෙන්, -දේශීය ආදායම් පනත අට වතාවක් සංශෝධනය වෙලා තිබෙනවා.- බදු සහනයන් මොන යම් පදනමකින් හෝ 109ක් ලැබිලා තිබෙනවා. ඒ ඔක්කෝම ගත්තොත් 327යි. ඔබතුමන්ලා ඒ ටික එකතු කරලා මේ පනත් කෙටුම්පතෙන් 25කට අඩු කරලා තිබෙනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පත සංශෝධනය වීම තුළින් - මුළු මහත් සංශෝධනය තුළින්- බදු සහනයන් ලැබුණු ප්‍රමාණ 302ක් ජනතාවට අහිමි වෙලා තිබෙනවා. ඒකට අදාළ කරන සැලකිය යුතු ප්‍රමාණයක, අඩු තරමින් අවසාන මොහොතේ හරි කලාකරුවන්ට, විදේශගත රැකියා කරන අයට, වැඩිහිටියන්ට,- [බාධා කිරීමක්] මම ඉදිරිපත් කරන්නම්. ඒ අයට ලබා ගත හැකි, මෙතෙක් පනත්වලින් ලැබුණු සහන ලබා ගන්න සංශෝධන 49ක් ඇතුළත් කරන්න කියා ඔබතුමන්ලාගෙන් අපි ඉල්ලා සිටිනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඉදිරිපත් කරලා තිබෙන සංශෝධන අතරේ ඔබතුමා කියන බොහෝ දේවල් ඇති.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, අද උදේ තමයි අපි ඒ සංශෝධන දැක්කේ. සංශෝධන අවස්ථාවේදී අපි බලමු. නමුත්, අපි ඉදිරිපත් කරනවා. මම එකින් එක කියන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉවත් කරන්නය කියා ශ්‍රේෂ්ඨාධිකරණයත් යම් කිසි සංශෝධන ප්‍රමාණයක් ඉදිරිපත් කරලා තිබෙනවා; ඔබතුමන්ලාත් ඉදිරිපත් කරනවාය කියනවා. නමුත්, මේ පනත් කෙටුම්පතේ ඇතුළත්ව තිබෙන තවත් වගන්ති කීපයක්, ජනතාවට සිදුවන අහිතකරභාවය වැළැක්වීමේ පදනමින් ඉවත් කළ යුතු යැයි කියන යෝජනා 16ක් තවදුරටත් අපි ඉදිරිපත් කරනවා. ඒ අනුව, ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම හැටියට සංශෝධන 65ක් මේ පනත් කෙටුම්පතට අප විසින් යෝජනා කර තිබෙනවා. විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පතේ අරමුණ ඉතා පැහැදිලියි. බදු ගහන බලය; බදු පනවන ක්‍රියාවලිය යම් ඒකාධිපති ස්වරූපයක් හදලා, ඒක කොමසාරිස් ජනරාල්වරයාට,- [බාධා කිරීමක්]

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඒක වෙනස් කළා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක වෙනස් කළාය කියා ඇමතිතුමා කියනවා. අසීමිත බලයක් ලබා දීමක් තමයි මේ පනත් කෙටුම්පතේ 97වැනි වගන්තියෙන් යෝජනා කළේ. විශේෂයෙන් බදු ගණනය කිරීම පෞද්ගලික අංශයට පැවරීමට ආදායම් බදු කොමසාරිස් ජනරාල්වරයාගේ අභිමතය පරිදි ඔහු කැමැති "වෙනත් තැනැත්තන්ට" යන පදය යොදලා, කැමැති කෙනෙකුට බදු ගහන ක්‍රියාවලිය පාවිච්චි කරන්න ඉඩක් ඔබතුමන්ලා හැදුවා. ඒ "තැනැත්තා" යන්න පුද්ගලයෙක් විතරක් නොවෙයි, -

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔබතුමාගේ කථාවට disturb කරන්න මා කැමැති නැහැ. 97වන වගන්තිය ගත්තොත් මේ විධියටයි තිබෙන්නේ. "කොමසාරිස් ජනරාල්වරයා හෝ මේ පනත යටතේ යම් කර්තව්‍ය ඉටු කිරීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරන ලද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයෙක් එම කර්තව්‍ය ඉටු කිරීමේ දී ඔහු විසින් සද්භාවයෙන්" වශයෙන් සංශෝධනය වනවා. මෙය සංශෝධනය කළේත් ඔබතුමන්ලාගේත්, අපේත් සියලු වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කළ අවස්ථාවේ ඒ අයගේ යෝජනාවක් අනුවයි. අපි එයට එකඟ වුණා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා කියන එක නොවෙයි. පනත් කෙටුම්පතේ 97. (1) වගන්තියේ තිබෙනවා, "මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය වනු ලැබිය හැකි පරිදි, කොමසාරිස් ජනරාල්වරයකු, නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයන් සංඛ්‍යාවක්, ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරයන්, කොමසාරිස්වරයන්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරයන්, නියෝජ්‍ය කොමසාරිස්වරයන්, සහකාර කොමසාරිස්වරයන් සහ වෙනත් බදු නිලධරයන් ද පත් කරනු ලැබිය යුතු ය." කියලා. දැන් ප්‍රශ්නය තිබෙන්නේ, මෙතැන "වෙනත් බදු නිලධාරයන් ද" යන වචන ඔබතුමන්ලා යෙදුවේ කුමන අරමුණකින්ද කියන එකයි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඒ අර පරණ කාලයේ -

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
පරණ කාලයේ වුණාට ඒක මෙයට ඇතුළත් වුණේ ඉබේ නොවෙයි. බදු නිලධාරින්ගේ සංගම් අදත් වැඩ වර්ජනය කරමින්, උද්ඝෝෂණය කිරීම නිසා මේ රටේ මතයක් හැදුණා. ඔබතුමන්ලාට ඒ මතයට හිස නමන්න සිද්ධ වුණා. මෙය ඉබේ ආපු දෙයක් නොවෙයි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
නැහැ, නැහැ. ඊටත් ඉස්සෙල්ලා අපි ඒක අපි වෙනස් කළා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එතකොට මේක හැදුවේ කවුද? ඔබතුමා කියනවා, වෙනස් කළාය කියලා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඕනෑම පනත් කෙටුම්පතක් හැදුවාට පස්සේ, අපි හැම කෙනාටම කන් දීලා එය වෙනස් කරනවා. එය අලුත් දෙයක් නොවෙයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
බොහොම ස්තුතියි. ඇත්තටම මේ පනත් කෙටුම්පත හැදුවේ මෙතුමන්ලා නොවෙයි. මේ පනත් කෙටුම්පත පරිවර්තනය කළේ ඔබතුමන්ලායි. මෙය හැදුවේ සානා රට සඳහායි. IMF එකෙන් සානා රට සඳහායි මේ පනත් කෙටුම්පත හැදුවේ. ඊට පස්සේ ඔබතුමන්ලාට මෙය ඉදිරිපත් කළා. සානා රටට ගැළපෙන්නේ නැති දේවල් ටික - [බාධා කිරීමක්] ලොකු දෙයක්. අපි එය අගය කරනවා. සානා රටට ගැළපෙන දේ ලංකාවට නොගැළපෙනවාය කියා හිතලා, අවසාන මොහොතේදී හෝ එය වෙනස් කරන්න එකඟ වනවා නම් එය හොඳ දෙයක් නේ. අපි එයට එකඟ වනවා. සානා රටට ගැළපෙන දේ ලංකාවට ගැළපෙන්නේ නැත්නම්, එය වෙනස් කරන්න ඔබතුමන්ලා කල්පනා කරනවා නම් එය හොඳ දෙයක්.

විශේෂයෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් යම්කිසි ප්‍රමාණයක් ඉවත් කර තිබෙනවා. සානා රටට ගැළපෙන දේවල් ලංකාවට නොගැළපෙනවාය කියන පදනමින් හෝ ඔබතුමන්ලාත් යම්කිසි ප්‍රමාණයක් ඉවත් කර තිබෙනවා. නමුත් මෙහි තිබෙන තත්ත්වය තවදුරටත් බරපතළ නිසා අපි සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම අපි කියනවා, මෙම පනත් කෙටුම්පත ශ්‍රී ලංකාව අරමුණු කරගෙන සකස් කරපු පනත් කෙටුම්පතක් නොවෙයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ - IMF එකේ - ණය වාරික වෙනුවෙන් සකස් කර තිබෙන පනත් කෙටුම්පතක් කියලා. ඒ කාරණය තමයි මේ පනත් කෙටුම්පතේ තිබෙන ප්‍රධාන දේ.

ඊළඟට, විශාල වශයෙන් තිබෙන්නේ දැන් ඔබතුමා මූලික වශයෙන් කියපු දේ තමයි. ඍජු බදු ප්‍රමාණය වැඩි කරන්න ඕනෑය, වක්‍ර බදු ප්‍රමාණය තමයි සියයට 82ක් වෙලා තිබෙන්නේ කියලා ඔබතුමා කිව්වා. හැබැයි අපි දන්නවා, මේ කථාව අපි අද ඊයේ අහන දෙයක් නොවෙයි කියලා. අය වැය කථාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කලිනුත් නොවැම්බර් මාසයේ 05වන දා රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයා මේ පාර්ලිමේන්තුවට වෙනම ආර්ථික ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් කිව්වා, මේ අනුපාතය 60 : 40 වශයෙන් අඩු කරන්න ඕනෑය කියලා. නමුත් 60 : 40 වශයෙන් අඩු කරනවාය කිව්වත්, අදත් ඒ අනුපාතය 82 :18 කියලා ඔබතුමාට කියන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ වෙනස කිරීම සඳහා ඔබතුමන්ලා අය වැයෙන් සුපිරි මන්දිර බද්ද හඳුන්වා දුන්නා, කැසිනෝ බද්ද හඳුන්වා දුන්නා. කැසිනෝ ආයතනයක් සඳහා එක් වරක් පමණක් ගෙවන රුපියල් මිලියන 1,000ක බද්දක් හඳුන්වා දුන්නා. නමුත් ඒවා ක්‍රියාත්මක වුණේ නැහැ. හැබැයි ඔබතුමන්ලා ඒවා ක්‍රියාත්මක කරනවාය කිව්වත් ඒවා ක්‍රියාත්මක නොකර අය වැය තුළින් ඉදිරිපත් කළ වක්‍ර බදු, VAT යනාදිය ක්‍රියාත්මක කළා. ඒ බදු අය වැයෙන් පස්සේත් ඉදිරිපත් කළා; වරින් වර ඉදිරිපත් කරනවා. දඩ මුදල් සම්බන්ධව වරින් වර ඉදිරිපත් කරනවා. ඔබතුමන්ලා හියක්, සැකක් නැතුව සාමාන්‍ය ජනතාවට බලපාන බදු සඳහා සංශෝධන පාර්ලිමේන්තුවට ගෙනෙනවා. හැබැයි ඔබතුමන්ලා ඒක වහන්න, ඒක ටිකක් සුමට කරන්න, ඒකට ජනතා විරෝධයක් එන එක වළක්වන්න කියනවා, "අපි සුපිරි බද්ද පනවනවා, ප්‍රාග්ධන බද්ද පනවනවා, කැසිනෝ බද්ද පනවනවා"යි කියලා. හැබැයි ඒ බදු ක්‍රියාත්මක වුණේ නැහැ. අය වැයෙන් යෝජනා කළා, PAYE taxවල සීමාව රුපියල් 7,50,000 සිට රුපියල් 12,50,000 දක්වා වෙනස් කරනවාය කියලා. නමුත් ඒවා ක්‍රියාත්මක කළේ නැහැ.

සාමාන්‍ය රජයේ සේවකයාට, ව්‍යාපාරිකයින්ට, පරිපාලන සේවයේ ඉන්න අයට, පෞද්ගලික අංශයේ වැඩ කරන අයට බලපාන ඒවා වෙනස් වුණේ නැහැ. එම නිසා තමයි මෙම කාරණයේදී අපි ඉතාම පැහැදිලිව සිතන්නේ මේ පනත් කෙටුම්පත අද සකස් කර තිබෙන්නේ හුස්ම ගන්න හැම කෙනෙක්ම බදු ගෙවිය යුතුය කියන පදනමේන්ය කියන එක. ඒ වාගේම ඔබතුමන්ලා අදත් කියනවා, අපි ඍජු බදු තමයි වැඩි කරන්නේ කියා. ඒ වාගේම ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉතා පැහැදිලිව කිව්වා, "මේ රටේ පවුල් ලක්ෂ 51ක් ඉන්නවා." කියා. පවුල් ලක්ෂ 51 ඇතුළේ ජීවත් වෙන ජනතාවගේ ස්වභාවය මොකක්ද? ඒ ජනතාවගේ ජනගහනයෙන් සියයට 43ක් -ආසන්න වශයෙන් පවුල් ලක්ෂ දහයක්, දොළහක් අතර ප්‍රමාණයක්- දවසකට ඩොලර් 2කට වඩා උපයන්නේ නැහැ. ඒකත් අගමැතිතුමාම කියනවා. ඒකත් ඔබතුමන්ලා විවිධ අවස්ථාවලදී පුනරුච්චාරණය කරනවා. ආසන්න වශයෙන් ඩොලරයක් රුපියල් එකසිය පණස්පහ හැටියට ගත්තොත් දවසකට රුපියල් තුන්සිය විස්සක් උපයන්නේ නැති පවුල් ලක්ෂ දහයකට දොළහකට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. කල්පනා කර බලන්න. එතකොට ඒ අයත් බදු ගෙවන අය හැටියට badge එකක් පැළඳ ගන්න ඕනෑය කියා ඔබතුමා හිතනවා නම්, ඒක නොවෙයි වෙන්න ඕනෑ. කල්පනා

කර බලන්න. එම නිසා මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරනවා. පනත් කෙටුම්පතේ 42 වන පිටුව බලන්න. මම උදාහරණ විතරයි මේ ගන්නේ. අපිට සංශෝධනවලදී තව කථා කරන්න පුළුවන්. මෙහි 42 වැනි පිටුවේ තිබෙනවා, "මරණය සිදුවීමේ දී වත්කම් පැවරීම" ගැන.

"45. 44වන වගන්තියට යටත්ව, යම් පුද්ගලයකු විසින් මරණය සිදු වීමේ දී වත්කමක හිමිකාරිත්වය වෙනත් තැනැත්තකු වෙත පැවරීම මගින් වත්කමක් උපලබ්ධි කරන අවස්ථාවක දී -" ආදී වශයෙන් සඳහන් වෙනවා. මේ නීතිමය භාෂාවෙන් එළියට ඇවිත් මෙහි අදහස ගත්තොත්, පරම්පරාවෙන් තමන්ගේ පවුලෙන් දේපළ පවරනවා. තාත්තාගෙන් පුතාලාට දේපළ පවරනවා. මිය ගියාට පස්සේ දේපළ පැවරෙනවා. දැවැද්දට දේවල් දෙනවා. තෑගි හැටියට දේවල් දෙනවා. මේ පනත් කෙටුම්පත අනුව ගත්තොත් - ඔබතුමා පසුව නිදහසේ මේ ගැන සිතා බලන්න. - දැවැද්දටත් බදු අය කරනවා. තාත්තාගේ මරණයෙන් පස්සේ දරුවන්ට පැවරෙන දේපළවලටත් බදු අය කෙරෙනවා. බදු අය කරන්නට පුළුවන් දේවල් හැටියට ඔබතුමා යෝජනා කර තිබෙන දේවල් මෙයට එකතු කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි ගරු ඇමතිතුමනි. මම ඔබතුමාට ඉදිරිපත් කරනවා ජනතාවට කලින් ලැබිච්ච, අද මේ පනතෙන් හැලුණු, බදු නිදහස් වීම් මොනවාද කියා. ඒ කියන්නේ, මේ පනත් කෙටුම්පතේ බදු නිදහසක් නැත කියන එකෙන් අදහස් වෙන්නේ, කලින් ලැබුණු දේවල්, කලින් සංශෝධනය වෙච්ච දේවල් අහිමි වෙලා තිබෙනවාය කියන එකයි. ඒවා තමයි අපි සංශෝධන 66ක් හැටියට ඉදිරිපත් කරන්නේ.

වරලත් ගණකාධිකාරී ආයතනයේ ලාභාංශවලින් හා පොලීවලින් ලැබෙන ලාභ හා ආදායම නොවන ලාභ මත ආදායම, ලංකා පුස්තකාල සේවා මණ්ඩලයේ ලාභ හා ආදායම් ලාභාංශවලින් ලැබෙන පොලී සහ ලාභ ආදායම නොවන ලාභ, විශ්වවිද්‍යාල ලාභාංශ හා පොලීවලින් ලැබෙන ආදායම් නොවන ලාභ හා ආදායම් මත කලින් බදු නිදහසක් තිබුණා, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතින්. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීම් පනතින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් වෙනුවෙන් ලැබුණු, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාවට ලැබෙන ලාභ නොවන ආදායම්වලින් බදු නිදහස තිබුණා. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලාභාංශවලින් හා පොලීවලින් ලැබෙන ලාභ හා ආදායම් නොවන ලාභ හා ආදායම් මත බදු නිදහසක් තිබුණා. ඔවුන්ට අද ඒක අහිමි වෙලා තිබෙනවා. ආයුර්වේද වෛද්‍ය සභාව, ශ්‍රී ලංකා කායික වෛද්‍යවරුන්ගේ සංගමය, ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනය, ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාළි විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා මුද්‍රණායතනය, ශ්‍රී ලංකා සමුපකාර සංවර්ධන අරමුදලේ ලාභාංශ ආදායම් නොවන පොලී, ජාතික ආරක්ෂක අරමුදල පනතින් පිහිටුවන ලද ජාතික ආරක්ෂක අරමුදලේ ලාභාංශ හා පොලීවලින් ලැබෙන ආදායම, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය, ශ්‍රී ලංකා මිනින්දෝරුවරයන්ගේ ආයතනය, ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනය, ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය, කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ලාභාංශවලින් හා පොලීවලින් ලැබෙන ආදායම් නොවන ආදායම, බුද්ධශාසන අරමුදල පනතින් පිහිට වූ ආදායම්, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ලාභංශ නොවන ආදායම්වලින් ලැබෙන ලාභ හා ආදායම, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ලැබෙන ආදායම, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ළමා ආරක්ෂණ අධිකාරිය. ඒ වාගේම රජයේ ආධාර ලබන පෞද්ගලික පාසල්.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, Semi-Government Schools හැටියට පවත්වා ගෙන පෞද්ගලික පාසල් තිබෙන බව. ඒ, රජයේ ආධාර ලබන රජය අනුමත පාසල්. උදාහරණ හැටියට ගත්තොත් මියුසියස් විද්‍යාලය, Trinity College වාගේ ආයතන ආදායම් බද්දට අයත් වුණේ නැහැ. එම ආයතන මීට කලින් බදු නිදහසක් ලැබුවා. ටවර්හෝල් රඟහල පදනමත්, මධ්‍යම සංස්කෘතික අරමුදලත් මීට කලින් බදු නිදහස ලැබූ ආයතන. අද මේ පනත් කෙටුම්පත යටතේ එම ආයතන බදු නිදහස අහිමි වන ආයතන බවට පත්වනවා. එම නිසා තමයි අපි කියන්නේ බදු නිදහස් කළ ආයතන යටතට සංශෝධන තුළින් එම ආයතන එන්න ඕනෑය කියලා.

ඊළඟට, ශ්‍රී ලංකාවෙන් පිට රට ගිය කෙනෙකු යම් තක්සේරු වර්ෂයක් තුළදී පිට රට රැකියාවක් කරලා විදෙශ්ගත සේවා නියුක්තිකයෙකු හැටියට ඔහුගේ භාර්යාවට, පවුලට එවන ආදායම මීට කලින් දේශීය ආදායම් පනත යටතේ බදුවලින් නිදහස් වුණා. නමුත්, ඒක අද-

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
පළමු ඩොලර් ලක්ෂය බද්දෙන් නිදහස්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අපි බලමු, එය සංශෝධනවල තිබෙනවාද කියලා.

ඊළඟට, අපේ රටින් ගිහිල්ලා පිට රටවල වෘත්තික සේවාවන් සපයන අය ඉන්නවා. ඉංජිනේරුවරු, වෛද්‍යවරු, ගණකාධිකාරිවරු හැටියට විදේශවල වෘත්තික සේවා සපයන අය ලබන ආදායම ආදායම් බද්දෙන් නිදහස් කරනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Cricketersලා?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔව්, cricketersලාත් අයිතියි. Cricketersලා වෘත්තිකයෝ හැටියට කටයුතු කරනවා නම්, ඔවුනුත් අයිතියි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මන්ත්‍රීතුමනි, වෘත්තීයවේදීන්ගේ ආදායම ඩොලර් ලක්ෂයක් වන තෙක් නිදහස් කරලා තිබෙන්නේ. නමුත්, මැද පෙරදිග රටවල වැඩ කරන අයට කිසිම බද්දක් පනවා නැහැ. මේ පනත් කෙටුම්පත අපි සංශෝධනය කරලා තිබෙන්නේ. ඔවුන්ට කිසිම බද්දක් පනවා නැහැ, ඒ අයගේ ආදායම මේ රටට එවන්න පුළුවන්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අපි කියන්නේ මේ ඉදිරිපත් කරපු පනත් කෙටුම්පතේ ඉවත් කරපු දේවල්-

ගරු කබීර් හාෂීම් මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு கபீர் ஹாஷீம் - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Public Enterprise Development)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, what is your point of Order?

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පෞද්ගලික පාසල්වලින් බදු අය කිරීම් පිළිබඳව ප්‍රකාශයක් කළා. මා දැනගන්න කැමැතියි, ජනතා විමුක්ති පෙරමුණ පෞද්ගලික පාසල් ප්‍රතිපත්තියට එකඟද කියලා. ඔබතුමන්ලා දැන් ඉල්ලනවා, පෞද්ගලික පාසල් බදුවලින් නිදහස් කරන්න කියලා. ඒක හොඳයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමා සඳහන් කළ කරුණ සම්පූර්ණයෙන් වැරදියි. මෙතැනදී අපි නිශ්චිත ලෙස කිව්වේ රාජ්‍ය ආධාර ලබන; රජයේ සාමූහික දායකත්වයක් තිබෙන පාසල් සම්බන්ධයෙන්. ඇත්තටම පාසල් පද්ධතියක් හැටියට ගත්තොත් එම පාසල්වල වියදමින් විශාල ප්‍රමාණයක් රජය දරන්නේ. අන්න ඒ ආයතනවලට රජයෙන් පඩි ගෙවනවා. ඒ ආයතන බද්දට යටත් කරන්න එපා කියන එකයි අපි කිව්වේ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Minister.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මේ පනත් කෙටුම්පත තුළින් විශේෂයෙන්ම මරණයකදී මිය ගිය තැනැත්තාගේ දේපළ පැවරීම බද්දට යටත් නොවේ. ලේ ඥාතීන් වෙත පැවරෙන දේපළ ප්‍රාග්ධන බද්දට යටත් නොවේ. ඒ වාගේම විශ්වවිද්‍යාල ආදායමත් බද්දට යටත් නොවේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒවා සංශෝධන හැටියට එනවා නම්, හොඳයි. නමුත්, දැන් ඔබතුමන්ලා පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරලා තිබෙනවා නේ? ඒ පනත් කෙටුම්පතේ නිදහස් කිරීම් කියලා ජනාධිපතිතුමාගේ වැටුපත් තිබෙනවා. ජනාධිපතිතුමාගේ වැටුපත් බදුවලින් නිදහස් කරලා තිබෙනවා. ඒ පිළිබඳව බොහොම සැලකිල්ලෙන් ඔබතුමන්ලා කල්පනා කරලා තිබෙනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
එතුමා එපා කිව්වා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නැහැ, නැහැ, මම කියන තෙක් ඔහොම ඉන්න. එතුමා එපා කියන එක වෙනම කථාවක්. මේ පනත් කෙටුම්පතේ නිදහස් කිරීම් යටතේ ජනාධිපතිතුමාගේ සේවා නියුක්ති වැටුප බද්දෙන් නිදහස් කරලා තිබෙනවා. ඒ ගැන බොහොම සැලකිලිමත් වූ ඔබතුමන්ලාට විශ්වවිද්‍යාල ආදායම අමතක වුණා. දැන් අපි මතක් කරන කොට, "ආ, ඒක මෙහෙමයි." කියනවා. ඔබතුමන්ලාට පිට රට වැඩ කරන අය අමතක වෙනවා. ඔබතුමන්ලා එක වෙලාවකට මේ අයට "රට විරුවෝ" කියලා කියනවා. ඒක නිසා ඉතා පැහැදිලිව මේ දේවල් අපි කියනකොට ඔබතුමන්ලා නින්දෙන් ඇහැරිලා වාගේ මේ දේවල් මතක් වෙලා, "හා, ඒක සංශෝධනයක්." කියලා කියනවා. හැබැයි, ඔබතුමන්ලා ජනාධිපතිතුමාගේ වැටුප මතක් කරලාම බද්දෙන් නිදහස් කරනවා. ඒක මේ පනත් කෙටුම්පතේ පළමුවෙනි නිදහස් කිරීම හැටියට තිබෙනවා.

ඊළඟට, පුණ්‍ය ආයතන. දැන් මේ පිළිබඳව දිගින් දිගට සංවාදයක් තිබුණා නේ? දැන් ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙන් සංශෝධනයක් කරනවා කියලා කියනවා නම්, ප්‍රශ්නයක් නැහැ. පුණ්‍ය ආයතන හැටියට තිබෙන ආයතනවලට මීට කලින් බදු සහනයන් තිබුණා.

මොකද, ඒවා ව්‍යාපාරික නොවන ආදායම් හැටියට ලබන දේවල්. එම නිසා ඒවාට බදු නිදහසක් තිබුණා. හැබැයි, මේ පනත් කෙටුම්පතේ ඒක නිදහස් කර නැහැ. ඒ විතරක් නොවෙයි, තව දෙයක් තිබෙනවා. ඔබතුමන්ලා මෙම පනත් කෙටුම්පතේ "තැනැත්තා" යන්න ගැන අර්ථ නිරූපණවලට මීට කලින් පනතේ නොතිබුණු දෙයක් ඇතුළත් කර තිබෙනවා. ඒක තමයි, පුණ්‍යායතනත් තැනැත්තා යන්නට ඇතුළත් කර තිබීම. එතකොට "පුණ්‍යායතනය" කියන එක "තැනැත්තා" වන්නේ කොහොමද? එහෙම අවස්ථාවකදී ආගමික ස්ථානයකට කවුරු හෝ කෙනෙක් දෙන දෙයක්, ඒ තැනැත්තා පුණ්‍යායතනයක් වෙන කොට ඒක ආගමික ස්ථානයක ඉන්න ප්‍රධානියාගේ ආදායමක් ලෙස සලකලා ඔහුට බදු පනවන්න පුළුවන්. මම වැරදි නම් නිවැරදි කරන්න, ගරු ඇමතිතුමනි. මෙම පනත් කෙටුම්පත් සඳහන් "තැනැත්තා" යන්න ගැන තිබෙන අර්ථ නිරූපණය බලන්න. ඒ අනුව, පුණ්‍යායතනයක්ද තැනැත්තා වේ. එතකොට වන්නේ මොකක්ද? ඒ, පූජකතුමෙක් වෙන්න පුළුවන්, හාමුදුරුනමක් වෙන්න පුළුවන්. හාමුදුරුවෝ පුණ්‍යායතනයක් වෙනවා. අහවල් හාමුදුරුවන්ගේ නමට බදු ෆයිල් එකක් එවන්න පුළුවන්. ඇයි, "තැනැත්තාද පුණ්‍යායතනයක් වේ" කියා නේ කියන්නේ. ඒක මොකටද දමා තිබෙන්නේ? කලින් පනතක නොතිබුණු දෙයක් නේ ඒක. ඒකෙන් ඔබතුමන්ලා බලාපොරොත්තු වන්නේ මොකක්ද? පන්සලට ලැබෙන ආදායම නායක හාමුදුරුවන්ගේ ආදායම ලෙස සලකා බදු පනවන්න පුළුවන් කියන එකයි. ඔබතුමන්ලාගේ පදනම හරි. ඒක තමයි, "හුස්ම ගන්නෝ සියල්ලෝ බදු ගෙවන්නෝය" කියන එක. ඒ පදනමින් ගත්තොත්, හාමුදුරුවෝ අදාළත් නැහැ; පිනට දෙන එක අදාළත් නැහැ; ඒවාට බදු පනවන්න පුළුවන්. එම කාරණය මේ පනත් කෙටුම්පතේ තිබෙනවා.

විශ්වවිද්‍යාලයක, පාඨශාලාවක හෝ වෙනත් අධ්‍යාපනික ආයතනයක ඉගෙනීම ලබන තැනැත්තකුට ශිෂ්‍යත්වයකින්, ආධාර ශිෂ්‍යත්වයකින් හෝ අධ්‍යාපන පරිත්‍යාගයකින් ලැබෙන ආදායමක් පවා මේකට යටත් කර තිබෙනවා. විශ්වවිද්‍යාල පවත්වාගෙන යන්න ශිෂ්‍යත්ව අරමුදලකින් පරිත්‍යාගයක් හම්බ වෙනවා. ඔබතුමන්ලා ඒක ආදායමක් හැටියට ගන්නවා. ඒක ආදායමක් හැටියට ගණන් ගන්න කියා මෙම පනත් කෙටුම්පතේ සඳහන් කර තිබෙනවා.

ඊළඟට බලන්න, රන්, මැණික් හෝ ස්වර්ණාභරණ අපනයනය කිරීමෙන් ලබන ආදායම් සම්බන්ධයෙන් සඳහන් දෙය. මහා පරිමාණයෙන් මේ කර්මාන්ත කරන අය නොවෙයි මේවායේ ඉන්නේ කියා අප දන්නවා. ගම්වල බොහොම අමාරුවෙන්

කර්මාන්ත කරගෙන යන අය තමයි ඉන්නේ. ඒ, අදටත් "වැට්" ගෙවන අය; සාමාන්‍ය මිනිසුන්. යම් තැනැත්තකු විසින් යම් පර්යේෂණයක් කරලා, එය නව නිර්මාණයක් කියා පිළිගත්තොත්, ඒ වෙනුවෙන් ඔහුට තෑග්ගක්, ප්‍රදානයක් ලැබුණොත්, එය මුදලක් නම් එම ත්‍යාග මුදල ඔබතුමන්ලා බද්දට යටත් කරනවා. මේවා මීට කලින් නිදහස් වුණු ඒවා. ජනාධිපතිවරයා විසින් ප්‍රදානයක්, තෑග්ගක් දුන්නොත්, ජනාධිපති අරමුදලින් තෑග්ගක් දුන්නොත්, ඔබතුමන්ලා ඒක මේ බද්දට යටත් කර තිබෙනවා. ඒකත් මීට කලින් නිදහස් කර තිබුණු දෙයක්. මම මේ කියන්නේ මීට කලින් නිදහස් කර තිබුණු ඒවා ගැනයි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
බොහෝ දේ අපි බද්දෙන් නිදහස් කරනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔව්, ජනාධිපති අරමුදලින් ලැබෙන දේවල් ඔබතුමන්ලාට බද්දට යටත් කරන්න බැහැ.

ඊළඟට විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතින් විදේශ සේවා නියුක්ති කාර්යාංශ නියෝජ්‍යායතන ව්‍යාපාරයක් පවත්වාගෙන යන කෙනෙක් හැටියට බලපත්‍ර ලබා තිබෙන කෙනෙක්; ඒ එක තැනැත්තකුට ගෙවන ලද මුදලක් මත ඔබතුමන්ලාට බදු අය කරන්න බැහැ කියා කලින් නිදහසක් තිබුණා. නමුත් එයත් දැන් මේකෙන් බද්දට යටත් කර තිබෙනවා. ඒ වාගේම සාහිත්‍ය, කලා, ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරු විසින් ඒ කලා හා සාහිත්‍ය කටයුතුවලට සහ ක්‍රීඩාවලට රුපියල් ලක්ෂය නොඉක්මවන්නා වූ යම් මුදලක්, තෑග්ගක්, පරිත්‍යාගයක්, ආධාරයක් හැටියට කෙනෙකුට දුන්නොත්, ඒකට මීට කලින් බදු නිදහසක් තිබුණා. ඔබතුමන්ලා අද එය බද්දට යටත් කර තිබෙනවා. යම් තැනැත්තෙක් විසින් පළ කළ පොතක් විකිණීමෙන් උපචිත වුණු ආදායමකදී, ඒ පොත ප්‍රකාශයට පත් කරන ග්‍රන්ථ ප්‍රකාශකයන්ට මෙතෙක් බදු නිදහසක් තිබුණා. අද ඒක බද්දට යටත් වෙලා තිබෙනවා. නාට්‍යයක් නිෂ්පාදනය කළා නම් ඒ නිෂ්පාදනය කරන නාට්‍යය පළමු රඟදැක්වීමෙන් ගතවන අවුරුද්දක් ඇතුළත සියයට 50ක බදු සහනයක් තිබුණා. දැන් ඒකත් බද්දට යටත් වෙලා තිබෙනවා. ගීතයක් නිර්මාණය කරන කෙනෙක්, ගායකයෙක්, තනු නිර්මාණකරුවෙක්, සංගීතඥයෙක් තමන්ගේ නිර්මාණය මත යම් බදු සහනයක් ලැබුවා නම්, අද ඒකත් බද්දට යට වෙලා තිබෙනවා. මම මේකෙන් කියන අදහස වෙන මොකක්වත් නොවෙයි. හැම කෙනෙක්ම, හැම කලාපයක්ම, හැම පදාසයක්ම ඔබතුමන්ලා මේ ක්‍රියාවලිය ඇතුළේ බදුවලට යටත් කිරීමට ලක් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒක හොඳටම පේනවා.

ඔබතුමන්ලා මේ බදු පනවන ක්‍රියාවලියේදී ඉවත් කළ යුතු සංශෝධන ප්‍රමාණයක් අප ඉදිරිපත් කරනවා. ඒ ඉවත් කළ යුතු කරුණු දිහා බැලුවාම මේ කාරණය තවත් පැහැදිලියි. ජනතාවට, කලාකරුවන්ට, ක්‍රීඩකයන්ට, ඉගෙන ගන්නා අයට, අධ්‍යාපන ආයතනවලට, රටේ බුද්ධිමය දේපළ වශයෙන් තිබෙන විවිධ ආයතනවලට යම් කිසි සහනයක්, නිදහසක් මෙතෙක් ලැබුණා නම්, ඒකත් බද්දට යටත් වන ආකාරයට තමයි ඔබතුමන්ලා මේ පනත් කෙටුම්පත හදලා තිබෙන්නේ. ඔබතුමන්ලාගේ පදනම අනුව ඒක හරි. මොකක්ද, ඒ පදනම? ඒ, "සියලුදෙනා බදු ගිවිය යුත්තෝ ය" කියන එක.

ඊළඟට තිබෙනවා, බරපතළ කාරණා කිහිපයක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ කාරණා ඔබතුමාගේ අවධානයට යොමු කරවන්න ඕනෑ. මේ පනත් කෙටුම්පතේ 196 වන පිටුවේ ඔබතුමන්ලා "සමාගම" යන්න අර්ථ නිරූපණය කරලා තිබෙන්නේ කොහොමද? මම හිතන විධියට මීට කලින් තිබුණු අර්ථ නිරූපණයට වඩා මෙහි යම් කිසි වෙනසක් තිබෙනවා. සමාගමක්, "සමාගම්" යටතේ තමයි බදුවලට යටත් වන්නේ. පනත් කෙටුම්පතේ 196වන පිටුවේ මෙසේ සඳහන් වනවා:

> "යම් මිත්‍රශීලී සමිතියක්, ගොඩනැගිලි සමිතියක්, විශ්‍රාම වැටුප් අරමුදලක්, අර්ථ සාධක අරමුදලක්, විශ්‍රාම ගැනීමේ අරමුදලක්, විශ්‍රාමික පාරිතෝෂික අරමුදලක් හෝ ඒ හා සමාන අරමුදලක් හෝ සමිතියක්"

ගරු ඇමතිතුමනි, "යම් මිත්‍රශීලී සමිතියක්" කියන්නේ මොකක්ද කියලා මට කියන්න. අපේ මංගල සමරවීර ඇමතිතුමාගේ දිස්ත්‍රික්කයේ තමයි මමත් ඉන්නේ. ඒ, මාතර දිස්ත්‍රික්කය. අපේ දිස්ත්‍රික්කයේ තිබෙනවා, මිතුරු හවුල්. නේද, ගරු මංගල සමරවීර ඇමතිතුමනි? මාතර දිස්ත්‍රික්කයේ බොහෝ පාරවල මිතුරු හවුල් තිබෙනවා නේ. මාතර දිස්ත්‍රික්කයේ එක එක පාරවල ඉන්න අය එකතු වෙලා හදා ගත්ත එක එක මිතුරු හවුල් තිබෙනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔව්. ඒ අය සීට්ටුත් දමනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔව්. ඒ වාගේ ඒවා තිබෙනවා. ඒවාට කියන්නේ, "මිත්‍රශීලී සමිති" කියලායි. ඔබතුමා දන්නවාද, මේ පනත් කෙටුම්පත අනුව ඒ සමිතියත් සමාගමක් වෙනවාය කියලා? "සමාගම" යන්න අර්ථ නිරූපණය කරලා තිබෙනවා, "යම් මිත්‍රශීලී සමිතියක්" යනුවෙන්. ඒ කියන්නේ ඔබතුමා නියෝජනය කරන, මා නියෝජනය කරන මාතර දිස්ත්‍රික්කයේ ගමේ පාරක පවුල් දහයක් එකතු වෙලා සමිතියක් හැදුවොත්,-

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඒකේ ආදායම තිබෙන්න ඕනෑ,-

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක තමයි, ඒක "සමාගම්" කියන ගොඩට දමන්නේ ඇයි? මිතුරු හවුලක්, මිත්‍රශීලී සමිතියක්, ගමේ සමිතියක් සමාගමක් බවට පත් කරන්නේ ඇයි? එතකොට වෙන්නේ මොකක්ද? සමාගම් යටතේ ඒ සමිතියට බදු පනවලා ඒකෙන් ආදායමක් ලබනවා. ඒක තමයි මේ කරන්න හදන්නේ. ඒක බරපතළයි. මීට කලින් එහෙම දෙයක් තිබුණේ නැහැ.

ඊළඟට, මෙම පනත් කෙටුම්පතේ 201 වන පිටුවේ සඳහන්ව තිබෙන "ආයෝජනය" පිළිබඳව මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. "ආයෝජනය" කියන කොට අපට තේරෙනවා. හැබැයි, "ආයෝජනය" යන්න මෙතැන දක්වා තිබෙන්නේ මේ ආකාරයටයි:

> "සමාන ස්වභාවයෙන් යුතු හෝ ඒකීකරණය කරන ලද ආකාරයකින් භාවිත කරනු ලබන වත්කම් එකක් හෝ වැඩි ප්‍රමාණයක් අයිතිව සිටීම..."

තේරෙන භාෂාවෙන් කියනවා නම් මේ කියා තිබෙන්නේ මොකක්ද කියලා දන්නවාද? එක සමාන වත්කම් දෙකක් තිබුණොත්, දෙවන වත්කම ඔබතුමන්ලා ආයෝජනයක් හැටියට

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

සලකනවා කියන එකයි. එතකොට ඒ වත්කමට බදු පනවන්නේ, "ආයෝජන" පදනමෙන්. ගරු ඇමතිතුමාට තේරෙනවාද? දේපළ දෙකක් තිබෙනවා නම්, ඉඩම් දෙකක් තිබෙනවා නම්, දෙවන ඉඩම ඔබතුමන්ලා සලකන්නේ, මොකක් හැටියටද? ආයෝජනයක් හැටියට. අපි හිතමු, රත්තරන් මාල දෙකක් තිබෙනවා කියලා. දෙවන මාලය ඔබතුමන්ලා සලකනවා, වත්කමක් නොවෙයි, ආයෝජනයක් හැටියට. [බාධා කිරීමක්] ඉන්න කෝ, ඉන්න කෝ, ඔබතුමා කියවලා නැහැ නේ. මම මේ කියවලායි කථා කරන්නේ. [බාධා කිරීමක්] නැහැ, කමක් නැහැ. ඔබතුමා මගේ වෙලාව කන්න එපා. දෙවන වත්කම ආයෝජනයක් හැටියට සලකනවා. "එක සමාන ස්වභාවයෙන් යුතු වත්කම් එකක් හෝ වැඩි ප්‍රමාණයක් අයිතිව සිටීම" කියලායි තිබෙන්නේ. එතකොට දෙවන වත්කම මොකක්ද? ආයෝජනයක්. එතකොට ඔබතුමන්ලා ඒකට බදු පනවන්නේ මොන පදනමෙන්ද? "අයෝජන" පදනමෙන්. ඒක සාධාරණද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හොඳයි.

අන්න ඒ නිසා මේ කරුණු සංශෝධනය වෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මම තව එක කාරණාවක් කියන්න ඕනෑ, "ස්වභාවික සම්පත්" අර්ථ නිරූපණය ගැන. ගරු ඇමතිතුමනි, මේ පනත් කෙටුම්පතේ 7 වන පිටුවේ මෙසේ සඳහන්ව තිබෙනවා:

"ලාභාංශ, පොලී, වට්ටම්, අයකිරීම්, වාර්ෂිකයන්, ස්වාභාවික සම්පත් ගෙවුම්, කුලී, අධිමිල හා රාජ්‍ය භාග"

මේවා තමයි තක්සේරු වර්ෂයක ආයෝජන ආදායම. ආයෝජන ආදායමට ගැනෙනවා, "ස්වභාවික සම්පත් ගෙවුම්" කියන එකත්. ස්වාභාවික සම්පත් ගෙවුම් කියන එක ඔබතුමන්ලා අර්ථ නිරූපණය කරලා තිබෙන්නේ කොහොමද? අර්ථ නිරූපණවල බලන්න. ඔබතුමන්ලා දේශීය ආදායම් පනත් කෙටුම්පතේ "ස්වාභාවික සම්පත් ගෙවුම්" කියන එක මේ ආකාරයට අර්ථ නිරූපණය කර තිබෙනවා:

" "ස්වාභාවික සම්පත් ගෙවුම්" යන්නෙන් ගොඩබිමෙන් හෝ මුහුදෙන් ලබා ගන්නා ලද ස්වාභාවික සම්පත්වල ප්‍රමාණය හෝ වටිනාකම සම්බන්ධව සමස්ත ලෙස හෝ කොටසක් ලෙස

ගණනය කරනු ලැබූ, ගොඩබිමෙන් හෝ මුහුදෙන් ස්වාභාවික සම්පත් ලබා ගැනීමේ අයිතිය සඳහා වූ වාරික හෝ සමාන මුදල් ප්‍රමාණයක් ඇතුළු, යම් ගෙවීමක් අදහස් වේ;"

මේක ටිකක් විපරීත වෙයි, මේ විධියට කියන කොට. මේක ආයෝජන ආදායම යටතට එන්නේ. ඔබතුමන්ලා ආයෝජන අදායමේ කොටසක් හැටියට ගන්නවා, ස්වාභාවික සම්පත් ගෙවුම් කියන එක. ඒ කියන්නේ, ස්වාභාවික සම්පත් කියන එකත් කොටසක් හැටියට අරගෙන ඒක ආයෝජන ආදායමක් බවට පත් කළා නම් ආදායම් බද්දට යටත් කරනවා කියලා. මම මේක සරලව හා තේරෙන්න උදාහරණයකින් කිව්වොත් මෙහෙමයි. මේ මැතකදී කරුණාරත්න පරණවිතාන නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා නේ, "වල් අලි වැඩියි. වල් අලි පිට රටවලට විකුණන්න ඕනෑ" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා එහෙම කිව්වා නේ. අන්න එතකොට වල් අලියා ස්වාභාවික සම්පතක් නම්, වල් අලියා පිට රටකට හෝ එහෙම නැත්නම් කොහේට හරි විකුණුවොත් ඒක ආයෝජන අදායමක් හැටියට ගන්නයි මේ යන්නේ.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான -திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Skills Development and Vocational Training)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, what is your point of Order?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම මේ උදාහරණයක් හැටියට විතරයි කිව්වේ.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කරමින් කියූ කාරණය ගැන කිව යුතුයි.

ගරු මන්ත්‍රීතුමනි, මම ඉතාම වැදගත් විෂයයකට අදාළවයි ඒ කාරණය කථා කළේ. ඔය කාරණාව සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ Adjournment Debate එකක් තමුන්නාන්සේලා හෝ සූදානම් කළොත්, කථා කරන්න මම කැමැතියි. එම නිසා, කරුණාකරලා ඒ කාරණාව මෙම මාතෘකාවට සම්බන්ධ කර ගන්න එපා කියලා මා කියනවා. මොකද, ඉතාම වැදගත් ප්‍රශ්නයක් ගැන කථා කරගෙන යන වෙලාවක ඒවා පිළිබඳ වැරදි අර්ථකථන ඇති වෙන්න හොඳ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා කියන්න උත්සාහ කළේ ඔබතුමා මතු කළ කාරණාව නොවෙයි. ස්වාභාවික සම්පත් යෙදවුම් කියන එක ගත්තොත්, ස්වභාව ධර්මයේ තිබෙන කොටසක් අරගෙන ආයෝජන ආදායමක් හැටියට සලකා

ඔබතුමන්ලාට පුළුවන් ඒක බද්දකට යටත් කරන්න. එතකොට ඒ ගන්න ආදායම -ජනනය කරන ආයෝජන ආදායම- සතෙක්ගෙන් වෙන්නත් පුළුවන්. ඒකයි මම මේ කිව්වේ. එම නිසා මේක බරපතළයි.

ඇත්තටම මේ පනත් කෙටුම්පත අපේ රටේ ව්‍යවස්ථාවට වැඩිය ලොකුයි. මේ පනත් කෙටුම්පත බරපතළයි. එම නිසා මම ඔබතුමන්ලාට කියනවා, මේක සානාවට අදාළ වෙන්න පුළුවන්; IMF එකේ ණය මුදල ගන්න අදාළ වෙන්න පුළුවන්. හැබැයි, මේක අපේ රටේ හුස්ම ගන්න හැම මිනිහෙක්ම, හැම කෙනෙක්ම අදාළ කරන පනත් කෙටුම්පතක්. ඒක නිසා මේක බරපතළ පනත් කෙටුම්පතක්. මේ ගැන පක්ෂ භේදයෙන් යුතුව හිතන්න එපා. ගරු ඇමතිතුමනි, මම හිතන හැටියට ඔබතුමා බලාපොරොත්තු වන බිලියන 45 මේ පනත් කෙටුම්පතෙන් ගන්න බැහැ. එහෙම නම් අපි ඔබතුමාට මෙසේ යෝජනා කරනවා.

අද ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් සමාගමේ පාඩුව බිලියන 169යි. ඔබතුමා බලාපොරොත්තු වෙන්නේ බිලියන 45යි. අද ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනයේ ඉන්නවා මාසයකට රුපියල් ලක්ෂ 10කට වඩා පඩි ගන්න 190දෙනෙක්. එහෙම තිබෙද්දී, රාජ්‍ය ආයතනයේ පාඩුව බිලියන 169ක්. පාර්ලිමේන්තුවේදී අපි ඒ ගැන සාකච්ඡා කරමු. අන්න සල්ලි හොයන ක්‍රම. අද රටේ හොරකම් කරන තරම හොයන්න. වංචා කරන තරම හොයන්න. නාස්ති කරන තරම හොයන්න. ඒවායින් ආදායම් ගන්න. හොරුන්ගෙන් අය කර ගන්න. හැබැයි, රටේ අහිංසක මිනිසුන්ගෙන් අය කර ගන්න එපා.

අද මේ පනත් කෙටුම්පතට අත ඔසවලා පාර්ලිමේන්තුවේදී සම්මත කරන තමුන්නාන්සේලා හැම කෙනෙක්ම මේ රටේ හුස්ම ගන්න හැම මිනිහාගෙන්ම බදු අය කරන පදනමකට යනවා. හොරකම් කරන අයගෙන් බදු අය කරන්න. නාස්ති කරන අයගෙන් බදු අය කරන්න. රටේ මුදල් කන අයගෙන් බදු අය කරන්න. හැබැයි, රටේ අහිංසක ජනතාවගෙන් බදු ගන්න එපා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට කියනවා මේ පනත් කෙටුම්පත මේ සංශෝධනවලින් විතරක් වුණත් නිවැරදි කරන්න බැහැ කියලා. ඔබතුමා හෘදය සාක්ෂියක් ඇතිව දේශපාලනය කරන කෙනෙක්. අද මේ පනත් කෙටුම්පත සම්මත කරන කටයුත්තට ඔබතුමා දායක වෙන්නේ අතරමැදින්. හැබැයි, කවදා හෝ දවසකදී -

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මම අතරමැදින් දායක වූ කෙනෙක් නොවෙයි. මම සම්පූර්ණ දායකත්වය භාර ගන්නවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා මේ පනත් කෙටුම්පත හැදුවේ නැහැ නේ. දේශීය ආදායම් පනත් කෙටුම්පත හදන වෙලාවේ ඔබතුමා මුදල් ඇමතිවරයා නොවෙයි නේ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ආදායම් බදුවලට ඔච්චර භය වෙන්න එපා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නැහැ. මේ පනත් කෙටුම්පත බරපතළයි. එම නිසා, මේ පනත් කෙටුම්පතට අපේ විරෝධය පළ කරනවා. ගරු ඇමතිතුමනි, අපි ඉදිරිපත් කළ සංශෝධන පිළිගන්න කියා ඉල්ලා සිටිමින් මා නවතිනවා. බොහොම ස්තුතියි.

[11.40a.m.]

ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு மலிக் சமரவிக்ரம - அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)
Mr. Deputy Chairman of Committees, as we all know, the existing Inland Revenue Act is an outdated Act that had gone through many amendments. It is complex, difficult to understand and implement.

The Sri Lankan economy has transformed our country from a low-income country to a middle-income country. As in the case of many legislative enactments, the existing Inland Revenue Act too has evolved over four decades or more and stands outdated. Even the principal enactment of 2006 has gone through nine Amendments by now. Those were piecemeal Amendments, which were made to address the issues and concerns that arose under different circumstances without any holistic review or appreciation of possible implications. Thus, the Act itself has become very complex, difficult to understand and confusing. It has also created loopholes and opportunities for many to escape the tax net, thereby creating a very unfair playing field.

As a result, Sri Lanka lags behind its peers in Ease of Doing Business in view of the existence of a very complex tax law. This has made tax payment very difficult, costly and time-consuming. Both local and foreign businesses find the Inland Revenue Act a serious impediment that requires immediate change. The new Inland Revenue Bill looks at the issue of taxation from a novel and modern perspective and meeting the current status of our economy. It is simple, easy to understand and encourages compliance by all rational taxpayers.

Another major concern is the gradual and consistent deterioration of Government revenue in Sri Lanka, which is falling way behind compared with the peer economies. There is also a serious disparity between the direct and indirect proportions which stand at 20:80 ratio today. While Government revenue is consistently dropping, the expenditure has consistently grown, thus creating an inevitable deficit with cascading implications to the economy. It is a vicious cycle and we must stop this and resurrect the situation.

Thus, the new Inland Revenue Bill looks at the entire tax code in a holistic manner with the multiple objective of reducing the unfair proportionality between direct and indirect taxes. Our aim is to move towards a 60:40 ratio by 2020, increasing the tax base and thereby increasing the tax revenue. The simplification of the tax code will not only make it easy to understand, but will also result in better compliance and enhanced administrative efficiency. The new Inland Revenue Bill and the RAMIS will undoubtedly improve efficiency of the tax authorities remarkably. The RAMIS, without a cleaner, clearer and a simplified tax code, would have been a non-starter and a disaster, wasting colossal amounts of public money.

[ගරු මලික් සමරවික්‍ර මහතා]

The principal features aimed at achieving overall increase in tax collection, better compliance and administrative efficiency are; simplification through reduction of sources of income - the sources of income which are currently divided into eight areas have been reduced to four main sources, thus simplifying the computation of tax. Then removing the imbalance in revenue collection through the introduction of the Capital Gain Tax - the introduction of the Capital Gain Tax subject to certain exemptions to capture high-value transactions will remove the imbalance in revenue collection by taxing the rich. Such taxes were not levied in the past, allowing capital formation within the local economy and the Government is now of the view that it is the right time to introduce such taxes to remove the unfair imbalance.

Since the appreciation in the value of capital, in the form of shares in companies or land and buildings, is largely due to improvement in economic fundamentals for which the Government spends considerable funds year-on -year, there is justification to tax part of that gain as income tax for the greater benefit of the people.

The tax exemptions and incentives in the current law have evolved over the years and were not targeted towards the increased economic development. As a result, most incentives and exemptions are being misused resulting in a significant loss of revenue to the Government and creating a non-level playing field. Taking this into account, the proposed Bill grants income tax exemptions in the form of investment allowance and accelerated depreciation allowances so that genuine investments will be entitled to incentives based on the quantum of their investment.

The multitude of tax rates prevailing in the current law have been rationalized into a three band income tax structure of 28 per cent standard Corporate Income Tax, 14 per cent for thrust industries and a 40 per cent of higher rate for liquor, tobacco and gaming. Having three rates will simplify the imposition of tax and tax administration and makes it easier for taxpayers to comply. Thrust industries will include export of goods and services, education and culture, IT and software development, BPOs and the SME sector which will be entitled to a low rate of 14 per cent.

Even in these sectors, new investors will not have to pay any taxes until their investment is fully recovered. The IT sector will have concessions based on the employment created and the gem and jewellery industry will have the same concessions as at present.

Removing exemptions and incentives in the current law will enhance revenue for the Government and facilitate increased public expenditure for capital and recurrent expenditure and welfare, particularly education and health services.

The proposed Inland Revenue Bill is comparable with international best standards and practices so that foreign investors will find it easier to understand and comply thus improving Sri Lanka's standing in the ease of doing business index.

The strict anti-avoidance sections introduced in the new Bill compared to the current law should discourage non-compliance and increase the tax net.

The administrative provisions such as return filing, payment and the appeals process in the proposed Bill are far simpler than those in the existing Act, so that the administration of the Inland Revenue Department is more efficient and the resources can be diverted to providing a better service to the taxpayers and increased revenue collection.

As mentioned by the Opposition, charitable institutions are not taxed under the proposed Bill in accordance with the provisions of the previous law. Therefore, temples, churches, mosques and other religious institutions will not have to pay income tax under the proposed Bill.

Overall, the proposed new Bill is far simpler from the standpoint of the taxpayers, will increase the tax base, make the administration of the Inland Revenue Department more efficient and will increase Government revenue collection. From another perspective, the simplification and international compatibility of the proposed Bill will enable the requisite legislative environment for Sri Lanka to encourage private investments, including enhanced FDI and achieve a rapid growth that it deserves to have. An efficient and effective tax code is a dire necessity for the vision of the Government to transform our economy to a competitive social market economy with a prosperous future for the nation.

Sir, we must compliment the Hon. Minister of Finance and his officials for consulting the private sector as well in introducing this new Inland Revenue Bill.

Thank you.

[පූ.භා. 11.50]

ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමනි, දේශීය ආදායම් පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය අවස්ථාවේ යම් අදහසක් දැක්වීමට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා.

2006 වසරෙන්, වසර 11ට පසුව මේ රටේ දේශීය ආදායම් පනත් කෙටුම්පතක් ගෙනෙන අවස්ථාවක් බවට මේ අවස්ථාව පත් වෙලා තිබෙනවා. හිටපු ජනාධිපතිතුමා විසින් 2009 වසරේ ජනාධිපති බදු කොමිසමක් පත් කළා. හැබැයි, ඒ බදු කොමිසමේ නිර්දේශ මොනවාද කියලා අපි මේ වන තුරු දන්නේ නැහැ. ඒකට මොකද වෙලා තිබෙන්නේ කියලා කවුරුවත් දන්නේ නැහැ. මට මතක හැටියට ආචාර්ය ජයන්ත කැලේගම මැතිතුමා ඇතුළු පිරිසක් තමයි එම බදු කොමිසමේ සිටියේ.

සාමාන්‍යයෙන් අලුත් බදු පනතක් ගෙනෙන්න කලින් බදු කොමිසමක් පත් කරලා, එම කොමිසමේ යෝජනා, අදහස් අරගෙන ක්‍රියාමාර්ගයකට යන එක තමයි කළ යුත්තේ. නමුත්, ඒක සිද්ධ වුණේ නැති නිසා 2009 වසරේ පත් කළ ජනාධිපති බදු කොමිසමෙන් ප්‍රයෝජනයක් නැතිව ගියා. ඒ නිසා අවුරුදු 11ට පසුව නව බදු පනත් කෙටුම්පතක් ගෙන ඒම වැදගත් කරුණක් වෙලා තිබෙනවා. මුදල් ඇමැතිවරයා එක් එක් ව්‍යාපාරිකයන්ට, විටින් විට විවිධ බදු සහන ලබා දුන් අවස්ථා පිළිබඳ අපට මතකයි. මුදල් ඇමැතිවරයා විසින් එක් එක් ව්‍යාපාරිකයන්ට -තමන්ගේ ගජ මිතුරන්ට, යහළු මිත්‍රයන්ට, අලුත් ආයෝජකයන්ට- තනි තනිව බදු සහන දුන්න ක්‍රියාදාමය අද මේ පනත් කෙටුම්පතෙන් අහෝසි කරලා තිබෙනවා. ඒ අනුව ස්ථාවර බදු වැඩ පිළිවෙළක් මේ පනත් කෙටුම්පත තුළ අන්තර්ගත වෙලා තිබෙනවාය කියලා මම කියන්න කැමැතියි.

මෙම පනත් කෙටුම්පත තුළින් අමාත්‍යවරයාට කලින් ලබා දී තිබූ බලය සම්පූර්ණයෙන් ඉවත් කරගෙන තිබෙනවා. එය විශාල වැදගත්කමක් තිබෙන කාරණයක්. මම මේ පනත් කෙටුම්පතේ තිබෙන තවත් කාරණා කිහිපයක් පෙන්වා දෙන්න කැමැතියි. අද මේ පනත් කෙටුම්පතට සංශෝධන විශාල ප්‍රමාණයක් ගෙනැත් තිබෙනවා. ඒ පිළිබඳව එතුමාටත්, නියෝජ්‍ය ඇමැතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. මෙම පනත් කෙටුම්පතේ තිබෙන්නා වූ කරුණු පිළිබඳ විශාල කතිකාවතක් පසු ගිය කාලයේ මේ රටේ ඇති වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට අපි, අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත්, ගරු මුදල් ඇමැතිතුමාටත් කරුණු දක්වලා, මෙම පනත් කෙටුම්පතේ තිබුණු ගැටලු විශාල ප්‍රමාණයක් අද වන විට නිරාකරණය කරලා තිබෙනවා. ප්‍රධාන සංශෝධන 23ට අමතරව, තවත් සංශෝධන 100ට වැඩි ප්‍රමාණයක් ගෙන ඒම තුළින් සමාජයේ සාකච්ඡා වුණු කාරණා පිළිබඳව ගරු මුදල් ඇමැතිතුමා ඉතාම නිවැරදි ලෙස තීන්දු අරගෙන තිබෙනවාය කියලා අපට පෙනී යනවා.

ඒ විතරක් නොවෙයි, එතුමා බොහොම සහනදායි විධියට, ඉතාම මිත්‍රශීලී ලෙස මේ සංශෝධන දෙස බලලා තිබෙනවා. ඒ ගැන එතුමාට මගේ ස්තුතිය, ගෞරවය පුද කරනවා. එතුමා කියන දේ අහගෙන ඉන්න ඇමැතිවරයකු විධියට මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ප්‍රායෝගිකව අපි යමක් කිව්වාම, එය තේරුම් අරගෙන, ඔළුව පහත් කරලා, ඒකට යම් සහනයක් ලබා දෙන ඇමැතිවරයෙක් නිසායි මම එතුමාට ගරු කරන්නේ. සමහර හිටපු ඇමැතිවරුන්ට අපි යමක් කිව්වාට, ඒ අයගේ ඔළුවේ තිබෙන දේ ක්‍රියාත්මක කරනවා මිස අනෙක් කාරණා ගැන ඒ අය කල්පනා කරන්නේ නැහැ. හැබැයි, මේ පනත් කෙටුම්පතේ ප්‍රශ්න කිහිපයක් තිබෙන බව මම කියන්න කැමැතියි. ඒ අනුව, මෙහි තිබෙන ප්‍රශ්න ගණනාවක් මම ඔබතුමාට පැහැදිලි කරලා දෙන්න කැමැතියි. මෙහි 100 (1) වගන්තිය යටතේ ඇමැතිවරයාට බලය ලබා දීමේ ක්‍රියාදාමයක් තිබෙනවා. ඔබතුමා සිටියදී නම් මෙය ප්‍රශ්නයක් වෙන්නේ නැහැ කියලා මම කියන්න කැමැතියි. නමුත් ඉදිරියට පත් වෙන ඇමැතිවරයා කවුද කියලා අපි දන්නේ නැහැ නේ. 100 (1) වගන්තිය යටතේ ඇමැතිවරයාට යම් කිසි විධියකට බලයක් ලැබෙන්න පුළුවන්. එහි මේ විධියට සඳහන් වෙනවා. "දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය සිදු කිරීමේ ක්‍රියාවලියකදී සහ එකී අධීක්ෂණය සිදු කරගෙන යෑමේ කාර්යය සඳහා මුල්‍ය විෂයය භාර අමාත්‍යවරයාට" යනුවෙන්.

ඊළඟට තිබෙනවා, "රාජකාරිමය කටයුතු කිරීමේ කාර්යය සඳහා එකී අනාවරණය කිරීම අවශ්‍ය වීම මත පමණක් විගණකාධිපතිවරයාට හෝ විගණකාධිපතිවරයා විසින් බලය පවරන ලද යම් තැනැත්තකුට" යනුවෙන්. පරණ පනතේ -2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ- 209. (12) දරන Section එකෙන් මුදල් අමාත්‍යවරයාට හෝ ලේකම්වරයාට මෙහි බලය ලබා ගැනීම, නැත්නම් තොරතුරු පරීක්ෂා කිරීම පිළිබඳ බලයක් තිබුණේ නැහැ. නමුත්, මේ පනත් කෙටුම්පතේ ඒක ඇතුළත් කරලා තිබෙනවා. බදු ගෙවීම සම්බන්ධව තිබෙන ප්‍රශ්නගත කාරණයක් බවට මෙය පත් වෙනවා. මොකද, මුදල් ඇමැතිවරයාට ඕනෑම file එකක් ගෙන්වලා පරීක්ෂා කිරීමේ අයිතිය තිබෙන නිසා. මේක ඉතාම වැරැදි ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බලපාන්න පුළුවන්.

ඒ නිසා ඒකට යම් සංශෝධනයක් ගෙනාවොත් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, මේකෙන් මුදල් ඇමතිවරයාට පුළුවන්, ඕනෑම කොම්පැනියක් ගැන කියලා ඒ කොම්පැනියට බදු ගහන්නත්, මේ කොම්පැනියට බදු ගහන්න එපා කියලා කියන්නත්. මම උදාහරණයක් කියන්නම්. පසුගිය කාලයේ "පීච් වැලි" කියන ආයතනය සම්බන්ධයෙන් මේ වගේ තත්ත්වයක් ඇති වුණා. ඒ ආයතනය ගෙවිය යුතුව තිබුණු බදු මුදල ගන්න හදපු කොමසාරිස්වරයාව එම ස්ථානයෙන් මාරු කළා. ඔහුව මාරු කරලා, එම ප්‍රශ්නගත ආයතනයෙන් බදු අය නොකර සිටීමට තරම් අදාළ අමාත්‍යවරයා පෙළඹවීමකට ලක්වුණා. අනාගතයේත් මේ වගේ කාරණා සිද්ධවෙන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, ඔබතුමා යටතේ නොවෙයි, වෙන ඕනෑම කෙනෙක් යටතේ මේක සිද්ධවෙන්න පුළුවන්. ඒ නිසා කරුණාකරලා මේ ක්‍රියාදාමය මේකෙන් ඉවත් කරන්න කියන ගෞරවනීය ඉල්ලීම මම ඔබතුමාගෙන් කරන්න කැමැතියි. ඒ වාගේම පුණ්‍ය ආයතන සඳහා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ තිබෙන බදු නිදහස,-

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Sir, I rise to a point of Order.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ කාලය එතුමන්ලාගෙන් අඩු කරන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ කාරණාවට අදාළව අපිත් සංශෝධනයක් ගෙනැල්ලා තිබෙනවා. ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමනි, ඔබතුමාත් එම ඉල්ලීම ඉදිරිපත් කරනවා නම්, මුදල් විෂය භාර අමාත්‍යවරයා තොරතුරු ලබා ගැනීමට අදාළව තිබෙන කොටස එම වගන්තියෙන් ඉවත් කරන්න කියලා අපි කරන ඉල්ලීමට ඔබතුමාටත් එකඟතාවකට එන්න පුළුවන් වෙයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බොහොම ස්තුතියි.

පුණ්‍ය ආයතන සඳහා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත මඟින් බදු නිදහසක් ලබාදී තිබෙන බව මම කියන්න කැමැතියි. විශේෂයෙන්ම බුද්ධ ශාසන අරමුදල, ඒ වාගේම දළදා මාලිගාවේ පෙරහැර, ඊළඟට කැලණිය විහාරයේ පෙරහැර, කතරගම පෙරහැර, ඒ සියල්ලම බදු අය කරන ගණයට ඇතුළත්

[ගරු දයාසිරි ජයසේකර මහතා]

වෙනවා. ඒක කාටවත් නවත්වන්න බැහැ. ගරු ඉරාන් වික්‍රමරත්න නියෝජ්‍ය ඇමතිතුමා මේ සඳහා යම් විසඳුමක් ලබාදෙයි කියා අපි විශ්වාස කරනවා. එතුමායි, මුදල් ඇමතිතුමායි මාත් එක්ක කථා කළා. මේවා කොහොම අර්ථ නිරූපණය කරනවාද කියලා මම දන්නේ නැහැ. නීතිඥයකු විධියට මම කියන්න කැමැතියි, මේ පනත් කෙටුම්පතේ 68. (3) යටතේ බොහොම පැහැදිලිව මෙසේ කියා තිබෙනවා:

"යම් පුණ්‍ය ආයතනයක් විසින් යම් තක්සේරු වර්ෂයක් තුළ දී රෝගීන් හෝ දුප්පතුන් සඳහා ආයතනගත රැකවරණයක් සලසන අවස්ථාවක දී සහ ..."

එතකොට ඒ අවස්ථාවේ විතරයි, පුණ්‍ය ආයතනවලින් බදු අය කළ යුතුද, නැද්ද කියන තීරණය ගන්න කොමසාරිස් ජනරාල්වරයාට යම් අභිමතයක් තිබෙන්නේ. අනෙක් සියල්ලම මේකට අයිති වෙනවා. එම නිසා අඩුම තරමින් මේ ක්‍රියාදාමය අහෝසි කිරීම සඳහා කරුණාකරලා ඔබතුමන්ලාගේ මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛනයක් මඟින් හෝ එම ආයතනවලින් බදු අය කිරීම සම්බන්ධයෙන් යම් සීමාවක් පනවන වැඩ පිළිවෙළක් සකස් කළොත් හොඳයි කියන කාරණය මම කියන්න කැමැතියි. නැත්නම්, මේක මේ පනත ඇතුළට හදිසියේ ඇතුළත් කරන්න බැරිවෙයි. ඒ නිසා කරුණාකරලා ඒ සඳහා වැඩ පිළිවෙළක් යොදන්න කියලා මම ඉල්ලනවා.

විශේෂයෙන්ම කලින් පනතේ තිබුණා, ආගම, සංස්කෘතිය, අධ්‍යාපනය ප්‍රවර්ධනය වෙනුවෙන් දරන වියදම් සියල්ල බද්දෙන් නිදහස් කියලා. නමුත්, මේකෙදී ඒවා සඳහාත් බදු ඇතුළත් කරලා තිබෙනවා. ඒවා ඇතුළත් කිරීමේ යම් හොඳකුත් තිබෙනවා. හැබැයි, මම කියන්න කැමැතියි, නිවැරදිව පුණ්‍ය ආයතන ලෙස ක්‍රියා කරන ආයතනවලින් බදු එකතු කිරීමෙන් යම් ප්‍රශ්නයක් ඇතිවෙන්න පුළුවන් බව.

ඒ වාගේම මෙහි 122වැනි වගන්තිය ගැනත් කියන්න ඕනෑ. එක පැත්තකින් බදු එකතු කරන නිලධාරීන්ට ඔබතුමන්ලා විශාල බලයක් දීලා තිබෙනවා. මේ පනත් කෙටුම්පත මඟින් ආදායම් බදු දෙපාර්තමේන්තුවට විශාල බලයක් ලැබී තිබෙනවා. එසේ ලැබෙන බලය 122 වගන්තිය නිසා යම් කිසි විධියකට සීමා වෙනවා. 122 වගන්තිය යටතේ බොහොම පැහැදිලිව මෙසේ කියා තිබෙනවා:

"122. (1) බලයලත් නිලධරයෙකුට, පූර්ව දැනුම්දීමකින් තොරව, බලයලත් කාර්යයක් සඳහා,

(අ) සාමාන්‍ය ව්‍යාපාරික වේලාවල් අතර දී; හෝ

(ආ) ඒ අවස්ථාවේ ඇතුළුවීමට ඇති අවශ්‍යතාවය පෙන්වා දීමෙන්, කොමසාරිස් ජනරාල්වරයාගේ ඉල්ලීම මත මහෙස්ත්‍රාත්වරයකු විසින් ලිඛිතව බලය දුන් යම් වේලාවක,

ව්‍යාපාර පරිශ්‍රයකට හෝ මහජනයාට විවෘත වෙනත් පරිශ්‍රයකට ඇතුළු විය හැකි ය."

මේකෙන් මොකක්ද කියන්නේ? මම දන්නේ නැහැ, කවුරු මේවා ඇතුළත් කළාද කියලා. මොකද හේතුව, ඕනෑම තැනකට ගිහිල්ලා පරීක්ෂා කරලා බද්ද අයකර ගැනීම සඳහා වන ක්‍රියාදාමයකට යන්න බදු නිලධාරියාට අයිතියක් තිබෙන්නට ඕනෑ. හැබැයි, මෙතැනදී කරලා තිබෙන්නේ මොකක්ද? වරෙන්තුවක් අරගෙන පොලීසිය පුද්ගලයෙක් අත් අඩංගුවට ගන්න යනවා වාගේ ක්‍රියාදාමයක් මේ පනත් කෙටුම්පත තුළට ඇතුළත් කර තිබෙනවා. එතකොට මොකද වෙන්නේ? කිසිම වෙලාවක වරෙන්තුවක් ගන්න හම්බවෙන්නේ නැහැ. මොකද, මහෙස්ත්‍රාත්වරයා ළඟට ගිහිල්ලා වරෙන්තුව ඉල්ලපු ගමන්, මහෙස්ත්‍රාත්වරයා විසින් තොරතුරු ටික ඉල්ලනවා. "කොහේද කඩේ තිබෙන්නේ? කාගේද මේ කඩේ? මේ කොම්පැනිය කාගෙද? ඒ සම්බන්ධයෙන් file එකේ තිබෙන තොරතුරු මොනවාද" කියලා අහනවා. ඒ file එකේ තොරතුරු සියල්ලම දුන්නාට පස්සේ බදු ගෙවන මිනිහා දන්නවා, ඒකෙන් මඟහරින්නේ කොහොමද කියලා. බදු ගෙවීම පැහැර හරින මිනිහා පැහැදිලිවම ඒකෙන් ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් තමයි මේ සිද්ධවෙලා තිබෙන්නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පියන් call එකක් දෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පියන් call එකක් දීලා කිව්වාම හරි. එතකොට ඒ ටික හංගන්න ඔහුට හැකියාවක් තිබෙනවා. එම නිසා කරුණාකරලා මෙහි තිබෙන 122 වගන්තිය සම්පූර්ණයෙන්ම ඉවත් කරන්න කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා.

අනෙක් කාරණය තමයි, Clause 18. නව ව්‍යාපාරිකයෙකු බිහිවීම. මේ පනත් කෙටුම්පත ගෙනාපු අය කවුද කියලා මම දන්නේ නැහැ. මම ඒකයි මුල ඉඳලාම කිව්වේ, සානාවෙන් ගෙනාපු එකක් මේ ගොල්ලෝ කොපි කරලා ගෙනැල්ලා තිබෙන්නේ කියලා. මම ඒකට විරුද්ධයි. මම මුල ඉඳලාම මේක කිව්වා. ඒත් ඇහුවේ නැහැ. හැබැයි, මම කියන්න කැමැතියි, Clause 18වලින් නව ව්‍යාපාරිකයෙකු, ආයෝජකයකු බිහිවීම සම්පූර්ණයෙන් නතර වන තැනට පත්වෙලා තිබෙන බව.

කලින් පනතේ 25, 26, 32 වගන්තිවලින් අලුතින් එන ව්‍යාපාරිකයකුට යම් ශක්තියක් දෙන වැඩ පිළිවෙළක් තිබුණා. දැන් මේකේ මොකක්ද තිබෙන්නේ? රුපියල් ලක්ෂ 10ක් තිබෙන පුද්ගලයකු රුපියල් ලක්ෂ 20ක ණයක් ගත්තොත්, ඒ ලක්ෂ 20න් ලක්ෂ 10කට බදු අය කරනවා. ආයෝජනයටත් බදු අය කරන වැඩ පිළිවෙළකුයි මේ සිද්ධ කරන්නේ. රුපියල් ලක්ෂ 10ක් තිබෙන මනුෂ්‍යයකු බැංකුවකින් රුපියල් ලක්ෂ 20ක ණයක් ගත්තොත්, අර තමන්ගේ අතේ තිබෙන මුදලේ ප්‍රමාණයට අමතරව තිබෙන මුදලට බදු අය කිරීමේ වැඩ පිළිවෙළකුයි මේ තිබෙන්නේ. ඉතින් මේක-

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, ඉස්සර ඉඩක් තිබුණා, ණයවල පොලිය ආදායම් බද්දෙන් අඩු කරන්න. දැන් ඒක නැති කර තිබෙනවා. ණයවලට පොලිය ගෙව්වාම ඒක ආදායම් බද්දට ගන්නවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉස්සර තිබුණා. දැන් ඒක නැති කර තිබෙනවා. මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාත්, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ නිලධාරීනුත් අද මෙහි පැමිණ සිටිනවා. ඉස්සර ණය පොලිය ආදායම් බද්දට යටත් කළේ නැහැ. ඒ නිසා ණය පොලිය ආදායම් බද්දට යටත් කරන ක්‍රියාදාමය අයින් කරන්න කියලයි මා යෝජනා කරන්නේ. එතකොට තමයි අලුත් ආයෝජකයන් බිහි වන්නේ. අපි දැන් මහා පරිමාණ ව්‍යාපෘති අරගෙන එනවා, කුඩා පරිමාණ ව්‍යාපෘති අරගෙන එනවා, කුඩා ව්‍යාපාරිකයන් නඟා සිටුවීමේ වැඩ පිළිවෙළවල් අරගෙන එනවා. හැබැයි, මේ ගෙනෙන වැඩ පිළිවෙළවල් අපිම -ආණ්ඩුවම- ගෙනෙන මේ පනත් කෙටුම්පතේ මේ අදාළ Clause එක තුළ විශාල අර්බුදයකට ලක් වෙනවා. ඒ නිසා අපි කියන්නේ ආණ්ඩුවක් විධියට අලුත් ව්‍යාපාරිකයන්ට බිහි වීමට තිබෙන

අයිතිවාසිකම, අවස්ථාව වැඩි කරන ගමන් මෙවැනි වැඩ පිළිවෙළකුත් සකස් කරන්න කියන එකයි.

ඒ විතරක් නොවෙයි. ස්වාභාවික සම්පත් පිළිබඳව ගත්තොත්, ඒ සම්බන්ධයෙන් මේ බදු අදාළ වන ආකාරය මේ පනත් කෙටුම්පතේ 195 වගන්තිය යටතේ බොහොම පැහැදිලිව නිර්වචනය කර තිබෙනවා. මුහුදෙන් හෝ ගොඩබිමෙන් ගන්නා වූ සියලුම සම්පත් මේකට අයත් වනවා. ඒ කියන්නේ, "natural resources" කිව්වාම මේ සියල්ලම අයිති වෙනවා. සමහර වෙලාවට විපක්ෂයේ ඉන්න අපේ ආදරණීය සහෝදරවරු කියන්න පුළුවන්, මාළු ටිකක් ඇල්ලුවත් ඒ මාළු ටිකටත් ආණ්ඩුව බදු ගහන්නයි මේ හදන්නේ කියලා. අර ගමේ තිබෙන කුඩා ජලාශවල මිරිදිය මාළු ඇල්ලුවත් ඒකටත් බදු ගහනවා කියලා කියාවි. ඒ නිසා කරුණාකර, මේ ගැන- [බාධා කිරීමක්] ඒක කිව්වාද? ඒ නිසා ඒ ගැන අපි පොඩ්ඩක් පරිස්සම් වුණොත් හොඳයි කියලා මා ගරු ඇමතිතුමාට යෝජනා කරන්න කැමැතියි.

ඊට අමතරව 195 වගන්තිය යටතේ සඳහන් වන investments ගැනත් ප්‍රශ්නයක් තිබෙනවා. මේක ගැන අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාත් කිව්වා. 195 වගන්තිය යටතේ කියන්නේ, එක හා සමාන වත්කම් දෙකක් තිබෙනවා නම් එකක් ආයෝජනයක් වනවා කියලයි. ඒ නිසා තමයි අපේ හිටපු ජනාධිපතිතුමාත් කිව්වේ, වළලු දෙකෙන් එක වළල්ලක් ආයෝජනය වෙනවා කියලා. ඒක නොවෙන විධියට යම් කිසි වැඩ පිළිවෙළක් හදන්න වෙවි. නැත්නම් ඇතැම් අය මේවා වෙනත් විධියකට පාවිච්චි කරනවා. ඇත්තටම මේ බදු පනත් කෙටුම්පතේ තිබෙන හොඳ කාරණා සියල්ල යටපත් වෙන්න මේ වාගේ එක කාරණයක් ඇති. ඒ නිසා කරුණාකර, මේ සම්බන්ධව අපි වැඩ පිළිවෙළක් සකස් කරමු. ආයෝජනය මත බදු පැනවීම නතර කරලා මේකෙදී ආයෝජනය ආදායම් ප්‍රභවයක් ලෙස සලකන්න පුළුවන් නම් හොඳයි. එතකොට ආදායම් ප්‍රභවයකට අය කරන බද්දක් විධියට මේ බද්ද අය කරන්න පුළුවන්. ආයෝජනය ආදායම් ප්‍රභවයක් ලෙස සලකා බදු අය කරනවා නම් මෙය යම් කිසි විධියකට සමනය කර ගන්න පුළුවන් කියලා මා විශ්වාස කරනවා. ඒ වාගේම එය සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ලාභාංශය මත බද්දක් විධියට සකස් කරන්න පුළුවන් නම්, ආයෝජන ආදායමේ ලාභාංශය මත කරන බදු අය කිරීමක් විධියට මෙය ක්‍රියාත්මක කරන්න පුළුවන් කියලා මා විශ්වාස කරනවා.

සහනාධාර නිදහස් ලේඛනයකට ඇතුළත් කරන්න පුළුවන් නම් හොඳයි. එහෙම නැත්නම් ඔබතුමන්ලා, අපි සාකච්ඡා කළා වාගේ යම් කිසි විධියකට මේ සම්බන්ධයෙන් වෙනයම් ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන් නම් එය ඉතාම හොඳයි. මොකද, කෘෂිකර්මාන්තය මත සියයට 14ක බද්දක් අය කර තිබෙනවා. ලංකාවේ කෘෂිකර්මය වර්ධනය කරන්න ඕනෑ වෙලාවක ඒකට සියයට 14ක බද්දක් ගහනවා කියන්නේ ඒක විශාල අර්බුදයක් බවට පත් වෙනවා. ඒ නිසා මා ගෞරවයෙන් කියන්න කැමැතියි, මේක සියයට 10 දක්වාවත් අඩු කරන්නය කියා. එහෙම අඩු කළොත් තමයි අපට කෘෂිකර්මය පිළිබඳව අලුතින් එන ව්‍යාපාරිකයන්ට, ව්‍යවසායකයන්ට කෘෂිකර්මය නංවාලීම සඳහා අවශ්‍ය කරන වැඩ පිළිවෙළ සකස් කරන්න පුළුවන්කම ලැබෙන්නේ.

දැන් ඔබතුමන්ලා RAMIS කියන වැඩ පිළිවෙළ හරහා විශාල වැඩ කොටසක් කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ වැඩ පිළිවෙළ රුපියල් කෝටි 900ක විතර ව්‍යාපෘතියක්. මෙවැනි ව්‍යාපෘතියක් සකස් කරලා දැන් ඒක ක්‍රියාත්මක කරගෙන යන කොට මේ බදු පනත් කෙටුම්පත ගෙන ඒම තුළ එම සමස්ත ක්‍රියාවලියම විනාශ වෙන්න පුළුවන්. අපේ ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වෙනවා, එතුමා එම කමිටුවේ දී අදාළ ආයතන ප්‍රමාණය 33 දක්වා වැඩි කරන්න කියලා උපදෙස් දීලා තිබීම ගැන. එතකොට ආයතන 33කින් කිසිම ප්‍රශ්නයක් නැතිව බදු අය කර ගැනීම සඳහා වන මූලික පරමාර්ථ ටික ඉෂ්ට කර ගන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, ඒ නිසා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අපි අද මේ පනත් කෙටුම්පත සම්මත කළත්, මෙය 2019 අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක කරන්නය කියා. නැත්නම් මේ ව්‍යාපාරිකයන් තමන්ගේ system එක හදා ගන්න බැරිව විශාල අර්බුදයකට පත් වෙවි. අපි බලාපොරොත්තු වන බදු ආදායම ලබා ගන්න බැරිව බදු ආදායම කඩා වැටීමකට ලක් වුණොත් එය ඔබතුමාටත් හොඳ නැහැ; මුදල් අමාත්‍යාංශයටත් හොඳ නැහැ; අප සියලු දෙනාටම විශාල අර්බුදයකට මුහුණ දෙන්න සිදු වෙවි.

ඒ නිසා අද අප මෙය සම්මත කරලා ආදායම් බදු දෙපාර්තමේන්තුවට වැඩ පිළිවෙළ සකස් කර දුන්නොත්, 2019 අප්‍රේල් මාසය වන කොට මේ ක්‍රියා දාමය ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙවි කියා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මා තවත් දෙයක් කියන්න කැමැතියි. මේ ක්‍රියා දාමය ඉතාම හොඳයි. ලංකාවේ පළමුවන වතාවට අප හැම කෙනෙකුම වෙනුවෙන් අඩුම තරමින් ආදායම් බදු ෆයිල් එකක් හදන වැඩ පිළිවෙළක් සකස් කරන්නේ ගරු අමාත්‍යතුමනි. මොකද, එය බදු ගෙවීම සඳහා වන ප්‍රවේශයක් බවට පත් වනවා. මේකට බය වෙන්න දෙයක් නැහැ. හැම කෙනෙකුම ආදායම් බදු ෆයිල් එකක් තිබෙන පුද්ගලයකු බවට පත් වනවා නම්, එක් පැත්තකින් එහි විශාල ගෞරවයක් හිමි වනවා. එවිට "මමත් ආදායම් බදු ගෙවන කෙනෙක්" කියා කියන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ඔබතුමාගෙන් තවත් එක් විනාඩියක කාලයක් ඉල්ලා සිටිනවා. ගරු අමාත්‍යතුමනි, මා ඔබතුමාගෙන් තවත් එක් ඉල්ලීමක් කරන්න කැමැතියි. නිවැරැදිව බදු ගෙවන අය, ඒ වාගේම බදු විශාල ප්‍රමාණයක් රටට ගෙවන අය සිටිනවා. ඒ අය මේ රටට විශාල සේවයක් කරන අය වශයෙන් සලකා ඒ අය වෙනුවෙන් යම්කිසි සහනාදායී වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා ඉල්ලනවා. අඩුම තරමින් ඔවුන් බැංකුවකට ගියාම, එහෙම නැත්නම් වෙනත් ස්ථානයකට ගියාම යම් ඔවුන්ට යම් ප්‍රමුඛතාවක් - priority එකක්- ලැබෙන විධියේ වැඩ පිළිවෙළක් සකස් කරන්න කියා ඉල්ලමින්, ගරු ඇමතිතුමා මේ ක්‍රියා මාර්ගය සඳහා කරපු කැපවීම, දරපු මහන්සිය පිළිබඳව හදවතින්ම ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු දයාසිරි ජයසේකර අමාත්‍යතුමනි, බරපතළ කරුණු හැටියට ඔබතුමා මතු කරපු බොහෝ දේවල් අපි සංශෝධන හැටියට ඉදිරිපත් කර තිබෙනවා. ඔබතුමා ඒ සංශෝධනවලට සහාය දෙනවා නම්, මෙය ඒ විධියට සම්මත කරන්න පුළුවන්. එහෙම නැතිව, ඔය ඔක්කෝම හොඳයි කියා සම්මත කළාට වැඩක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

That is not a point of Order.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

අපි සාධාරණ හැම ඉල්ලීමකටම ඇහුම් කන් දෙනවා. හැබැයි ආදායම් බදු ගෙවන භීතිකාව නැති කරගන්න. මොකද, අපි හැම කෙනෙක්ම පොඩ්ඩක් හරි බදු ගෙවන්න පුරුදු වෙමු. මා තවත් දෙයක් නිවැරදි කරනවා. පෙරහැරවලට බදු ගහනවා කියන කතාව සම්පූර්ණයෙන්ම අසත්‍යයක්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මෙතුමායි එහෙම කිව්වේ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මා පැහැදිලිවම කියනවා, එහෙම එකක් නැහැ කියලා. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

கௌரவ சாள்ஸ் நிர்மலநாதன் அவர்கள்!

[பி.ப. 12.06]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! நன்றி. இன்று இந்த நாட்டுக்குரிய வருமானங்களை அதிகரிக்கும் நோக்கத்தில் நிதியமைச்சினால் வரி அறவீடு தொடர்பான சட்டமூலம் இங்கு முன்வைக்கப்பட்டிருக்கின்றது. நிதியமைச்சர் அவர்கள் அதனை முன்வைத்து உரையாற்றும்போது, வரி எவ்வாறு அறவிடுவது? என்பதுபற்றி மற்றைய நாடுகளுடன் ஒப்பிட்டுக் கூறினார். அதாவது இந்தியா, சிங்கப்பூர் போன்ற நாடுகளில் நேரடியாகவும் மறைமுகமாகவும் எவ்வளவு வரி அறிவிடப்படுகின்றது என்ற விகிதாசாரம் முன்வைக்கப் படுகிறது என்றும் இலங்கையில் அப்படியான ஒரு வரி முறைகளை நடைமுறைப்படுத்த வேண்டும் என்றும் அவர் குறிப்பிட்டார். கௌரவ நிதி அமைச்சர் அவர்கள் முன்னர் வெளிநாட்டமைச்சராக இருந்தவர். அந்த வகையில் அயல் நாடுகளுடன் ஒப்பிட்டு இந்தச் சபையில் அவர் வரி முறைகளை முன்வைக்கின்றபோதிலும், அயல் நாடுகளிலிருக்கின்ற ஆட்சி முறைமையை முன்வைப்பதற்கு நீங்கள் ஏன் தயங்கு கின்றீர்கள்? என்ற விடயத்தை கௌரவ நிதியமைச்சர் அவர்களின் கவனத்திற்குக் கொண்டுவர விரும்புகின்றேன்.

வேறு நாடுகளிலே இருக்கின்ற ஆட்சிமுறைகள், அந்த நாடுகளில் வாழ்கின்ற அனைத்து மக்களும் சமத்துவமாக, கௌரவமாக வாழ்கின்ற வகையில், மக்களால் தெரிவு செய்யப்படுகின்ற பிரதிநிதிகள் தங்களுடைய பிரதேசங்களை நிருவாக ரீதியாகவும் அபிவிருத்தி ரீதியாகவும் முன்கொண்டு செல்லக்கூடிய வகையில் அமைந்திருக்கின்றன. உதாரணமாக, கனடா நாட்டைக் குறிப்பிட விரும்புகின்றேன். அங்கு ஒன்ராறியோ மாநிலம் மட்டும் பிரெஞ்சு மாநிலமாக இருக்கின்றது. மற்ற அனைத்து மாநிலங்களும் ஆங்கில மாநிலங்களாக இருக்கின்றன. ஒரேயொரு மாநிலம் பிரெஞ்சு மாநிலமாக இருந்தாலும், அந்த நாட்டில் வெளியிடப்படுகின்ற அரச திணைக்கள அறிக்கைகள் எல்லாமே இரண்டு மொழிகளிலும் - பிரெஞ்சிலும் ஆங்கிலத்திலும் அமைவதுண்டு. அங்கு எங்கு சென்றாலும் மக்கள் தங்கள் மொழியில் பேசித் தங்களுடைய கருமங்களைச் செய்ய முடியும். ஆனால், இலங்கையில் இருக்கின்ற சில பிரதேச செயலகங்கள் சிங்கள மொழி, தமிழ் ஆகிய இரண்டு மொழிமூலப் பிரதேச செயலகங்களாக இருந்தும், அங்கு தனியாக ஒரு மொழியில் மட்டுமே சகல நிர்வாக நடவடிக்கைகளும் இடம்பெறுகின்றன. குறிப்பாக கொழும்பு திம்பிரிகஸ்யாய பிரதேச செயலகம் இரண்டு மொழிமூலப் பிரதேச செயலகமாக இருக்கின்றது. திம்பிரிகஸ்யாய பிரதேச செயலகத்துக்கு உட்பட்டு 35 வீதமான தமிழ் மக்கள் வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். இருந்தபோதும், அங்கு வருகின்ற தமிழ் மக்களால் தமிழ்மொழியில் பேசி, தமிழ்மொழியில் படிவத்தை நிரப்பித் தங்களுடைய கருமங்களை நிறைவேற்ற முடியாமல் இருக்கின்றது. இந்த நிலைமைகளை கௌரவ நிதியமைச்சர் அவர்களின் கவனத்திற்குக் கொண்டுவர விரும்புகின்றேன்.

அதேவேளை, நேற்றும் அவரது கவனத்துக்கு ஒரு விடயத்தைக் குறிப்பிட்டிருந்தேன். அதாவது, 2016ஆம் ஆண்டு யூன் மாதம் அரச தாதியருக்கான மேலதிக நேரக் கொடுப்பனவு தொடர்பாக நிதியமைச்சால் ஒரு சுற்றுநிருபம் வெளியிடப்பட்டது. அது வெளியிடப்பட்டபோதும், அதன் பிரகாரம் வடக்கு மாகாணத்திலுள்ள அரச தாதியருக்கான மேலதிகக் கொடுப்பனவுகள் இன்றுவரை வழங்கப்படவில்லை. அவர்களுக்கு வழங்கப்படுகின்ற மேலதிக நேரக் கொடுப்பனவுக்குரிய அதிகரிக்கப்பட்ட arrears கடந்த ஒரு வருடமாக வழங்கப்படவில்லை. இந்த நிலையில், 2017ஆம் ஆண்டு யூலை மாதத்திலிருந்து அந்த மேலதிகக் கொடுப்பனவை மற்ற மாகாணங்கள் வழங்குகின்றபோதும் வடக்கு மாகாணத்தால் அதை வழங்க முடியாமல் இருக்கிறது. அதற்குக் காரணம், கௌரவ நிதி அமைச்சருடைய பரிந்துரை வடக்கு மாகாணப் பிரதம செயலாளருக்கு இன்னமும் கிடைக்காமையாகும். இதனை கௌரவ நிதி அமைச்சருடைய கவனத்திற்குக் கொண்டுவருகின்றேன். 2017ஆம் ஆண்டு யூலை மாதத்துக்குப் பிற்பட்ட காலப்பகுதி வரையில் மேலதிகக் கொடுப்பனவுத் தொகையான கிட்டத்தட்ட ஐம்பது மில்லியன் ரூபாய், வடக்கு மாகாண அரச தாதியர்களுக்கு வழங்கப்பட வேண்டியிருக்கிறது. கௌரவ நிதி அமைச்சர் அவர்களே, அந்த ஐம்பது மில்லியன் ரூபாயினை வட மாகாணத்திற்கு வழங்கும்படி உங்களைத் தாழ்மையுடன் கேட்டுக் கொள்கின்றேன். அந்த வகையில், வட மாகாணத்திற்கு இந்த ஐம்பது மில்லியன் ரூபாயினையும் வழங்கத் தாங்கள் முன்மொழிவொன்றை மேற்கொள்ள வேண்டுமென்பதற்காக இந்த விடயத்தை நான் இந்த நேரத்தில் உங்களுடைய கவனத்திற்குக் கொண்டுவருகின்றேன்.

வரிகள் விதிக்கப்படுகின்றபோது வர்த்தகர்களுடைய வர்த்தக நடவடிக்கைகளைப் பாதிக்காதவாறு அவை அமுல்படுத்தப்பட வேண்டும். கௌரவ விளையாட்டுத்துறை அமைச்சர் தயாசிறி ஜயசேகர அவர்கள் அதுபற்றிய

தன்னுடைய கருத்தை முன்வைத்திருந்தார். புதிய வர்த்தகர்கள் தங்களுடைய வியாபார நடவடிக்கைகளை மேற்கொள்ள முன்வர வேண்டும். தற்பொழுது வியாபாரம் செய்கின்ற வர்த்தகர்களுடைய வர்த்தக நடவடிக்கைகள் இந்த வரியின்மூலம் பாதிக்கப்படக்கூடாது. அவர்கள் தொடர்ந்து தங்களுடைய வியாபாரங்களைச் செய்ய வேண்டும். பொதுவாக சாதாரண வர்த்தகர்களுக்குத்தான் இறைவரித் திணைக்களம் சட்டத்தை முழுமையாக நடைமுறைப்படுத்து கின்றது. கடந்த அரசாங்கத்திலும் சரி, தற்போதைய அரசாங்கத்திலும் சரி, குறிப்பிட்ட சில அமைச்சர்கள் தங்களுடைய அமைச்சின்மூலம் செயற்றிட்டங்களை நடைமுறைப்படுத்துவதாகப் பதிவுகள் செய்து பெற்றுக் கொண்ட பணத்தை அல்லது அதற்காக இலஞ்சமாகப் பெற்ற கறுப்புப் பணத்தைத் தற்பொழுது என்ன செய்வதென்று தெரியாமல் சொத்துக்களை வாங்குகின்ற முயற்சியில் ஈடுபடுகின்றார்கள். மக்கள் - வர்த்தகர்கள் வியர்வை சிந்தி உழைத்த பணத்திலிருந்து பெறப்படும் அந்த வரிப்பணத்தை தவறான வழியில் பெற்ற குறிப்பிட்ட சில அமைச்சர்கள் தங்களுடைய சாமர்த்தியத்தால் வருமானங்களைப் பெருக்கி, அந்த வருமானங்களின்மூலம் இன்றும் சொத்துக்களைக் கொள்வனவு செய்துகொண்டிருக்கிறார்கள்.

நான் அண்மையில் யாழ்ப்பாண நகரத்துக்குச் சென்றி ருந்தேன். அப்பொழுது அங்கிருக்கின்ற வர்த்தகர் ஒருவர், தற்பொழுது ஓர் அமைச்சர் தன்னுடைய பிரதிநிதிகளை அந்தப் பிரதேசத்திற்கு அனுப்பியிருப்பதாகவும் யாழ்ப்பாணத்தில் ஏதாவது கடைகள் விற்க இருந்தால் எவ்வளவு பணமானாலும் சரி, அதைச் செலுத்தி அந்தக் கடையை வாங்க அவர் தயாராக இருப்பதாக அவர்கள் சொன்னதாகவும் என்னிடம் கூறினார். அந்தப் பிரதிநிதிகள் கடைகடையாகச் சென்று, "உங்களுடைய வியாபார நிலையத்தை விற்பதாக இருந்தால் கூறுங்கள், நாங்கள் வாங்குவதற்குத் தயாராக இருக்கிறோம்" என்று கூறுகிறார்கள். உண்மையில் அவர்களிடமிருக்கின்ற பணம் முறையாக வியர்வை சிந்தி உழைத்ததல்ல. நாட்டின் வருமானத்துக்காக, பாமர மக்களுக்கு வழங்க வேண்டிய நிவாரணத்தைக் கொடுப்பதற்காக இந்த அரசாங்கத்தினால் விதிக்கப்பட்ட வரிகளின்மூலம் சம்பாதிக்கப்பட்ட பணம்தான் அமைச்சர்கள் ஒருசிலரிடம் இருக்கின்றது.

இறைவரித் திணைக்கள அதிகாரிகள் இங்கு இருக் கிறார்கள். நான் அவர்களிடம் பணிவாகக் கேட்டுக் கொள்வது, குறிப்பாக பல மில்லியன் ரூபாய் செலவில் புதிதாக ஒருவர் - அது அமைச்சர்களாக இருக்கலாம், அல்லது மிகப்பெரிய வர்த்தகர்களாக இருக்கலாம் - ஒரு சொத்தைக் கொள்வனவு செய்யும்போது முத்திரை வரியை அவர்கள் மிகக் குறைந்தளவில் செலுத்தி, இந்த அரசாங்கத்துக்கு நட்டத்தை ஏற்படுத்துகின்றார்கள். அது சாதாரண மக்களால் முடியாது. அரசியல்வாதிகள் அல்லது பணபலமிக்க தொழிலதிபர்களால் மட்டும்தான் இப்படியான ஒரு நடைமுறையைச் செய்ய முடியும். ஆகவே இந்த இறைவரித் திணைக்கள அதிகாரிகள், புதிதாகப் பல மில்லியன் ரூபாய் செலவில் புதிய சொத்துக்களைக் கொள்வனவு செய்கின்றவர்களிடம், குறித்த பணம் எங்கிருந்து வந்தது? அவர் கொள்வனவு செய்கின்ற சொத்துத் தொடர்பில் அரசாங்கத்துக்குச் செலுத்தப்பட வேண்டிய சரியான பெறுமதியை, அதாவது, அதற்குரிய முத்திரை வரியை, சொத்தை வாங்குகின்றவர் சரியாகச் செலுத்துகின்றாரா?"என்று ஓர் ஆராய்ந்து பார்க்கவேண்டும்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய உரையை முடித்துக்கொள்ளுங்கள்!

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எனக்கு இன்னும் 2 நிமிடங்கள் தாருங்கள்.

அப்படிச் செய்தால், இந்த அரசாங்கத்துக்குப் பல மில்லியன் ரூபாய் பெறுமதியான வரி வருமானம் வந்து சேரும் என்பதைக் கௌரவ நிதியமைச்சர் அவர்களுக்கும் இறைவரித் திணைக் கள அதிகாரிகளுக்கும் நான் சொல்லிக்கொள்ள விரும்பு கின்றேன்.

மேலும், எங்களுடைய நாட்டில் பாதிப்புக்குள்ளான, பல துன்பங்களை அனுபவித்த தமிழ் மக்கள், தங்களுக்கு இழைக்கப்பட்ட அநீதிக்கு நீதி கிடைக்க வேண்டும்; தாம் கௌரவமாக வாழக்கூடிய வகையில் ஓர் அரசியல் தீர்வு கிடைக்க வேண்டும் என்று ஏங்கிக்கொண்டிருக்கின்றார்கள். இந்த வேளையிலே, எமது நாட்டின் மேதகு ஜனாதிபதி அவர்கள் "இராணுவத்தை விசாரிப்பதற்கு யாருக்கும் அனுமதி யில்லை" என்று கூறி, தமிழ் மக்களுடைய நெஞ்சங்களில் மிகப்பெரிய வடுவை ஏற்படுத்தியிருக்கின்றார். உண்மையில் இராணுவத் தளபதிகள் சிலர் குற்றமிழைத்திருந்தால், அல்லது அவர்கள் குற்றமிழைத்தவர்கள் என்று குற்றஞ்சாட்டப் பட்டிருந்தால், அவர்கள் விசாரணையை எதிர்கொண்டு, தாங்கள் குற்றமற்றவர்கள் என்று நிரூபிக்க வேண்டுமேயொழிய, குற்றத்திலிருந்து தப்பிப்பதற்காகப் பொய்யான செய்தியைக் குறிப்பிடக்கூடாது. குறிப்பாக, இந்த நாட்டின் மேதகு ஜனாதிபதி அவர்கள் தெரிவித்த கருத்தானது, ஒட்டுமொத்த தமிழ் மக்களுக்கும் மிகப் பெரிய ஏமாற்றமாக அமைந்திருக்கிறது.

அதேநேரத்தில், நேற்று மேதகு ஜனாதிபதி அவர்கள் காணாமல் ஆக்கப்பட்டவர்களுடைய உறவுகளை அழைத்து, சரணடைந்த மற்றும் அவர்களால் நேரடியாக ஒப்படைக்கப் பட்டவர்களுடைய எந்தவித விபரங்களும் தங்களுடைய தளபதிகளிடம் இல்லையென்று கூறியிருக் கின்றார். அப்படியென்றால் 2009ஆம் ஆண்டு ஓமந்தை முகாமில் நின்றது இலங்கை இராணுவமா? அல்லது பன்னாட்டு இராணுவமா? பன்னாட்டு இராணுவம் நின்றிருந்தால், இந்த நாட்டினுடைய அதிபர் அந்தப் பன்னாட்டு இராணுவத் தளபதிகளை அழைத்து, ஒப்படைக்கப்பட்டவர்களின் பெயர் விபரங்களை அவர்களிடம் கேட்கவேண்டும். ஏனென்றால், உறவுகளை நேரடியாக இராணுவத்திடம் ஒப்படைத்தவர்கள் இருக்கின்றார்கள்; கண்முன்னே ஒப்படைக்கப்பட்ட பின்பு சென்று பார்த்தவர்கள் இருக்கின்றார்கள்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களது உரையை முடித்துக்கொள்ளுங்கள்!

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

இப்படியான சூழ்நிலையில் இந்த நாட்டின் அதிபர் கூறுகின்ற கருத்து மிகவும் வேதனைக்குரியது. இந்த நாட்டின் அதிபர் ஓரினத்துக்கு மாத்திரம் அதிபரல்ல! அவர் இந்த நாட்டில் வாழ்கின்ற பல்லின மக்களுக்கும் குறிப்பாக, மூவின மக்களுக்கும் அதிபராக இருக்கின்றார். எனவே, ஜனாதிபதி அவர்கள் அந்த மக்களுடைய மனநிலையைப் புரிந்துகொண்டு, பாதிக்கப்பட்ட மக்களுக்குரிய உரிமைகள் கிடைக்க ஆவன

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

செய்ய வேண்டுமென்றும் அவர் கூறிய கருத்துக்களைத் தெளிவுபடுத்த வேண்டுமென்றும் கேட்டு, விடைபெறு கின்றேன். நன்றி.

[අ.භා. 12.23]

ගරු කබීර් හාෂිම් මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு கபீர் ஹாஷீம் - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Public Enterprise Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම, මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමාටත්, මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමාටත් මගේ ස්තුතිය පුද කරන්න ඕනෑ, මේ රටේ ජනතාව, මන්ත්‍රීවරුන්, අමාත්‍යවරුන්, විපක්ෂය ගෙනෙන ලද යෝජනාවලට බොහොම නම්‍යශීලිව ඇහුම් කන් දීලා අදාළ සංශෝධන ඉදිරිපත් කරන්න කැමැත්ත පළ කිරීම ගැන. ශ්‍රී ලංකාවේ බදු අය කිරීම රජ කාලයේ සිට පවත්වාගෙන එන ලද දෙයක් කියන එක මේ ගරු සභාවේ කියන්න කැමැතියි. බොහෝ ඉතිහාස තොරතුරු දිහා බැලුවාම ඒ බව පෙනෙනවා. රොබට් නොක්ස් ලියපු වාර්තාවක් වන, "ලංකාවේ ඓතිහාසික සම්බන්ධතා" -"An Historical Relation of the Island Ceylon"- කියන වාර්තාවෙහි බොහෝ තොරතුරු සඳහන්ව තිබෙනවා, බදු අය කිරීමේ ක්‍රමවේදය ගැන.

1893 නැඟෙනහිර පළාත් දිසාපති වාර්තාව බැලුවත්, එහි විවිධ ශිලා ලේඛනවලත් සඳහන් වනවා බදු අය කිරීම පිළිබඳව. එම තොරතුරු අනුව, ඉන්දියාවේ සිට ආර්යයන් ලංකාවට පැමිණි කාලයේ සිට පවා රට තුළ ආනයන අපනයන බද්ද කියන දේ අය කිරීමට කටයුතු කර තිබෙන බවට සාක්ෂි තිබෙනවා. ඒ ගැන කතා කරනකොට කිව යුතුයි, අනුරාධපුර යුගයේදී බදු අය කිරීම සඳහා "මහාපටුලද්ද" නම් නිලධාරියෙකු සිටි බව. අනුරාධපුර යුගයේ සිටි මහාපටුලද්ද කියන නිලධාරියා හම්බන්තොට ගොඩවායේ සිට එම කටයුතු කළා කියන එක සඳහන් වෙලා තිබෙනවා. මට හිතෙනවා ඒ මහාපටුලද්ද කියන නිලධාරියාට 2005 සිට 2015 දක්වා පැවැති ආණ්ඩු කාලයේත් නැවත පණ ආවාද කියා. ඒ කාලයේදී කටයුතු කරපු ආකාරය දිහා බලන විට මට නිකමට වගේ එසේ සිතෙනවා. අනුරාධපුර යුගයේ සිටියා වාගේම 2005 සිට 2015 දක්වා පැවැති ආණ්ඩු කාලයේත් මහාපටුලද්ද මේ රටේ කටයුතු කළ බව ඉතාම පැහැදිලියි කියන එක කියන්න පුළුවන්. ඒ කාලයේ සිදුවීම් ගෙන බැලුවාම ඒ බව තහවුරු වෙනවා. ඇයි ඉතින්, මහ මඟදී පොඩි දරුවන් උදුරාගෙන උඩ දමාදමා ඉඹපු ජාතියේ දරුවන්ගේ අප්පච්චිගේ අය වැයෙන් තමයි කුඩා දරුවන්ගේ කිරි පිටිවලට එදා බදු අය කළේ. ඒ වාගේම, ඒ කාල පරිච්ඡේදයේ ඒ අය වැයවලින්ම තමයි බලු කුක්කන් වෙනුවෙන් විදේශ රටවලින් ගෙනෙන බලු කෑම පවා බදුවලින් නිදහස් කළේ. මේ කාල පරිච්ඡේදය එයත් එක්ක සසඳා තමයි අප මේ දේශීය ආදායම් පනත් කෙටුම්පත ගැන කතා කරන්න ඕනෑ. 2015දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා නැවත ජනාධිපතිතුමා හැටියට පත් වුණා නම් එදා අර දරුවන්ට කළා වාගේම එදා ඉඹ ඉඹ ගිය ආච්චි අම්මලාගේ සිල් රෙදිවලටත් දැන් වනකොට බදු අය කර ඇති කියා මම හිතනවා.

ලැම්බොගිනිවලට බදු නිදහස් කරලා, කුඩා දරුවන්ගේ කිරි පිටිවලට බදු අය කරපු යුගය විශේෂයෙන්ම අපට සිහිපත් වෙනවා. 2005-2015 කාල පරිච්ඡේදයේදී තිබූ දළ දේශීය නිෂ්පාදනය ගැන අපේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කථා කරන කොට කිව්වා. විශේෂයෙන්ම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට බදු අය කිරීමේ ප්‍රවණතාවත් ඇති වෙන්න ඕනෑ. රටක සාමාන්‍ය ඉලක්කවලින් රාජ්‍ය ආදායම් වැඩි කෙරුවේ නැත්නම්, දුප්පත්කමින් පෙළෙමින් දවසකට ඩොලර් දෙකක ආදායමකින් ජීවත් වෙන අයට උදවු කරන්න අපට ක්‍රමවේදයක් ඇති වෙන්නේ නැහැ. ඒ නිසා රාජ්‍ය ආදායම වැඩි කිරීම ඉතා වැදගත්. 1994 කාල පරිච්ඡේදයේදී බදු අය කිරීම හරහා 20ක ප්‍රතිශතයක් වූ රාජ්‍ය ආදායම සියයට 11ට කඩා වැටුණා. එයට හේතුව ගජ මිතුරන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ජාවාරම්කරුවන්ට ඒ කාල පරිච්ඡේදය තුළ බදු සහන ලබා දීමයි. විවිධ බදු සහන දුන්නා. පවතින බදු ක්‍රමය අවිධිමත් නිසා තමයි අපි අලුත් බදු පනතක් ඉදිරිපත් කරන්නේ. අවිධිමත් බදු ක්‍රමය වෙනස් කරන්න තමයි අපි කල්පනා කරන්නේ.

2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සහ 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත මහින්ද රාජපක්ෂ මහතාමයි මේ පාර්ලිමේන්තු සභාවේ සම්මත කළේ. අද මේ ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට උසාවියට, අධිකරණයට ගිහිල්ලා මේ පනත් කෙටුම්පතට අභියෝග කරන්න නිදහස තිබෙනවා. බන්දුල ගුණවර්ධන, වාසුදේව නානායක්කාර, උදය ගම්මන්පිල වැනි මන්ත්‍රීවරුන්ට එදා ඒ නිදහස තිබුණේ නැහැ. 2006දී ගෙනාපු වැරදි පනතට කථා කරන්න ඔවුන්ට එදා අයිතියක් තිබුණේ නැහැ. එහෙම කථා කළා නම් අද වන විට එතුමන්ලාගේ නම් ටිකත් අතුරුදන් ලැයිස්තුවේම තමයි තිබෙන්නේ. එදා මහින්ද රාජපක්ෂ මහත්මයා ගෙනා පනතේ තිබුණු සමහර වගන්තිවලින් සාමාන්‍ය ජනතාවට ලොකු බලපෑමක් වුණත්, එක මන්ත්‍රීවරයෙකුටවත් එදා කථා කරන්න අයිතියක් තිබුණේ නැහැ. මහින්ද රාජපක්ෂ මහත්මයා ඉංග්‍රීසි පුවත් පතක ලිපියක් පළ කරලා තිබෙනවා. එතුමා ඒ ලිපියේ කියලා තිබෙන දේ දැකලා මට පුදුම හිතුණා. එතුමා ඒ ලිපියෙන් කියනවා, "ඔබ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයෙක් නම් මේ ගෙනාපු බදු පනතට විරුද්ධව ඡන්දය දෙන්න" කියලා. මම මහින්ද රාජපක්ෂ මහතාගෙන් අහනවා, ඔබතුමා එදා ගෙනා 2006 පනතට විරුද්ධව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ හෘදය සාක්ෂිය අනුව ඡන්දය දීලා තිබුණා නම් ඔබතුමා මොකක්ද කරන්නේ කියලා. එහෙම වුණා නම්, එතුමන්ලා සියල්ලෝම අතුරුදන් වූ ලැයිස්තුවේ තමයි අද ඉන්නේ. ඒක තමයි යථාර්ථය.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

එහෙම වෙනවා නම් ඔබතුමාත් මෙලහකට නැහැ නේ.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

විපක්ෂයේ අපි එදා කෙළින් හිටියා. අපි භය වුණේ නැහැ. අපි අතුරුදන් වුණත් ඇත්ත කථා කළා; අතුරුදන් වෙන්න භය වුණේ නැහැ. එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් අපි අපේ යුතුකම් ටික කළා. ඔබතුමන්ලා ඒ වෙලාවේදී ඇමතිකම් තියාගෙන 'ෂේප්' න්‍යායේ හිටියා. ඒ වාගේම, 2009 වසරේදී රාජපක්ෂ රෙජීමය යටතේ එදා ජාතිය ගොඩනැඟීමේ බද්ද සියයට 1ක් අය කරන තත්ත්වයකින් හඳුන්වා දුන්නා. නමුත්, 2009දී ගෙනා ජාතිය ගොඩනැඟීමේ බද්ද මාස 3ක් ඇතුළත සියයට 3 දක්වා වැඩි කළා. මාස 3ක් ඇතුළත සියයට 3 දක්වා ජාතිය ගොඩනැඟීමේ බද්ද වැඩි කළා. ඉන් පස්සේ රටේ සිටින සාමාන්‍ය ජනතාවට බර ඇති කරමින් ගජ මිතුරන් සතුටු කරන්න ඒ වෙලාවේදී මහින්ද රාජපක්ෂ මහත්මයා මුදල් ඇමතිවරයා හැටියට මොකක්ද කළේ? පොහොසත් ඉහළ පැළැන්තියේ අයට බදු සහන ලබාදීමට බදු නිදහස් සීමාව, ආර්ථික සේවා ගාස්තුව රුපියල් කෝටි 3 දක්වා වැඩි කළා. මේක තමයි ඒ කාල පරිච්ඡේදයේදී එතුමා කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාවලට අනුව 2009

දෙසැම්බර් 31වන දිනට සමස්ත ආදායම් බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව 729,101ක්. 2014 දෙසැම්බර් මස 31වන විට සමස්ත ආදායම් බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව 559,360යි. ඒ කියන්නේ 2009 සිට 2014 දක්වා කාලය තුළ සමස්ත ආදායම් බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව සියයට 23කින් පමණ අඩුවී තිබෙනවා. මෙන්න, මහින්ද රාජපක්ෂලාගේ සංවර්ධනය! නමුත්, 2015 වසරේදී සමස්ත ආදායම් බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව නැවත 621,989ක් දක්වා වැඩි වුණා. එනම් සියයට 12කින් පමණ අපට වැඩි කරන්න හැකි වුණා. ඒ වාගේම, රාජපක්ෂ පාලනය තුළ පෞද්ගලික ආදායම් බදු ගොනු සංඛ්‍යාව 210,399 සිට 148,720 දක්වා සියයට 29කින් අඩු වෙලා තිබෙනවා. ආදායම් බෙදීයෑමේ විෂමතාවේ බලපෑම නිසා මේක දිගටම සිදු වුණා.

2014 වන විට ආදායම් බදු ගෙවන සේවා නියුක්තිකයන්ගේ සංඛ්‍යාව 2009ට සාපේක්ෂව, 475,340 සිට 354,758 දක්වා සියයට 25කින් පමණ අඩු වෙලා තිබෙනවා. රටේ සැබෑ සංවර්ධනයක් තිබුණා නම්, රටේ ආදායම නිසි ලෙස බෙදී ගියේ නම් මෙහෙම වෙන්න විධියක් නැහැ. ඒ නිසා මම කියන්න කැමැතියි, පසු ගිය 2015 වසරේදී 426,496 දක්වා සියයට 20කින් පමණ අපි මෙය වර්ධනය කර තිබෙනවා කියලා.

බදු ගෙවීම ජාතික වගකීමක් වෙනවා. රටකට ජාතික බදු ප්‍රතිපත්තියක් තිබිය යුතුයි. එය බදු මූලධර්මවලට අනුකූලවීම ද, වැදගත් බදු ක්‍රමවේදය සරල වීම වාගේම ඉහළ ආදායම්ලාභීන්ගෙන් වැඩි බදු අය කිරීමක් සිදු විය යුතු අතර, ආදායම් අඩු පාර්ශ්වයන්ගෙන් අඩු බදු අය කිරීමක් කළ යුතුයි කියන එක මම විශේෂයෙන්ම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා සෘජු බදු සහ වක්‍ර බදු ගැන කථා කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
I will take only one more minute, Sir.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ සෘජු බදු සහ වක්‍ර බදු පරතරය වෙනස් කිරීම එක පාරටම අවුරුද්දකින්, දෙකකින් කරන්න බැහැ. නමුත්, උපරිමයෙන් සියයට 40 දක්වා සෘජු බදු වැඩි කරන්නටත් වක්‍ර බදු සියයට 60 දක්වා අඩු කරන්නටත් ඉලක්ක කරගෙන අපි කටයුතු කරනවා. එය මුදල් අමාත්‍යාතුමාගේ විශේෂ ඉලක්කයක් වනවා. ඒ නිසා බදු නොගෙවන ඉහළ පැළැන්තියේ අය, පසු ගිය කාල පරිච්ඡේදය තුළ දේශපාලන බලපෑම් මත සුපිරි මන්දිර ගැහූ, ජාවාරම් කළ, කොන්ත්‍රාත් කළ ලොකු මිනිසුන් බදු දැලට එකතු කරන්න මේ රජය බැඳී සිටිනවා. ඒ ප්‍රතිපත්තිය අද අලුත් ආදායම් බදු පනත් කෙටුම්පත තුළ ඇතුළත් වෙලා තිබෙන බවත් විශේෂයෙන්ම සතුටු විය යුතු කාරණාවක් කියන එක මම ප්‍රකාශ කරන්න කැමැතියි. ස්තුතියි.

[අ.භා. 12.33]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නව දේශීය ආදායම් පනත් කෙටුම්පත ගැන යමක් කියන්න අවස්ථාව ලැබීම ගැන සතුටක්. විශේෂයෙන්ම කබීර් හාෂිම් ඇමතිතුමාගේ කථාවේ කියපු කරුණු පළමුව අපේ අවධානයට යොමු කරගත යුතුව තිබෙනවා. එදා කිරි පිටිවලට බදු වැඩි කළා කිව්වා. එදා කිරි පිටිවලට බදු වැඩි කළේ, කිරි ගොවියන්ගෙන් ගන්නා වූ කිරිවලට දෙන මුදලද වැඩි කරලායි. ඒ, මේ රටේ කිරි නිෂ්පාදනය වැඩි කරන්නයි. මම හිතන්නේ එතුමා දන්නවා ඇති, ඉන්දියාව කිරිවලින් ස්වයංපෝෂිත වුණේ පිට රටින් ගෙනෙන කිරි පිටිවලට සියයට එකසිය ගණකින් බදු පනවලායි. ඒ නිසා මේ රටේ දේශීය ආර්ථිකය ගැන කුට්ටු භාගයකට ගණන් නොගත්ත එතුමන්ලාගේ ආණ්ඩු පාලන ක්‍රමයේ ඒ ප්‍රතිපත්තිය අපට මතක් කර දීම ගැන එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

මේ universal tax එකක් තිබෙන්න ඕනෑ කියන අදහස එන්නේ කොහෙන්ද? Universal tax එකක් දෙන්න පුළුවන් ඉතා දියුණු රටවලටයි. නමුත්, මේ වාගේ මැද මට්ටමේ අදායම් තිබෙන රටවලට universal tax එකක් ගහන්න කිසියම් ආකාරයකට වුවමනා ආදායම් ව්‍යූහයක් නැහැ; සේවා නියුක්තික ව්‍යූහයක් නැහැ. එම නිසා නොගැළපෙන දේවල් මෙතැන කිරීමෙන් පහළම ආදායම් ලබන කොටස්වලටයි මෙමඟින් ලොකුම අමාරුව, තෙරපීම එන්නේ.

Tax file එකක් තිබෙනවා කිව්වාම, යම් යම් තැන්වල පිළිගැනීමක් තිබෙනවා. ඔව්. අපි දන්නවා, VIP lounge එකක් යම් මට්ටමක ව්‍යාපාරිකයන්ට පාවිච්චි කරන්න පුළුවන් බව. Tax ගෙවන කට්ටියට මෙන්න විවිධ සැලකීම්, විවිධ පිළිගැනීම් කියලා මේ සමාජය විවිධාකාර විෂමතාවන්ට යටත් කරන්නයි යන්නේ. එහෙම ගෙවන්න බැරි මිනිසුන්ට නොසැලකීම්. මේක තමයි තමුන්නාන්සේලාගේ පන්ති භේද ප්‍රතිපත්තිය. ඒ නිසාම තමයි අපි මේ ආණ්ඩුවට විරුද්ධව අපේ ජනතාවගේ පොදු කෝණයෙන් බලලා විවේචන එල්ල කරන්නේ.

අපේ මුදල් ඇමතිතුමා ඇති නැති පරතරය ලොකුවට පෙන්වලා තිබෙනවා. "මේ බලන්න, සියයට 1ක් පමණ වූ අයට මෙච්චර පංගුවක් ලැබෙනවා, සියයට 5ක් වූ පොහොසත්ම අයට මෙච්චර පංගුවක් ලැබෙනවා, ඒ අතර, සියයට 10ක් වූ දුප්පත්ම අයට මෙන්න ලැබෙන පුංචි ප්‍රමාණය" කියලා ලොකු වේදනාවකින් කියන හඬක් ඇහුණා.

අන්තිමට මේ දේශීය ආදායම් පනත් කෙටුම්පත යටතේ සිද්ධ වන්නේත් ඒ කාරණය තවත් තීව්‍ර වීමයි. ඉහළම ආදායම් ලබන කොටස්වලින් සෘජු බදු ගන්න ක්‍රමය මේ පනත් කෙටුම්පතේ පෙන්වලා තිබෙන බවක් මා නම් දකින්නේ නැහැ. ඉහළම ආදායම් ලබන කොටස්වලට සෘජු බදු සියයට 28ට වඩා වැඩි කර තිබෙනවාද? සියයට 40 දාලා තිබෙන්නේ සුදුවලට, දුම්කොළවලට, මත්පැන්වලට. ඒ හැරුණාම මේ රටේ ඉහළ ධනවත් පන්තියට සියයට 40 අදාළ වන්නේ නැහැ. ඒ අයට අදාළ වන්නේ වෙනදා තිබුණු සියයට 28ම පමණයි. අනික් අතට සියයට 14ක් ගෙවා ගෙන සිටි අය සියයට 28 bracket එකට දාලා තිබෙනවා.

බදු ප්‍රතිපත්තියක අරමුණු මොනවාද කියා බලන්න. බදු ප්‍රතිපත්තියක එක් අරමුණක් තමයි රජයට ආදායම් ලබා ගැනීම. බදු ප්‍රතිපත්තියක තිබිය යුතු දෙවැනි අරමුණ මොකක්ද? සමාජ සාධාරණත්වය ඇති කිරීම. තිරසර සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ එක්සත් ජාතීන්ගේ සංවිධානය කියන්නේත් සමාජ සාධාරණත්වය ඇති කරන්න කියායි. අඩු ආදායම්ලාභී ජන කොටස්වලට යම් සහන, දීමනා හෝ ආරක්ෂණය ලබා දීමට රජය මේ ලබා ගන්නා ආදායම වැය කිරීම තමයි සමාජ සාධාරණත්වය කියා කියන්නේ. ඔක්කොම අරමුණු ගැන දිගටම කියාගෙන යන්න මට වෙලාවක් නැහැ. මේ දේශීය ආදායම් පනත්

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

කෙටුම්පතින් සිද්ධවෙලා තිබෙන්නේ පහළ ආදායම් ලබන කට්ටියත්, පහළ මධ්‍යම ආදායම් ලබන කණ්ඩායමත් මෙම බදුවලට හිර කිරීමයි. මේ බදුවලට හිර කිරීම නිසා පහළ මධ්‍යම පන්තිය සහ මධ්‍යම මැද පන්තිය කියන කොටස් දෙක විශාල තැලීමකට ලක් වනවා. එසේ වන්නේ මක් නිසාද කියා අප බලමු. රුපියල් ලක්ෂ 12ක වාර්ෂික ආදායම් තිබෙන අය මේ බදුකරයට හසු වන බව අප දන්නවා. රුපියල් ලක්ෂ 12ක වාර්ෂික ආදායමක් තිබෙන අය මේ බදුවලට හසු වීම නිසා විශාල ප්‍රමාණයක් ඒ අනුව මේ බදු ක්‍රමයට අසු වනවා. මේ කොටස් අතර ආර්ථික ක්‍රියාකාරිත්වයට තමුන්නාන්සේලා ලබා දෙන සහනය මොකක්ද; ලබා දෙන දිරිගැන්වීම මොකක්ද? බදු ප්‍රතිපත්තියකින් අනික් පැත්තට කරන්නේ යම් යම් ආර්ථික ක්‍රියාකාරිත්වයන්ට දිරිගැන්වීම් කිරීමයි. ඒ දිරිගැන්වීම් මේ රටේ දේශීය ස්වයං රැකියාකරුවන්ට, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට මොන විධියටද ලබා දීලා තිබෙන්නේ? අද තමුන්නාන්සේලා බදු අය කරන්න හදන රුපියල් ලක්ෂ 12ක වාර්ෂික ආදායම් සීමාව තුළ ඉන්න මිනිස්සු තමයි මේ සුළු මධ්‍යම පරිමාණ ක්‍රියාකාරිත්වයේ ඉන්නේ; කුඩා සුළු මධ්‍ය පරිමාණ ස්වයං රැකියා ක්‍රියාකාරිත්වයේ ඉන්නේ. ඒ අයට බදු බර වැඩි කිරීම තුළින් තමුන්නාන්සේලා අද ඒ පහළ මැද පන්තියේ වාගේම මධ්‍යම මැද පන්තියේ ආර්ථික ක්‍රියාකාරිත්වය දිරිගැන්වීමට වඩා එය අධෛර්යවත් කිරීමට හේතු වන ආකාරයට කටයුතු කර තිබෙනවා. අප මේ කාරණය දිහා පොඩ්ඩක් බැලුවොත් හොඳයි.

මේ රටේ පහළ මධ්‍යම පන්තිය හා මැද මධ්‍යම පන්තිය සියයට 40ක් ඉන්නවා. ඒ සියයට 40ට ජාතික ආදායමෙන් ලැබෙන්නේ සියයට 21යි. ඉහළ මැද පන්තිය හා මහා පොහොසතුන්ගේ පන්තියේ තවත් සියයට 40ක් ඉන්නවා. ඒ සියයට 40ට ආදායමින් සියයට 71ක් ලැබෙනවා. ඒ අයගේ ආදායම අල්ලන්න තමුන්නාන්සේලා මොනවාද කර තිබෙන්නේ? ජාතික ආදායමෙන් සියයට 71ක් ලබන ඉහළ මැද පන්තියයි, පොහොසතුන්ගේ පන්තියයි ඇල්ලීමට තමුන්නාන්සේලා කිසිම අලුත් බද්දක් ගෙනැල්ලා නැහැ; කිසිම අලුත් බදු රේට්ටුවක් නියම කරලා නැහැ. ජාතික ආදායමින් සියයට 21ක් පමණක් ලබන පහළ මධ්‍යම පන්තියේයි, මැද මධ්‍යම පන්තියේයි සියයට 40 මතට තමයි තමුන්නාන්සේලා මේ බර පටවලා තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ ඉලක්කය වෙලා තිබෙන්නේ ඒ මිනිස්සු; ඉහළම ධනවතුන් නොවෙයි. ජේම්ස් ටෝබින් කියන ආර්ථික විද්‍යාඥයාගේ උපදේශය මත ප්‍රමාදවෙලා හෝ දැන් වෙනත් රටවල්වල පටන්ගෙන තිබෙනවා, "Financial Transaction Tax" කියලා එකක්. ඒ Financial Transaction Tax එක යොමු කරලා තිබෙන්නේ, විවිධ මට්ටම්වල අද මූල්‍ය ආර්ථිකය ප්‍රබල වෙලා තිබෙන තත්ත්වයක් තුළ සිදු වන විවිධ මූල්‍ය ගනුදෙනු සම්බන්ධවයි. ඒ සෑම මූල්‍ය ගනුදෙනුවකින්ම දශම ගණනක ආදායමක් ආණ්ඩුව එකතු කළොත්, පහළ මධ්‍යම පන්තිය සම්පූර්ණයෙන්ම බදුවලින් නිදහස් කරන්නට පුළුවන්. රුපියල් දශ ලක්ෂයක් දක්වා ආදායම ලැබෙන මිනිසුන් පවා අපි ක්‍රියාකාරිත්වයට යොමු කරන්නට ඕනෑ; ආර්ථික වර්ධනයට යොමු කරන්නට ඕනෑ. අපට Financial Transaction Tax එක ක්‍රියාත්මක කරන්නට පුළුවන් නම්, ඉහළම මූල්‍ය ගනුදෙනුවලින් දශම ගණනක ආදායමක් ගන්නට පුළුවන් නම් ආණ්ඩුවට විශාල ආදායමක් ලබන්නට පුළුවන් බව ගණන් හදලා බැලුවොත් පෙනේවි. ජේම්ස් ටෝබින් ඒ දවස්වල කිව්වා හැම රටකම ඉහළ මට්ටමේ මුදල් ගනුදෙනුවලින් දශම ගණනක් තිබුණොත් ලෝකයේ තිබෙන දුප්පත්කමත් නැති කරන්නට පුළුවන් කියලා.

මම හිතන්නේ නැහැ තමන්ව බලයේ පවත්වාගෙන යන, තමන්ට ගුරුහරුකම් දෙන ඉහළම ධනපති පන්තියට විරුද්ධව කිසිම අලුත් බද්දක්, බදු රේට්ටු වැඩි කිරීමක් කරන්නට සූදානමක් මේ ආණ්ඩුවට තිබෙනවා කියලා. මම උදාහරණයක් පෙන්වන්නම්. තමුන්නාන්සේලාගේ පළමුවෙනි අය වැය ලේඛනයේදීම හිටපු මුදල් ඇමතිතුමා කිව්වා මන්දිර බද්දක් අය කරනවා කියලා. අපේ ගරු කබීර් හාෂිම් ඇමතිතුමාත් දැන් කිව්වා, "ඉස්සර ගහපු මන්දිරවලට අපි දැන් බදු අය කරනවා" කියලා. එතුමාට අමතක වෙලා තිබෙනවා, මන්දිර බද්ද ගෙනාවේ රවි කරුණානායක හිටපු මුදල් ඇමතිතුමා බව. නමුත් ඒ මන්දිර බද්ද අය කළේ නැහැ. ඔබතුමා ඒක දන්නවානේ. මන්දිර බද්ද අය කිරීම අත් හැරියා. ඒ තමයි තමුන්නාන්සේලාගේ පදනම පවත්වාගෙන යන මේ රටේ ඉහළම සමාජ පන්තිය වෙනුවෙන් තමුන්නාන්සේලා කරන අනුග්‍රහය දැක්වීම.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබූ කාලය අවසානයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මට විනාඩි 15ක් තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
No, you have been allotted only 11 minutes.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, may I take a few minutes from the time allotted to the Hon. Sisira Jayakody?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Okay.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම කියමින් සිටියේ, තමුන්නාන්සේලා එදා ලොකුවට බෙර ගහලා මන්දිර බද්දක් අය කරනවා කියලා කිව්වාට අන්තිමට බලන විට මන්දිර බද්දක් ක්‍රියාත්මක කළේ නැති බවයි. ඒ වාගේ, අදත් මංගල සමරවීර මහත්මයා ලොකුවට බෙර ගැහුවා දුප්පතුන්ගේ ප්‍රමාණය මෙපමණයි, ඔවුන්ට ලැබෙන ආදායම මෙපමණ පුංචියි, මෙන්න පුංචි ප්‍රමාණයක් වන පොහොසතුන්ගේ ආදායම, මේ පරතරය තමයි අපි නැති කරන්නට යන්නේ කියලා. මේ පරතරය නැති කරන්න තිබෙන යෝජනාව මොකක්ද?

ඇත්තටම සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? පහළ මධ්‍යම පන්තිය යන්තම් රුපියල් ලක්ෂයක මාසික ආදායම තුළ ජීවිතය ගැට ගහ ගන්න බලනවා, දුප්පත්කමට නොවැටී. ඇයි? තමුන්නාන්සේලා දන්නවා, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කියනවා රුපියල් 44,600ක් වුවමනායි කියලා හතර දෙනෙකුගේ පවුලකට -දෙමහල්ලන්ටයි, දරුවෝ දෙන්නාටයි අත්‍යවශ්‍ය වියදම් සඳහා- ජීවත් වෙන්නට. ඒ අත්‍යවශ්‍ය වියදම් තුළ වක්‍ර බදු කොපමණ ඇතුළත් වෙනවාද? අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහ සේවාවන් තුළ රුපියල් 4,600කට වැඩි ගණනක් බදු හැටියට ඇතුළත්ව තිබෙනවා. ඒ මිනිසුන් එක පැත්තකින් වක්‍ර බදු ගෙවනවා; අනෙක් පැත්තෙන් සෘජු බදු ගෙවනවා. මේක තමයි වෙලා තිබෙන්නේ. එහෙම නැතිව ඉහළම පන්තියේ බදු රේට්ටු වැඩි කළේ නැහැ. පහළ මධ්‍යම පන්තියේ

සහ මැද මධ්‍යම පන්තියේ මිනිසුන් පාරිභෝගික භාණ්ඩවලට ගෙවන වක්‍ර බදුවලට අතිරේකව සෘජු බද්දකටත් යටත් කරලා තිබෙනවා. මේකයි තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ වික්‍රමය වෙලා තිබෙන්නේ.

තමුන්නාන්සේලාගේ ඇමතිතුමා කථා කරමින් කිව්වා, එදා අපේ ආණ්ඩුවෙන් ගෙනාව සමහර යෝජනාවලට විරුද්ධ වෙන්න බැරි වුණේ සුදු වෑන් එකේ යන්න තිබුණු භය නිසා කියලා. තමන්ව විවේචනය කරන උදවිය එහෙම සුදු වෑන් එකෙන් අරගෙන ගිහින් අතුරුදහන් කරනවා නම්, එහෙම නම් කබීර් හාෂීම් ඇමතිතුමා තමයි අපි ඒ කාලයේ ඉස්සෙල්ලාම අරගෙන යන්නේ. ඒක මම එතුමාට කිව්වා. නමුත් එහෙම සංස්කෘතියක් තිබුණේ නැති නිසා එතුමා අදත් මේ සභාවට ඇවිල්ලා එදා වාගේම අපට විරුද්ධව කථාවක් පවත්වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හතර දෙනෙකු සිටින පවුලක වියදමට අද රුපියල් 50,000ක් විතර යනවා. මේ තමයි ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තොරතුරු. මේ මිනිසුන්ට දෙමව්පියන් බලා ගන්න වුණොත්, මේ මිනිසුන්ට තමන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් වැඩි වියදමක් කරන්න වුණොත්, මේ මිනිසුන්ට ලෙඩක්-දුකක් හැදුණොත්, ඒවා වෙනුවෙන් වැය කරන්න මුදල් අවශ්‍ය වුණොත් මේ රුපියල් ලක්ෂයේ ආදායම ඒවාට දිය වෙලා යනවා. මේ රුපියල් ලක්ෂයේ ආදායමින් තමුන්නාන්සේලා බදු අය කරන්න හදන කොට, අද තිබෙන ජීවන වියදම ගැනත් මතක තබා ගන්න ඕනෑ. ඒ කාලයේ තමයි "ලක්සෙට කොඩිය" දැම්මේ. අද ලක්සෙට කොඩිය දමන්න බැහැ. ඇයි? අද ලක්ෂය බාල්දු වෙලා. ඒ බාල්දු වුණු ලක්ෂයේ ඇත්ත වටිනාකම "කොඩිය දමන්න" තරම් වටිනාකමක් ඇති අගයක් නොවෙයි. ලක්ෂයකට වඩා මාසික ආදායමක් ලැබෙනකොටම ඒකට බදු දැමීම ඉතාම යුක්ති සහගත, සාධාරණත්වයේ ප්‍රතිපත්තියක් කියලා මංගල සමරවීර ඇමතිතුමා කියන කොට, අද ලක්ෂයේ වටිනාකම මොකක්ද කියලාත් ඇමතිතුමා දැනගත යුතුයි. අද අපේ කම්කරු පන්තියේ සමහර උදවියත් රුපියල් 50,000ට වැඩි, ලක්ෂයකට කිට්ටු ආදායමක් ලබනවා. අද රුපියල් ලක්ෂයට වැඩි ආදායම් ලබන සේවකයෝ ඉන්නවා. කම්කරු පන්තියේ අර්ථය තිබෙන්නේ ආර්ථික සබඳතාවේ ස්වභාවය අනුවයි. එහෙම නැතුව ලැබෙන්නා වූ ආදායම් මට්ටම අනුව නොවෙයි. ඒ නිසා අපේ කම්කරු පන්තියේ උදවියත් සමහර වෙලාවට ඔය කියන ආදායම ගන්න පුළුවන් තත්ත්වයක ඉන්නවා. ඒ අය බොහොම මහන්සියෙන් දුක් විඳලා, සේවය කරලා උපයන මුදල ලක්ෂයකට වැඩි වුණ හැටියේ බදු අය කරන තීරණයකට ආණ්ඩුව එනවා නම්, ආණ්ඩුව මේ රටේ ඉහළ පන්තියෙන් බදු ගැනීම වෙනුවට පහළ පන්තියෙන් බදු ගැනීම ගැන කල්පනා කර තිබෙන බව පෙනෙනවා.

ඊළඟට, මම කියන්න කැමැතියි අර්ථ සාධක අරමුදල ගැන. ඒ වාගේම, ඒ කාලයේ සහන දීලා තිබුණු විවිධාකාර පුද්ගලයන්ගේ - කලාකරුවන්ගේ, සාහිත්‍යධරයන්ගේ- ආදායම් ගැන. ඒ වාගේම, මේ රටේ නොයෙක් දිරි ගැන්වීම් සඳහා ලබා දී තිබුණු බදු සහන ගැන. මේ පනත් කෙටුම්පතින් මේවා ඔක්කෝම කප්පාදු කර තිබෙනවා. මේවා කප්පාදු කිරීමත් එක්ක මේ රටේ දිරි ගැන්වීම් නැති වෙලා යනවා. හැබැයි, විදේශිකයන්ට ඒ දිරි ගැන්වීම් තිබෙනවා. විදේශිකයන් ආයෝජන අරගෙන එනවා නම්, ඒවාට ඒ දිරි ගැන්වීම් තිබෙනවා. ඒවායේ විස්තර මම දැන් කියන්න යන්නේ නැහැ. ඒ වාගේම මේ රටින් මුදල් අරගෙන යනවා නම්, ඒ අයගෙනුත් ගන්නේ සියයට දහයයි. මනුස්සයෙක් මුළු ජීවිත කාලයක් තුළ හම්බ කරපු ඒ අර්ථ සාධක අරමුදල ආයෝජනය කරලා යමක් එකතු කර ගත්තා නම්, ඒකෙන් බදු අය කරන එක සාධාරණ නැහැ. අපිත් එදා ඒකෙන් සියයට එකොළහක් ගත්තා. ඒක අද සියයට දහහතරකට නංවලා.

මම දන්නේ නැහැ, මේ සංශෝධන අතරින් කොපමණ ඒවා වෙනස් කරලා තිබෙනවාද කියලා. ඒවා වෙනස් කරලා තිබෙනවා නම් එම සංශෝධන එනකොට බලමු. මුල් පනත් කෙටුම්පත කියවපු හැටියටයි අපි මෙම තත්ත්වය තේරුම් ගන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් විනාඩි පහක කාලය අවසානයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හොඳමයි.

දැන් අපි වැඩ කරපු සේවකයෙක් ලබන වැටුප වැඩ කරපු දින ගණනින් බෙදලා බලමු. එසේ දින ගණනින් බෙදා බැලුවාම, මුළු සේවා කාලය තුළ ඒ මනුස්සයා එම සේවය ලබා දීමට මොන තරම් අවදානම්, අමාරු තත්ත්ව තුළ කටයුතු කළාද කියලා පෙනී යනවා. ඒ මිනිසුන් ලබන ප්‍රතිලාභයෙනුත් බදු ගන්නා, ඒ මිනිසුන්ගේ අරමුදලිනුත් මේ තරම් ඉහළ බද්දක් ගන්නා මේ ආණ්ඩුව, "අපි ඉහළ පන්තියටයි බදු බර දමන්නේ, පහළ පන්තියේ ජනතාවගේ බදු බර අඩු කරනවා"ය කියන්නේ කොහොමද? මේ විධියේ බදු ප්‍රතිපත්තියක් හා බදු යෝජනා ගෙන එමින්, "වැඩි ආදායම්ලාභීන්ගේ පැත්තට අපි මේ රටේ ආදායම් බදු ප්‍රතිපත්තිය හරවනවා, අඩු ආදායම් ලබන අයට වඩා වාසියක් වෙන විධියට බදු එකතු කිරීමේ අනුපාතය 60:40ට ගෙනෙනවා"ය කියන්නේ කොහොමද? එහෙම තමයි තමුන්නාන්සේලා පළමුවෙන් කිව්වේ. "අපි ක්‍රමානුකූලව සෘජු බදු 40ට ගෙනෙනවා. වක්‍ර බදු 60කට ගෙනෙනවා" කිව්වා. නමුත් ඇත්තටම වුණේ මොකක්ද? තමුන්නාන්සේලා අය වැය ලේඛන තුනක් ඉදිරිපත් කළා. සමස්ත වශයෙන් ගත්තාම ඒවා අනුව වක්‍ර බදු සියයට 85ක් පමණ වෙලා තිබෙනවා. සෘජු බදු සියයට 15ක් වෙලා තිබෙනවා. ඊට කලින් තිබුණේ,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම අවසාන කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආණ්ඩුව තමන්ගේ ඉහළ පන්තිය වෙනුවෙන් සේවය කිරීම සඳහා වෙස්මුහුණක් දමාගෙන අද මේ රටේ පහළ මධ්‍යම පන්තියත්, මැද මධ්‍යම පන්තියත් ඉලක්ක කරගෙන මේ ගෙනයන බදු ප්‍රතිපත්තිය අවසාන වශයෙන් මේ රටේ ආර්ථික ක්‍රියාකාරිත්වය දුර්වල කරන බව මතක් කරමින් මා නිහඬ වනවා.

[අ.භා. 12.51]

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත ඉදිරිපත් කර වසර 11ට පසු නව දේශීය

[ගරු අශෝක් අබේසිංහ මහතා]

ආදායම් පනත් කෙටුම්පතක් දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කළ අවස්ථාවේ මට කථා කිරීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව මා ඉතාම සන්තෝෂ වනවා.

අපි මේ පනතින් බලාපොරොත්තු වන්නේ ඉහළ ආදායම් ලබන, එහෙත් බදු නොගෙවා සිටින ව්‍යාපාරිකයන් බදු ගෙවීම සඳහා යොමු කරවීමයි. ඒ වාගේම, එම බදුවලින් මේ රටේ පහළ ආදායම් ලබන අයට සුබසාධනය ඇති කිරීම සහ මේ රටේ බදු ආදායම ඉහළ නැංවීමයි.

1950දී අපේ රටේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 16.1ක් වශයෙන් තිබුණා. එය ක්‍රම ක්‍රමයෙන් වැඩි වුණා. 1977දී විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නාට පසු 1978 වනවිට අපේ රටේ එදා මෙදා තුර තිබුණු වැඩිම ආදායම වුයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 28.9යි. ඉන්පසුව අප රජය 1977 සිට 1994 දක්වා මේ රට පාලනය කළා. 1994 වර්ෂයේ ආදායම, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 20.4ක් වනවිට අපේ රජය වෙනස් වෙලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ රජයක් පැමිණියා. ඔවුන් 1994 සිට 2014 දක්වා රට පාලනය කළා. නැවත 2015දී අපි රට භාරගන්නා විට අපේ රටේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 11.6ක් දක්වා අඩු වෙලා තිබුණා. ඒ තත්ත්වය තුළ නැවත අපි මේ රටේ ආදායම වැඩි කිරීම සඳහා අපේ අය වැය කිහිපය තුළින් යම් යම් ක්‍රියා මාර්ග ගත්තා. ඒ අනුව මේ වනවිට අපේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15ට ආසන්න වී තිබෙනවා. ඒ තත්ත්වය තුළ, මේ රටේ ආදායම වැඩි කිරීම සඳහා විශාල පිටුවහලක් මෙම නව දේශීය ආදායම් පනතින් ඇතිවෙයි කියා අප බලාපොරොත්තු වනවා.

අපේ රටේ අය වැය ඉදිරිපත් කිරීමේදී අපි ඇස්තමේන්තු කරන ආදායම ඉදිරිපත් කරනවා. මා හැම වෙලාවේම මේ කාරණය කියනවා. නමුත් අපි ඇස්තමේන්තු කරන ආදායම කවදාවත් අපට ලැබෙන්නේ නැහැ. ඊට වඩා සියයට 20ක් පමණ අඩුවෙන් තමයි ලැබෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම මේ ආදායම් එකතු කිරීමේ ව්‍යුහය ශක්තිමත් කරන්න ඕනෑ. විපක්ෂයෙන් කිව්වා, මේක හිඟන්නන්ටත් බදු ගහන පනතක් කියලා; පුණ්‍ය ආයතනවලටත් බදු ගහන පනතක් කියලා. නමුත් මම මේ අවස්ථාවේ කියන්න ඕනෑ, හිඟන්නෙක් වුණත් ආදායමක් ලබලා එයින් ව්‍යාපාරයක් කරනවා නම්, ඒ ලබන ආදායමින් මේ පනත අනුව අනිවාර්යනේම බදු ගන්න සිද්ධ වෙන බව. ව්‍යාපාරයක් කරනවා නම්, අනිවාර්යයෙන්ම ඒ බදු ගෙවිය යුතුයි. පුණ්‍ය ආයතනයක, පන්සලක පිං කැටයට ලැබෙන මුදල්වලට අපි බදු ගහන්නේ නැහැ. නමුත් ඒ පුණ්‍ය ආයතනය ව්‍යාපාරයක් කරනවා නම්, ඒ ව්‍යාපාරයෙන් ආදායමක් ලබනවා නම්, ඒ ආදායමට අනුව මේ රටට බදු ගෙවන්න ඕනෑ. එහෙම නැතුව රටක් ඉදිරියට අරගෙන යන්න බැහැ. බෞද්ධ විහාර හා දේවාලගම් පනතේ 42 වගන්තියේ තිබෙන්නේත් ව්‍යාපාරයක් කරනවා නම් පමණයි බදු ගෙවන්න වෙන්නේ කියලායි. එහෙම නැත්නම් බදු ගෙවන්න වෙන්නේ නැහැ. ඒ විහාරස්ථානයේ අභිවෘද්ධියට ලැබෙන මුදල්වලින් ව්‍යාපාරයක් නොකරනවා නම් බදු ගෙවන්න වන්නේ නැහැ.

විශේෂයෙන්ම අපි මේ දේශීය ආදායම් පනත තුළින් බලාපොරොත්තු වන්නේ ආදායම ඉහළ නැංවීමයි. රජයේ රැකියා කරන අය, ව්‍යාපාරිකයන් සහ ස්වයං රැකියා කරන අය අපේ රටේ අසූහතර ලක්ෂයක් සිටිනවා. මෙයින් දහහතර ලක්ෂයක් රජයේ රැකියා කරනවා. ඒ අයගෙන් බදු ගෙවන්නේ එක්ලක්ෂ හතළිස් දහසකට වඩා අඩු පිරිසක්. ඒ කියන්නේ රුපියල් ලක්ෂයකට වඩා වැඩියෙන් උපයන අයගෙන් පමණයි බදු ගන්නේ. ලක්ෂයට වඩා අඩුවෙන් උපයන අයගෙන් බදු ගන්නේ නැහැ.

අපේ රටේ දැනට ව්‍යාපාරික ස්ථාන පමණක් විසි ලක්ෂයක් තිබෙනවා. නමුත් වැට් ගෙවන ලිපි ගොනු තිබෙන්නේ 15,696යි.

ජාතිය ගොඩනැඟීමේ බදු ලිපිගොනු තිබෙන්නේ 21,700යි. Economic Service Charge - ESC- බදු ගෙවන ලිපිගොනු තිබෙන්නේ 4,026යි. අපි මේ රජය භාර ගන්නා විට සමස්ත බදු ලිපිගොනු ප්‍රමාණය 6,90,000කට සීමා වී තිබුණා. නමුත් අපේ රජයේ ආර්ථික ප්‍රතිපත්ති මත මේ බදු ලිපිගොනු ප්‍රමාණය ලක්ෂ 14ක් දක්වා වැඩි කරලා, රටේ ආදායම ශීඝ්‍රයෙන් වැඩි කර ගැනීම සඳහා මේ අවස්ථාවේ අපි ක්‍රියාත්මක කරගෙන යන වැඩ පිළිවෙළ තුළ 2020 වන විට බලාපොරොත්තු වන ආදායම අපේ රට ලැබෙයි කියලා අපි හිතනවා. අපේ ඇමතිතුමා කිව්වා, මෙම දේශීය ආදායම් පනත ක්‍රියාත්මක වීමෙන් පසුව රුපියල් බිලියන 45ක් නැත්නම් කෝටි 4,500ක ආදායමක් බලාපොරොත්තු වෙනවාය කියලා. නමුත් දැනට අප රටේ බදු ලිපිගොනු තිබෙන, නමුත් බදු නොගෙවන ප්‍රමාණය; ගෙවීම පැහැර හරින බදු ප්‍රමාණය 2015 වසරේ පමණක් රුපියල් කෝටි 15,984ක්. ඒ කියන්නේ 2015 වසරේ බදු ගෙවන අය රුපියල් බිලියන 159ක බදු ප්‍රමාණයක් ගෙවීම පැහැර හැර තිබෙනවා. මේක විශාල මුදල් ප්‍රමාණයක්. අපි මේ යෝජනාවෙන් බලාපොරොත්තු වන්නේ රුපියල් කෝටි 4,500යි. ඒ කියන්නේ බදු ගෙවන්නන් විසින් රුපියල් බිලියන 45ට වඩා බදු ගෙවීම පැහැර හරිනවා. මේ ගෙවීම පැහැර හරින බදු එකතු කිරීම සඳහා යම් කිසි වැඩ පිළිවෙළක් අනිවාර්යයෙන්ම සැකසිය යුතුය කියලා මම මේ අවස්ථාවේ මුදල් ඇමතිතුමාට විශේෂයෙන්ම ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ බදු අනුපාත සියයට 10, සියයට 12, සියයට 15, සියයට 28 සහ සියයට 40 වශයෙන් ඉතා සංකීර්ණ විධියට තිබුණා. නමුත් මෙවර අපි සියයට 10, සියයට 12, සියයට 15 කියන බදු අනුපාත තුනම ඉවත් කරලා සියයට 14ක තනි බද්දක් බවට පත් කර තිබෙනවා. විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා තිබුණු සියයට 28 බද්ද මේ පනත මඟින් සමහර ව්‍යාපාර සඳහා සියයට 14 දක්වා අඩු කර තිබෙනවා. විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා පසු ගිය දිනවල ණය යෝජනා ක්‍රම කිහිපයක් අපි හඳුන්වා දුන්නා. ඒ ණය යෝජනා ක්‍රම කිහිපය තුළින් "දිවි උදාන" කියලා රජයේ සහන පොලී සඳහා ණය යෝජනා ක්‍රම කිහිපයක් අපි හඳුන්වා දුන්නා. ඒ තුළින් මේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඉදිරියට ගෙන යාම සඳහා එම ව්‍යාපාරිකයන්ට විශාල රුකුලක් ලැබෙන බව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕනෑ. "රන් අස්වැන්න" ණය යෝජනා ක්‍රමය තුළින් සියයට 6.54 පොලිය යටතේ රුපියල් මිලියන 750 දක්වා ණය මුදලක් ලබා දෙනවා. විශේෂයෙන්ම එම පොලී අනුපාත පහත දැමීම නිසා මේ ණය යෝජනා ක්‍රම සඳහා, මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 4,475ක්, ඒ කියන්නේ රුපියල් කෝටි 447ක් සහනාධාර දෙනවා. විශේෂයෙන්ම සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි "රන් අස්වැන්න" ණය යෝජනා ක්‍රමය, "ගොවි නවෝදා" ණය යෝජනා ක්‍රමය, "රිය ශක්ති" ණය යෝජනා ක්‍රමය, "රිවි බල සවි" ණය යෝජනා ක්‍රමය, "දිරි සවිය" ණය යෝජනා ක්‍රමය, "ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය, "මාධ්‍ය අරුණ" ණය යෝජනා ක්‍රමය, "සොඳුරු පියස" ණය යෝජනා ක්‍රමය ආදී වශයෙන් ණය යෝජනා ක්‍රම රාශියක් පසු ගිය කාලය තුළ අපි හඳුන්වා දී තිබෙනවා. විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා මෙම දේශීය ආදායම් පනත් කෙටුම්පත ගෙනාවත්, ඔවුන්ට විශාල ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. මක් නිසාද, අපි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා ණය යෝජනා ක්‍රම රාශියක් ඉදිරිපත් කර තිබෙන නිසා.

විශේෂයෙන්ම අපි බලාපොරොත්තු වන්නේ සියයට 80ක් වන වක්‍ර බදු අනුපාතය සියයට 60 දක්වා අඩු කරන්නයි. මේක

අවුරුද්දෙන්, දෙකෙන්, මාසයෙන් කරන්න පුළුවන් වැඩක් නොවෙයි. සාමාන්‍යයෙන් ලෝකයේ තිබෙන ඍජු බදු අනුපාතය සියයට 40ක් වෙනවා. නමුත් අපේ රටේ තිබෙන ඍජු බද්ද සියයට 20යි. එය වැඩි කිරීම සඳහා මේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම තුළින් පුළුවන් වෙයි කියලා මා හිතනවා. මේවා ක්‍රියාත්මක වන්නේ 2018 අප්‍රේල් මාසයේය කියලා ගරු ඇමතිතුමා කිව්වා. 2018 අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක වුණොත් අපට මේ ආදායම ලැබීම 2019 වන තෙක් කල් යනවා. ගරු දයාසිරි ජයසේකර මැතිතුමා කිව්වා, මෙය ක්‍රියාත්මක කිරීම 2019 දක්වා කල් දමන්න කියලා. මොකද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරින් සමඟ අපි සාකච්ඡා කර තිබෙනවා. මේ තුළින් අපේ ආදායම අඩු වෙයිද කියන ප්‍රශ්නය ඔවුන්ට ඇති වෙලා තිබෙනවා.

කෙසේ වෙතත්, ක්‍රම ක්‍රමයෙන් මේ ක්‍රමය අපේ රටේ ජනතාවට හුරු කරමින්, අපේ රටේ ආදායම වැඩි කරමින්, ඒ ලැබෙන ආදායම විශේෂයෙන්ම පහළ ආදායම් ලබන අයගේ සුබසාධන කටයුතු සඳහා යොමු කරමින්, 2025 වන විට මේ රට දියුණු ආර්ථිකයක් සහිත රටක් බවට පත් කිරීමට අපි බලාපොරොත්තු වනවා. ඩොලර් 5,000ට වැඩි ඒකපුද්ගල ආදායම, 2025 වන විට ඩොලර් 7,500කට වැඩි ඒකපුද්ගල ආදායමක් සහිත රටක් බවට පත් කිරීමට මෙම දේශීය ආදායම් පනත් කෙටුම්පත උපකාරී වනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

The next speaker is the Hon. Ajith Mannapperuma. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දේශීය ආදායම් පනත් කෙටුම්පත උත්තරීතර පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා අද දින ඉදිරිපත් කර තිබෙනවා. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේදී සංශෝධන විශාල ප්‍රමාණයකට යටත්වීම සුවිශේෂ කාරණාවක් වනවා. මේ රජය හැම තිස්සේම සියලු දෙනා සාකච්ඡා කරලා, සියල්ලන්ගේම අදහස් සැලකිල්ලට අරගෙන තමයි යම් දෙයක් කරන්නේ. ඒ නිසා තමයි මෙපමණ විශාල ප්‍රමාණයක් සංශෝධනවලට යටත් වෙලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, ගරු ඇමතිතුමා මේ විවාදය ආරම්භයේදී ප්‍රකාශ කළා, අද කථා කරන දේවලත් හොඳ දේවල් තිබෙනවා නම් සංශෝධනය කරන්න එතුමා ලැහැස්තියි කියන කාරණය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "බදු" කිව්වාම අමුතු දෙයක් නොවෙයි. සිංහල රජ කාලයේ ඉඳලාම; ඉතිහාසයේ ඉඳලාම මේ රටේ බදු අය කළා. මුදල්වලින් විතරක් නොවෙයි, එදා බඩු- භාණ්ඩවලින් බදු අය කළා. බඩු-භාණ්ඩ වශයෙන් බදු ලබා ගත්ත අවස්ථා තිබෙනවා; අස්වැන්න ලබා ගත් අවස්ථා තිබෙනවා. මෑත ඉතිහාසය දිහා බැලුවොත්, අලුතින් බදු පනතක් ගෙන ආවේ 2000 වර්ෂයේ දීයි. අවුරුදු 6කට පසුව 2006 වර්ෂයේ නැවතත් බදු පනතක් අලුතින් ආවා. නැවත අවුරුදු 11කට පසුව 2017 වර්ෂයේ තමයි මේ බදු පනත් කෙටුම්පත ගෙන ආවේ. හැබැයි, ලෝකයේ ආදායම් උත්පාදන ක්‍රමවේද සීඝ්‍රයෙන් වෙනස් වෙද්දී; ලෝකයේ ස්වභාවය, දියුණුවීම, ආදායම් යනාදිය සීඝ්‍රයෙන් වෙනස් වෙද්දී මෙම පනත් කෙටුම්පත ගෙන එන්නට අවුරුදු 11ක කාලයක් ගතවීම ගැන අපි කනගාටු වෙන්න ඕනෑ. කොහොම වුණත්, මේ කරුණ සැලකිල්ලට ගෙන අද බදු පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම ගැන වර්තමාන රජයටත්, ගරු මුදල් ඇමති මංගල සමරවීර මැතිතුමාටත් ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන්ම මේ බදු පනත් කෙටුම්පත හොඳට අධ්‍යයනය කරලා බැලුවාම, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ වැඩිපුර බදු ගන්න නොවෙයි. බදු ගෙවන්න සුදුසුකම් ලබපු අය බදු ගෙවන එක පැහැර හරිනවා. අන්න ඒ අයව බදු දැලට එකතු කර ගන්න තමයි මේ බදු පනත් කෙටුම්පත විශේෂයෙන්ම ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ නීතිය දිහා බැලුවත් පුළුවන් අය; බලවත් අය මේ නීතියෙන් පැනලා යන බව අප කවුරුත් දන්නවා. බදු ප්‍රතිපත්ති දිහා බැලුවත්, බදු ක්‍රමවේද දිහා බැලුවත්, බදු දැලත් හරියට මකුළු දැලක් වාගේයි. පුංචි සතෙක් මකුළු දැලට අහු වෙනවා මිසක්, ලොකු සතෙක් මකුළු දැලට අහු වෙන්නේ නැහැ. අන්න ඒ වාගේ තමයි බදු දැලේ ස්වභාවයත්. නමුත් මෙම අවස්ථාවේදී අපි දකිනවා, අලුත් බදු පනත් කෙටුම්පත තුළින් උපයන සියලුම අය බදු ක්‍රමවේදයට එක්කාසු කර ගැනීමේ ක්‍රමවේදයක් නිර්මාණය කර තිබෙන බව. නමුත්, කිසිම බද්දක් වැඩි කරලා නැහැ. මේ රටේ එක පුද්ගලයෙකුට කිසිම බද්දක් නැතිව මාසයකට රුපියල් ලක්ෂයක ආදායමක් ගන්න පුළුවන්. ඒ කියන්නේ බදු ලිහිල් කරලා තිබෙනවා. නමුත්, බදු ගෙවන්නන් ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා කටයුතු කරනවා. අපි දන්නවා, මේ රටේ බර අදින්නේ ආදායම උපයන අය නොවෙයි කියා. රට කරවන ආදායමට දායක වෙන්නේ ආදායම උපයන අය නොවෙයි, අහිංසක දුප්පත් මිනිස්සු. Pickpocket ගහලා ගන්න බද්දෙන්; දන්නේම නැතිව ගත්තු බද්දෙන්. වර්තමාන රජය බලයට ඇවිල්ලා මේවා හෙළි කරලා තිබෙනවා, "මෙන්න බදු අය කරන විදි" කියලා. පසු ගිය කාලයේ මේ දේවල් කවුරුවත් දැන ගෙන හිටියේ නැහැ. නමුත් අද සියයට 80ක් රට කරවන්නේ දුප්පත්, අහිංසක මිනිස්සුන්ගෙන් ලබා ගන්නා බද්දෙන්. මෙය අඩුම ගණනේ සියයට 60 දක්වා අඩු කර ගැනීමත් මේ පනත් කෙටුම්පතෙන් බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර වෙලාවට කියනවා, "හිඟන්නන්ගෙනුත් බදු අය කරන ක්‍රමයක් මේ හදලා තිබෙන්නේ" කියලා. නමුත් මම පැහැදිලිව කියනවා, ඒ විධියට බැලුවොත් මේ රටේ ජනතාව සීනි ටිකක් මිල දී ගන්න කොට; තේ කොළ ටික ගන්න කොට; පාන් ගන්න කොට; වෙනත් කෑම ටිකක් මිල දී ගන්න කොට හිඟන්නාත් සියයට 80ක් රටේ බදු එකතු කිරීමට දායක වෙච්ච යුගයක් තිබුණු බව. අපි උත්සාහ කරන්නේ එය සියයට 60 දක්වා පහළ දමන්නයි.

2015 ජනවාරි 8වැනිදා වන විට පැවති රජය වෙනස් කිරීමේදී ජනතාව කරපු එක ඉල්ලීමක් තමයි, මේ රටේ වංචාව, දූෂණය නැති කරලා දමන්න කියන කාරණය. ඒ කියන්නේ, මේ රටේ කළු සල්ලි උපයන එක නැති කරන්න, මූල්‍ය පරිපාලනය ඇති කරන්න කියන ඉල්ලීම. එදා හම්බන්තොට වරාය වෙනුවෙන් කොපමණ ණය මුදලක් ගත්තාද කියලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් අපි දැනගෙන සිටියේ නැහැ. අපි ඒවා හොයන්න ගියාම ගුටි කාලා, පිස්තෝල්කාරයින්ගේ ප්‍රහාරවලට ලක් වෙන්න සිදු වුණා. නමුත්, ඒවා හොයා ගන්න බැරි වුණා.

අද ගරු අගමැතිතුමා, -විශේෂයෙන්ම නව රජය- සියලු මූල්‍ය කටයුතු පිළිබඳව මේ පාර්ලිමේන්තුව දැනුවත් කරමින් විනිවිදභාවය තුළ කටයුතු කරනවා. මේවාටත් විවිධ විවේචන එල්ල වෙනවා. අපි ඒ විවේචනවලට මුහුණ දෙන්න සූදානම්. ඒ

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

වාගේම අද රටේ කළු සල්ලි නිර්මාණය නොවන ආකාරයේ ක්‍රමවේදයක් හදන්න ඕනෑ.

අපි දන්නවා, පසු ගිය කාලයේ සිදු වුණේ මොනවාද කියලා. පසු ගිය රජය කාලයේ මූල්‍ය පාලනයක් නොතිබුණු නිසා සිදු වුණු සිද්ධීන් පිළිබඳව අද අධිකරණය ඉදිරියේ විභාග වනවා. CSN නාළිකාවට අයත්ව තිබුණු රුපියල් කෝටි 8ක් වටිනා සන්නිවේදන ට්‍රක් රථය අද ජාතික රූපවාහිනියට දීලා තිබෙනවා, හම්බ කරපු සල්ලි පෙන්වන්න බැරිව. ඒ විතරක් නොවෙයි, ඇම්ට්‍රැඩ් හෝල්ඩිංස් ප්‍රයිවට් ලිමිටඩ් කියන එක්තරා පෞද්ගලික බැංකුවක තැන්පත් කර තිබුණු රුපියල් කෝටි 15ක මුදල අද රාජ සන්තක කර තිබෙනවා, ඒ සල්ලි සෙව්වේ කොහොමද කියන එක පිළිගන්න බැරිව. මල්වානේ තිබුණු අක්කර 16ක පොල් ඉඩමේ සහ සුඛෝපභෝගී නිවසේ වටිනාකම රුපියල් කෝටි 20යි. එහි අයිතිකාරයෙක් නැහැ. ඒ සල්ලි ඉපැයුවේ කොහොමද? ඒ කළු සල්ලි නිර්මාණය වුණු ක්‍රමවේදයක් මේ රටේ තිබුණා. ඒ කළු සල්ලි නිර්මාණය වුණු ක්‍රමවේදයට වැට බැඳීම තමයි අපි කරන්නේ. ගම්පහ ඔරුතොට පාරේ තිබුණු ඉඩමේ වටිනාකම රුපියල් කෝටි 15යි. එහි අයිතිකරුවන් අද අධිකරණය ඉදිරියේ නිරුත්තර වෙලා තිබෙනවා. මේ විධියට සල්ලි හම්බ කරපු අවස්ථා බොහොමයක් තිබෙනවා. අයිතිකරුවන් නැති ඉඩම් මේ රටේ බිහි වුණා. අයිතිකරුවන් නැති වත්කම් මේ රටේ බිහි වුණා. අපේ සිංහල ඉතිහාසයට තවත් ප්‍රස්තාව පිරුළක් එකතු වුණා, "ඩේසි ආච්චිගෙ මැණික් මල්ල වාගෙයි" කියලා. ඉඩම් ගන්න සල්ලි කොහෙන්ද ලැබුණේ කියලා ඇහුවාම හොරෙක් ඇවිල්ලා ඩේසි ආච්චිගේ ගෙදරට මැණික් මල්ලක් තබා ගිහින් තිබෙනවාය කිව්වා. මේ මැණික් මල්ල සල්ලි කරලා තමයි ඉඩම් අරගෙන තිබෙන්නේ. සල්ලි හම්බ කරලා තිබෙන්නේ එහෙමයි. මේ රටේ රුපියල් කෝටි ප්‍රකෝටි ගණන් ධනය හොරකම් කරපු යුගය නවත්වන්න තමයි අලුත් දේශීය ආදායම් පනත ක්‍රියාත්මක වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

විශේෂයෙන්ම අපි කියනවා, ඒ නිසාම අපට පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය ඇති කරන්න සිද්ධ වුණා, ඒ වාගේම සාපරාධී ක්‍රියාවලදී අන්‍යයන්ගේ සහයෝගය ලබාගන්න පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්න අපට සිද්ධ වුණාය කියලා. මෙවැනි දේ තුළින් මේ රටේ කළු සල්ලි උපයන එක නවත්වන්න අපි උත්සාහ කළා. අද මේ ඉදිරිපත් කර තිබෙන දේශීය ආදායම් පනත් කෙටුම්පත, සියලු පෞද්ගලික මූල්‍ය පරිහරණය විනිවිදභාවයකින් දැකලා බදු ගෙවිය යුතු කෙනාට බදු ගෙවන්නත්, අහිංසක මනුෂ්‍යයින්ගෙන් බදු එකතු කරන එක අඩු කරන්නත්, නැති කරන්නත් කරන ක්‍රමවේදයක් කියලා අපි දකිනවා. අහිංසක දුප්පත් මිනිසුන් වෙනුවෙන් කථා කරන යම් කෙනෙක් ඉන්නවා නම්, තැළිලා, පොඩිවෙලා, පෑගිලා මේ රට කරවන ආදායමට සියයට 80ක් දායකවන අහිංසක දුප්පත් මිනිසුන් බේරා ගන්න, එහෙම නැත්නම් සෘජු බදු ක්‍රමවේදය වැඩි කරන්න යන මේ බදු ප්‍රතිපත්තියට සහයෝගය දෙන්න ඕනෑය කියන එකත් ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. The next speaker is the Hon. (Prof.) Ashu Marasinghe. Before that, will an Hon. Member propose the Hon. Lucky Jayawardana to the Chair?

ගරු දිලිප් වෙදආරච්චි මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு திலிப் வெதஆரச்சி - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilip Wedaarachchi - State Minister of Fisheries and Aquatic Resources Development)
"ගරු ලකී ජයවර්ධන මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 1.08]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සාකච්ඡාවට භාජන වන දේශීය ආදායම් පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කරන්න ලැබීම ගැන මා සතුටට පත්වනවා. විශේෂයෙන් රටේ නිදහස් අධ්‍යාපනයට, නිදහස් සෞඛ්‍යයට ආදී වශයෙන් ජනතාව වෙනුවෙන් වැය කරන්න මුදල් සොයන්න අවශ්‍ය ඉතාමත් වටිනා පනත් කෙටුම්පතක් හැටියට තමයි අපි මේ පනත් කෙටුම්පත දකින්නේ. මේ පනත් කෙටුම්පත මඟින් ලැබෙන වාසිය කෙළින්ම ලැබෙන්නේ රටේ මහ ජනතාවටයි; රටේ දුගී දුප්පත් ජනතාවටයි. මේ පනත් කෙටුම්පත හරහා අපි කරන්න උත්සාහ කරන්නේ රටට අවශ්‍ය බදු ආදායම එකතු කර ගන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෘජු බදු හා වක්‍ර බදු වශයෙන් බදු ආදායම් වර්ග දෙකක් තිබෙනවා. සෘජු හා වක්‍ර බදු ආදායම් ගැන කථා කරනකොට ආසියානු රටවල බදු ආදායම, ඒ කියන්නේ සෘජු බදු ආදායම - direct tax - වශයෙන් GDP එකෙන් කොපමණ percentage එකක් තිබෙනවාද කියලා මා බැලුවා.

උදාහරණයක් වශයෙන්, Maldivesවල සියයට 32.9ක් තිබෙනවා, මැලේසියාවේ සියයට 25ක් තිබෙනවා, Thailandවල සියයට 24ක් තිබෙනවා, චීනයේ සියයට 22.9ක් තිබෙනවා, Myanmarවල සියයට 22.3ක් තිබෙනවා, Vietnamවල සියයට 22.1ක් තිබෙනවා, Indiaවල සියයට 20ක් තිබෙනවා, Nepalවල සියයට 19.2ක් තිබෙනවා, 2015 අප්‍රේල් මාසය වනවිට ලංකාවේ සියයට 13.1ක් තිබෙනවා. එතකොට මේ region එකෙන්ම අඩුම සෘජු බදු ආදායමක් තිබෙන්නේ ලංකාවේයි. එහෙම නම් මේ සෘජු බදු ආදායම තබාගෙන අපි නිදහස් අධ්‍යාපනයට වියදම් කරන්නේ කොහොමද, නිදහස් සෞඛ්‍යයට වියදම් කරන්නේ කොහොමද?

මේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති අනුව, රට යහපත් මාර්ගයකට යනකොට රටේ මහජනතාවගේ සහනාධාර වෙනුවෙන් වැය කරන්න අවශ්‍ය මුදල් සොයා ගන්න වෙනවා. මෙහි ප්‍රධාන ආදායමක් වෙන්නේ සෘජු බදු ආදායම. විවිධ ආදායම් බදු වර්ග තිබෙනවා. Corporate income tax එක නැත්නම් සමාගම් සඳහා වන සෘජු බදු ආදායම අපි මෙහිදී ප්‍රධාන වශයෙන් අර්ථ කථනය කරනවා. සමාගම් සඳහා වන සෘජු බදු ආදායම දැනට අලුත් පනත් කෙටුම්පත යටතේ අර්ථ කථනය කර තිබෙන්නේ, "taxable income" එක වශයෙනුයි. ඒ අනුව අවුරුද්දකට මිලියන පහකට වඩා ආදායම අඩු වෙනවා නම්, ආදායම මිලියන පහකට වඩා වැඩි වෙනවා නම්, ආදි වශයෙන් එය අර්ථ කථනය කර තිබෙනවා. එහෙම නම් තිබෙන්නේ, profits තිබෙනවා නම් කොහොමද බදු එකතු කරන්නේ කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දත්ත ගැන කථා කළා. අපේ දත්ත හැටියට ලියාපදිංචි ව්‍යාපාර - registered companies - තිබෙන්නේ අසූ දාහක විතර ප්‍රමාණයක්. හැබැයි මේ ලියාපදිංචි ව්‍යාපාර අසූ දාහෙන් tax files විවෘත කර තිබෙන්නේ ව්‍යාපාර හතළිස් හය දාහකයි. මේ ව්‍යාපාර හතළිස් හයදාහෙනුත් 2017.03.31 ට තිබෙන දත්ත අනුව ආදායම් බදු ගෙවන්නේ සමාගම් දහසය දහස් අටසිය හැත්තෑහතරක් විතරයි. මේ රටේ ආදායම් බදු වශයෙන් රුපියලක් හෝ ගෙවන සමාගම් තිබෙන්නේ දහසය දහස් අටසිය හැත්තෑහතරක් විතරයි නම්, මේක හරිද? අපි මේ ආදායම ලබා ගන්න කරන ක්‍රමවේදය තුළ නියමිත බදු ආදායම ලබා දෙනවාද කියන කාරණය තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බදු ආදායම ගැන කියනකොට අපේ ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා පොතක් පළ කර තිබෙනවා. මම බලාපොරොත්තු වුණේ එතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්නට ලැබෙයිද කියායි. නමුත් එතුමා කථා කළේ නැහැ. එතුමා ඇවිත් ඉන්න නිසා, එතුමාත් එක්ක විවාදයකට යන්නත් එක්ක" බදු දඩයම" කියන පොත ගැන විග්‍රහයක් කරන්න කැමතියි. එතුමාගේ මේ පොත ගැන බැලුවාම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද මේ පොත ගැන බැලුවාම පෙනෙන්නේ, අපි මේ ඉදිරිපත් කර තිබෙන දේශීය ආදායම් පනත් කෙටුම්පතට පිට කවරයක් දාලා බෙදා හැර තිබෙනවා වාගෙයි. මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඇත්තවශයෙන්ම රජය විසින් කළ යුතු දෙයක්. එතුමා ලස්සනට දේශීය ආදායම් පනත් කෙටුම්පතට පිටකවරයක් දාලා බෙදා තිබෙනවා. එතුමා මේ පොතේ බොහොම ලස්සන විග්‍රහයක් කරනවා. මම හිතුවා, මට මේ පොත කියවන්න සතියක කාලයක්වත් යාවිය කියා. මොකද, හර බර ඇතිව ලියා තිබෙනවා. එතුමා අපේ පාසල් කාලයේත් බොහොම ප්‍රසිද්ධ දේශකයෙක්. මා නම් එතුමාගෙන් ඉගෙන ගත්තේ නැහැ. මොකද, මා ගණිත අංශයෙන් ඉගෙන ගත් නිසා. එතුමාගේ මේ පොත බැලුවාම පේනවා, මේ පොතේ සියයකට අනුවකට කිට්ටුවෙන්න, මේ දේශීය ආදායම් පනත් කෙටුම්පතෙන් එහෙම පිටින්ම copy කර තිබෙන බව. ඒත් එක්කම සමහර පිටුවලට පරණ පනතෙනුත් copy කර තිබෙනවා. ඒ copy කිරීම තුළ මේ වාගේ පොතක් සාමාන්‍යයෙන් එක් රැයකින් වාගේ ලියන්න පුළුවන්. එම නිසා මේ "බදු දඩයම" කියන පොතම සම්පූර්ණ බොරුවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ කථාවෙන් මේ ගැන පැහැදිලි කිරීමක් අපි බලාපොරොත්තු වෙනවා. මේ පොතේ තිබෙන කාරණා ගත්තාම, එතුමා සංශෝධන නවයක් ඉදිරිපත් කර තිබෙනවා. මේ සංශෝධන නවයම copy කරලා තිබෙන්නේ. ඒ සංශෝධන නවයටම එතුමා කලින් දේශීය ආදායම් පනතේ තිබුණු ටික අලුතෙන් ඇතුළත් කර තිබෙනවා. ඒ වාගේම අවසානයේදී එතුමා සඳහන් කරනවා, එතුමාට Doctor of Philosophy, Beijing Foreign Studies University එකෙන් ලැබුණු ශිෂ්‍යත්වයක් ගැන. ඒ අනුව එතුමාගේ ආචාර්ය උපාධිය සඳහා මේ පොත පාවිච්චි කරනවාද කියා පොඩ්ඩක් සැක සිතෙනවා. එහෙම වෙනවා නම් මේ ආචාර්ය උපාධිය ලබා දෙන විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන්ද ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේ වාගේ copy කර ලියන පොත්වලට ආචාර්ය උපාධිය දෙනවා ද? එතුමා ඒ ගැන උත්තර දෙයි කියා මා බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදු ආදායම -income tax - ගැන කථා කරනකොට පැහැදිලිවම සඳහන් කර තිබෙනවා, මේ දේශීය ආදායම් පනත් කෙටුම්පතට අනුව වර්ෂයක ආදායම හැටියට ලක්ෂ 12 ක් දක්වා අදායම් බද්දෙන් නිදහස් කර තිබෙන බව. ඒ කියන්නේ මුලින් ලක්ෂ පහක් සහ ලක්ෂ හතක් වශයෙන් ලක්ෂ 12ක බදු සහන ලබා දී තිබෙනවා, ආදායම් උපදවන කෙනෙකුට.

ඒ කියන්නේ මාසයකට රුපියල් ලක්ෂයක ආදායමක් ලබන කෙනෙකුට ආදායම් බදු ගෙවිය යුතු වන්නේ නැහැ. එහෙම නම්, ඒ පුද්ගලයා ආදායම් බදු ගෙවිය යුතු වන්නේ තමන් ලබන රුපියල් ලක්ෂයට අමතරව උපයන මුදලටයි. අපි හිතමු, නිවාස කුලියට දීමෙන්, වෙනත් ආදායම් මාර්ගයකින් ආදී වශයෙන් එකතු කරන මුදල්වලින් ලාභයක් ලබනවා නම්, ඒ ලාභයට පමණයි taxable වන්නේ. මන්ත්‍රීවරු හැටියට අපත් tax එකක් ගෙවනවා. ඒ PAYE tax එක. මේ PAYE tax එක මා ගණනය කළා. අගෝස්තු මාසයේ මගේ වැටුපට අනුව මාසයකට මාත් රුපියල් 16,425ක බද්දක් -tax එකක්- ගෙවනවා. එහෙම නම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනාම බදු ගෙවන පුද්ගලයෝ. එම නිසා අපි හැමෝටම tax file එකක් තිබිය යුතුය කියලායි මා හිතන්නේ. මාත් ගිය සතියේ tax file එකක් open කළා. මේ රටේ බදු ගෙවන ජනතාව හැටියට මේ රටේ සිටින අපි හැමෝටම පුළුවන්, තමන්ගේ tax file එක open කරන්න. නමුත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් බදු එකතු කිරීම සම්පූර්ණ block එකක් විධියටයි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යොමු කරන්නේ කියලා මට දැනගන්න ලැබුණා. මා හිතන්නේ මේක වැරදියි. මේක ඒ ඒ මන්ත්‍රීවරයාගේ tax file එකේ PAYE tax එක විධියට යා යුතුයි. මේ ක්‍රමය නිවැරදි කළ යුතුයි කියලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන්ගෙන් මා ඉල්ලා සිටිනවා.

බදු ආදායම් ලබා ගන්නා ක්‍රමය අනුව -අපි එම විස්තර සොයා බැලුවා.- දැනට income tax files 120,000ක් තමයි register වෙලා තිබෙන්නේ. 2016දී ඒ ගොල්ලන් 99,000ක් return කරලා තිබෙනවා. 2016දී income tax රුපියලක් හරි ගෙවා තිබෙන්නේ 37,329ක් පමණයි. එහෙම නම්, මේ ක්‍රමවේදය තුළ විශාල වැරැද්දක් තිබෙනවා. මිලියන 23ක ජනගහනයක් ඉන්න රටක income tax files තිබෙන්නේ 120,000යි නම්, අපට ප්‍රශ්නාර්ථයක් පැන නඟිනවා. 1500cc වාහන කොපමණ ප්‍රමාණයක් ලංකාවේ ධාවනය වනවාද කියලා අපි දකිනවා. උදාහරණයක් විධියට රුපියල් 10,000කට වැඩි telephone bill එකක් එන අය මේ රටේ

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

කොපමණ ඉන්නවාද? මේ ආදී කාරණා කාරණා හැටියට ගත්තාම බදු ලැබෙන; ආදායම් ලැබෙන ක්‍රමවේදයේ විශාල වරදක්, විශාල සිදුරක් තිබෙන බව අපට පෙනෙනවා. මෙන්න මේ සිදුර ගැන කල්පනා කරලා තමයි දේශීය ආදායම් පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා කලින් තිබුණු සංකීර්ණ ක්‍රමවේදය බොහොම සරල කරලා තිබෙන්නේ.

ජනතා විමුක්ති පෙරමුණේ මගේ හිතවත් සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා විශාල චෝදනාවක් කළා. හැබැයි, ඒවා චෝදනා නොවෙයි, මේ ඔක්කෝම පට්ටපල් බොරු. එතුමා චිත්‍රපට නිෂ්පාදකයෝ සහ නාට්‍ය නිෂ්පාදකයෝ ගැන සඳහන් කළා. එතුමා කරුණු ගත්තේ 2009 අංක 19 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින්. එම පනත අනුව 2009 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් යම් නාට්‍යයක් නිෂ්පාදනය කිරීමෙන් උපචිත වූ ද එම නාට්‍යය පළමු වරට මහජනතාව වෙත රඟ දැක්වීමේ දින සිට ආරම්භ වන අවුරුදු එකක කාලයක් සඳහා, ඒ තැනැත්තාගේ ලාභ සහ ආදායමෙන් හරි අඩක් නිදහස් කරනවා. නමුත්, දැන් මේ දේශීය ආදායම් පනත් කෙටුම්පත මඟින් එම සංශෝධනය ඉවත් කරනවා. දැන් මේ කිසි දෙයක් සලකන්නේ නැහැ. එතකොට මෙවැනි නිෂ්පාදකයන්ට බදු ගහන්නේ කොහොමද? මොකද, මේක මටත් අදාළ වනවා. මාත් චිත්‍රපටි සහ නාට්‍ය නිෂ්පාදකයෙකු ලෙස කටයුතු කරනවා. මම "සොක්‍රටීස්" කියලා නාට්‍යයක් නිෂ්පාදනය කළා. මම ඒකෙන් කිසිම ලාභයක් ලැබුවේ නැහැ. තව films දෙකක් මා නිෂ්පාදනය කළා. ඒවායෙනුත් ලාභයක් ලැබුවේ නැහැ. කලාකරුවෝ මේ දඩයට අහු වෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. මාත් මේ ගැන හෙව්වා. මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරින්ගෙන් මම මේ සම්බන්ධයෙන් අහලා බැලුවා. උදාහරණයකට මම නාට්‍යයක් නිෂ්පාදනය කළා කියලා හිතමු. මට එම නාට්‍ය නිෂ්පාදනය කරන්න රුපියල් මිලියන දෙකක මුදලක් වැය වුණාය කියලා අපි හිතමු. මේ රුපියල් මිලියන දෙකක මුදල වැය කරලා මේ නාට්‍ය නිෂ්පාදනය කරලා පළමුවෙනි අවුරුද්ද ඇතුළත මට මේ රුපියල් මිලියන දෙක පියවා ගන්න ලැබුණේ නැත්නම්, මම කිසිම දඩයක්, එහෙමත් නැත්නම් බද්දක් ගෙවන්න අවශ්‍ය නැහැ. මගේ නාට්‍ය සඳහා වැය වූ රුපියල් මිලියන දෙකක මුදල ලබා ගත්තාට පස්සේ මම පළමුවෙනි අවුරුද්දේ ලාභය ලෙස එහෙම නැත්නම් ආදායම ලෙස රුපියල් මිලියන තුනක් ලබා ගත්තා නම්, ඔන්න මට රුපියල් මිලියනයක ලාභයක් තිබෙනවා. මෙන්න මේ ලාභයෙන් සියයට 14ක් තමයි බද්ද හැටියට අය කරන්නේ. ඒක සාධාරණයි නේ? මම ලාභ ලබනවා නම්, ඒකෙන් කොටසක් රජයට ආදායම් බදු ලෙස ලබා දෙන්න මට යුතුකමක් තිබෙනවා. මේක තමයි මේ කියන්නේ. එම නිසා මේ රටේ කලාකරුවන්ට මම පැහැදිලිව ප්‍රකාශ කරන්නේ, මේ රජය කිසිම වෙලාවක කලාකරුවන් බද්දකට යටත් කරන්නේ නැහැයි කියලායි.

යම් නිර්මාණයකින් හෝ නිෂ්පාදනයකින් ලාභ ලබනවා නම්, අන්න ඒ ලාභයෙන් තමයි බද්දක් අය කරන්නේ. ඔබතුමන්ලා මේ කාරණය මතක තියාගන්න. අපේ උගත් සමහර මන්ත්‍රීවරු මේ ලාභයයි, ආදායමයි කියන දෙක පටලවාගෙන තිබෙනවා. සියයට 14ක් ගන්නේ ආදායමින් නොවෙයි. ශුද්ධ වූ ලාභයෙන් සියයට 14ක් අය කරනවා කියන එකයි මේ පනත් කෙටුම්පතේ සඳහන් වන්නේ. එම නිසා ඔබතුමන්ලා බදු අය කිරීම පටලවා ගන්න එපා. ලැබෙන ලාභයෙන් තමයි බදු අය කරන්නේ. කිසිම වෙලාවක ආදායමට බදු අය කරන්නේ නැහැ. ලැබෙන ලාභයට තමයි බදු අය කරන්නේ. එය මේ පනත් කෙටුම්පතේ හැම තැනම පැහැදිලිවම සඳහන් වෙනවා. ඒ ගැන මේ සියලුදෙනාම හරියාකාරව දැනුවත් විය යුතුය කියා මා හිතනවා.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන් ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහනක් දැනටමත් ක්‍රියාත්මක වෙනවා. ඔබතුමන්ලා මේ වචනය වැරදියට වටහා ගන්න එපා. පෞද්ගලීකරණයවත්, වෙනත් දෙයක්වත් නොවෙයි මේ සිද්ධ වන්නේ. පරිගණක ජාල පද්ධතියකට එකතු කරලා, දැනට පාවිච්චි කරන RAMIS හරහා සියලුම ආයතන ටික එකතු කරනවා. පාර්ලිමේන්තුවේ Public Finance Committee එකේදී අප මේ ගැන සාකච්ඡා කළා. ආයතන 35ක් විතර කැඳවලා හැම මාසයකම අප රැස් වෙනවා. අපේ target එක; අපට දැනට තිබෙන direct tax එක වන සියයට 13, සියයට 40 දක්වා වැඩි කරගන්නේ කොහොමද කියන එකයි අපට තිබෙන අභියෝගය. දළ වශයෙන් මෙය දෙගුණයකට වඩා වැඩි කරගන්න ඕනෑ. එහෙම වැඩි කරගන්නේ කොහොමද කියන ප්‍රශ්නයයි අපට තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි. ඔබතුමා විනාඩි 14ක් කථා කළා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මට ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමාගේ වෙලාවත් ලැබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔව්, ලැබුණා. ඒ වෙලාවත් අරගෙන තමයි ඔබතුමා කථා කළේ.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මට තව විනාඩියක් දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. බදු එකතු කිරීම තුළ දැනට සිද්ධ වන දෙයක් අප දකිනවා. ඒක තමයි, රටේ වෛද්‍යවරු සහ නීතිඥවරු වැනි අය ඇත්තටම බදු ගෙවනවාද කියන එක. මම උදාහරණයක් කියන්නම්. ගම්පහ Doctor කෙනෙක් ඉන්නවා. එයාගේ electricity bill එක විතරක් අවුරුද්දකට Rs. 2.4 million වෙනවා. බලන්න, ලක්ෂ 24ක විදුලි බිලක් ගෙවන දොස්තර මහත්මයෙක්. එයා Nissan X-Trail වාහනයක් පාවිච්චි කරනවා නම්, මීගමුවේ තට්ටු තුනක ගෙයක් තිබෙනවා නම්, තව තැනක තට්ටු දෙකක ගෙයක් තිබෙනවා නම් එවැනි අයගෙන් බදු අය නොකරන්නේ ඇයි? මෙවැනි වෘත්තිකයෝ සියලු දෙනාම ආදායම් බදු ලබාදිය යුතු වෙනවා. මේ රටේ ජනතාවට අප පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ, අපි කමිටුව හරහා සංශෝධනයක් ඉදිරිපත් කළ බව. Tax ගෙව්වත් නැතත්, අවුරුදු 18ට වැඩි සියලුදෙනාටම tax file එකක් හිමි විය යුතුයි. ඒක ඇත්තටම බොහොම සරල විධියට කරන්න පුළුවන්. අපේ ජාතික හැඳුනුම්පත් අංකයත් එක්ක automatic විධියට tax number එකක් හදන්න. එහෙම වුණොත් හරි ලෙහෙසියි. හැමෝම register වෙන්න ඕනෑ නැහැ. එතකොට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අපේ tax number එකක් තිබෙනවා. අපි tax ගෙවනකොට ඒ tax file එක ඉබේම ලැහැස්ති වෙලා තියෙන්නේ. මේ විධියේ system එකක් ඇවිත්, පරිගණක ජාලගත කිරීම තුළ; සරල දේශීය ආදායම් පනතේ ක්‍රමවේදය තුළ මේ කටයුතු කරගන්න අපට හැකියාව තිබෙනවා. මුදල් රාජ්‍ය ඇමතිතුමා මේ

ගරු සභාවේ දැන් ඉන්න නිසා, එතුමා පරිගණක ගැනත් දන්නා නිසා මම එතුමාගෙන් මෙන්න මේ ඉල්ලීම කරන්න කැමැතියි. මේ හැමදෙනාටම පහසු වෙන්න අපට මේ විස්තරය තිබෙන සරල "App" එකක් හදා දෙන්න පුළුවන්; මට ලැබෙන ආදායමත් එක්ක, මට ලැබෙන ලාභත් එක්ක මම මේ රටට කොයි තරම් tax එකක් ගෙවන්න ඕනෑද, ආදායම් බදු ගෙවන්න ඕනෑද කියා calculate කරගන්න. එහෙම වුණොත්, මේ රටට හරියාකාරව ලැබිය යුතු ආදායම් බදු ටික ඉතාම සරල ක්‍රමයක් ඔස්සේ එකතු කරගෙන, 2020 වන විට ඍජු ආදායම් බද්ද -Direct Tax එක- සියයට 40කට වැඩි කර ගැනීමේ අපේ target එකට යන්න පුළුවන්. එතකොට නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කරලා, නිදහස් සෞඛ්‍ය සේවාව ආරක්ෂා කරලා ජනතාවට අවශ්‍ය සියලුම සුබසාධන කටයුතු කරන්න මේ tax එක හරහා අපට හැකියාව ලැබෙනවා. අන්න ඒ කටයුත්ත අනිවාර්යයෙන්ම ඉටු කර ගන්න ලැබෙන විධියේ ඉතාම වටිනා ආකර්ෂණීය පනත් කෙටුම්පතක් තමයි අද ඉදිරිපත් කර තිබෙන්නේ. මම මුලින් කිව්වා වාගේ, ආසියාවේ අපේ කලාපයේ රටවල වැඩිම direct tax එක එකතු කරන රට බවට අපේ රට පරිවර්තනය කරගන්න මේ පනත හරහා අපට පුළුවන්කම ලැබෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කොපමණ වෙලාවක් තිබෙනවාද කියා ප්‍රථමයෙන්ම දැනගන්න කැමැතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි 30ක් තිබෙනවා.

[අ.භා. 1.25]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු උගත් මහාචාර්යතුමා දේශීය ආදායම් පනත් කෙටුම්පත පිළිබඳව කරුණු දැක්වීමේදී ප්‍රථමයෙන්ම සඳහන් කළා, මා විසින් ලියා පළ කරන ලද "බදු දඩයම" නමැති කෘතිය දේශීය ආදායම් පනත හා සම්බන්ධ එකක්ය, එය තිබෙන එකක් සම්පූර්ණයෙන්ම කොපි කිරීමක්ය කියලා. මම එතුමාට කියන්න ඕනෑ, එය මා ලියූ පළමුවන කෘතිය නොවන බව. එය මා ලියූ 42වන කෘතිය. මා විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍යයකුව සිටි අවධියේ සිට විෂයානුබද්ධව විවිධ පත පොත ලියා තිබෙන, ඒ විෂයය පිළිබඳව ප්‍රාමාණික අවබෝධයක් තිබෙන කෙනෙක්. එතුමා ගණිත අංශය, පරිගණක අංශය පිළිබඳ මහාචාර්යවරයෙක් බව කිව්වා. නමුත් ආර්ථික විද්‍යාව කියන්නේ මම අපොස (සාමාන්‍ය පෙළ) විභාගයටත් විෂයයක් ලෙස හදාරපු, අපොස (උසස් පෙළ) විභාගයටත් විෂයයක් ලෙස හදාරපු, විශ්වවිද්‍යාලය තුළදීත් ඉගෙන ගත්ත, විශ්වවිද්‍යාලයෙන් පිටතදීත් ඉගෙන ගත්ත, තවමත් ඉගෙන ගන්නා විෂයයක්. මොකද, අපේ ජීවිතවලට වැදගත් වන, මේ පාර්ලිමේන්තුවට වැදගත් වන සහ බරපතළ ලෙස වෙනස්කම්වලට භාජන වන ආර්ථික විද්‍යාව නමැති මේ විෂයය ලෝකයේ තිබෙන සමාජ විද්‍යාවන් අතර රැජින ලෙස තමයි සැලකෙන්නේ.

චීන රටේ රාජ්‍ය නායකයන් වැඩි දෙනෙක් අධ්‍යාපනය ලබා තිබෙන විශ්වවිද්‍යාලය තමයි Beijing Foreign Studies University එක. ඒ විශ්වවිද්‍යාලයෙන් අපේ රටේ දෙදෙනෙකුට ශිෂ්‍යත්ව ලබා දුන්නා, ආචාර්ය උපාධිය සඳහා. ඉන් එක් කෙනෙක් තමයි මම. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් නොවෙයි, බන්දුල ගුණවර්ධන වශයෙන් මට එක ශිෂ්‍යත්වයක් ලැබුණා. අනෙක් ශිෂ්‍යත්වය විදේශ කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයෙක් වන අමුණුගම මහත්මයාට ලැබුණා. මට පැවරුණු පර්යේෂණ කාර්යය තමයි 1952 චීන-ලංකා රබර්-සහල් ගිවිසුමෙන් පසු ශ්‍රී ලංකාව හා චීනය අතර පැවැති වෙළෙඳ, ආර්ථික සම්බන්ධතා පිළිබඳ පර්යේෂණාත්මක නිබන්ධනයක් කිරීම. ඒ සඳහා ඒ විශ්වවිද්‍යාලයේ මාගේ මහාචාර්යවරු තුන් දෙනෙක් මෙහි පැමිණියා, මම ඒ බීජිං විශ්වවිද්‍යාලයට ගියාම, ඔවුන් සාදා දුන් ක්‍රමය තුළ ඒ පර්යේෂණ නිබන්ධනය මේ වන විට නිම කරලා තිබෙනවා. එය දැන් චීන භාෂාවට පරිවර්තනය කරමින් තිබෙනවා. එතුමා එය බොහොම සරල ලෙස අරගෙන ඒකට අදාළව පොතක් ලිව්වාද කියලා අහපු එක ගැන මම කනගාටු වෙනවා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න මහජන නියෝජිතයෙකුට එවැනි ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයකින් ශිෂ්‍යත්වයක් ලැබීම පිළිබඳව රටක් වශයෙන් ආඩම්බර වෙන්න ඕනෑ. ඒ සඳහා පර්යේෂණයක් කරන්න ඒ රටෙන් මුදල් ලැබෙනවා නම්, ඒ පර්යේෂණය කරලා ඉවර වුණාට පස්සේ ඒක අගය කරලා, viva එකෙන් පස්සේ ආචාර්ය උපාධියක් ලැබෙනවා නම්, ඒක මේ පාර්ලිමේන්තුවට ආඩම්බරයක් මිසක් අගෞරවයක් නොවන බව මා එතුමාට කියන්න කැමැතියි.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එවැනි නිවැරදි කිරීමක් කරනවා නම් මම එය පිළිගන්නවා. නමුත් මේ පොතේ පිටු පසට එවැන්නක් දැමීම තුළ ඔබතුමාගේ ආචාර්ය උපාධිය නිබන්ධනයක්ද කියන හැඟීම අපට ඇති වෙනවා. ඒකයි මම එහෙම කිව්වේ. මෙකෙන් වැරදි අර්ථ කථනයක් වෙනවා. මේ පොත ගැන හැඟෙන ඒ වැරදි අර්ථ කථනය ගැනයි මම කිව්වේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මම පිළිගන්නවා. ඕනෑ කෙනෙකුට-

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ඒ කියන්නේ ඔබතුමා වක්‍රව පිළිගන්නවා, මේ පොත ඒකට අයිති වෙන්නේ නැහැ කියලා?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
වක්‍රව නොවෙයි, ඍජුව පිළිගන්නවා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ඒ වාගේම පිළිගන්නවා, මේක කොපි කරපු පොතක්ය කියන එක?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

විශ්වවිද්‍යාලයකින් මට ශිෂ්‍යත්වයක් දෙනකොට ඒ විශ්වවිද්‍යාලය ශිෂ්‍යත්වය දීම සඳහා බලන්නේ, මොකක්ද තිබෙන සුදුසුකම කියලා නේ.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ඒ ලැබුණු ශිෂ්‍යත්වය පිළිබඳව මම ඔබතුමාට හද පත්ලෙන්ම සුබ පතනවා. මොකද, ආචාර්ය උපාධිය හදාරපු කෙනෙක් විධියට ඒ පිළිබඳව මා සන්තෝෂ වනවා. මේ පාර්ලිමේන්තුවෙන් ඒ වාගේ උපාධිධාරීන් වැඩි වැඩියෙන් බිහි විය යුතුයි. ඒ ගැන වාද විවාදයක් නැහැ. ඒ ගැන මම ඔබතුමාට සුබ පතනවා. නමුත් මම කිව්වේ, මේ පොත අදාළ කර ගැනීම වැරදියි කියන එකයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ඔව්. මේ පොත අදාළ නැහැ. ඒක අදාළ වෙන්නේ අපට. පාර්ලිමේන්තුවට, රටට සහ බදු විෂයය පිළිබඳව හදාරන විද්‍යාර්ථයන්ට. මම මේ පොතේ පෙරවදනේත් ඒ ගැන ලියා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට පෙර ලංකාවේ බදු අය කළේ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේයි.

දේශීය ආදායම් පනත විශාල කෘතියක්. එම කෘතිය රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරලා, අළෙවි කරන මිල රුපියල් 1,000යි. එම පනත සම්පූර්ණයෙන් නැති වෙලා, දැන් ඒ වෙනුවට අලුත් පනතක් එනවා. ඉදිරියේදී මේ රටේ සියලුම අංශවල පාවිච්චි වෙන්නේ අද මේ පාර්ලිමේන්තුවෙන් සම්මත වන පනත් කෙටුම්පත. කිසිවෙකු දන්නේ නැහැ, පෙර පනතේ තිබුණ දේ මොනවාද කියලා. එම පනතේ තිබුණ සියලු දේ අපට වැදගත් නැහැ. පනතේ එක්තරා පරිච්ඡේදයක් තමයි අපට වැදගත්. ඒ තුන්වන පරිච්ඡේදය. තුන්වන පරිච්ඡේදයේ තමයි බදු සහන පිළිබඳව සඳහන් කර තිබුණේ. බදු සහන පිළිබඳව සඳහන් කරපු පරිච්ඡේදයේ පිටු 44ක් පුරාවටම මේ රටේ කෘෂි කර්මාන්තයට, කර්මාන්තවලට, ව්‍යවසායකයන්ට, අපනයනකරුවන්ට, විදේශ විනිමය උපයන්නන්ට, කලාකරුවන්ට, වෘත්තිකයන්ට, සේවා නියුක්තිකයන්ට ආදී විවිධ පාර්ශ්වවලට ලබා දෙන රාජ්‍ය මූල්‍ය අනුග්‍රහයන් හා බදු සානුබලයන්, බදු සහන විශාල ප්‍රමාණයක් අන්තර්ගත කරලා තිබෙනවා. ඒ පිටු 44 තිබුණු ටික අදින් පස්සේ අපේ රටේ ඉතිහාසයේ කොටසක් විතරයි. කවුරුවත් දන්නේ නැහැ. ඒ නිසා තමයි ඒ සියල්ලම මම මේ පොතට ඇතුළත් කරනු ලැබුවේ. දැන් ඕනෑම කෙනෙකුට විවිධ කට කථා කියන්නේ නැතුව, අහවල් දවසේ මැණික් කර්මාන්තයට දීලා තිබුණු සහන මොනවාද, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට දීලා තිබුණු සහන මොනවාද, සිනමා කර්මාන්තයට දීලා තිබුණු සහන මොනවාද, නාට්‍යකරණයට එහෙම නැත්නම් ග්‍රන්ථකරණයට දීලා තිබුණු සහන මොනවාද, සේවක අර්ථ සාධක අරමුදලට දීලා තිබුණු සහන මොනවාද කියලා දැන ගන්න නිශ්චිත වශයෙන්ම තිබුණු සහන මොනවාද කියන එක ඉතා පැහැදිලිව තිබෙනවා. ඕනෑ දවසක ඒ ගැන තර්ක කරන්න මම මේ කෘතියේ ඒවා සඳහන් කර තිබෙනවා. ඒ සඳහා තමයි මේ කෘතිය කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පනතේ ඒ පිටු 44 ඉවත් වුණාම -මේ සියලුම සහන ඉවත් කළාම- මේ අලුත් පනත යටතේ නිශ්චිත වශයෙන් කියලා නැත්නම් කුමන නීතියක, කොයි ආකාරයකට සහනය තිබුණත් ඒ කිසිම සහනයක් ලැබෙන්නේ නැහැ. අපි මුදල් අමාත්‍යාංශයට ගිහිල්ලා මංගල සමරවීර මුදල් අමාත්‍යතුමාත්, මුදල් රාජ්‍ය අමාත්‍යතුමාත් සමඟ සාකච්ඡා කරලා ඒ බව කිව්වා. මේ ඉදිරිපත් කර තිබෙන දේශීය ආදායම් පනත් කෙටුම්පතේ 9. (2) උප වගන්තිය මම කියවන්න කැමැතියි. එහි මෙසේ සඳහන් වනවා:

> "යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත මඟින් විධිවිධාන සලසා ඇති පරිදි හැර යම් තැනැත්තකු හෝ යම් මුදල් ප්‍රමාණයක් මේ පනත මඟින් පනවනු ලබන බද්දෙන් නිදහස් කිරීමට විධිවිධාන සලස්වනු නොලැබිය යුතු අතර, මේ පනත අදාළ වීම කෙරෙහි බලපාන හෝ මේ පනත අදාළ වීම කෙරෙහි බලපෑම අරමුණු කොට ගත් යම් ගිවිසුමකට ඇතුළත් නොවිය යුතු ය."

මම "බදු දඩයම" කෘතියේ 60 පිටුවේ පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. මේ අලුත් පනත් කෙටුම්පතේ 9. (2) උප වගන්තියේ කියනවා, "කවර නීතියක කුමන කරුණක් පටහැනිව සඳහන් වුණත් පනතේ නිශ්චිත වශයෙන් කියලා නැත්නම් සහනයක් නම් ලැබෙනනේ නැහැ" කියලා. උදාහරණයක් ලෙස ගනිමු, ශ්‍රී ලංකා ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලයේ - BOI - ගිවිසුමක් තිබෙනවා. එහෙම නැත්නම් Port City එකට තමුන්නාන්සේලා අලුතෙන් ගිවිසුමක් ඇති කර ගන්නවා. එහෙමත් නැත්නම්, වෙනත් ව්‍යාපෘතියකට දේශීය හෝ විදේශීය බදු සහනයක් ලබා දෙනවා කියලා ගිවිසුමක් ඇති කර ගන්නවා. එලෙස ගිවිසුම් අත්සන් කළාට බදු නීතිය ඉස්සරහාට ගියාම, කවර නීතියක මෙයට පටහැනිව කුමක් සඳහන් වුණත් ඒ බදු නිදහස ලැබෙන්නේ නැහැ. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. එම නිසා තමයි අපි උත්සාහ කළේ සංශෝධන ඉදිරිපත් කරලා, බදු සහන ලැබෙන පාර්ශ්ව ටික මේ පනත් කෙටුම්පතට ඇතුළු කරන්න. මොනවාද නිදහස්?

සේවක අර්ථසාධක අරමුදල තමයි, අපේ රටේ තිබෙන විශාලම අරමුදල. සේව්‍ය, සේවක දෙපාර්ශ්වයම දායක වන දහඩිය උරුමය තමයි සේවක අර්ථ සාධක අරමුදල. මේ සේවක අර්ථසාධක අරමුදල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තමයි පරිපාලනය කරන්නේ. එහි මුදල් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරනවා. ඒ තුළින් ලැබෙන ලාභයෙන් සියයට 10ක සාධාරණ ප්‍රතිශතයක් ගන්නවා; සියයට 10ක් රජය බදු වශයෙන් ගන්නවා.

සේවකයන්ට සියයට 90ක් ප්‍රතිලාභ වශයෙන් ලැබෙනවා. ඒක සියයට 14 දක්වා වැඩි වෙලා, හතරක් වැඩිපුර මංකොල්ල කනවා. අපි කිව්වේ, ඒක කරන්න එපා කියලායි. මොකද, දැන් සේවකයාට ලැබෙන්න තිබෙන මුදලෙන් සාධාරණ මුදලක් ගන්නවා. මේ අරමුදල සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් ඇති වුණා නේ. අපේ ලංකා ඉතිහාසයේ සිදු වුණු විශාලතම මුදල් මංකොල්ලය වන මහ දවල් මහ බැංකුවේ ඇති වුණු මහා මුදල් මංකොල්ලයේදී සේවක අර්ථ සාධක අරමුදලත් මංකොල්ල කෑවා. මෙහෙම කියන්නේ මම නොවෙයි, ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපති ආචාර්ය ඩබ්ලිව්.ඒ. විජේවර්ධන මහතායි. මහ බැංකුවේ මහා මංකොල්ලය සිද්ධ වුණු අවස්ථාවේදී රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා පත් කළ ත්‍රිපුද්ගල කමිටුවේ උපදේශක ලෙස පත් කළේ ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපති ඩබ්ලිව්.ඒ. විජේවර්ධන මහතායි. එතුමා කොමිසම ඉදිරියට ගිහින් කියන ලද කරුණු 2017 අප්‍රේල් 28 සිකුරාදා "මව්බිම" පුවත් පතේ මෙසේ සඳහන් වනවා:

> "මහ බැංකුවටත්, රටටත් කළ අපරාධයට අර්ජුන් පත් කළ පාලකයන් වගකිව යුතුයි"

> "බැඳුම්කර මගඩියෙන් රටටත් ආර්ථිකයටත් සිදු වූ පාඩුව පිරිමැසිය නොහැකියි"

> " අර්ජුන් මහේන්ද්‍රන් බෑනාගේ සමාගමෙන් වැඩි පොලියට ගත්තේ අඩු පොලියට ගත හැකිව තිබියදීයි"

"රටට සිදුවූ බරපතළ පාඩුව වගකිව යුත්තන්ගෙන් අයකර ගත යුතුයි"

"අර්ථසාධකයේ රුපියල් කෝටි 100කුත් බැඳුම්කර මගඩියෙන් ක්ෂය වෙලා"

" මහ බැංකු අධිපතිකමට පත් කළ යුත්තේ හෙංචයියන් නොවේ: සුදුස්සකුම පමණයි"

2017 අප්‍රේල් 28 සිකුරාදා "මව්බිම" පුවත් පත් වාර්තාව මම **සභාගත*** කරනවා.

අර්ථ ශාස්ත්‍රඥයෙක් වන, රටේ පොදුවේ පිළිගන්න, අගමැතිතුමා පත්කළ ත්‍රිපුද්ගල කමිටුවේ උපදේශකවරයෙක් ලෙස කටයුතු කරන්නට කියූ, ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපති විජේවර්ධන මහතා පැහැදිලිව කියනවා අර්ථ සාධක අරමුදලේ කෝටි 100කටත් ගැහුවාය කියලා. අපි නොවෙයි කියන්නේ. ඒ විෂය පිළිබඳ ප්‍රාමාණික අවබෝධයක් තිබෙන විද්වතෙක්. එහෙම කරලා තිබෙන එකෙන් තව සියයට 4ක් ගන්න එපාය කියන ඉල්ලීම තමයි අපි කරන්නේ. සියයට 10 කියන්නේ සාධාරණ මුදලක්. ඒ සියයට 10 ගන්න.

සේවක අර්ථ සාධක අරමුදලේ සේවා නියුක්තයාගේ කොටස, සේවා යෝජකයාගේ කොටස, පොලිය කියන තුනේ එකතුවෙන් තමයි සේවකයා විශ්‍රාම යනකොට ලැබෙන ප්‍රතිලාභය තීරණය වෙන්නේ. ඒ ප්‍රතිලාභය තමයි පෞද්ගලික අංශයේ සේවය කරන කෙනෙකුගේ එකම බලාපොරොත්තුව වන්නේ. තමාගේ දූ දරුවන් දීගතල දෙන්න, ගත් ණයවලින් නිදහස් වෙන්න, අනාගත ජීවනෝපායක් සලසා ගැනීම සඳහා යම් ආයෝජනයක් කරන්න යන මේ සියල්ලට තිබෙන්නේ එම මුදලයි. මහත් බලාපොරොත්තු ඇතිව ඒ මුදල ගන්න අවස්ථාවේදී තවත් සියයට 4ක් අය කරන්න එපා. හිටපු මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා 2011 වසරේ සිට ඒ සියල්ල බද්දෙන් නිදහස් කරලා තිබුණා. එයින් සේවා යෝජකයාගේ කොටසට බදු අය කරනවා. ඒක ඔබතුමන්ලාත් පිළිගත්තා. ඔබතුමන්ලා එදා අපට එකඟ වුණා සේවකයාට ප්‍රතිලාභය ලැබෙනකොට බද්දෙන් නිදහස් කරනවා කියලා ආපසු සංශෝධනයක් ගෙනෙනවා කියලා. එය බද්දෙන් නිදහස් කළ යුතුම වෙනවා. ඒ සහනය සේවකයන්ට ලැබෙන්න ඕනෑ.

තවත් එවැනි ප්‍රශ්නයක් තිබෙන තැනක් තමයි පුණ්‍යායතන. පුණ්‍යායතන කියන්නේ පන්සල්, පල්ලි, කෝවිල්, දේවාල යනාදී සියල්ලයි. ඒවායේ ඉතිරි කිරීම්වලට, පන්සලේ දායක සභාවේ, නැත්නම් පල්ලියේ මීසම් සභාවේ ඉතිරි කිරීමේ ගිණුම්වලින් අය කරන මුදල වැඩි වෙන එක වෙනම කථාවක්. ඒක ගිණුම්වලින් අය වෙනවා. 1815 වර්ෂයේ මාර්තු 2වැනි දාට පෙර රාජකීය ප්‍රදානයන් මඟින් ලබා දීලා තිබෙන දේපොළ වත්කම්වලින් ලබන ආදායම් බද්දෙන් නිදහස් කරලා තිබුණා. මම මේ පොතේ එය පැහැදිලිව මුද්‍රණය කරලා තිබෙනවා. ඒක කළේ අපි නොවෙයි, සුදු ජාතිකයන්ගේ කාලයේ සිටයි. මේ අපේ රටේ ඓතිහාසික උරුමය; මේ අපේ රටේ ඉතිහාසය. ඉතිහාසයට බදු ගහන්නේ නැහැ නේ. මොකද, මේ රටේ අවුරුදු 2,500කට වඩා පැරණි ඉතිහාසයේ, බ්‍රිතාන්‍යයට යටත් වෙන්න කලින් ආගමික වතාවත් කරන්න, එහෙම නැත්නම් වෙහෙර විහාර නඩත්තු කරන්න, ඒවායින් පොදු පරමාර්ථ ඉෂ්ට කරන්න රජවරු, නැත්නම් වග කිව යුත්තන් විසින් ප්‍රදානය කරලා තිබෙන දෙයින් ලබන ආදායමෙන් බදු අය කරන එක බ්‍රිතාන්‍යය අධිරාජ්‍යවාදී යුගයේදීවත් කළේ නැහැ. එම නිසා ඒක නිදහස් කරන්න කියලා අපි කිව්වා.

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

පුණ්‍යායතනවලට ලැබෙන පරිත්‍යාග, පෙරහැර පැවැත්වීම, පඬුරු, පිංකැටයට දමන මුදල් යනාදියෙන් කිසිම ආකාරයකින් බදු අය කරන්නේ නැහැ. ඒ වාගේම රාජකීය නියෝග අනුව දුන්න බදු නිදහස ඒ ආකාරයෙන්ම, දැන් පවතින ආකාරයෙන්ම අනාගතයේදීත් -අපි අලුත් සංශෝධනවලට ඇතුළත් කරලා තිබෙනවා- පවත්වා ගෙන යනවා කියන එක කියන්න අවශ්‍යයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

හොඳයි, අද ඔබතුමන්ලා ඒ සඳහා සංශෝධනයක් ගේනවාද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

දැනට තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

හොඳයි. ඒක තමයි අපි දෙවනුවට ඉදිරිපත් කරපු ප්‍රශ්නය. පුණ්‍ය ආයතනවල තැන්පතු සඳහා වන පොලියට අය කරන බද්දත් වැඩිවෙනවා.

ඊළඟට දෙවැනි කරුණ මෙයයි. ආදායම් බදු කිව්වාම සමහර අය කියනවා, ආදායම රුපියල් ලක්ෂයකට වඩා වැඩි නම් විතරයි බද්දට යටත් වෙන්නේ කියලා. මසක ආදායම රුපියල් 50,000ට වැඩි නම්, ඒ කියන්නේ වාර්ෂික ආදායම රුපියල් ලක්ෂ 6ට වඩා වැඩි නම් අලුත් පනත් කෙටුම්පතේ 5වැනි උප ලේඛනය මඟින් සියයට 4ක බද්දකට යටත් වෙනවා. ඒ විධියට ආදායම් බදුවලට යටත් වෙන්නේ නැති අපේ රටේ බොහෝ දෙනෙකුට ඉතිරි කිරීමේ හෝ ස්ථාවර තැන්පත් ගිණුමක් තිබෙනවා. ඒ ස්ථාවර තැන්පත් ගිණුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් නොවන අයටත් තිබෙනවා. අවදානමකට අකැමැති බොහෝ අය තමන්ගේ මුදල් ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කරන්නේ ස්ථාවර පොලී ආදායමක් ලබාගෙන එයින් ජීවනෝපාය සලසාගන්න සහ ජීවිතයේ එදිනෙදා අවශ්‍ය කටයුතු කර ගැනීම සඳහායි.

විශේෂයෙන් රෝගීන් තමන්ගේ වත්කමක් අළෙවි කරලා, පාරම්පරිකව උරුම වුණු ගෙයක් දොරක් අළෙවි කරලා, එයින් ලැබෙන මුළු මුදලම ස්ථාවර තැන්පත් ගිණුමක දාලා, එයින් මාසිකව ලැබෙන පොලී ආදායම ගණන් බලාගෙන එම පොලී මුදලින් තමයි ජීවත් වෙන්නේ. ඒ සඳහා මෙතෙක් අය කළේ සියයට දෙකහමාරක රඳවුම් බද්දක්. ඒකට ආදායම් බද්ද කියලා කියන්නේ නැහැ. ආදායම් බදු කථාවට ඒක වැටෙන්නේ නැහැ. ආදායම් බදු නොගෙවන අයගෙනුත්, ගෙවන අයගෙනුත් ඕනෑ කෙනෙකුගේ ඉතිරි කිරීමේ ගිණුමක, ස්ථාවර තැන්පත් ගිණුමක මුදල් තැන්පත් කර තිබෙනවා නම් ඊට ලැබෙන පොලියෙන් සියයට දෙකහමාරක් අය කළා. මේ පනත් කෙටුම්පත මඟින් ඒක සියයට 100කින් වැඩිවෙනවා. සියයට 100කින් වැඩිවෙලා, පොලියෙන් සියයට දෙකහමාරක් අය කරපු ප්‍රමාණය සියයට 5 දක්වා වැඩිවෙනවා. ඒක අසාධාරණයි. මොකද හේතුව, වෙනත් ව්‍යාපාරයකට, කොටස් වෙළෙඳ පොළට යන්න බැරි, ව්‍යවසායක් කරන්න බැරි, අවදානමට කැමැති නැති, එහෙත් ස්ථාවරව යම් කිසි ආදායමක් ලබන්න කැමැති මිනිස්සුන්ගේ අහිංසක ආදායම් මාර්ගයක් තමයි පොලී ආදායම. ලෙඩක් දුකක් වුණාම බෙහෙත් ටික ගන්න, තමන්ගේ දරු මල්ලන්ට කරදරයක් නොවන පරිදි ජීවත් වෙන්න ඔවුන් ඒ පොලී ආදායම ලබා ගන්නවා. සියයට

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

දෙකහමාරක් කියන්නේ විශාල මුදලක්. එවැනි මුදලක් රඳවාගෙන -බැංකුවෙන්ම කපාගෙන- තමයි ඉතිරි මුදල දෙන්නේ. ඒ නිසා බැංකු ගිණුමේ මුදල් තැන්පත් කරපු කෙනා දන්නේ නැහැ, තමන්ගේ පොලී ආදායමෙන් සියයට දෙකහමාරක් කැපෙනවා කියලා. තව ටික දවසකින් තමයි දැනෙන්නේ සියයට දෙකහමාර වෙනුවට සියයට 5ක් කැපෙනවා කියලා. එතකොට ඔහුට ලැබෙන්නේ පොලී ආදායමෙන් සියයට 95යි. ඒ නිසා ඒක කරන්න එපා කියලායි අපි කියන්නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
සීමාවක් නැද්ද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
සීමාවක් නැහැ. ඉස්සෙල්ලා සීමාවක් තිබුණා. පසු ගිය රජය කාලයේ එක් අවස්ථාවක් තිබුණා, මසකට රුපියල් 5,000ක පොලී ආදායමක්, ඒ කියන්නේ අවුරුද්දකට රුපියල් 60,000ක පොලී ආදායමක් දක්වා කිසිම බද්දක් අය කරන්නේ නැහැ කියලා. දැන් එහෙම සීමාවක් නැහැ. ඒවා ඔක්කෝම අයින්වෙලා. කීය තිබුණත්, පොලී මුදලින් සියයට 5ක් අඩු කරගෙන ඉතුරු ටික තමයි දෙන්නේ. ඒ නිසා එම ප්‍රතිශතය සියයට දෙකහමාරේ තියන්න එකඟ වෙන්න කියලා අපි ඔබතුමන්ලාට යෝජනා කරනවා. [බාධා කිරීමක්] ඔව්, අඩුම තරමින් එහෙම සීමාවක් දෙනවා නම්, අසරණ මනුස්සයාට ඒකෙන් සාධාරණයක් වෙනවා. මසකට රුපියල් 5,000ක පොලී ආදායමක්, ඒ කියන්නේ අවුරුද්දකට රුපියල් 60,000ක පොලී ආදායමක් කියන පැත්තෙන් බැරි නම්, අඩු ගණනේ මේ පැත්තෙන් හරි සහනයක් දෙනවා නම් දුප්පතුන්ට බදු පැනවෙන්නේ නැහැ. [බාධා කිරීමක්] තව වේලාව තිබෙනවා නේ. ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය අමාත්‍යතුමනි, ඒක නිසා සියයට දෙකහමාර සියයට 5 දක්වා ගෙනෙන සංශෝධනය ඉවත් කරන්න තමුන්නාන්සේලා කැමැති නැත්නම්, ඔබතුමා ගරු මුදල් ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කරලා අඩු ගණනේ කලින් තිබුණු ආකාරයට මසකට රුපියල් 5,000ක පොලී ආදායම සහ අවුරුද්දකට රුපියල් 60,000ක පොලී ආදායම මත පනවපු බද්ද නිදහස් කරන්න. ඇයි, දැන් තමුන්නාන්සේලා කියනවා නේ, පොලී ආදායම රුපියල් ලක්ෂයකට වැඩි නම් විතරයි බද්දට යටත් වෙන්නේ කියලා. මෙහි ඒ ලක්ෂයේ කථා නැහැ නේ. ඒ නිසා ඒක මෙය අළෙවි කරන්න කියන කථාවක්. ඇත්ත කථාව තමයි, රුපියල් ලක්ෂයකට වඩා අඩු වුණත් බැංකු ගිණුමේ තැන්පත් කරලා තිබෙනවා නම්, ඒ සඳහා ලැබෙන පොලියෙන් බදු ගෙවන්න වෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
වෙන ආදායම් මාර්ග නැති වුණත් ගෙවන්න ඕනෑද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
වෙන ආදායම් කිසිවක් නැතත් ගෙවන්න වෙනවා. මේ, පොලිය මත රඳවුම් බද්ද. ඒක ඉතාම අසාධාරණයි කියලා තමයි අපි හිතන්නේ. ගරු ඇමතිතුමනි, බදු අය කිරීමේදී අනුගමනය කළ යුතු මූලධර්ම මොනවාද කියලා ඔබතුමා දන්නවා. සාධාරණ බවේ මූලධර්මය, සරල බවේ මූලධර්මය, නිශ්චිත බවේ මූලධර්මය, සානුබල මූලධර්ය යනාදී මූලධර්ම තිබෙනවා. එතකොට මේ මූලධර්මවලට අනුව මානුෂික මුහුණුවරක් ඇතිව බදු අය කරන්න ඕනෑ.

ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, මේ තැන්පත් මුදල්වලට ලැබෙන පොලියට අය කරන බදු පිළිබඳ සානුකම්පිතව හිතා බලා කටයුතු කරන්නය කියලා.

ඊළඟට, ඉතිහාසයේ පළමු වතාවට තමයි සහනාධාරත් බද්දට යටත් වෙන්නේ. සහනාධාරයක් දෙන්නේ ආණ්ඩුව විසින්. තේ නැවත වගා කිරීම සඳහා සහනාධාර, රබර් නැවත වගා කිරීම සඳහා සහනාධාර, පොල් නැවත වගා කිරීම සඳහා සහනාධාර ආණ්ඩුව විසින් දෙනවා. ඒ සහනාධාර බද්දෙන් නිදහස් කරලායි තිබුණේ. නමුත්, මේ පනත් කෙටුම්පතේ කොහේවත් නැහැ, සහනාධාර බද්දෙන් නිදහස් කරනවා කියලා. එතකොට සහනාධාරය වශයෙන් ලැබෙන මුදලටත් බදු ගෙවන්න වෙනවා. සහනාධාරවලටත් බදු ගහපු එකම ආණ්ඩුව බවට අලුත් වාර්තාවක් මේ පනත් කෙටුම්පතින් තමුන්නාන්සේලා තියනවා. ආණ්ඩුව දෙන සහනාධාරයට ආණ්ඩුවම බදු අය කරන්න ඕනෑ නැහැ නේ. ආණ්ඩුවමයි සහනාධාර දෙන්නේ. ආණ්ඩුවම දීලා නැවත ඒකෙන් බදු අය කරනවා. ඉතින් ඒක තේරුමක් තිබෙන්න ක්‍රියාවක් නොවෙයි නේ. කෘෂිකර්මයට වෙන්න පුළුවන්, යම් කිසි ව්‍යාපාරයකට, වෘත්තියකට සහනාධාරයක් දෙන්නේ ඒවා නඟා සිටුවන්නයි. ඒ දෙන ටිකෙනුත් කොටසක් අඩු කර ගත්තාම මොකද වෙන්නේ? පොහොර සහනාධාරය දීලා, පොහොර සහනාධාරයෙන් ගණනක් ආපසු ආණ්ඩුව ගත්තොත්, තේ නැවත වගා කරන්නය කියලා සහනාධාර දීලා ඒකෙන් ආණ්ඩුව ආපසු ගණනක් ගත්තොත්, ඒ මුදල අර නිශ්චිත අරමුණ සඳහා යෙදවෙන්නේ නැහැ. ඒ නිසා සහනාධාර බද්දට යටත් කිරීම පිළිබඳව තමුන්නාන්සේලා නැවත සිතා බැලිය යුතු වෙනවා. ඒ සම්බන්ධයෙන් අප ඉදිරිපත් කරන සංශෝධනය පිළිගන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

ඊළඟට, සේවා නියුක්තිකයන් සම්බන්ධයෙනුත් බද්දක් නියම කර තිබෙනවා. තමුන්නාන්සේලා මේ බදු පනත් කෙටුම්පත හදලා තිබෙන්නේ මේ රට ඇමෙරිකාව, එංගලන්තය, ස්විට්සර්ලන්තය, ස්වීඩනය වැනි රටක් කියලා හිතාගෙනයි. මොකද, තමුන්නාන්සේලා කියනවා, මේ බදු පනත් කෙටුම්පතින් සියයට 40ක් සෘජු බදු පනවනවා කියලා. අපි ධනපතීන්ට බදු ගහලා සියයට 40ක් ගන්නවා කියනවා. භාණ්ඩ හා සේවා බදු සියයට 60ට අඩු කරනවා කියනවා. සිහින ලෝකයේ සිහින සරුංගලයක් තමයි ඔබතුමන්ලා මේ අරින්නේ. ගරු ඇමතිතුමනි, ආදායම් බදුවලින් අපි වර්ෂයකට ලබන ආදායම රුපියල් බිලියන 335යි. රුපියල් බිලියන 335ක් කියන්නේ සියයට 18යි. මුළු බදු ආදායමින් සියයට 18යි, මේ රුපියල් බිලියන 335. එතකොට, සියයට 40ක් සෘජු බදු අය කරන්න නම් සෘජු බදුවලින් ගන්නා ආදායම රුපියල් බිලියන 700ක් වෙන්න ඕනෑ. සෘජු බදු ආදායම රුපියල් බිලියන 700ක් කරන්න බදු පදනමක් - tax base - තිබෙනවාද? කාගෙන්ද මේ බදු ගන්නේ? එහෙනම් අර සුද්දාගේ කාලයේ වාගේ ඇඟ බද්ද, බලු බද්ද, තන බද්ද වාගේ බදු පනවන්න ඕනෑ. ඒ වාගේ බදු පැනෙව්වොත් නම් මේ කියන ක්‍රමයට සෘජු බදු අය කර ගත හැකියි. තිබෙන කෙනාගෙන් ඒ වාගේ හිතෙන ගණනක් අය කරන එකයි තිබෙන්නේ. එහෙම නැත්නම්, මේක කතන්දරයකට කියාපු දෙයක් වෙනවා. අපිත් කැමැතියි, සෘජු බදු ප්‍රතිශතය වැඩි වෙලා වක්‍ර බදු අඩු වෙන එකට. ඒක හොඳයි. නමුත්, මේකෙන් එහෙම කරන්න බැහැ. ඒකට පදනමක් නැහැ. ලංකාවේ කර්මාන්ත වැටිලා; ව්‍යාපාර වැටිලා; කොන්ත්‍රාත් වැටිලා. මේ සියල්ල වැටිලා තිබෙන වෙලාවක සෘජු බදු සියයට 40ට වැඩි කරනවා කිව්වත්, කොයි විධියටද වැඩි කරන්නේ කියන එක මේකෙන් පැහැදිලි වෙන්නේ නැහැ. ඒ නිසා මේ තිබෙන තත්ත්වය තුළ එය සිහිනයක්ය කියන එක මා ඉතා පැහැදිලිව අද දවසේ කියනවා.

අපේ රට අඩු ආදායම් ලබපු රටක්. මෑත ඉතිහාසය තුළ තමයි අපේ රට පහළ මැදි ආදායම් ලබන රටක් වුණේ. ඉහළ මැදි ආදායම් ලබන කොරියාව වාගේ රටවල සහ ඊටත් වඩා සංවර්ධිත රටවලට නම් මේක ප්‍රායෝගික සත්‍යයක්. ඒ සංවර්ධිත රටවල නම් සෘජු බදු සියයට 40, 60 ගන්නවා. ඒක අපේ රටට ආදේශ කරන්න බැහැ. අපි පහළ මැදි ආදායම් ලබන, දුප්පත්කමින් යාන්තමින් ගොඩ ගිය රටක්.

සේවා නියුක්තිකයන් මත සියයට 16යි මීට පෙර බදු පැනෙව්වේ. මොකද, අපේ වැටුප් මට්ටම් පහළ තලයකයි තිබෙන්නේ. ඒ සියයට 16 උපරිමය ලෙස සියයට 24 දක්වා දැන් වැඩි වෙනවා. මේ රටේ වැඩ කරන ජනතාවට, රක්ෂාවල නියුතු අයට, තමන්ගේ මහන්සියෙන් හම්බ කරන අයට ඉස්සෙල්ලා වැඩිම යටත් වෙන්න වුණ බදු ප්‍රමාණය සියයට 16යි. ඒක දැන් සියයට 24 දක්වා වැඩි වෙනවා. ඒක ලංකාවේ වෘත්තිකයන්ට, සේවා නියුක්තිකයන්ට අසාධාරණයක් කියලා අපි සලකනවා. වෘත්තිකයන් කිව්වාම, විශේෂඥ වෘත්තිකයන් වන වෛද්‍ය විශේෂඥයන්, ඉංජිනේරුවන්, ගණකාධිකාරිවරුන්, ගෘහ නිර්මාණ ශිල්පීන් වෙනත් රටවලට ගිහිල්ලා වෘත්තිය සේවාවක් සපයනවා. ඒක අපේ රටට ආඩම්බරයක් අභිමානයක් වාගේම, විදේශ විනිමය ඉපැයුම් මාර්ගයක්. උදාහරණයක් ලෙස Maldivesවලට ගිහිල්ලා සංචාරක හෝටලයක සැලැස්ම අඳින මනුස්සයා හැම දාම ඒක කරන්නේ නැහැ. එහෙම අවස්ථාවක් හෝ දෙකක් ඔහුට ලැබේවි, මුළු ජීවිතයටම. ඒ විදේශ විනිමය ටික බැංකුව හරහා මේ රටට ගෙනෙනවා. නමුත්, ඒ ගෙනෙන විදේශ විනිමයට දැන් මේ රටේ බද්දක් අය කරනවා. එහෙම නම් ඊට වඩා හොඳයි ඒ මුදල් ටික මේ රටට ගෙනෙන්නේ නැතිව ඒ රටේ තියාගෙන ඉන්න එක. අපට තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි විදේශ විනිමය පිළිබඳ ප්‍රශ්නය.

දැන් වෛද්‍යවරයකු වෙනත් රටකට ගිහිල්ලා ශල්‍යකර්මයක් කරන්න උදව් කරලා හෝ ශල්‍යකර්මය කරලා ඩොලර් ටිකක් අරගෙන එනවා. ඒ මනුෂ්‍යයා කරන්නේ කොයි තරම් ලොකු දෙයක්ද? අපේ රටින් මැදි පෙරදිග ඇතුළු අනෙකුත් රටවලට ගිහිල්ලා ශ්‍රමය වගුරවන අය අවුරුදු ගණනක් සේවය කරලා හම්බ කරන මුදල් ප්‍රමාණය වාගේ මුදල් ප්‍රමාණයක් යම් පොඩි දෙයක් කරලා විශේෂඥයකු අරගෙන එනවා, එයාගේ විශේෂඥතාව නිසා.

ඒ අය වෙනත් රටකදී නීත්‍යනුකූලව උපදවන ලද මුදල් ඒ රටේ බැංකු ගිණුමක දාලා එන්න පුළුවන් නේ, කිසි කරදරයක් නැතිව. මොකටද, මේ රටට ගෙනෙන්නේ? ඒ මුදල් මේ රටට ගෙන එන්න නම් පෙළඹවීමක් තිබෙන්න ඕනෑ. ඒ නිසා කරුණාකර කල්පනා කරන්න මේ මහ පොළොවේ යථාර්ථයත් එක්ක, අපේ රටේ මහ පොළොවේ යථාර්ථයත් එක්ක. මෙහි තවත් පැත්තත් තිබෙනවා. ETCA ගිවිසුම අත්සන් කළාට පසුව, විදේශිකයෙකු ලංකාවට ඇවිල්ලා මොනවා හෝ කරලා සල්ලි අරගෙන යනවා නම්, ඒ මනුස්සයා බදුවලින් නිදහස් වෙනවා. ඒක තමයි අපි කිව්වේ මේ කෙටුම්පත් කර තිබෙන්නේ, ස්වදේශිකයන් වනසන, විදේශිකයන් සනසන පනතක් කියලා. අපේ මනුස්සයන් ගෙනෙන මුදලට බදු අය කරනවා; ගෙනෙන්න එපා කියනවා. අපෙන් අරගෙන යන මුදල් වැඩිපුර අරගෙන යන්න කියලා සහන දෙනවා. එහෙම බදු නීති හදන රටක් තිබෙනවාය? මෙය අපි හදපු එකක් නොවෙයි. ඒකයි මේ තිබෙන ප්‍රශ්නය. වෘත්තිකයන්ට, මේ රටට මුදල් ගෙනෙන අයට එහෙම කරන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ගනිමු. ඉතා පැහැදිලි ලෙස දීර්ඝ කාලයක සිට -ඉබන් බතූතාගේ කාලයේ ඉඳන්, ලංකාවේ විදේශ වෙළඳාම ඇති වූ කාලයේ ඉඳන්- ප්‍රධානම අපනයන ද්‍රව්‍යය තමයි මැණික්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමාගේ කාලයෙන් විනාඩි හයක් ඉතිරි වෙලා තිබෙනවා. ඒ කාලය මට ගන්න කියලා තිබෙනවා.

මැණික් කර්මාන්තය ගත්තොත්, එහි ආදායම මේ රටට ගෙනෙන්නේ නැහැ. ඒ තත්ත්වය නතර කිරීම සඳහා තමයි කටයුතු කරන්න ඕනෑ. ඉතිහාසය පුරාම ලංකාවෙන් මැණික් අරගෙන යනවා. ඒ මැණික් අළෙවියෙන් ලැබෙන ආදායම මේ රටට එන්නේ නැහැ කියා අපි දන්නවා. සමහර විට ලෝකයේ විශාලතම මැණික මේ රටෙන් හමු වෙලා තිබෙන්න පුළුවන්. නමුත් එය විකිණෙන්නේ වෙනත් රටකයි. ඒ, කොහේද කියලා දන්නේ නැහැ. ඒ අතිදැවැන්ත විදේශ විනිමය තමයි අපට නැති වන්නේ. ඒ නිසා තමයි හරියාකාරව ගණනය කරන්න බැරි ඒ වාගේ ඒවාට බදු සහන දීලා ඒ ආදායම් ගෙනෙන්න කටයුතු කරන්න ඕනෑ. ඒ ආදායම බැංකුවක් හරහා අරගෙන එන්න. මැණික් කර්මාන්තය, ස්වර්ණාභරණ කර්මාන්තය අපට අලුතින් නැඟිටුවන්න පුළුවන් කර්මාන්තයි. ඒ නිසා ඒ කර්මාන්ත මරන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගමක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු ලෙස ඔබතුමාත් දන්නවා, වක්කඩ කැඩූ ලෙස භාණ්ඩ ගෙන්වන ප්‍රතිපත්තිය යටතේ ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සියල්ල මැරිලා අවසන් බව. දැන් පාවහන් හදන්නේ නැහැ; ඉදල් හදන්නේ නැහැ; කොහු හදන්නේ නැහැ. වාද්දුව පැත්තේ තිබුණා කොහු ඉදල් කර්මාන්තය. ප්ලාස්ටික් ඉදලක්, ප්ලාස්ටික් කොස්සක් තමයි ඔක්කෝම ගෙවල්වල දැන් තිබෙන්නේ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
The Hon. Eran Wickramaratne)

ගරු මන්ත්‍රීතුමා, ස්වර්ණාභරණ හා මැණික් කර්මාන්තය සම්බන්ධයෙන් වෙනසක් නැහැ. ඒ රඳවාගැනීමේ බද්ද - Withholdig Tax- 2.5 එලෙසම පවත්වාගෙන යනවා. එයත් අද ගෙනෙන සංශෝධනවල තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

එය අද ගෙනෙන සංශෝධනවල තිබෙනවා ද? ඔබතුමන්ලා අපේ සංශෝධන පිළිගෙනද ඒවා ගෙනෙන්නේ? අපේ සංශෝධන වෙනුවට ඔබතුමන්ලා සංශෝධන දෙනවා; අපේ ඒවා පිළිගන්නේ නැහැ. එහෙමද වෙන්නේ?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

අපට හුඟක් පාර්ශ්වවලින් සංශෝධන ලැබී තිබෙනවා. අද උදේත් මම දැක්කා, දිනේෂ් ගුණවර්ධන, මහින්දානන්ද අලුත්ගමගේ කියන මන්ත්‍රීතුමන්ලා සංශෝධන කීපයක්ම දීලා තිබෙනවා. ඒ සංශෝධනවලින් වැඩි ප්‍රමාණයක් අපි ඇතුළත් කරනවා. අපි සමහර ඒවා ඇතුළු කර තිබෙනවා. සමහර ඒවා ගැන අපි තව ටිකක් සොයා බලනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා, විරුද්ධවාදීව, වෛරයෙන් මේ ප්‍රශ්නය දෙස බලන්නේ නැතිව අපි සාකච්ඡා කරන්න ඕනෑ. මේ විවාදයේදී වැදගත් වන්නේ එයයි. පාර්ලිමේන්තුවක් තිබෙන්නේ ඒකටයි. ඔබතුමා 1940 ගණන්වල, 1950 ගණන්වල, 1960 ගණන්වල හැන්සාඩ් වාර්තා කියවා බැලුවා නම් පෙනේවි, පාර්ලිමේන්තුවට පැවරුණු වගකීම ඉටු කරමින් ඒ කාලවල විෂයානුබද්ධ දේ පිළිබඳ ඉතාම වැදගත් ලෙස වාද විවාද ඇති වෙලා, ඒ අනුව අවශ්‍ය සංශෝධන කෙරුණු බව. ඒ ආකාරයට ඔබතුමන්ලාත් අලුත් ආදර්ශයක් දෙයි කියා මම හිතනවා. පසු ගිය කාලයේ එවැනි ආදර්ශයක් හිටපු මුදල් අමාත්‍යවරයාගෙන් බලාගන්න බැරි වුණා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු මන්ත්‍රීතුමා, මට විනාඩියක් දෙනවාද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මට නියමිත කාලය අවසන් වෙමින් යනවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඔබතුමාගේ සංශෝධනය ගැන කියන්නයි හදන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හොඳයි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
98-[බාධා කිරීමක්] අපි ඒ සංශෝධන ඇතුළත් කර- [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් පනතකදී කාරක සභා අවස්ථාවේදී ගෙනෙන සංශෝධන කැබිනට් මණ්ඩලයෙන් අනුමත කරලා නැත්නම් ඉදිරිපත් කරන්න බැහැ. ඒක තමයි නීතිය. [බාධා කිරීම්] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්න බැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සභානායකතුමා කියන එක අප පිළිගන්නවා නම් දැන් කරන්න තිබෙන්නේ මෙච්චරයි. මේ සභාවේදී දැන් ඉදිරිපත් කරන සංශෝධනවලින් ගරු ඇමතිතුමා එකඟ වෙන සංශෝධන නැවත කැබිනට් මණ්ඩලයට අරගෙන ගිහිල්ලා, ඊළඟ දවසේ ඡන්ද විමසීම පැවැත්වීමයි කරන්න තිබෙන්නේ. වෙන කරන්න දෙයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභානායකතුමා ගෙනෙන තර්කය ඒක නම්,- [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා කථා කරන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා ගන්න වෙලාව මට ඕනෑ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වග කීම ස්ථාවර නියෝග පෙන්වා දීමයි. ස්ථාවර නියෝග අනුව, රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මුදල් පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයෙන් අනුමත නොකරපු සංශෝධන පාර්ලිමේන්තුවට පිළිගන්න බැහැ. [බාධා කිරීමක්] ඒක තමයි නීතිය.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හරි, එහෙම නම් ඔබතුමා කෑ ගහන්නේ නැතිව ඉන්න. [බාධා කිරීම්] ඔබතුමා කෑ ගහන්නේ ඇයි?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා මේ ගැන දන්නේ නැති එක ගැන මම පුදුම වෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මම මේ ගැන නොදන්නවා නොවෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කථා කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු සභානායකතුමනි, මේක මුදල් පනත් කෙටුම්පතක් නිසා අය වැය ලේඛනයට සංශෝධන ගේන්න බැහැ වාගේම කාරක සභා අවස්ථාවේදී මේ පනත් කෙටුම්පතටත් සංශෝධන ඉදිරිපත් කිරීමේ හැකියාවක් නැහැ. හැබැයි, අපි ඉදිරිපත් කරලා තිබෙන සංශෝධනවලට ගරු ඇමතිතුමා එකඟතාව පළ කරනවා නම්,- එකඟ වෙන්නේ නැත්නම් අපි කියලා නිකම් ඉන්නම්. හැබැයි, ගරු ඇමතිතුමා එකඟතාව පළ කරනවා නම්- කළ යුතු වන්නේ ඒ සංශෝධන ලැයිස්තුව හදලා ඊළඟ කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා ඊළඟ දිනයේදී පනත් කෙටුම්පත සම්මත කරගන්න එකයි.

ඒක තමයි වඩාත් යුක්තිසහගත. එතකොට මේ සංශෝධන ඇතුළත් කර ගැනීම සඳහා කැබිනට් මණ්ඩලයට යා යුතු නම්, ඒ රීතිය කඩන්න එපා. ඒ නිසා ගරු ඇමතිතුමා එකඟ වෙන සංශෝධන කැබිනට් මණ්ඩලය වෙත අරගෙන ගිහිල්ලා එකඟතාවෙන් පාර්ලිමේන්තුවට ගේන්න. එතකොට ඉවරයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

අපි අලුත් ක්‍රමවේදයකට සාකච්ඡා කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මෙතැන වෙන්නේ,- [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මම තමුන්නාන්සේලාට එකක් කියන්නම්. ආණ්ඩු පක්ෂයයි, විපක්ෂයයි එකඟ වුණා කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්න බැහැ. අන්න ඒක තේරුම් ගන්න. You cannot agree to violate the Constitution. තමුන්නාන්සේලා දෙපැත්තම එකතු වෙලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්න හදනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු සභානායකතුමනි, මේ මගේ වෙලාව. අපි ඒ ගැන වෙනම කථා කරමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමන්ලා ප්‍රාදේශීය සභාවේ -

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

ප්‍රාදේශීය සභාව මීට වඩා හොඳයි. ඔබතුමා වාගේ සභානායකවරු ප්‍රාදේශීය සභාවේ හිටියේ නැහැ. [බාධා කිරීමක්]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු සභානායකතුමනි, මට කථා කරන්න දීලා ඔබතුමා වාඩි වෙන්න කෝ. තමුන්නාන්සේලා පිළිගන්නේ නැති ඒවාට අපට කරන්න තිබෙන්නේ එක දෙයයි. මේ ආණ්ඩුව ගියාම නැවතත් බලයට එන්නේ අපේ ආණ්ඩුව නේ. අපේ ආණ්ඩුවක ප්‍රධාන කාර්ය තමයි දේශීය ආදායම් පනත වෙනස් කරලා 2006 තිබුණු සියලුම බදු සහන ටික මේ රටේ ගොවීන්ට, කම්කරුවන්ට, අනෙකුත් වැඩ කරන ජනතාවට හා අපනයනකරුවන්ට ලබා දීම. ඒ වගකීම අපි ඉෂ්ට කරනවා කියන එක මම මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

අවුරුදු 20ක් රට පාලනය කළා නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

අවුරුදු 20ක් රට පාලනය කරපු කාලයේ තමයි අඩු ආදායම් ලබන රට ඉහළ,- [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීමක්] අපි මේ ප්‍රශ්නය නිරාකරණය කරගන්නේ නැත්නම් මේ ගැන කථා කරලා වැඩකුත් නැහැ. අප විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනවලට ගරු සභානායකතුමාගේ තර්කය මතම පදනම් වෙමින් පාර්ලිමේන්තු මහ ලේකම්තුමා දැන් අප වෙත ලිපියක් එවා තිබෙනවා. දැන් ලැබුණු එම ලිපිය අනුව කියන්නෙත්, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152වන ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 133 ප්‍රකාරව කාරක සභා අවස්ථාවේදී සංශෝධන ඉදිරිපත් කිරීමට අවකාශ නොමැති බව දැනුම් දෙනවා." කියලයි. ගරු සභානායකතුමාගේ තර්කය මතම පදනම් වෙමින් පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා මේ සංශෝධන බාර ගන්න බැහැ කියලා දැන් අපට ලිඛිතව දැනුම් දීලා තිබෙනවා. ඒ නිසා දැන් කරන්න තිබෙන්නේ එක දෙයයි. අප විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනවලින් ගරු අමාත්‍යතුමා එකඟ වෙන සංශෝධන කැබිනට් මණ්ඩලය වෙත ගෙන ගිහිල්ලා ඊළඟ දවසේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කරමු. එහෙම නැතිව අපි දීර්ඝ වේලාවක් අරගෙන සාකච්ඡා කරලා අපේ අදහස් ඉදිරිපත් කරලා, සංශෝධනවලට එකඟයි කියලා එම සංශෝධන මේ පනත් කෙටුම්පත තුළට ඇතුළත් කර ගන්න බැරි නම්, මේ විවාදයෙන් තේරුමකුත් නැහැ; මේක අනුමත කර ගැනීමේ තේරුමකුත් නැහැ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ඔබතුමන්ලා ඉදිරිපත් කරපු සංශෝධන 35ක් තිබුණා. ඒ සංශෝධන 35න් වැඩි ප්‍රමාණයක්ම අපි කැබිනට් මණ්ඩලයටත් ඉදිරිපත් කරලා, එහිදී අනුමැතිය ලබා ගත් සංශෝධන දැනටමත් ඉදිරිපත් කරලා තිබෙනවා. ඔබතුමාගේ මේසය උඩ තිබෙන සංශෝධනවල ඒවා ඇතුළත් වෙලා තිබෙනවා. ඔබතුමාට ඒවා සසඳා බලන්න පුළුවන්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

එතුමන්ලා දීලා තිබෙන ඒවා ගැන නොවෙයි කියන්නේ. එතුමන්ලා සංශෝධන දීලා තිබෙන්නේ අදයි. ඔබතුමා කියන්නේ, - [බාධා කිරීමක්]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ සංශෝධන ගැනයි කියන්නේ. ඔබතුමා දීපු සංශෝධන ගැනත් අපි දැන් සලකා බලාගෙන යනවා. තිබෙන ඒවා එක්ක සසඳා බලනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 18 වන වගන්තියට අදාළ සංශෝධන, 1 වන උපලේඛනය, 3 වන උපලේඛනයට අදාළ සංශෝධන කිසිවක් භාර ගන්න බැහැ කියා සඳහන් කරනවා. සංශෝධන භාර ගන්න බැහැ කියන කාරණය තමයි එතුමා සඳහන් කරන්නේ. සංශෝධන පිළිගන්නවාද, නැද්ද කියන කාරණය නොවෙයි, සංශෝධන ඉදිරිපත් කිරීමම භාර ගන්න බැහැ කියන එක තමයි ගරු සභානායකතුමා මතු කරන කාරණය මත පදනම්ව මහලේකම්තුමා විසින් දැනුම් දීලා තිබෙන්නේ. ඒ

[ගරු අනුර දිසානායක මහතා]

නිසා මේ පනත් කෙටුම්පත අද මේ පාර්ලිමේන්තුවේ කිසිසේත්ම සම්මත නොකළ යුතුයි කියලා තමයි අපි කියන්නේ.

ගරු සභානායකතුමා පිළිගන්නවා, මීට පෙර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට උපදේශක කාරක සභාව තිබුණු බව. එම උපදේශක කාරක සභාවේදී අපි මෙවැනි කරුණු පිළිබඳව කථා කළා. ගරු ඇමතිතුමාත් එහි සිටිනවා; ලේකම්තුමාත් සිටිනවා. කරුණු කථා කරලා එකඟතාව මත කැබිනට් මණ්ඩලයට අරගෙන ගිහිල්ලා, ඒ සංශෝධන ටික ගෙනෙනවා. දැන් එහෙම උපදේශක කාරක සභාවකුත් නැහැ; පාර්ලිමේන්තුවේ සංශෝධන ඉදිරිපත් කළාට ඒවා ඇතුළත් කර ගන්න අවස්ථාවකුත් නැහැ. ඒ නිසා මේක සාධාරණ නැහැ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු මන්ත්‍රීතුමා, මුදල් ඇමතිතුමා මුලින්ම සඳහන් කළා, ඔබතුමන්ගේ සංශෝධන එතුමා සලකා බලනවා කියලා. මූල්‍ය - financial - පිළිබඳව විතරක් වෙනස්වීම් තිබෙනවා නම්, ඒක කැබිනට් මණ්ඩලයට යා යුතුයි. අනෙක් සංශෝධන සලකා බලන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම අහන්නේ,-

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මගේ වේලාව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලබා දුන් වේලාව දැන් අවසානයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නැහැ, නැහැ. එහෙම කොහොමද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි.[බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සභානායකතුමාත් කෑ ගැහුවා නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කෑ ගැහුවේ නීතිය තේරුම් කරලා දෙන්නයි. ප්‍රාදේශීය සභාව වාගේ නොවෙයි. පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය එකතුවෙලා, -

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමා ළමයෙකුට හපන්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය එකතුවෙලා ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්න බැහැ. ඒක තේරුම් ගන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මෙතුමන්ලාගේ නීතිය, - අපි උදාහරණයක් ගනිමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම ස්ථාවර නියෝග පෙන්වා දුන්නේ මේ නිසයි. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කියන විධියට මේක ආපස්සට ගෙනයන්න බැහැ. පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කරලා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න බැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සම්මත කරන්න එපා කියන්නේ ඒක නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒ නිසා තමයි අපි සාකච්ඡා කරලා, ඊළඟ දවසේ සම්මත කරන්න කියන්නේ. ඒකට මුදල් ඇමතිතුමා එකඟයි. මුදල් ඇමතිතුමා, සාකච්ඡාවෙන් මේ ප්‍රශ්නය විසඳා ගන්න ලැහැස්තියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉල්ලන්නේ මේකයි. අපි ඇතිවිය යුතුයි කියා හිතන සංශෝධන භාරදීලා තිබෙනවා. හැබැයි, මහලේකම්තුමා නිශ්චිත වශයෙන් අපට දැනුම්දීලා තිබෙනවා, ස්ථාවර නියෝගත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් එකට කියවිය යුතු නිසා 152 වන ව්‍යවස්ථාව සහ ස්ථාවර නියෝග 133 මත පදනම්ව මේ සංශෝධන භාරගන්න බැහැ කියලා. එතුමාට අපි ලිඛිතව සංශෝධන භාර දීලා තිබෙනවා. මීට පෙර මෙවැනි අවස්ථාවලදී අපට උපදේශක කාරක සභාවට සංශෝධන ඉදිරිපත් කර සාකච්ඡා කිරීම සඳහා අවස්ථාවක් ලැබුණා. එම උපදේශක කාරක සභාවේ දී අපි සංශෝධන ඉදිරිපත් කරලා, ඇමතිතුමා සහ ලේකම්තුමා සමඟ සාකච්ඡා කරලා යම් එකඟතාවකට පැමිණෙන්න හැකියාව තිබුණා. නමුත් දැන් අපට එහෙම අවස්ථාවකුත් නැහැ. පළමුවෙනි වතාවට අපි මේ පනත් කෙටුම්පත පිළිබඳ අදහස් ඉදිරිපත් කරන්නේ පාර්ලිමේන්තුවේ. ඊට පෙර මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වේලාවෙත් මම කිව්වා, පක්ෂ සමඟවත් අපි සාකච්ඡා කරමු කියලා. ඔබතුමාට මතක ඇති, මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කරන දවසේ දී මම ප්‍රකාශ කළා. ඒ නිසා මේ සම්බන්ධව අපේ පාර්ශ්වයෙනුත් සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා අපට අවස්ථාවක් තිබිය යුතුව තිබෙනවා. නමුත් දැන් ඇති වී තිබෙන තත්ත්වය තමයි අපට එවැනි කිසිදු අවස්ථාවක් නැහැ. අපේ සංශෝධනයන් පිළිගැනීම හෝ නොපිළිගැනීම නොවෙයි, අඩුම තරමේ ඉදිරිපත්

කරන්නවත් අවස්ථාවක් නැහැ. ඒ නිසා මා ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ, අප ඉදිරිපත් කරන සංශෝධන ඔබතුමන්ලාගේ සංශෝධනවලට ඇතුළත් වෙලා නැති පිළිගන්න පුළුවන් ඒවා නම්, ඊළඟ පාර්ලිමේන්තු සැසිවාරයේ දිනයක් අරගෙන, ඒ දිනයේ කාරක සභා අවස්ථාවේ දී අපි මේ සංශෝධන සම්මත කරමු කියලායි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම අපට තවත් දිනයක් ගැනීමේ අවශ්‍යතාවක් නැහැ. ඔබතුමන්ලා දීපු සංශෝධන අපත් අධ්‍යයනය කළා. මා දන්නා හැටියට නම්, මෙතැන ප්‍රශ්නය financial implications තියෙන ඒවා තමයි කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න ඕනෑ කියලා කියන්නේ. නමුත් මෙතැනදී ඒ ප්‍රශ්නය මතු නොවන්නේ ඔබතුමන්ලා කියපු ගොඩක් දේවල් අපිම හිතලා, අපිම වෙනස් කරලාත් තිබෙනවා. ඒ නිසා ඔබතුමාට කලබල වෙන්න දෙයක් නැහැ. ඔබතුමාටත් ඒ ගරුත්වය දීලා, ඒ වෙනස් කරපු ඒවා මොනවාද කියලා අපි පස් වරු 4.30ට කියන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අද උදේ ඔබතුමන්ලාගේ සංශෝධන මට ලැබුණාම මම බැලුවා. [බාධා කිරීමක්] අපට මහහැරුණොත් තමයි. හැබැයි, මේක දිහා බැලුවාම -

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඇත්ත වශයෙන්ම ඔබතුමන්ලා දීපු සංශෝධනවලින් කිහිපයක්ම ඇතුළත් වෙලා තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇතුළත් වෙලා තිබෙන කොටසක් තිබෙනවා. විශේෂයෙන්ම ආයතනය පිළිබඳව.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔබතුමන්ලා ඉදිරිපත් කරපු සංශෝධන අතරින් යම්කිසි විධියකින් ඇතුළත් නොවුණු ඒවා -අපත් පිළිගන්න ඒවා- තිබෙනවා නම් අපි ඒ පිළිබඳව බලා අවශ්‍ය නම් එම සංශෝධනත් ඇතුළත් කරන්නම්. OMP එකට අප සංශෝධනයක් ගෙනා බව ඔබතුමන්ලාට මතකයි නේ. ඒ නිසා ඒවා ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. මේ පනත් කෙටුම්පත තවත් කල් දාන්න නම් එපා, ගරු මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා කියන කාරණය මා පිළිගන්නවා. නමුත් පනත් කෙටුම්පතක් ඉදිරිපත් වුණාට පස්සේ ඒ පනත් කෙටුම්පතම මුළුමනින්ම පිළිගෙන අනුමත කිරීමකටනේ මේ ක්‍රියාවලිය ඇතුළේ අප ලක්වෙලා තිබෙන්නේ. මීට පෙර උපදේශක කාරක සභා අවස්ථාවක් තිබුණා. ඒ අවස්ථාවේදී අප සාකච්ඡා කරනවා. මේ පනත් කෙටුම්පත පිළිබඳව ඔබතුමා එක්ක හෝ ඔබතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරින් එක්ක හෝ අදහස් හුවමාරු කර ගන්න අපට කිසිදු සාකච්ඡාවක් තිබුණේ නැහැ. ඒ සඳහා ඇති එකම අවස්ථාව මේ පාර්ලිමේන්තුවයි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඒ සඳහා අවස්ථාව ලබා දුන්නා. නමුත් ඔබතුමන්ලා අපෙන් සාකච්ඡාවක් ඉල්ලුවේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, මා මේ පාර්ලිමේන්තුවේදීම කිව්වා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මෙතුමන්ලා සාකච්ඡාවක් ඉල්ලුවා. ඒ ඉල්ලපු වෙලාවේම අප ඒ සඳහා අවස්ථාව දීලා සාකච්ඡා කළා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සභානායකතුමාට මතක ඇති, මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු දවසේ මා මේ සභා ගර්භයේදීම කිව්වා, "මේ පිළිබඳව අප සාකච්ඡා කළ යුතුයි" කියලා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමායි මමයි හොඳ යාළුවෝ. සභා ගර්භයේදී නොවෙයි, එළියේදී පොඩ්ඩක් කනට කරලා කිව්වා නම් මා ඒ වෙලාවේම වේලාව දෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න. බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට තව විනාඩියක් දෙන්නම්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මට විනාඩි පහක් ලබා දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි පහෙන් විනාඩි තුනයි ඉතුරුවෙලා තිබෙන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
කරුණාකරලා මට කථා කරන්න දෙන්න කෝ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තව විනාඩි දෙකකින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු ඇමතිතුමා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ අත්සන් කරපු, බිලියන 1.5 ගැනීමේ කොන්දේසිවල ප්‍රධාන දේ තමයි රජයේ ආදායම වැඩි කරන්න ඕනෑ කියන එක. ඒ සඳහා තමයි මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ. රජයේ වියදම් අඩු කරන්න ඕනෑ; අය වැය පරතරය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 3 දක්වා අඩු කරන්න ඕනෑ; රුපියලේ අගය නිදහසේ තීරණය වෙන්න ඉඩ හරින්න ඕනෑ; රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගතකරණය හෝ පෞද්ගලීකරණය කරන්න ඕනෑ. ඒ කොන්දේසි ඉෂ්ට වනවා නම් පමණයි මිලියන 169 බැගින් විටින් විට මේ ණය මුදල ලබා දෙන්නේ. නමුත් වියදම අඩු කරන්නේ නැතිව මේ ආකාරයෙන් ජනතාව පෙළලා ආදායම වැඩි කළාට අය වැය පරතරය අඩු වෙන්නේ නැහැ. මා ගරු මුදල් ඇමතිතුමාට ඒ සඳහා උදාහරණයක් පෙන්වන්න කැමැතියි.

1980 අවුරුද්දේ ලංකාවේ ආදායම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 23.5යි; වියදම සියයට 42.7යි; 1980 වර්ෂයේදී රජයේ අය වැය පරතරය සියයට 19.2යි. ඒ නිසා ආදායම වැඩි කළාය කියලා, අය වැය පරතරය අඩු වෙලා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතාව වැඩි වෙනවා කියලා හිතන්න බැහැ. තමුන්නාන්සේලා විශාල අලාභ ප්‍රමාණයක් නොදැනුවත්ව හෝ දැනුවත්ව කරගෙන තිබෙනවා. මා ඒ සඳහා උදාහරණයක් කියලා මගේ කථාව අවසන් කරන්නම්.

ගරු මුදල් ඇමතිතුමනි, 2015 සහ 2016 කියන මේ වර්ෂ දෙකේදී ලෝක වෙළෙඳ පොළේ බනිජ තෙල් මිල අඩු වීම නිසා අපේ රටින් පිටට යන්න තිබුණු විදේශ විනිමය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 4ක් රට ඇතුළේ ඉතුරු වුණා. ඒ ඇමෙරිකානු ඩොලර් බිලියන 4ම නැහැ. ඊළඟට මහ දවල්, මහ බැංකුවේ ඇති වෙච්ච මහා මුදල් මංකොල්ලය කරණකොටගෙන මේ රටේ සුරැකුම්පත් හා විනිමය බිල්පත් ඇතුළු අනිකුත් විදේශ ආයෝජන ඇමෙරිකානු ඩොලර් බිලියන 2ක් ආපසු අරගෙන ගියා. මේ ගනුදෙනු දෙකේ විතරක් ඇමෙරිකානු ඩොලර් බිලියන 6ක් තිබෙනවා. තමුන්නාන්සේලා හම්බන්තොට වරාය විකුණලා ගන්නේ ඩොලර් බිලියන 1.1යි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ගන්නේ ඩොලර් බිලියන 1.5යි. ඒ සියල්ලට වඩා ලොකුයි, මේ වැරැදි සහගත ප්‍රතිපත්තිය නිසා විනාශ කර ගත් ඇමෙරිකානු ඩොලර් ප්‍රමාණය. එසේ විනාශ කර ගත් ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 6යි. ණය ගෙවන්න තිබෙන ඇමෙරිකානු ඩොලර් බිලියන 4ත් එක්ක ඇමෙරිකානු ඩොලර් බිලියන 10ක ප්‍රශ්නයක් ආර්ථිකයට තිබෙනවා. ඒ නිසා තමයි මේ ආර්ථිකය පමණට වඩා රත් වෙච්ච - overheated - ආර්ථිකයක් බවට පත්වෙලා තිබෙන්නේ. ඒ ඇමෙරිකානු ඩොලර් බිලියන 4ට කළේ මේකයි. රුපියල් 131ට තිබුණු ඩොලරය රුපියල් 135, රුපියල් 140 වෙගෙන එනකොට එවකට හිටපු මුදල් අමාත්‍යතුමා කිව්වා, "සතියක් ඇතුළත මේ ඩොලරය රුපියල් 130ට ගෙනෙනවා. ඒ සඳහා වෙළෙඳ පොළට ඩොලර් දාන්න" කියා. ශ්‍රී ලංකා මහ බැංකුව ඩොලර් 100, ඩොලර් 80, ඩොලර් 50, ඩොලර් 60 යනාදී වශයෙන් ජාත්‍යන්තර සංචිතය - international reserves - පාවිච්චි කරලා ඒ ටික දැම්මා. අන්තිමට ජාත්‍යන්තර සංචිත දාලා නතර වනකොට බිලියන 4ක් දාලා.

අවුරුද්දකට අපට විදේශ ණය ගෙවන්නට යන මුදල ගැන බලමු. 2015දී ගියේ බිලියන 4.6යි, ණය වාරිකය සහ පොලිය දෙකටම. 2016දී ගියේ බිලියන 4.3යි. ලංකා ඉතිහාසයේ වැඩිම ඩොලර් ප්‍රමාණයක් පුච්චපු රජය, වාෂ්ප කරපු රජය, විනාශ කළ රජය බවට මේක පත් වුණා. රුපියල රැකුණෙත් නැහැ. රුපියල් 131ට තිබුණු ඩොලරය රුපියල් 157ට ගියා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න, කාලය අවසානයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මේ තත්ත්වය ගැඹුරින් තේරුම් අරගෙන බැංකුවක් හරහා රටට විදේශ විනිමය ගේන අයට සහන ලබා දෙන්නට ඕනෑ. රුපියල් ලක්ෂ 1,450ක් පෝර මලු දෙකක දාලා පෞද්ගලික සේප්පුවක තැන්පත් කරලා ඒකෙන් කෝටි 16, 1/2ක ගෙයක් ගත්තොත් ඔප්පු වෙනවා සම්පූර්ණ විදේශ විනිමය වංචාවක්, මුදල් විශුද්ධිකරණයක් කියලා. පෝර උර දෙකක දාගෙන රුපියල් ලක්ෂ 1,450ක් ගෙනැල්ලා ඒකෙන් කෝටි 16, 1/2ක වත්තමක් ගත්තාම නීතිය දන්නේ නැති බබෙක් වුණත් දන්නවා මුදල් විශුද්ධිකරණයක් කියලා. අපි ඔබතුමාට කියන්නේ ඒ විධියේ මුදල් විශුද්ධිකරණයට නොවෙයි පිරිසිදුව බැංකුවක් හරහා ගේන සෑම විදේශ විනිමය සතයකටම සහන ලබාදීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන්න කියලා. මේ තිබෙන විදේශ විනිමය අර්බුදය යටතේ අපනයනකරුවන්, ආයෝජකයන්, මේ රටේ සාමාන්‍ය ජනතාව, ගොවීන්, කලාකරුවන් අධෛර්යවත් කරන වාතාවරණයක් තිබෙන්නේ.

ගරු මුදල් ඇමතිතුමනි, ඒ වාගේම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට කන් දෙන්න. දැන් දවස් දෙකක සිට ඒ අය වැඩ කරන්නේ නැහැ. වැඩ කරන්නේ නැත්තේ පෞද්ගලීකරණය සඳහා වන යම් යම් වගන්ති ඔබතුමාගේ සංශෝධනවල තිබෙන නිසායි. ඒවා ඉවත් කළ යුතු වෙනවා. අපි ඒ සඳහා සංශෝධන දීලා තිබෙනවා. ඒවා ඉවත් නොකළොත් මේ පනත් කෙටුම්පත සම්මත වුණත් බදු අය කරන්නට බැරි වෙයි. මොකද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සියලු දෙනා එළියට බැස්සොත් ඒ කටයුත්ත කරන්නට බැරි වෙනවා. ඒ නිසා අපි- [බාධා කිරීමක්] හිනා වෙන්න එපා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හිනා වෙන්නට එපා. ඒ අය තමයි ආණ්ඩුවට සල්ලි එකතු කරලා දෙන්නේ. ඒ අයගේ හඬට කන් දෙමින් ඒ කටයුත්ත ඉටු කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා, බොහොම ස්තුතියි.

[අ.භා. 2.14]

ගරු ලසන්ත අලගියවන්න මහතා (මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிதி மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)
The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Finance and Mass Media)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට ගැනෙන දේශීය ආදායම් පනත් කෙටුම්පත ඉතාම වැදගත් පනත් කෙටම්පතක් හැටියටයි මම පෞද්ගලිකව දකින්නේ. අද ලෝකයේ සෑම රටක්ම පාලනය කිරීම සඳහා පත් වන ආණ්ඩුවලට අනිවාර්යයෙන්ම රට පවත්වාගෙන යාම සඳහා විවිධාකාරයෙන් මුදල් ඒක රාශී කර ගැනීමට සිදු වෙනවා. ඒ අනුව අද ලෝකයේ සෑම රටකම ආණ්ඩු විවිධ බදු වර්ග සහ ආදායම් මාර්ග ශක්තිමත් කර ගැනීම සඳහා කටයුතු කරනවා. මෙවැනි අණපනත් ගේන බොහෝ අවස්ථාවල අපේ රටේ විපක්ෂයේ සිටින පක්ෂ සාධාරණ වූ විවේචන ඉදිරිපත්

කරනවා වාගේම ඒ විවේචන හා යෝජනා පිළිගැනීම වග කිව යුතු රජයක යුතුකම හා වගකීම බවට පත් වෙනවා. ඒ අනුව වර්තමාන මුදල් අමාත්‍යතුමා විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂවලත්, වෘත්තීය සමිතිවලත්, විවිධ පාර්ශ්වවලත් අදහස් සහ යෝජනා ලබාගෙන තිබෙනවා. මම හිතන හැටියට අපේ රටේ ඉතිහාසයේ වැඩිම සංශෝධන ප්‍රමාණයක් ඉදිරිපත් කරන පනත් කෙටුම්පත හැටියට මේ පනත් කෙටුම්පත හඳුන්වන්නට පුළුවන්. විශේෂයෙන් එවැනි සංශෝධන ප්‍රමාණයක් ඉදිරිපත් කරන්නට සිද්ධ වුණේ මම පෙර කියූ ආකාරයට අදහස් හා යෝජනාවලට ඇහුම් කන් දීමේ ප්‍රතිඵලයක් විධියටයි. ආණ්ඩුවක් බදු පනවන්නේ, මෙවැනි නීති - රීති ගේන්නේ කැමැත්තකින් නොවෙයි. ආණ්ඩුවක් විධියට වඩාත්ම කැමැත්ත දක්වන්නේ කිසිම බදු අය කිරීමකින් තොරව ජනතාවට ලබා දෙන්නට පුළුවන් ඉහළම ආකාරයෙන් සේවය ලබාදීලා, ලබාදෙන පඩි සහ විශ්‍රාම වැටුප් වැඩි කිරීමටයි. එවැනි ආකාරයට කටයුතු කරන්න තමයි රජයක් වඩාත්ම කැමැත්ත දක්වන්නේ.

එම නිසා විශේෂයෙන්ම අපි මේ දිහා බලනකොට, අපේ රටේ රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයත් එක්ක -එහි ප්‍රතිශතයක් විධියට- විවිධාකාරයෙන් සංසන්දනය කිරීම් සිදු කර තොරතුරු ඉදිරිපත් කළ ආකාරය මීට පෙර අපි දැක්කා. ඍජු බදු, වක්‍ර බදු පිළිබඳව අපි විවිධාකාරයෙන් මෙතැනදී අදහස් හා යෝජනා ඉදිරිපත් කළා. එම නිසා ආණ්ඩුවේ සිටින අය විධියට අපි මේ පිළිබඳව දකිනවා වාගේම, විපක්ෂයේ සිටින අයත් මේ පිළිබඳව විවිධ කෝණවලින් දකිනවා කියන එක විශේෂයෙන්ම අපි සඳහන් කරන්න ඕනෑ.

ප්‍රධාන වශයෙන්ම මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කළාට පසුව අපේ රටේ මේ පිළිබඳව විශාල වශයෙන් සාකච්ඡාවට භාජන වුණු කරුණු ගණනාවක් තිබුණා. එම කරුණු ගණනාව අතර ප්‍රධානතම වශයෙන් ගත්තොත්, පුණ්‍ය ආයතන පිළිබඳව තිබුණු ප්‍රශ්නය, සේවක අර්ථ සාධක අරමුදල පිළිබඳව තිබුණු ප්‍රශ්නය වාගේම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සම්බන්ධයෙන් ප්‍රශ්නය තිබුණා. මේ කියන කරුණු තුනම දිහා අපි බැලුවොත්, ඇතැම් විට අද වන විට අපේ රටේ ජනතාව හිතනවා ඇති, පුණ්‍ය ආයතන සඳහා අලුතින්ම බද්දක් පනවනවා, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා අලුතින්ම බද්දක් පනවනවා, සේවක අර්ථ සාධක අරමුදල සඳහා අලුතින්ම බද්දක් පනවනවා කියලා. ඒ මතය තමයි අද මේ රට තුළ විවිධ මාධ්‍ය හරහා දකින්න සහ අහන්න ලැබෙන්නේ. පුණ්‍ය ආයතන සඳහා රජය අලුතින්ම බද්දක් ගෙනෙනවා, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා -එම මුදල්වලට- අලුතින්ම බද්දක් ගෙනෙනවා, ඒ වාගේම සේවක අර්ථ සාධක අරමුදල සඳහාත් අලුතින්ම බද්දක් ගෙනෙනවා කියන එක තමයි පසු ගිය දවස්වල සාකච්ඡාවට භාජන වුණේ. මේ තත්ත්වය තවත් ඉදිරියට ගියා. ඉදිරියට ගිහිල්ලා කිව්වා, "පන්සලට දානය දුන්නත් බද්ද ගහනවාය කියලා. එය, තවත් ඉදිරියට ගියා. පුණ්‍ය කටයුත්තක් සඳහා පන්සලකට සල්ලි දුන්නත් බද්දක් ගහනවා කියලාත් කිව්වා. මේවා තමයි අපිට දකින්නට සහ අහන්නට ලැබුණේ.

අපි කලින් පැවැති ආණ්ඩුවේත් අපි කටයුතු කළා. කලින් ආණ්ඩුව පැවැති කාලයේ සිදු කළ හොඳ-නරක කියන දෙකෙහිම වගකීම අපි භාර ගන්නවා. ඒ නරක කොටස් කාටවත් දිගු කරලා අපි ඒකෙන් බේරෙන්නේ නැහැ. මට හොඳට මතකයි, අපි එම ආණ්ඩුවේ ඉන්නකොට එක අය වැයකදී ගෙනා යෝජනාවක්. විවාහ වෙනකොට විවාහ රෙජිස්ට්‍රාර් ළඟට ගියාම රුපියල් 2,500ක් ගන්නවාය, රෙජිස්ට්‍රාර් ගෙදරට ආවොත් රුපියල් 5,000ක් ගන්නවාය කියලා ඒ වේලාවේ යෝජනාවක් ගෙනාවා. අපි ඒකට අත ඉස්සුවා. අපි ඒ වේලාවේ එම නීතිය ගෙනාවේ යම් කිසි ආකාරයකට රටේ ආදායම් වර්ධනය කර ගැනීමේ හැඟීමෙන්. ඒ වේලාවේ විපක්ෂයේ හිටපු අය එයට විශාල වශයෙන් චෝදනා කළා. "ඒක හරි"ය කියලා අපි එදා කථා කළා. අපි එදා ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙනාවා. අපි එදා ඒ බද්ද ගෙනෙනකොට, "ඒක හරි"ය කියලා අපි කිව්වා. විපක්ෂය "ඒක වැරදියි" කියලා කිව්වා. මේක තමයි ඉතිහාසයේ ඉඳලා සිද්ධ වුණේ. නමුත් අද අපි මේ පිළිබඳව පවතින ඇත්ත යථාර්ථය ගැන සිතිය යුතුයි කියලා මම හිතනවා.

පුණ්‍ය ආයතන සම්බන්ධයෙන් මීට පෙර තිබුණු තත්ත්වය බලමු. විශේෂයෙන්ම පුණ්‍ය ආයතන යම් කිසි ආකාරයකින් ලබන ලාභය හෝ පුණ්‍ය ආයතන යම් කිසි ආකාරයක ස්ථාවර තැන්පතුවකින් ලබන පොලී ආදායම රුපියල් ලක්ෂ පහට වඩා අඩු නම් කලින් සම්පූර්ණ නිදහස ලබා දුන්නා. නමුත් පුණ්‍ය ආයතනයකට යම් කිසි ආකාරයකින් ස්ථාවර තැන්පතුවක් මගින් ලක්ෂ පහට වඩා වැඩියෙන් ආදායමක් ආවා නම් සියයට අටක බද්දක් ගන්නවා කියලා 2011දී අපිම සිටි රජයේදී නීතියක් ගෙනාවා. මේක තමයි ඇත්ත යථාර්ථය. සේවක අර්ථ සාධක අරමුදලින්, ඒ පොලී ආදායමින් සියයට දහයක බද්දක් ගන්නවා කියලා අපේම ආණ්ඩුවෙන් අපිම නීතියක් ගෙනාවා. [බාධා කිරීමක්] හරි. අපි එදා කිව්වේ සියයට දහයක බද්දක් ගන්නවා කියලායි. අද සේවක අර්ථ සාධක අරමුදලට සේවක-සේව්‍ය පාර්ශ්වයන්ගෙන් ලබා දෙන මුදල වැඩියි, එදාට වඩා. ඒ අනුව සියයට හතරක වැඩිවීමක් සිද්ධ කළා.

ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගෙනුත් අපි ගත්තා. 2011දී ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගෙනුත් ලක්ෂ 5ට වැඩි නම් ගන්න ඒ පොලී ආදායම තිබුණේ නැහැ. රුපියල් ලක්ෂ 5-12 අතර ගන්නවා නම් සියයට 2.5ක් ගත්තා. රුපියල් ලක්ෂ 15ට වැඩි නම් සියයට 8ක් ගත්තා. අද රුපියල් ලක්ෂ 15 දක්වා බදු නිදහසක් ලබා දී තිබෙනවා. රුපියල් ලක්ෂ 15ට වැඩි නම් සියයට 5ක බදු ප්‍රමාණයක් ගන්න අද තීරණය කර තිබෙනවා. මේ උදාහරණ තුනම ගත්තොත්, මේ උදාහරණ තුනම අනුව අද රටේ ජනතාව දකින්නේ මේ රජය අලුතින්ම බදු ගෙනෙනවාය කියලායි. නමුත් අලුතින්ම ගෙනෙන බදු නොවෙයි, අපි පෙර රජයේ ඉන්නකොටත් මේ බදු හඳුන්වා දුන්නා. මේ විධියට බදු ගත්තා. අද සංශෝධන විධියට ඒ මුදල් ප්‍රමාණයන්වල ප්‍රතිශතයන් තමයි වෙනස් වන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

Sir, I rise to a point of Order. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක්.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ඔබතුමා මුදල් ඇමතිතුමාගෙන් පැහැදිලි කර ගැනීම කර ගන්න. [බාධා කිරීමක්]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

පැහැදිලි කර ගැනීමක්. ඔබතුමා කිව්ව විධියට පුණ්‍යායතනවල තිබෙන්නේ පොලී ආදායම නොවෙයි. ලාභ. යම් කිසි දෙයක් කුලියට දීලා, එහෙම නැත්නම්-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඒක point of Order එකක් නොවෙයි. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන්න. [බාධා කිරීමක්] ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් පැයක් විතර කථා කළා නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ගරු මන්ත්‍රීතුමනි, මම කිව්වේ ලාභ හා පොලී. [බාධා කිරීමක්] ඔබතුමා ඒක හැන්සාඩ් වාර්තාවෙන් බලන්න. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ලාභ හා පොලී. ලාභ හා පොලී දෙකම යටත්. කලින් රුපියල් ලක්ෂ පහක් දක්වා- [බාධා කිරීමක්]

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ලාභයක් ලබනවා නම්, ඒකෙන් බද්දක් ගෙව්වාම තිබෙන වරද මොකක්ද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
පුණ්‍යායතන.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
පුණ්‍යායතන තිබෙන්නේ ලාභ ලබන්න නොවෙයි. පුණ්‍යායතන තිබෙන්නේ පුණ්‍ය කටයුතු කරන්නයි.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ගරු මන්ත්‍රීතුමනි, මම කිව්වේ කලිනුත් යම් පුණ්‍යායතනයක් රුපියල් ලක්ෂ 5කට වඩා වැඩි පොලී ආදායමක් ගත්තා නම් ඒකට සියයට 8ක් බද්ද ගැහුවා කියලායි. පුණ්‍යායතනයකට බදු ගහන එක හොඳ නැත්නම් රුපියල් ලක්ෂ 5කට වැඩි ආදායමකට සියයට 8ක් ගහන එකත් හොඳ නැහැ. ඒක මගේ පෞද්ගලික මතය. ගරු මුදල් ඇමතිතුමනි, මේක ඔබතුමාට නොවෙයි, මම කියන්නේ අපි කරපු ඒවා. ඔබතුමන්ලාට ඒකට නිදහසට කරුණක් තිබෙනවා. නමුත් මම පෞද්ගලිකව කියන්නේ සේවක අර්ථ සාධක අරමුදලටත්, පුණ්‍යායතන සම්බන්ධයෙනුත්, විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහාත් පසුගිය රජය කාලයේ අපිත් අත උස්සලා යම් යම් ප්‍රමාණයන්වලට බදු ගැහුව බවයි. අද මේ රජය තුළත් අනිවාර්යයෙන්ම මේ බදු ගහනවා. එම නිසා සේවක අර්ථ සාධක අරමුදලට බදු ගහන එක හොඳ නැත්නම් සියයට 10, සියයට 14 කිරීම නොවෙයි ප්‍රශ්නය. සියයට 10ක් බදු ගහන එකත් හොඳ නැහැ. පුණ්‍යායතනවලට බදු ගහන එක හොඳ නැහැයි කියලා මමත් පෞද්ගලිකව කියනවා. නමුත් රජයක් විධියට එවැනි දේවල් සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම කටයුතු කරන්න සිද්ධ වෙනවා. එම නිසා අපි මේවා පිළිබඳව විශේෂ අවධානය යොමු කරනවා.

අද රජය විධියට අපට තිබෙන ප්‍රධානතම අභියෝගය තමයි, මේ විධියට බැණුම් අහලා ලබා ගන්නා ආදායම අපි නිසි පරිදි වියදම් කරනවාද කියන එක. ඒක තමයි රජයට තිබෙන ප්‍රධානම ප්‍රශ්නය. අද ජනතාවගේ විරෝධය තිබෙන්නේ අපි විවිධ නීති - රීති ගෙනැල්ලා, ජනතාවගෙන් බදු අය කරලා ලබා ගන්නා මුදල් හරියට වියදම් කරනවාද කියන එක ගැනයි. මේක තමයි අද තිබෙන ප්‍රධානතම අභියෝගය විධියට අපි දැකිය යුතු වන්නේ. අද මේ ආකාරයෙන් බදු පනවලා ආදායම ලබා ගන්නවා වාගේම රජය ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කළ යුතු තව බොහෝ අංශ තිබෙනවා. විශේෂයෙන්ම අපි රේගුව ගත්තොත්, ගරු ඇමතිතුමා මේ වන විට අවුරුදු ගණනාවක් පැරණි ඒ පනත වෙනස් කරන්න කටයුතු කර තිබෙනවා. පසු ගිය කාලයේ රේගුව සඳහා ස්කෑනර් යන්ත්‍රය සවි කර ගැනීමේ කාර්ය භාරය කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. අද ඒ සඳහා මුල් ගල තියලා වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා.

අපි ඉතාමත් වග කීමකින් යුතුව සඳහන් කළ යුතුයි, අද රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමේදී, විශේෂයෙන්ම නවීන තාක්ෂණය භාවිත කිරීම පිළිබඳව අභියෝග ගණනාවකටම පසුගිය කාලයේ මුහුණ දුන් බව. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙන්න පුළුවන්, ශ්‍රී ලංකා රේගුව වෙන්න පුළුවන්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙන්න පුළුවන්, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙන්න පුළුවන්, මේ සෑම ආයතනයකම තොරතුරු තාක්ෂණය හඳුන්වාදීම සඳහා 1990 සිට දැවැන්ත මුදල් ප්‍රමාණයක් වියදම් කරලා තිබෙනවා. නමුත්, අද වන කොටත් ඒ ආයතනවලට වාගේම, ඒ ආයතන අතර අන්තර් සම්බන්ධතාවක් ඇති වන පරිදි තොරතුරු පද්ධතියක් ඇති කර ගැනීමට අපට පුළුවන්කමක් ලැබිලා නැහැ. මේක තමයි අපි විශේෂයෙන්ම අවධානය යොමු කළ යුතු කරුණ විධියට මා පෞද්ගලිකව දකින්නේ. අද අපි බදු පනවනවා. බදු පනවලා රාජ්‍ය ආදායම වැඩි කර ගන්න උත්සාහ කරනවා වාගේම ඒ කාර්යයත් කළ යුතුයි. මීට වඩා වැඩි වැදගත්කමක් අපි අනිවාර්යයෙන්ම ඒ සඳහා ලබා දිය යුතුයි. මෙවැනි බදු පැනවීමකින් තොරව ලබා ගත යුතු රාජ්‍ය ආදායම් වැඩි කර ගැනීම සඳහා වැඩි අවධානයක් අපි අනිවාර්යයෙන්ම යොමු කළ යුතුව තිබෙනවා. මේ සඳහා විවිධ බලවේග තිබෙනවා. තොරතුරු තාක්ෂණය හඳුන්වා දුන්නාම වංචා, දූෂණ කරන්න අමාරුයි.

විශේෂයෙන්ම දේශපාලනඥයන්ගෙන් පමණක් නොවෙයි, නිලධාරින්ගේ පාර්ශ්වයෙනුත් මේ සඳහා විවිධ අභියෝග තිබෙනවා. සමහර ආයතනවල අභ්‍යන්තර ස්ථාන මාරුවීම් කිරීමේදී ප්‍රධාන අභියෝග ගණනාවක් තිබෙනවා. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර ස්ථාන මාරුවීම් කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. මේවා තමයි තිබෙන ප්‍රශ්න. ලෝකයේ අනෙක් රටවල් වාගේම රජයක් විධියට අපටත් මේ ආකාරයෙන් බදු පැනවීම් කරන්න අනිවාර්යයෙන්ම සිද්ධ වෙනවා. ඒ හා සමානවම, අපට නොලැබෙන රාජ්‍ය ආදායම ලබා ගැනීම සඳහා අපේ රටේ ආදායම් උපදවන දෙපාර්තමේන්තු, ආයතන දැනට වඩා ශක්තිමත් කරලා, මේ ලබා ගන්නා ආදායමට වඩා සියයට තුන් හාර සියයක් ආදායම වැඩි කර ගන්න හැකියාවක් තිබෙනවා. ඒ පිළිබඳවත් අද සිටම අවධානය යොමු කිරිම අපි සියලු දෙනාගේ යුතුකමක්, වග කීමක් විධියටයි මා පෞද්ගලිකව දකින්නේ.

මේ පනත් කෙටුම්පත ගෙන ඒමේ ක්‍රියාවලියේදී ආණ්ඩුව තුළ සිටින පක්ෂයක් වශයෙන් අපි සාකච්ඡා වට 10ක් විතර පැවැත්තුවා; අපේ අදහස්, යෝජනා අපි ඉදිරිපත් කළා. ඒ ආකාරයෙන් වෘත්තීය සමිති සහ පාර්ලිමේන්තුවේ පක්ෂ සමඟ සාකච්ඡා කරලා මේ පනත් කෙටුම්පතේ තිබුණු අඩු පාඩුකම් නිවැරැදි කර ගැනීමට ලබා දුන් නායකත්වය පිළිබඳවත් අපේ ගෞරවය මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට පුද කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

[2.30p.m.]

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)
Hon. Presiding Member, at the outset I wish to offer my congratulations to the new Finance Minister, the Hon. Mangala Samaraweera, for presenting the Inland Revenue Bill in Parliament even though the spadework would have been done by the former Finance Minister. In fact, Hon. Ravi Karunanayake, the then Finance Minister,

in his Budget Speech for 2016, proposed to introduce a new income tax law on the following lines; I quote:

> "Existing tax laws in the country are cumbersome, complex and based on traditional British concepts. The complexity of the tax laws has been identified as an impediment for the effective implementation of tax policy in Sri Lanka. It has led to various complications thereby hampering the effective implementation of the tax policy. Therefore, we need to redraft the tax laws to bring about necessary improvements to the legal framework to ensure clarity, consistency and simplicity towards reflecting the features of modern tax systems which will help taxpayers to understand the system easily and eliminate loopholes that have been created by the ambiguities in laws while strengthening tax administration. For this purpose, we will receive technical assistance from IMF and I propose to complete the project/process by end 2016."

That was Hon. Ravi Karunanayake in November, 2015 presenting his Budget for the year 2016.

Now, we are debating the new Inland Revenue Bill. As I quoted from the then Finance Minister's speech, the new Inland Revenue Bill was prepared with the technical assistance from the IMF. However, critics claimed that the IMF had not merely provided technical assistance, but the entire Bill was prepared by the IMF and it was similar to what they did a few years back in Ghana.

Whatever it may be, Sri Lanka had severe problems with respect to tax revenue for years. The tax revenue - both direct and indirect - was declining substantially over the years and had reached a crisis situation. The proportion of direct tax to indirect tax was 20:80 and the tax burden was borne by the low-income groups in Sri Lanka. But, now with the introduction of the new Bill, the Government expects to ambitiously reverse the proportion to 40:60 and the tax burden will be borne by the well-to-do thereby helping the poorer sections to a great extent. The new law is also expected to double the income tax to GDP ratio to 4 per cent by 2020 from the current rate of 2 per cent.

The revenue available for taxation in Sri Lanka is limited. The level of revenue exploitation in Sri Lanka is not only low by international standards, but is also declining over the years. The revenue raised by the Government was only 12 per cent of the GDP. Tax as well as non-tax revenue contributed to this decline and tax to GDP ratio continued to register a sharp decline.

If the new Inland Revenue Act is implemented successfully, we expect general government revenues to increase to about 14.7 per cent of the the GDP in 2017 and to 15 per cent in 2018. The IMF projects revenues will rise further to about 16 per cent of the GDP by 2021.

The new Inland Revenue Bill is designed to: focus on reducing the indirect tax burden on people; to have a broad-based tax net; turn the tax system into a simpler, more direct structure; simplify the tax system in order to create an investor-friendly environment to attract more foreign investments; reduce indirect taxes to 60 per cent and direct taxes to 40 per cent as the immediate goal; to be the key aspect of the fiscal consolidation drive after weak tax collection in recent years, partly due to the complexity of the Act; avoid diversification of taxes with different bases; reduce the volume of legislation and to use user-friendly language in the legislation.

The World Bank and credit rating agencies laud the new law. The proposed tax reforms also pave the way for the International Monetary Fund to approve the pending third tranche of Sri Lanka's three-year, US Dollars 1.5 billion Extended Fund Facility arrangement.

A strict perusal of the Bill would show that some of these objectives may not be realized. It is regretted that stakeholder consultation is minimal. The Government must realize that the taxpayers will comply and pay tax if they understand the basis and accept the law as reasonable, giving them the right to challenge the acts of the IRD officials, if their actions are not within the framework of the Act. It must be remembered that the American War of Independence of 1789 was initiated on the slogan "no taxation without representation", clearly demonstrating the need for stakeholders' participation for great acceptability.

Sri Lanka's Minister of Finance, in an interview a few weeks back, said that the main objective of the new Inland Revenue Bill is to simplify the tax system in order to create an investor-friendly environment to attract more foreign investments. "The new Inland Revenue Bill will broad-base the tax system and incorporate globally accepted new tax principles to deal with international cross border relations", the Minister of Finance, Hon. Mangala Samaraweera, also said.

It is true that Sri Lanka's Foreign Direct Investments dropped by 45.6 per cent to a very low level of slightly over US Dollars 300 million in 2016 from US Dollars 658 million in 2015. The new Inland Revenue Bill has an inbuilt mechanism to reverse this trend. The new Bill treats the entire country as a single entity and has not addressed the regional imbalances, especially the situation in the Northern and Eastern Provinces.

Whatever the result, the new Bill does not address the concerns of the population in the Northern and the Eastern Provinces. The 30-year long war had destroyed almost all micro, small and medium enterprises that existed in the region before the war. The destroyed enterprises have to be revived. Employment and income generation are the need of the hour for the people of the Northern and the Eastern Provinces. The GDP contributions of the Northern and the Eastern Provinces were among the lowest with around 4 to 5 per cent, whereas the GDP contribution by the Western Province is much higher.

It is, therefore, unfair to treat all provinces alike. It is a discrimination if unequals are treated alike. The Northern and the Eastern Provinces should be protected so that they could revive their lost enterprises. All incentives shall be granted to the Northern and the Eastern Provinces for new investments, including Foreign Direct Investment. Tax incentives are an absolute necessity for the Northern and the Eastern Provinces, at

least for the next five to seven years, for economic development of the Provinces.

The issues pertaining to the Northern and the Eastern Provinces should be treated on a separate basis. I wish to lay emphasis on the fact that the Government should commit itself to eliminate the existing socio-economic gap between the North and the East with the rest of the country at least by 2020. One way is to continue with the 2017 Budget Proposal to provide a 200 per cent capital allowance for businesses which make investments of over US Dollars 3 million in the Northern and the Eastern Provinces, excluding land, and generate new employment opportunities for 250 or a three to five-year 50 per cent tax holiday for such businesses which will create 500 or 800 new employment opportunities.

Hon. Presiding Member, before I conclude, let me wish the Hon. Minister of Finance and Mass Media success in his endeavour. In another month or two, he will bring in Budget Proposals for the year 2018 in this House, taking into account the peculiar situation in the Northern and the Eastern Provinces.

The Hon. Minister was here. I reiterate the fact that to date, proper investments have not been made and employment has also not been created in the Northern Province. If you take into account the enterprises which were introduced recently - two industries - but they are not operating properly and I think those enterprises might get closed any time. So, how are we going to promote these enterprises in the North? The farmers are there; the products are being made, but still, we have not introduced appropriate systems -proper storage facilities or machineries are not available. Now, there is milk production in the North and milk is being collected. So you can make dairy products creating more employment opportunities there.

I strongly feel that the Ministry of Industry and Commerce or the Government should have a separate unit for the development of the North, like you have for some other provinces. Please consider that.

Talking of the GDP contribution, at the last Budget, it was stated that you are going to bring the GDP contribution of the North equal to that of other provinces. But, I do not think that even now, we have reached that level. Last time, it was told that the GDP contribution of the North was at 4 to 5 per cent. Maybe, it would have increased by 1 per cent. There are so many avenues to reach that level. We did better before the war and made a good produce. I think our GDP contribution was almost equal to that of the other provinces prior to 1983. But today, we are unable to reach that level. So, that is why I said that for five to seven years, tax concessions must be given even for small investments. Starting a US Dollars 300 million project would be applicable to the rest of the provinces, but not to the Northern Province. From where will you find investors? We have been canvassing with the diaspora to come and invest in our area, but we find it difficult to bring them in because we have to give them some boost. They have money, they can come and invest, but they must be given some tax concessions.

We are experiencing various other difficulties and are facing many problems when dealing with the Provincial Council with regard to obtaining environmental certificates and so on. So, all these things will have to be sorted out by the Central Government. I hope at least from the next Budget onwards, we will have better improvement compared to the other provinces. So, Hon. Minister, your vision to bring development in all the provinces to an equal status by 2020 must start from today.
Thank you.

[අ.භා. 2.44]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම රාජ්‍යය පවත්වාගෙන යන්නත්, සහනාධාර ලබා දෙන්නත්, පොදු සේවා පවත්වාගෙන යන්නත් රටක බදු ආදායම වැදගත් වනවා. අපේ රටේ ජනගහනයෙන් සියයට 3කින් පමණ බදු අය කරගෙන, ඉතිරි සියයට 97ටම සහනාධාර ලබා දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. අපේ රටේ දරුවකු උපදින කොට රෝහල් පහසුකම නිකම් දෙන්න ඕනෑ, ඊට පස්සේ පාසල් යනකොට අධ්‍යාපනය නිකම් දෙන්න ඕනෑ, නිල ඇඳුම් ටික නිකම් දෙන්න ඕනෑ, පොත් - පත් ටික නිකම් දෙන්න ඕනෑ. ඊට පස්සේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයත් නිකම් ලබා දෙන්න ඕනෑ. විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසන් වුණාට පස්සේ අයිස් ගහන්න පුළුවන් මට්ටමේ ආණ්ඩුවේ රක්ෂාවකුත් දෙන්න ඕනෑ. ඊටත් පස්සේ මැරෙන කල් විශ්‍රාම වැටුපක් දෙන්නත් ඕනෑ. එහෙම හිතමින් තමයි අපි මේ රට දියුණු කරන්න හදන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක සන්තෘෂ්ටි වාර්තා එක - දර්ශකය- අනුව ලෝකයේ ඉහළම රටවල බදු ආදායම් ප්‍රතිශතය ගත්තොත්, නෝර්වේ රටේ සියයට 43.6යි; ඩෙන්මාර්ක් රටේ සියයට 50.8යි; අයිස්ලන්තයේ සියයට 40.4යි. මේ දර්ශකයේ 120වන ස්ථානයේ ඉන්න ලංකාවේ බදු ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 13.6යි. මේ බදු ආදායමෙන් තමයි අපට ඔක්කොම දේවල් කරන්න වෙලා තිබෙන්නේ. මේ තුළ, ඍජු බදු සියයට 20ක් හැටියටත්, වක්‍ර බදු සියයට 80ක් හැටියටත් තිබෙනවා. බදු සහන ලබා දෙන්න කියලා සමහර අය කෑ ගහන්නේ මොකටද? තක්කඩියන්ටයි, නෑදෑයන්ටයි රුපියල් කෝටි ප්‍රකෝටි ගණන් බදු සහන දීම නිසා රාජ්‍ය ආදායම නැති වෙනවා. එතකොට රටේ ශුභ සාධන කටයුතු පවත්වාගෙන යන්න බැරි වුණාම, ජනතාවට තේරෙන්නේ නැති විධියට වක්‍ර බදු ආදායම වැඩි කරලා තමයි රට ගෙන යන්න වෙන්නේ.

විශේෂයෙන්ම ලෝකයේ දියුණු රටවල ජනතාව දන්නවා, තමන් කොපමණ බදු ගෙවනවාද, බදු ආදායම රටේ අදායමෙන් කොපමණ ප්‍රමාණයක්ද, ඒ බදු ආදායමෙන් මොනවාද කරන්නේ කියලා. නමුත් අපේ රටේ වක්‍ර බදු ආදායම සියයට 80ක් දක්වා වැඩිවෙලා තිබුණත්, රජයට ආදායම ලෙස එයින් කොපමණ ලැබෙනවාද, ජනතාවගේ ශුභ සාධනය සඳහා එයින් කොපමණ පාවිච්චි කරනවාද කියලා විශ්වාසයක් නැහැ. ඒ විශ්වාසය නැති නිසාම තමයි ජනතාවගෙන් චෝදනා එල්ල වන්නේ, "අපෙන් බදු අරගෙන හොරකම් කරනවා" කියලා. ඒ ගොල්ලන්ට සැප විඳින්න අපි බදු ගෙවන්න ඕනෑ නැහැ"යි කියලා මතයක් ජනතාව තුළ ගොඩනැඟී තිබෙන්නේ. එම නිසා රටේ ජනතාවගෙන් ලබා ගන්නා බදුවලට මොනවාද කරන්නේ කියන එක විනිවිදභාවයෙන්

යුතුව පෙන්වන්න බලයට පත්වන ඕනෑම රජයකට වග කීමක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සෘජු බදු ආදායම සියයට 20 සිට 40 දක්වාත්, වක්‍ර බදු ආදායම සියයට 80 සිට 60 දක්වාත් වෙනස් කිරීම සම්බන්ධව මුදල් ඇමතිතුමාට අපේ ස්තුතිය පුද කරනවා. මොකද, මේ ක්‍රමය හරහා තමයි රටක් දියුණු කරන්න පුළුවන් වන්නේ. මැදි ආදායමක් ලබන රටක් නම්, ඒ රට දියුණුවන මාර්ගයක ගමන් කරනවා නම්, ඒ රටේ බදු ආදායම අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 25 - 30 අතර ප්‍රමාණයක තිබෙන්න ඕනෑ. බදු ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 13.6ක තබාගෙන දියුණු රටක් බවට පත්වෙන්න අපට බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දියුණු රටවල් තිබෙනවා; සල්ලි තිබෙන රටවල් තිබෙනවා; ඒක පුද්ගල ආදායම වැඩි රටවල් තිබෙනවා. හැබැයි, ඒ රටවල අඩු බදු ප්‍රමාණයක් ගෙවන්නේ. ඒ රටවලට වෙනත් ආදායම් මාර්ග තිබෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, සවුදි අරාබියේ බදු අය කරන්නේ සියයට 5.3යි, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සියයට 1.4යි, කටාර් රාජ්‍යයේ සියයට 2.2යි. ඔවුන්ට ඛනිජ තෙල් සම්පත තිබෙන නිසා රාජ්‍යය පවත්වාගෙන යෑම සඳහා සහ අවශ්‍ය ශුභ සාධන කටයුතු කරන්න ආදායමක් තිබෙනවා. අපේ රට මේ බදු ආදායම ලබාගෙන ඒවායින් කරන දේ පිළිබඳ විශ්වාසයක් නැති වීම නිසා තමයි මේ ගැටලුව මතුවෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැම අංශයකටම බදු සහන දීලා අපට මේ රට පවත්වාගෙන යන්න බැහැ. දැන් කෘෂි කර්මාන්තයට අවශ්‍ය පොහොර සහනාධාරය ලබාදෙන්න රුපියල් බිලියන 37ක් ඕනෑ. අධ්‍යාපනය නොමිලයේ ලබාදෙන්න රුපියල් බිලියන 85ක් ඕනෑ. සෞඛ්‍ය සේවාව පවත්වා ගැනීම සඳහා රුපියල් බිලියන 100කට අධික මුදල් ප්‍රමාණයක් ඕනෑ. මේ සේවා ලබාදීම සඳහා යොදා ගන්නා ක්‍රමවේදය ජනතාවට විශ්වාස කරන්න පුළුවන් ස්ථිරසාර ක්‍රමවේදයක් සහ විනිවිදභාවයක් සහිත ක්‍රමවේදයක් වෙන්න ඕනෑ. රට යන්නේ කොයි පැත්තටද, මැදි ආදායම් රටක් හැටියට දියුණුව කරා යන්නේ කෙහොමද කියන එක ජනතාවට පෙන්වන්න ඕනෑ.

විශේෂයෙන්ම දියුණු රටවල ජනතාව දන්නවා, තමන්ට ආදායම් බදු ගෙවන්න තිබෙනවා, තමන්ට ලැබෙන ආදායම පිළිබඳව රජය දැනුවත්, එම නිසා බොරු කරන්න බැහැ, හොර කරන්න බැහැයි කියලා. එම නිසා අපි යෝජනා කරනවා, බදු ගෙව්වත්, නොගෙව්වත් හැම පුරවැසියකුටම බදු file එකක් විවෘත කරන්නය කියලා.

බදු file එකක් විවෘත කළාම යම් කිසි කාලයක් යනකොට ජනතාව එයට හුරුවනවා. මේ නීතිමය රාමුව නිසා තුන්වෙනි පාර්ශ්වයකට පගාවක් ගෙවා කට්ටි පනින්න හම්බ වන්නේ නැහැ. මෙවැනි system එකක් තියෙනකොට ඒකෙන් ඒවා අහුවෙනවා, එම නිසා රට පවත්වාගෙන යන්න, රටේ සේවා පවත්වාගෙන යන්න අපි බදු ගෙවන්න ඕනෑය කියලා. අපි පරිභෝජනය සඳහා නිකම් ඉල්ලන දේවල් ලබා ගන්න බදු ගෙවන්න ඕනෑය කියන හැඟීම ජනතාව තුළ ඇති කරන්න ඕනෑ. ඒ වාගේම, මෙහිදී පාලකයන්ටත් වග කීමක් තිබෙනවා, ජනතාවගෙන් ගන්නා බදු මුදල්වලින් කරන දේවල් මොනවාද කියලා කියන්න. මෙන්න, යටිතල පහසුකම් සඳහා මෙපමණක්, අධ්‍යාපනය සඳහා මෙපමණක්, සුබ සාධන කටයුතු සඳහා මෙපමණක්, මේකට මෙපමණ ආදායමක් ලැබෙනවා, මේවා මේ මේ විධියට බෙදෙනවා කියන එක පිළිබඳව ජනතාවට නිසියාකාර අවබෝධයක් දුන්නොත් තමයි, ජනතාව බදු ගෙවීමට පෙලඹෙන්නේ. වක්‍ර බදු අඩු කරලා, සෘජු බදු වැඩි කරලා, බදු ලබා ගැනීම සමපාත තැනකට ගෙනැල්ලා, බදු ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 25ක් දක්වා ගෙන යන වැඩසටහනේ ආරම්භය හැටියට ගෙනෙන මේ පනත් කෙටුම්පත සාර්ථක වෙයි කියලා අපි විශ්වාස කරනවා.

විශේෂයෙන්ම වර්තමාන මුදල් ඇමතිතුමා ගැන මම මේ කාරණා කීපය කියන්න ඕනෑ. ඉතිහාසය දිහා බැලුවාම නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ මහජන උපයෝගිතා අමාත්‍යාංශය වෙන්න පුළුවන්, විදේශ කටයුතු අමාත්‍යාංශය වෙන්න පුළුවන්, වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය වෙන්න පුළුවන්, එතුමා passion එකක් ඇතුව ඒ කටයුතු හරියට කරලා තිබෙනවා. සෘජු තීරණ ගන්න පුළුවන්, කොන්ද පණ තිබෙන නායකයෙකු හැටියට එතුමාගේ මේ වැඩසටහනට- [බාධා කිරීම්] ඔව්, ඉතින් ඔබතුමන්ලා කෑ ගහමින් ඉන්න. මේවා implement කරලා ආදායම වැඩි වුණාම ඔබතුමන්ලාට ආයෙත් බලයට එන්න හම්බ වන්නේ නැහැ. ඔබතුමන්ලා කලබල නොවී ඔහොම ඉන්න. මුදල් ඇමතිතුමා එඩිතරව සහ කලාවක් ඇතුව කරන මේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහයෝගය අපි ලබා දෙනවා.

ඒ එක්කම මා මේ කාරණයත් කියන්න ඕනෑ. පසුගිය රජය කාලයේ තක්කඩියන්ට, හොරුන්ට, ඥාතීන්ට දුන් සියලු බදු සහන නැවත අය කර ගැනීමේ වැඩ පිළිවෙළකුත් මේ පනත් කෙටුම්පතට ඇතුළත් කරන්න ඕනෑ. දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? අපේ අයගේ වැරදි හොයන්න විතරක් අපි කොමිෂන් පත් කරනවා. තමුන්නාන්සේලාගේ ඒවා හොයන්න පත් කරන්නේ නැහැ නේ? [බාධා කිරීම්] සමහරු නයා ගැහුවා කියලා උසාවි එන්න බැහැයි කිව්වා. ඔබතුමන්ලා ඒ වාගේ කථා කිය කියා ඉන්නේ අපේ ආණ්ඩුවේ වරදින්. පසුගිය ආණ්ඩුව කාලයේ ජනතාවගේ බදු මුදල් හොරා කාලා, ඔබතුමන්ලා සහන ලබා ගත්තා. ඔබතුමන්ලා ගමේ ඉන්න අහිංසක මිනිසුන්ගෙන් පරිප්පු ග්‍රෑම් 500න්, තේ කොළ ග්‍රෑම් 100න්, සීනි ග්‍රෑම් 250න් ගහපු වක්‍ර බදුවල වන්දිය නැවත ලබා ගැනීම සඳහා කොමිසමක් පත් කරන්න කියලාත්, ඒකට නායකත්වය දෙන්න කියලාත් අපි මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.51]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශීය ආදායම් පනත් කෙටුම්පත පිළිබඳ විවාදයේදී කථා කිරීමට මට වෙලාවක් ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශීය ආදායම් පනත් කෙටුම්පත සම්බන්ධව බොහෝ කරුණු සාකච්ඡා වන අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් අදහස් කීපයක් දක්වන්න මා කැමැතියි. පසුගිය රජය කාලයේත්, මේ රජය කාලයේත් විශාල පරිමාණයෙන් බදු මුදල් නාස්තියට, දූෂණයට, හොරකමට පාවිච්චි වනවාය කියන එක පිළිබඳව කිසිම විවාදයක් නැහැ.

[ගරු බිමල් රත්නායක මහතා]

අද දිනයේදී ජනමාධ්‍යවලින් අපට දැනගන්න ලැබුණා, ලලිත් වීරතුංග මහතාට හා අනූෂ පැල්පිට මහතාට වසර 3 බැගින් සිර දඬුවම් සහ රුපියල් ලක්ෂ 20ක් බැගින් දඩ හා රුපියල් මිලියන 50 බැගින් වන්දි ගෙවන්නැයි මහාධිකරණයෙන් නියෝගයක් ලබා දීලා තිබෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලලිත් වීරතුංග මහතා සහ අනූෂ පැල්පිට මහතා සම්බන්ධ වෙලා, බදු මුදල් රුපියල් මිලියන 600ක් පසුගිය ජනාධිපතිවරණයේදී ඡන්ද අරමුණු සඳහා බෙදා දී මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට සම්බන්ධවීම හේතුවෙන් මේ දඬුවම් නියම වූ බව ඔබතුමා දන්නවා ඇති. නමුත්, අපි හොඳටම දන්නා දේ තමයි, ලලිත් වීරතුංග මහතා ඡන්දය ඉල්ලුවේ නැහැයි කියන එක. අනික, එතුමා ඉහළ පරිපාලන නිලධාරියෙකු වශයෙන් කටයුතු කළා. යම් කිසි පාලකයෙකු සමඟ එක දිගට වැඩ කිරීම නිසා එතුමාගේ නම සවුත්තු වුණා. ඒක වෙනම කථාවක්. නමුත්, එතුමා ඡන්දය ඉල්ලුවේ නැහැ. මේ බදු සල්ලි වියදම් කළේ රාජපක්ෂ මහත්තයාගේ ඡන්දයට නේ. නමුත් එතුමන්ලාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මේවාට ආවරණ ලැබිලා තිබෙනවා. නමුත් ඒ දූෂිතයන්ට, ඒ වැරදිවලට උදව් කරපු නිලධාරීන්ට අධිකරණය දඬුවම් දීලා තිබෙනවා. අපි අධිකරණයට තිබෙන ඒ අයිතිය පිළිගන්නවා. එම නිසා අපි පැහැදිලිවම කියනවා, බදු මුදල් වංචා කිරීම සම්බන්ධයෙන් අද ලබා දුන් මේ නඩු තීන්දුව ඓතිහාසික නඩු තීන්දුවක් කියලා.

මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මා තවත් කරුණක් කියන්න කැමැතියි. හිටපු ජනාධිපති ලේකම්වරයෙකුට තමයි අද හිරේ යන්න නියමිත වෙලා තිබෙන්නේ.

දැනුත් බලය අතට අරගෙන රාජ්‍ය බදු මුදල් වංචා කරනවා. ඊයේත් COPE එකට ඒ විස්තර ආවා. SriLankan Airlines ඩොලර් මිලියන සිය ගණන් වියදම් කරනවා, කැබිනට් මණ්ඩලයේ කිසිම අනුමැතියක් නැතිව. ඒ නිසා, රටේ බදු සල්ලි හොරකම් කරන දේශපාලනඥයන්ට කත් අදින නිලධාරීන්ට සහ දේශපාලනඥයන්ටත් මේක හොඳ පූර්වාදර්ශයක් වෙයි කියලා අපි හිතනවා. මේ තීන්දුව නිසා රාජ්‍ය නිලධාරීන් කුලප්පු වෙනවා කියලා සමහර අය කියනවා. අපි පැහැදිලිවම කියනවා, රාජ්‍ය නිලධාරීන්ගෙන් සියයට 10ක පිරිසක් තමයි දූෂණයේ යෙදෙන්නේ කියලා. ඒ සියයට 10 නිසා ඉතිරි සියයට 90ම මඩ කනවා. මේක මහාධිකරණයෙන් ලබා දුන් තීන්දුවක්. ඇත්තටම මේ තත්ත්වය ඉදිරියට ගෙන යන්න ඕනෑය කියන අදහස තමයි අපට තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මේ පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන්නම්. මේ පනත් කෙටුම්පත ඉතා පැහැදිලිවම ලංකාවට අනුව හදපු පනත් කෙටුම්පතක් නොවෙයි කියන කාරණය මතු කළා. ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ තිබෙනවා, 2017 මැයි 03වැනි දා නිකුත් කළ මහ බැංකු මාධ්‍ය නිවේදනය. එය මම උපුටා දක්වන්න කැමැතියි. ඒ මාධ්‍ය නිවේදනයේ දෙවැනි point එක වශයෙන් පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, "The new Inland Revenue Act should pave the way for a durable fiscal consolidation." කියලා. ඒ නිසා IMF එකත් එක්ක මේ කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කළාය කියන එක පැහැදිලියි. ඊට වඩා වැදගත් දේ මොකක්ද? එස්.බී. දිසානායක ඇමතිතුමාත් අහගෙන ඉන්න නිසා මම කියන්නම්. ඇමතිතුමනි, ඒකේ ඉතා පැහැදිලිව තිබෙනවා, "The Board - ඒ කියන්නේ IMF's Executive Board- is expected to consider Sri Lanka's request for completion of the second review in June, 2017, by which time the new Inland Revenue Act is expected to be submitted to Parliament as a prior action." කියලා.

ඒ කියන්නේ IMF එක ලංකාවට ලබා දෙන්න තිබෙන ඩොලර් මිලියන 167 කට ආසන්න තුන්වෙනි වාරිකය ලබා දීම සලකා බලන්නේ ජූනි මාසයේ දී, අද මේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා කියන එක පූර්ව කොන්දේසියක් බවට පත් කර ගෙනයි. "expected to consider" කියලායි තිබෙන්නේ. එම නිසා ඔබතුමන්ලා IMF එකත් එක්ක මෙහි කිසිම සම්බන්ධයක් නැහැයි කිව්වාට, මෙම මාධ්‍ය නිවේදනයෙන් එය පැහැදිලි වෙනවා. මහ බැංකු වෙබ් අඩවියෙන් මම මේ ලේඛනය ලබා ගත්තේ. මම මේ ලේඛනය **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මේ පනත් කෙටුම්පතේ ඉතා බරපතළ ගැටලුවක් තිබෙනවා, ව්‍යවස්ථාවේත් තිබෙන යම් කිසි බාධාවක් එක්ක. කිසිදු සහනයක් සඳහා මෙම පනත් කෙටුම්පතට කාරක සභා අවස්ථාවේ දී අලුතෙන් සංශෝධන ඉදිරිපත් කරන්න බැහැ. මුදල් වැය වෙන දේවල් සම්බන්ධයෙන්. ඒක අපේ ව්‍යවස්ථාවේ තිබෙනවා. ඒක ඇත්ත. ඔබතුමා දන්නවා, මේක අය වැයක් තරම්ම විශාල පනත් කෙටුම්පතක් බව. මේකේ බලපෑම මුළු මහත් අය වැයක් තරම්මයි. නමුත් මෙයින් බලපෑමට ලක්වන පාර්ශ්ව ගණනාවක් ඉන්නවා. ඔවුන් සමඟ තවම කිසිදු සාකච්ඡාවක් කර නැහැ. බලගතු දැනුවත් පර්ශ්ව සමඟ සාකච්ඡා කර තිබෙනවා. රක්ෂණ සමාගම්, සමහර වෘත්තීය සමිතිත් එක්ක. ඒක ඇත්ත. නමුත් උදාහරණයක් වශයෙන් ගත්තොත් මේ කාරණය ගැන බලන්න. එක එක සංශෝධන පොඩි ප්‍රමාණයක් කිව්වා. නමුත් වැදගත්ම දෙය මොකක්ද? රුපියල් කෝටියේ ඒවා එක් ලක්ෂ හැට දාහක් තිබෙනවා. රුපියල් බිලියන 1,600ක් තිබෙන EPF එකට ඔබතුමන්ලා දැනට තිබෙන බදු මුදල තව සියයට හතරකින් වැඩි කරනවා. සියයට හතර වුණාට, හැම අවුරුද්දේම මේ අරමුදලෙන් කෝටි දහ දාහකට වඩා ලබා ගන්නා බව මතක තබා ගන්න. බලාපොරොත්තු වෙන්නේ රුපියල් බිලියන හතළිස් පහයි කිව්වා. බිලියන හතළිස් පහ ගන්නත් ඔබතුමන්ලා බිලියන දහයක් විතර වියදම් කරන්න ඕනෑ. හැම කෙනෙකුටම tax file එකක් open කරනවා කියන එකට වියදමක් යන්නේ නැද්ද? ඇඩම් ස්මිත් කියා තිබෙන්නේ මොකක්ද? බදු එකතු කරද්දී ඒ සඳහා කරන වියදමට වඩා බද්ද වැඩි වෙන්නට ඕනෑ කියලායි. නිකම් ජොලියට හැම කෙනෙකුටම බදු file එකක් open කළාම, එයට වියදමක් යනවා. බිලියන 45යි expected income එක. ඒකෙන් බිලියන දහයක්ම ඔබතුමන්ලා ගන්නේ මේ EPF එකට ගහලාය කියන එක මතක තියා ගන්න. තව බිලියන 10ක් විතර ඔබතුමන්ලා වියදම් කරයි, බදුකරණය සඳහා පරිපාලන වැඩවලට. ඊට පස්සේ ඇත්තටම ඔබතුමන්ලාට ලැබෙන්නේ කීයද? තව රුපියල් බිලියන දහයක් පහළොවක් ඒ අවශ්‍යතාවන්ට වියදම් වුණාම රුපියල් බිලියන හතළිස් පහම ලැබෙන්නේ නැහැ නේ. ඇත්තටම සිදු වන්නේ, මේක EPF එකෙන් ලබා ගන්න එකයි. අපි ආණ්ඩුවට අවධාරණය කර කියනවා, එම EPF සල්ලි තමයි අර්ජුන් ඇලෝසියස්ලායි, ඇමතිවරුයි එකතු වෙලා Treasury Bondsවලින් ගැහුවේ කියලා.

EPF සල්ලි තමයි, සියයට අනුවක්ම Perpetual Treasuries Limited එකේ ආදායම. අද නාරාහේන්පිට තට්ටු තිහේ බිල්ඩින් එකක් හදනවා. මම හිතන විධියට බිලියන 50කට වැඩියි වියදම. ඒත් EPF සල්ලියි.

*** පුස්තකාලයේ තබා ඇත.**
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඉතාම වැදගත් සංශෝධනයක් තිබෙනවා, කලාකරුවන් සම්බන්ධයෙන්. කලාකරුවන්ගේ සංවිධාන රාශියක් තිබෙනවා. ඔවුන්ට මේක සුවිශාල වශයෙන් බලපානවා. එකම එක සාකච්ඡාවක්වත් මේ ගැන කරලා නැහැ. එම නිසා අපි ඉල්ලා සිටින්නේ මෙයයි. ව්‍යවස්ථාවේ තිබෙන කරුණු නිසා අපට මෙතැනදී සංශෝධන ඉදිරිපත් කරන්න බැරි වෙන්න පුළුවන්. අපි කියන්නේ මේ පනත් කෙටුම්පත අද විවාද කරලා, සම්මත කර ගැනීම සඳහා සතියකට කල් දමන්න කියලායි. අපේ සංශෝධනත්, තව තිබෙන සංශෝධනත් කැබිනට් එකෙන් අනුමත කර ගෙන මේක සම්මත කර ගැනීම සඳහා ගෙනෙන්න. මේක අය වැයක් තරම් ලොකු පනත් කෙටුම්පතක්, ගරු ඇමතිතුමනි. මේක නිකම්ම නිකම් පනත් කෙටුම්පතක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩියක කාලය තුළ මා මේ කාරණයත් කියන්නට කැමතියි. වේදිකා නාට්‍යකරුවන්ට ඔවුන් නිෂ්පාදනය කරන නාට්‍ය සඳහා පළමු වසරේ ආදායම සියයට පණහකින් ආදායම් බද්දෙන් නිදහස් කර තිබුණා. මේ පනත් කෙටුම්පතේ ඒ බදු නිදහස නැහැ. වේදිකා නට්‍යය කියන්නේ මේ රටේ කර්මාන්තයක් නොවෙයි. නාට්‍යකරුවාගේ ඇඹිමට අතින් කාලා කරන වැඩක්. ඒ බදු නිදහස අයින් කර තිබෙනවා. ලේඛකයන් හා පොත් ප්‍රකාශකයන්ට පළමුවන edition එක විකුණුවාම ඒකෙන් සියයට පණහක බදු නිදහසක් මුලින් ලබා දී තිබුණා. අද ඒ බදු නිදහස නැහැ. ඔබතුමා දන්නවා, අද කවි පොත් පන්සියයක් විකිණෙන්නේ නැති බව. ඒකටත් බදු ගහනවා. සංගීත නිර්මාණකරුවන්ටත් බදු නිදහසක් තිබුණා. අද ඒකත් මේ පනත් කෙටුම්පතෙන් ඉවත් කර තිබෙනවා. බලන්න, නවෝත්පාදන සඳහා වෙහෙසන පුද්ගලයන් පර්යේෂණයක් කර අලුත් දෙයක් සොයා ගත්තොත් බදු ගහනවා. කලාකරුවන් පමණක් නොවෙයි, කෘෂි විද්‍යාඥයන් පවා බද්දට යටත් වෙනවා. ඔබතුමා හිටපු කෘෂිකර්ම ඇමතිවරයෙක්. ඔබතුමා දන්නවා, මොරටුව විශ්ව විද්‍යාලයේ මහාචාර්ය රංගික හල්වතුර මැතිතුමා, තුන්වන ලෝකයේ හොඳම විද්‍යාඥයා වුණු බව. මේ අනුව එතුමාටත් බද්දක් ගෙවන්න වෙනවා. මෙහෙම රටවල් හදන්න පුළුවන්ද?

ඊළඟට, චිත්‍රපට කර්මාන්තය. ගරු ඇමතිතුමනි, ලංකාවේ චිත්‍රපට දහයයි, පහළොවයි නිර්මාණය වෙන්නේ. එයින් බලන්න පුළුවන් චිත්‍රපට තිබෙන්නේ හතරයි, පහයි. මගේ දැනීමේ හැටියට කලින් බදු සහනයක් තිබුණා, රුපියල් මිලියන විසිපහට වඩා ආදායමක් ගත්තොත් තමයි බදු ගෙවන්න ඕනෑ. දැන් සිනමා පටයෙන් පාඩු වුණත් බදු ගෙවන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මෙයයි. අප ඉදිරිපත් කරන සියලුම සංශෝධන ආණ්ඩුවට භාර ගන්න කියා අප කියන්නේ නැහැ. නමුත් මේවා සෘජුවම කලා ක්ෂේත්‍රය, සංස්කෘතික ක්ෂේත්‍රය කාන්තාරයකට ගෙන යනවා. එම නිසා මේ සංශෝධන පිළිගන්න. ඒවා භාර ගන්න නීත්‍යානුකූලව අද යම්කිසි බාධාවක් තිබෙන බව අප පිළිගන්නවා. ඒ නිසා මේ පිළිගන්න පුළුවන් සංශෝධන ටික සහ ජනතාව ඉල්ලා සිටින සංශෝධන ටික ඔබතුමන්ලා කැබිනට් මණ්ඩලයේ දී අනුමත කරලා, ඊළඟ පාර්ලිමේන්තු සතියේ දිනක, නැත්නම් වෙනම විශේෂ දිනයක් යොදාගෙන හෝ ඒවා ඉදිරිපත් කරන්න. එහෙම නැත්නම් ජනතාව වෙනුවෙන් මේ පනත් කෙටුම්පතට අපේ සම්පූර්ණ විරෝධය පළ කරන බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 3.01]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශීය ආදායම් පනත් කෙටුම්පත පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේ මුදල් ඇමතිතුමා තමන්ගේ ආසනයේ නැති වුණත්, එතුමා ඉන්නවා කියා මා විශ්වාස කරනවා. මෙම පනත් කෙටුම්පත පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලැබීම ගැන මා ඉතාම සන්තෝෂ වෙනවා.

රජයේ බලාපොරොත්තුව වන්නේ, මේ පනත් කෙටුම්පත සම්මත කිරීම තුළින් බදු ආදායම වැඩි කර ගැනීමටයි. ඒ වාගේම රජයේ අවධානය යොමු වී තිබෙන්නේ, සෘජු බදු සියයට 18 සිට සියයට 45 දක්වා වැඩි කිරීමයි. මේ බදු වැඩි කිරීම තුළින් රජය අපේක්ෂා කරන රුපියල් බිලියන 350ක ආදායම ඉදිරියේදී රුපියල් බිලියන 750ක් දක්වා වැඩි කර ගැනීම තමයි රජය බලාපොරොත්තු වන්නේ. මෙම බදු ආදායම වැඩි කිරීම තුළින් මේ රටේ ජීවත් වන සියයට 75කට වැඩි පිරිසකට යම් බදු මුදලක් ගෙවන්න සිද්ධ වෙනවා. එම නිසා ආණ්ඩුව ගෙනෙන මේ පනත තුළින් මේ රටේ වැඩි පිරිසකට බදු ගෙවන්න සිද්ධ වෙනවා, වැඩි පිරිසකගේ ආදායම් අසීරුකම් ඇති වෙනවා. 2020 වන විට බදු ආදායම සියයට 40ක් දක්වා වැඩි කරන්න ආණ්ඩුව බලාපොරොත්තු වෙනවා.

ආණ්ඩුවක් බදු ගහනවාට මම විරුද්ධ නැහැ. ආණ්ඩුකට බදු අවශ්‍යයි. ඕනෑම ආණ්ඩුවක් බදු ගහනවා. ඒ බදු සල්ලිවලින් තමයි රාජ්‍ය සේවකයන්ට පඩි දෙන්නේ; පාරවල් හදන්නේ; වැඩ කරන්නේ. එම නිසා බදු ගහන්න ඕනෑ. එහෙම නැත්නම් pension එක ගෙවන්න බැහැ. රජයේ ආදායම තමයි බදු ආදායම. ඒ නිසා බදු ගැහීම පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි මේ බදු ගහන්නේ ආණ්ඩුවට සල්ලි නැහැ කියලා නේ. එහෙම නම් ආණ්ඩුවට සල්ලි හොයන, සල්ලි ඉතුරු කරන ක්‍රමවේද කීපයක් තිබෙනවා. මෙතුමන්ලා මේ බදු පැනවීමෙන් 2020 වන විට රුපියල් බිලියන 350ක් සොයන්න බලාපොරොත්තු වෙනවා. මෙහිදී මගේ අවධානය යොමු කරන්නේ මෙන්න මේ කාරණයටයි. මේ රුපියල් බිලියන 350 සොයන්න බදු ගහන්න ඕනෑ නැහැ, ගරු එස්.බී. දිසානායක ඇමතිතුමනි. මේ බර මිනිසුන් පිට පටවන්න ඕනෑ නැහැ. මේ බදු හොයාගන්න ක්‍රම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාට මේ කාරණය මතක ඇති. ගරු එස්.බී. දිසානායක ඇමතිතුමාත් පිළිගනීවි, ඔබතුමාත් අපේ ආණ්ඩුවේ සිටි කාලයේ හිටපු මුදල් ඇමති රවි කරුණානායක මැතිතුමා නිතරම කියපු දෙයක් තමයි, රාජපක්ෂලාගේ හොරකම් නතර කළොත් මිනිසුන්ට බදු ගහන්න ඕනෑ නැහැයි කියන කාරණය. ඒක එතුමා දිගින් දිගටම කිව්වා නේ. "රාජපක්ෂලාගේ හොරකම් නැවැත්තුවොත් බදු ගහන්න ඕනෑ නැහැ, බදු වැඩි කරන්න ඕනෑ නැහැ" කිව්වා. ඒක තමයි මේ යහ පාලන ආණ්ඩුව බලයට පත් වෙන්න කථා කළ මූලික කාරණාව. දැන් රාජපක්ෂලාගේ හොරකම් නැහැ නේ; රාජපක්ෂලා මේ ආණ්ඩුවේ නැහැ නේ. ඇයි, දැන් බදු ගහන්නේ? රාජපක්ෂලා දැන් නැති නිසා රවි කරුණානායක හිටපු මුදල් ඇමතිතුමා කියපු තර්කය අසත්‍යයක් නේ. එහෙම නම් දැන් බදු ගහන්න ඕනෑ නැහැ නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නේ බදු ගහන්න ඕනෑ නැහැ කියලායි. අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් තිබෙන ආර්ථික කළමනාකරණ කමිටුව අවලංගු කරන්න, එස්.බී.

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

දිසානායක ඇමතිතුමනි. මේ රුපියල් බිලියන 350 හොයා ගන්න පුළුවන්. අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගෙන් ප්‍රධානත්වයෙන් තිබෙන ආර්ථික කළමනාකරණ කමිටුව හෙට අවලංගු කරන්න, මේ රුපියල් බිලියන 350 හොයාගන්න පුළුවන්. මේ ආණ්ඩුව බලයට පත් වුණේ හොරකම් නවත්වනවා කියායි. මිනිසුන්ගෙන් බදු අය කරනවා. හැබැයි මේ ආණ්ඩුවේ තුන් හතරදෙනෙක් හිටගෙන හොරකම් කරනවා. බිලියන ගණන් හොරකම් කරනවා. අහිංසක දුප්පත් මිනිහාගේ කෘෂිකර්මාන්තයට බදු ගහනවා. අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන එස්.බී. දිසානායක ඇමතිතුමනි, ඔබතුමාගේ හේවාහැට ආසනයේ කුඩා තේවතු හිමියාටත් දැන් බදු ගහනවා.

කෘෂිකර්මාන්තය බද්දෙන් නිදහස් වෙලා තිබුණු එකත් දැන් ඉවරයි. දැන් හැම දේකටම බදු ගහනවා. විශ්‍රාමිකයකු තමන්ගේ pension එකෙන් ඉතිරි කිරීමේ ගිණුමක් පවත්වාගෙන ගියාම, තැන්පතු සඳහා අය කරන බද්දත් සියයට 5ක් දක්වා වැඩි කරලා. හැබැයි ආණ්ඩුවේ තුන්හතර දෙනෙක් බිලියන ගණන් හොරකම් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව බලාපොරොත්තු වන්නේ රුපියල් බිලියන 350යි.

පසුගිය කාලයේ තමුන්නාන්සේලා හම්බ කළ බිලියන ගණන් පිළිබඳව මම දැන් කියන්නම්. බලන්න, තමුන්නාන්සේලා ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ගුවන් යානා ටික අවලංගු කළා.

එස්.බී. දිසානායක ඇමතිතුමා සාක්ෂි දෙයි; අද වෙනකල් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය දීලා නැහැ. ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ගුවන් යානා අවලංගු කරලා, ශ්‍රීලන්කන් ගුවන් සමාගමට යූඑස් ඩොලර් බිලියන 120ක් ගෙවන්න වුණා. ඒක ගෙවන්න ණය ගත්තේ ලංකා බැංකුවෙන්, මහජන බැංකුවෙන්; යූඑස් ඩොලර් බිලියන 200ක්. ශ්‍රීලන්කන් ගුවන් සමාගම ගෙවපු බිලියන එකසිය ගණනෙන් එයාර් බස් සමාගමට ගියේ යූඑස් ඩොලර් බිලියන 50යි. ඉතුරු යූඑස් ඩොලර් බිලියන 70 කාගේ සාක්කුවටද ගියේ? අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි කළා. ඒ පිළිබඳ පරීක්ෂණ පැවැත්වෙනවා. එස්.බී. දිසානායක ඇමතිතුමනි, ඔබතුමා හිතන්න, කැබිනට් මණ්ඩලයේ අනුමැතියක් නැහැ; කැබිනට් මණ්ඩලයෙන් ඔබතුමන්ලා අනුමැතිය දුන්නේ negotiate කරන්න කියලා; negotiate කරන්න කියලා අනුමැතිය දුන්නාම චරිත රත්වත්තේ මහත්මයාගේ BlackBerry එකෙන් e-mail එකක් යවනවා, අගමැතිතුමා උපදෙස් දුන්නා, වැඩේ කරන්න කියලා. ඒ අනුව ගිවිසුම අවලංගු කරලා, අදාළ සමාගමට යූඑස් ඩොලර් බිලියන 120ක් ගෙව්වා. විෂය භාර ඇමති කබීර් හාෂිම් මහත්මයා දන්නේ නැහැ, කැබිනට් මණ්ඩලයේ වෙච්ච සිද්ධිය. මේ සිද්ධිය නිසා රුපියල් බිලියන 30ක් මේ රටට අහිමි වුණා, එස්.බී. දිසානායක ඇමතිතුමනි.

ඊළඟට, වරාය. හම්බන්තොට වරාය වික්කා. කීයටද දුන්නේ? යූඑස් ඩොලර් බිලියන 1.4කට. එස්.බී. දිසානායක ඇමතිතුමනි, ඔබතුමා ගණන් හදලා බලන්න. හෙක්ටයාර 10,000ක් නිකම් දුන්නා. වරායේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් බිලියන 1.4යි; පිළිගන්නවාද? මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේදී ඉඩම් දුන්නේ හෙක්ටයාරයක් ඩොලර් 50,000කට. ඔබතුමා වැඩි කරලා බලන්න. දැන් මේ ගොල්ලන් දීලා තිබෙනවා, අක්කර 1,000ක්. 50,000x1,000 කීයද? මිලියන 50යි. ඒක අවුරුදු 100න් වැඩි කරන්න. මිලියන **500**යි. මිලියන **500**යි ඉඩම්වල විතරක් වටිනාකම, ගරු ඇමතිතුමනි. සත පහක් නැතුව ඉඩම් ටික නොමිලේයි දුන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරායේ ඉඩම් නිකම් දීපු නිසා රටට වුණු පාඩුව රුපියල් බිලියන 50යි. එතකොට එතැනම බිලියන 80ක්, ගරු එස්.බී. දිසානායක ඇමතිතුමනි.

ඊට පස්සේ බැඳුම්කර වංචාව. බැඳුම්කර වංචාවේ දීර්ඝ කාලීන හොරකම් ගැන මම කථා කරන්නේ නැහැ. අපේ "කෝප්" වාර්තාව ඒ අනුව කිව්වා, රුපියල් බිලියන 10ක් පාඩුයි කියලා. සේවක අර්ථ සාධක අරමුදලේ රුපියල් බිලියන 10ක් පාඩුයි. මිලියන 20යි. එහෙම නම් එස්.බී. දිසානායක ඇමතිතුමනි, ශ්‍රීලන්කන් ගුවන් සමාගමෙන් ගෙවපු -කැබිනට් මණ්ඩලය අභිභවා ගිහිල්ලා ආර්ථික කළමනාකරණ කමිටුව ගත්ත තීරණයෙන් ගෙවපු- රුපියල් බිලියන 30ක් පාඩුයි. ඊට පස්සේ වරාය විකිණීමේදී ඉඩම් නිකම් දීපු නිසා රුපියල් බිලියන 50ක් පාඩුයි. බැඳුම්කරය නිසා මහ බැංකුවේ රුපියල් බිලියන 10යි, සේවක අර්ථ සාධක අරමුදලේ රුපියල් බිලියන 10යි, එතැන බිලියන 100යි. රුපියල් බිලියන 100ක් මහජනතාවගෙන් බදු ගහන්නේ නැතුව අය කර ගන්න තිබුණා, ගරු ඇමතිතුමනි. ඒ විතරක්ද? ඒ විතරක් නොවෙයි.

ඊළඟට, මහනුවර අධිවේගී මාර්ගය භාර දුන්නා, ගරු ඇමතිතුමනි. තමුන්නාන්සේලා දකින්න ඇති, "සිරස" නාළිකාවේ ගියා; අපේ මලික් සමරවික්‍රම ඇමතිතුමා ඊයේ "සිරස" නාලිකාවට බැණ්ණා. ඇත්ත කියනකොට "සිරස" නාලිකාවට බණිනවා. ඇමතිවරු ගැන කියනකොට බණිනවා. අපට ගහනකොට "සිරස" හොඳයි. අපේ නම් දමලා විශ්වාස භංගය ගැන අහනකොට "සිරස" හොඳයි.

අන්න, අපේ මිත්‍ර ගරු මංගල සමරවීර මුදල් ඇමතිතුමා එනවා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට සල්ලි හොයන හැටි කියා දෙනකොට ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ නැහැ නේ. බලන්න කෝ. [බාධා කිරීමක්] Thank you, Sir. අපි දන්නවා, ඔබතුමා හිටපු මුදල් ඇමතිතුමාට වඩා බොහොම හොඳයි. ඔබතුමා ඕනෑ වෙලාවක බොහොම සතුටෙන් ඉන්නවා. අපට ඔබතුමා පිළිබඳව ගැටලුවක් නැහැ. ඔබතුමා ඒ පැත්තට නැහැ. ඒ පිළිබඳව කියන්න ඕනෑ. ඔබතුමා ගැන ඒ guarantee එක දෙන්න පුළුවන්. එස්.බී. දිසානායක ඇමතිතුමා මම කියපු ටික ඔබතුමාට කියාවි. එස්.බී. දිසානායක ඇමතිතුමනි, මහනුවර-හම්බන්තොට අධිවේගී මාර්ගය - [බාධා කිරීමක්] සමාවෙන්න, මාතර-හම්බන්තොට අධිවේගී මාර්ගය. Thank you, ඔබතුමාත් ඒ දිස්ත්‍රික්කයේ නිසා මට උදවු කළාට.

ගරු මංගල සමරවීර ඇමතිතුමනි, මාතර-හම්බන්තොට අධිවේගී මාර්ගය අපි දුන්නේ රුපියල් බිලියන 242කට. දැන් මහනුවර අධිවේගී මාර්ගය - එස්.බී. දිසානායක ඇමතිතුමාත්, මමත් යන අධිවේගී මාර්ගය - කීයටද දෙන්නේ? රුපියල් බිලියන 430කට. රුපියල් බිලියන 430කට, ගරු එස්.බී. දිසානායක ඇමතිතුමනි. වෙනස කීයද? රුපියල් බිලියන 200යි. මම ඔබතුමාට කලින් කියපු රුපියල් බිලියන 100යි, මෙතැන රුපියල් බිලියන 200යි. එතැන විතරක් තිබෙනවා, රුපියල් බිලියන 300ක්. රුපියල් බිලියන 300ක් වෙනවා, මේ ආණ්ඩුව මේ මෑත කාලයේ -අවුරුදු දෙකහමාරට- කරපු අයථා ගනු-දෙනු. ඔබතුමා මතක තියා ගන්න, අයථා ගනු-දෙනුවල එකතුව රුපියල් බිලියන 300යි. මම ඔබතුමාට කිව්වා, ශ්‍රීලන්කන් ගුවන් සමාගමෙන් රුපියල් බිලියන 30යි; වරායෙන් රුපියල් බිලියන 50යි; බැඳුම්කරයෙන් රුපියල් බිලියන 10යි; අර්ථ සාධකයෙන් රුපියල් බිලියන 10යි; මහනුවර අධිවේගී මාර්ගයෙන් රුපියල් බිලියන 200යි. ඒ විතරක් නොවෙයි, තව එනවා. අපේ මුදල් ඇමතිතුමනි, ඔබතුමා ටිකක් මේවා ගැන අවධානය යොමු කරන්න. ඔබතුමා මුදල් අමාත්‍යාංශයේ යමක් කරන්න උත්සාහ දරනවා. ඔබතුමා මේ ගැන අවධානය යොමු කරන්න.

එස්.බී. දිසානායක ඇමතිතුමනි, පසුගිය සතියේ ඔබතුමන්ලාට Cabinet Paper එකක් ඉදිරිපත් වුණා. කෙරවලපිටිය LNG plant එකට proposal එකක් ඉදිරිපත් වුණා. ඔබතුමා දන්නවා, මේ

සඳහා කැබිනට් මණ්ඩලය විදුලිබල මණ්ඩලයෙන් ටෙන්ඩර් කැඳෙව්වාය කියලා. සමාගම් අටක් ඒ ටෙන්ඩර් එකට කැඳෙව්වා. ඒකෙන් සමාගම් හතක් reject කළා. Mitsubishi Corporation එක විතරයි තේරුණේ. අවසානයේදී Mitsubishi Corporation එකේ financial proposal එක ගැලෙව්වා. ගැලෙව්වාම, Mitsubishi Corporation එකත් reject වුණා, මංගල සමරවීර ඇමතිතුමනි. ඒ අනුව Technical Evaluation Committee එක තීරණය කළා, මේ කිසිම සමාගමකට මේ ටෙන්ඩරය දෙන්න අවස්ථාවක් නැහැ කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
බණින කොට කාලය අවසන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 11ක් වෙන් වී තිබෙනවා. හරියටම ගත වුණේ විනාඩි 9½යි. මම වේලාව බලනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 11ක් ගත වී තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ නිසා මට විනාඩියක් දෙන්න.

ගරු මංගල සමරවීර ඇමතිතුමනි, ටෙන්ඩරයට කැඳවූ එම සමාගම් අටම reject වුණා. ඉන් පසුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුව - ගරු මංගල සමරවීර ඇමතිතුමනි, එම Committee එක- මොකක්ද කියලා මට කියන්න.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
The Technical Evaluation Committee - TEC.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Hon. Minister, it is not the Technical Evaluation Committee.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Cabinet Appointed Procurement Committee.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Cabinet Appointed Procurement Committee එක අරලියගහ මන්දිරයට කැඳෙව්වා. කැඳවලා කමිටුවේ සභාපතිතුමාට කිව්වේ, "මේ සියලු මූල්‍ය යෝජනා වහාම විවෘත කරන්න" කියලා. එතුමා කිව්වා, "බැහැ" කියලා. බැරි නම්, එතුමාට ඉල්ලා අස් වෙන්න කිව්වා. එතුමා ඉල්ලා අස් වුණා. ඊට පස්සේ අලුතෙන් සභාපතිවරයෙක් පත් කළා; ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලේකම්තුමාව පත් කළා. පත් කරලා එතුමාට කිව්වා, "විවෘත කරන්න" කියලා. එතුමාත් කිව්වා, "බැහැ" කියලා. ඊට පස්සේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය සතියේ කැබිනට් පත්‍රිකාවක් නිකුත් කළා, "සමාගම් පහක මූල්‍ය යෝජනා ආපහු විවෘත කරන්න" කියලා. TEC එක බැහැ කියනවා; අමාත්‍ය මණ්ඩලය පත් කරපු කමිටුව බැහැ කියනවා. හැබැයි අගමැතිතුමා කැබිනට් පත්‍රිකාවක් මඟින් දැනුම් දෙනවා, "සමාගම් පහක විතරක් financial proposals විවෘත කරන්න" කියලා. මේකේ ඉන්නවා මැලේසියානු සමාගමක්. අනෙක් සමාගම් හතරම reject වනවා. මැලේසියානු සමාගමට දෙන්න තමයි හදන්නේ. ගරු මංගල සමරවීර ඇමතිතුමනි, එතැනින් නවතින්නේ නැහැ. දැන් ජපානයයි, ඉන්දියාවයි එක්ක ගැහුවා ගිවිසුමක්. ඒක තමයි, LNG deal එක. ඒක තමයි හෙණ ගහන, රටට වන ලොකුම අපරාධය. ඒ ගිවිසුම ගැහුවොත් ගරු මංගල සමරවීර ඇමතිතුමනි, අපි හාංසියි. මතක තබා ගන්න, අපි හාංසියි. ඒක ගැහුවොත්, අපි ඉවරයි; රටම ඉවරයි. LNG බලාගාර ඇති වෙන්න ඕනෑ. නමුත්, අපට තවම ඒවා කරන්න බැහැ.

ගරු මංගල සමරවීර ඇමතිතුමනි, ඔබතුමා සෘජු බදු සියයට 18 - 40 දක්වා වැඩි කරලා මිලියන 350ක් මහ ජනතාවගෙන් හොයන්න බලාපොරොත්තු වනවා. මම ඔබතුමාට කියනවා, මේ ආණ්ඩුවේ දෙතුන් දෙනෙක් එකතු වෙලා බිලියන 300ක් හොරකම් කරලා තිබෙනවා. මහජන මුදල් බිලියන 300ක් අරගෙන තිබෙනවා. ඒවා නවත්වන්න. ඔබතුමා නොවෙයි. රවි කරුණානායක ඇමතිතුමා කිව්වා, "රාජපක්ෂලාගේ හොරකම් නැවැත්තුවොත් බදු ගහන්න ඕනෑ වෙන්නේ නැහැ" කියලා. එහෙම නම් මොකටද මේ බදු ගහන්නේ? එම නිසා අපි මේ ආණ්ඩුවට කියනවා, අහිංසක මිනිසුන්ට බදු ගහන්න එපා; ආණ්ඩුවේ තුන් හතර දෙනෙක් එක්කහු වෙලා මේ කරන හොරකම් ටික නවත්වන්න. මේ හොරකම් නැවැත්තුවා නම් බදු ගහන්න ඕනෑ නැහැ. අහිංසක මිනිසුන් මේවාට වග කියන්න ඕනෑ නැහැ. මේ රටේ මිනිසුන්ගෙන් බදු ගහන්න එපා. අපේ ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා දන්නවා ඒ හොරු ටික කවුද කියලා. එතුමා -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්. ස්තුතියි.

ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 3.13]

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ දේශපාලන ඉතිහාසය තුළ ඉදිරිපත් වූ ඉතා වැදගත් පනත් කෙටුම්පතක් අනුමත කරමින් කථා කරන්න ලැබීම ගැන මට බොහොම සතුටුයි.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

දේශීය ආදායම් පනත් කෙටුම්පත බොහෝ විවාදයට ලක් වුණා. මේ රටේ රාජ්‍ය සේවයේ වාගේම, ඉන් පිටතත් විද්වතුන්ගෙන්, ව්‍යාපාරිකයන්ගෙන්, දේශපාලනඥයන්ගෙන් හා විවිධ දේශපාලන සංවිධානවලින් මේ පනත් කෙටුම්පතේ ඇති ගුණ අගුණ පිළිබඳව සලකා බැලුවා. ඉතාම වැදගත් දේ තමයි, මේ පනත් කෙටුම්පතේ ඇති ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කරපු ශ්‍රේෂ්ඨාධිකරණය මේ පනත් කෙටුම්පත පිළිබඳව ඉදිරිපත් කරපු ඒ සෑම නිර්දේශයක්ම සලකා බලලා, පාර්ලිමේන්තුව තුළ සාමාන්‍ය බහුතර ඡන්දයකින් සම්මත කර ගැනීමට හැකි වන ආකාරයට අපි මේ පනත් කෙටුම්පත සංශෝධනය කර තිබීමයි. රටේ නීතිය අනුව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දීපු උපදෙස් අනුවයි මේ පනත් කෙටුම්පත රජය විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ. එම නිසා මේ පනත් කෙටුම්පත පිළිබඳව කිසිම කෙනෙකුට චෝදනාවක් එල්ල කිරීමට හැකියාවක් නැහැ. අපි ඉදිරිපත් කරපු සංශෝධනත් නීතිපතිවරයා විසින් පරීක්ෂා කර බලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල බව සහතික කර තිබෙනවා.

අද ජනතා විමුක්ති පෙරමුණ ඉදිරිපත් කරපු සමහර විවේචන දිහා බලන කොට, ඔවුන්ගේ ආර්ථික දර්ශනය කුමක්ද කියලා අපට යම් සැකයක් මතු වනවා. සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය - social market economy - පිළිගන්න, ක්‍රියාත්මක කරන ආණ්ඩුවක් හැටියට අපි පිළිගන්නවා, සමාජය කෙරෙහි රජයේ වගකීම උපරිම බව. අපේ එක්සත් ජාතික පක්ෂයේ ආදිකර්තෘවරු මේ රටට හඳුන්වා දීලා, පෝෂණය කරපු නිදහස් අධ්‍යාපනය අපි අදටත් ප්‍රවර්ධනය කරනවා. ඒ නිසා කවරදාකවත් මේ රටේ නිදහස් අධ්‍යාපනයට හානි කර වන කිසිවක් අපි නොකරන අතරම, නවීන ලෝකයට ගැළපෙන ආකාරයට හා රටේ සෑම පුරවැසියෙකුටම අධ්‍යාපනයට ඇති අයිතිය තහවුරු කරන ආකාරයට මේ රටේ නීති අපි සකස් කරනවා.

මේ රටේ පරිපාලන පරිසරය අපි සකස් කරනවා. ඒ වාගේම නිදහස් සෞඛ්‍ය අයිතිය ඉදිරිපත් කරලා ප්‍රවර්ධනය කරපු පක්ෂයක් විධියට වර්තමාන රජයත් නිදහස් සෞඛ්‍ය අයිතිය ආරක්ෂා කිරීම සඳහා කැපවෙලා, අතිවිශාල මුදල් ප්‍රමාණයක් අපි වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම පොදු ප්‍රවාහන පද්ධතිය, පොදු මාර්ග පද්ධතිය ඇතුළු මේ රටේ සාමාන්‍ය ජනතාවගේ ජීවන අවශ්‍යතාවන් උදෙසා රාජ්‍ය කියන ආයතනයේ කැපවීම එක්සත් ජාතික පක්ෂය හැටියට අපි නැවත නැවත සනාථ කරනවා. අපි සමාජ වෙළඳ පොළ ආර්ථිකයක් තුළ, Social Market Economy කියන සංකල්පය තුළ රජයේ දායකත්වය අපි පිළිගන්නවා. ඒ වෙනුවෙන් කැප වෙනවා. හැබැයි, අපි නිදහස් අධ්‍යාපනය දෙද්දී, නිදහස් සෞඛ්‍ය අයිතිය තහවුරු කරද්දී, රටේ ප්‍රවාහන පද්ධතිය ඇතුළු මහජන අවශ්‍යතාවන් පිළිබඳ දැවැන්ත ආයෝජන කරද්දී ඒ ආයෝජන සඳහා මුදල් උපයා ගැනීමට ඵලදායී ක්‍රියා මාර්ග අනුගමනය කළ යුතු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා අපට විදේශ ණය මත රැඳී සිටින්නට බැහැ. මේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවන්න, පුරවැසියන් දුප්පත්කමින්, මධ්‍යම පන්තිය කරා රැගෙන යන්න, මේ රටේ දුක් මහන්සි වෙලා ජීවිතය ගොඩ නඟාගත්ත මධ්‍යම පාන්තිකයා ආරක්ෂා කරන්න අවශ්‍ය කරන්නා වූ රාජ්‍ය වියදම් සොයා ගන්නට අපට සාධාරණ බදු ක්‍රමයක් අවශ්‍යයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ බදු ආදායම ලෝක මට්ටමින් ගත්තාම ඉතාම පහළ මට්ටමකයි පවතින්නේ. අපේ රටේ බදු ගෙවීම, බදු අය කර ගැනීම ලෝක මට්ටමින් ඉතාම නරක තත්ත්වයකයි පවතින්නේ. එම නිසා අපේ රටට යහපත්, කාර්යක්ෂම බදුකරණය පිළිබඳ අලුත් නීතියක් අවශ්‍ය වුණා. එම නිසා ඉතාම දුෂ්කර තත්ත්වයන් යටතේ, ඉතා දැඩි මතභේදවලට මුහුණ දෙමින් ධෛර්යවන්තව, බරපතළ දේශපාලන තීරණයක් ගනිමින් මේ පනත ඉදිරිපත් කිරීම ගැන ගරු මංගල සමරවීර ඇමතිතුමාට, ගරු ඉරාන් වික්‍රමරත්න නියෝජ්‍ය ඇමැතිතුමාට, මීට පෙර මෙම කාර්යයට මහන්සි වුණු සියලුම දේශපාලනඥයන්ට සහ නිලධාරින්ට, විශේෂයෙන් මුදල් අමාත්‍යාංශයේ සියලුම නිලධාරින්ට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ පනත් කෙටුම්පතෙන් රටට ලැබෙන ශක්තිය නිසා මේ රටේ ආර්ථිකය සුරක්ෂිත වුණා කියන කාරණය කියන්නට ඕනෑ. එම නිසා මේ පනතට මගේ සහාය පළ කරන අතර, මගේ සුබ පැතුම් ගෙන ඒමට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සුවිශේෂී දවසක්. යහ පාලන ආණ්ඩුව පත් කරන්න මහන්සි වුණු මිනිසුන් පළමුවෙන්ම අපෙන් ඉල්លුවේ හොරුන් අල්ලන්න කියන කාරණය. අපේ රටේ පුරවැසියන් අවුරුදු දෙකකට පසුව අද කියන්නේත් හොරු අල්ලන්න කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොරු අල්ලලා තිබෙන්නේ, හොරු ඇප පිට ඉන්නේ. ඇප පිට ඉන්න හොරු නීතියේ කාර්ය පටිපාටිය අනුව, අපරාධ නඩු විධාන සංග්‍රහයට අනුව, මේ රටේ තිබෙන සාක්ෂි නීතියට අනුව, සාධාරණ නඩු විභාගයකින් පසුව, සාක්ෂි තිබෙනවා නම් වැරැදිකරු කරලා වරදට ගැළපෙන දඬුවම දීමට තරම් අපේ රටේ අධිකරණ පද්ධතිය ශක්තිමත්. මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය අපි ශක්තිමත් කළා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා මේ රටේ අධිකරණයට අවශ්‍ය ශක්තිය අපි ලබා දුන්නා; දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා ස්වාධීන නීතිපති දෙපාර්තමේන්තුවක් සඳහා වූ පරිසරය අපි සකස් කරලා දුන්නා. මේ රටේ පොලිස් කොමිසම නැවත ගොඩ නඟලා, පොලීසිය ස්වාධීන කරලා, පොලීසියේ අමාරු පරීක්ෂණ කිරීමට හැකියාව තිබෙන දක්ෂ නිලධාරින්ව ගොනු කරලා, ඒ සඳහා අලුත් ඒකක ගොඩ නඟලා පොලීසියේ අපරාධ පරීක්ෂණ ශක්තිමත් කරන්න අපට පුළුවන්කම ලැබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉතාම වැදගත් ප්‍රතිඵලය, පළමු ප්‍රතිඵලය අද මේ රටේ පුරවැසියන්ට ලැබුණා. මේ ලෙහෙසි පහසු පුද්ගලයන් නොවෙයි. එදා ජනාධිපතිවරණය ගනිමු. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වගකීම මොකක්ද? වගකීම තමයි මේ රටේ විදුලි සංදේශ සේවය නියාමනය කිරීම. මේ රටේ රේඩියෝ තරංග පරිපාලනය කිරීම. මේ රටේ රූපවාහිනී තරංග පරිපාලනය කිරීම. මේ රටේ දුරකථන තරංග පරිපාලනය කිරීම. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු මුදල් කෝටි ප්‍රකෝටි ගණනක් වියදම් කරලා මැතිවරණ ව්‍යාපාරය වෙනුවෙන් සුදු රෙදි මිලදී ගෙන, එම සුදු රෙදි රටේ සෑම තැනම පන්සල්වලට බෙදා හැරලා ඡන්ද දූෂණයක් කළා.

ඡන්ද දූෂණයට දායක වුණු රටේ ප්‍රධානතම රාජ්‍ය නිලධාරියා; ඔහු ජනාධිපති ලේකම්වරයා, ඒ විතරක් නොවෙයි ඔහු විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිවරයා. ඒ වාගේම එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා. ඒ පුද්ගලයින් මේ රටේ මහජන මුදල් කෝටි ප්‍රකෝටි ගණනක් මැතිවරණයක් වැනි පටු පරමාර්ථයක් වෙනුවෙන් වැය කරලා ගත්ත වැරදි පියවර වෙනුවෙන් සාධාරණ නඩු විභාගයකින් පස්සේ අද මේ රටේ අධිකරණය ඉදිරියේ නීත්‍යනුකූලව දඬුවම් ලබන දවස අපි කාටවත් සතුටු වෙන්න පුළුවන් දවසක් නොවෙයි. නමුත්, මේ රජය බලයට පත්කරපු මේ රටේ ලක්ෂ ගණනක් වුණු, මිලියන ගණනක් වුණු සාමාන්‍ය පුරවැසියන්ට හිතේ බලාපොරොත්තුවක් ඇති කරනවා, කවදා හෝ දවසක හොරකම් කරපු; තක්කඩිකම් කරපු මිනිසුන්ට එරෙහිව රටේ නීතිය ක්‍රියාත්මක වෙනවා කියලා. ඒ වාගේම අපේ අපේක්ෂාව තමයි, ඔය පරණ පුරුද්දට අපේ රජය බලයට පත්වුණාට පසුවත් හොරකම් කරපු කවුරු හෝ ඉන්නවා නම් මේ නීතිය මේ ආකාරයෙන්ම ක්‍රියාත්මක වෙන්න ඕනෑය කියන එක. මේ විධියට රටේ නීතිය ක්‍රියාත්මක වෙනවා, වැරැදි කරන මිනිසුන්ට දඬුවම් ලැබෙනවා කියන පණිවුඩය ලැබෙනකොට

අපරාධකරුවන් අපරාධ කිරීමට පෙළඹවීම නැතිවෙනවා, එහෙම නැත්නම් අඩුවෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලනඥයෝ මොනවා කිව්වත්, කොන්ද කෙළින් තියාගෙන, රටේ නීතිය මේකයි, රෙගුලාසිය මේකයි, කළ හැකි දේ මේකයි, නොකළ හැකි දේ මේකයි කියලා කියන්නට අවශ්‍ය ශක්තිය මේ නඩු තීන්දුව මඟින් රජයේ නිලධාරින්ට ලැබෙනවා. සමහරු විශ්වාස කරනවා, මෙවැනි බරපතළ තීන්දු මඟින් රජයේ නිලධාරින් අධෛර්යවත් වෙනවා කියලා. එහෙම වෙන්නේ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇස් බැල්මට විදුලි සංදේශ නියාමන කොමිසමේ සල්ලි ජන්දය වෙනුවෙන් සුදු රෙදි ගන්න වැය කරනකොට ඒක වැරැදියි කියලා තේරුම් ගන්න බැරි මිනිස්සු රාජ්‍ය සේවයට සුදුසු නැහැ. හරි වැරැද්ද තේරුම් ගන්න බැරි, රටේ නීතිය තේරුම් ගන්න බැරි මිනිස්සු රාජ්‍ය සේවයට සුදුසු නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා රටේ රාජ්‍ය සේවකයන්ට අවශ්‍ය කරන ශක්තියයි මේ ලැබෙන්නේ, රටේ පුරවැසියන්ට අවශ්‍ය කරන ශක්තියයි මේ ලැබෙන්නේ. මේ පරීක්ෂණ ඉතාම ධෛර්යවන්තව කරපු මේ රටේ අතිදක්ෂ පොලිස් නිලධාරින්ට අවශ්‍ය ශක්තියයි, ධෛර්යයි මේ ලැබෙන්නේ කියන එක මම මතක් කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාම වැදගත් දවසක්. එක පැත්තකින්,- [බාධා කිරීමක්] සමහරුන්ට මේ හඬ අහගෙන ඉන්න අමාරුයි. තමන්ටත් මේ ඉරණම අත්වෙයිද කියන හැඟීම තිබෙන සමහරු ඉන්නවා. අපි දන්නවා, මගේ මිත්‍රයන්ට එවැනි විපතක් අත්වෙන්නේ නැහැයි කියලා. [බාධා කිරීම්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය ඇහෙන්නේ හොරුන්ගේ හඬ. [බාධා කිරීම්] ඔය ඇහෙන්නේ අධි චෝදනා පත්‍ර ලැබූ මිනිසුන්ගේ හඬ. මේ රටේ සාමාන්‍ය පුරවැසියන්ගේ හඬ අද ජයග්‍රහණය කළා. මේ රටේ අහිංසක මිනිසුන්ගේ හඬට අද ජයග්‍රහණයක් ලැබුණා. මේ රටේ නීතිය ගැන විශ්වාසය කරන මිනිසුන්ට අද ජයග්‍රහණයක් ලැබුණා. මේ රටේ නීතිපති දෙපාර්තමේන්තුවට අද ජයග්‍රහණයක් ලැබුණා. මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වයට අද ජයග්‍රහණයක් ලැබුණා. ඒ නිසා හොරුන්ගේත්, හොරුන්ගේ උදව්කරුවන්ගේත්, හොරුන්ට උදව් කරන සහ ඔවුන්ට සුබ පතන සියලු දෙනාගේත්, ඔය හඬ නඟන සියලු දෙනාගේත් ඒ උත්සාහය පරාජයට පත් කරලා, එදා හොරුත්, අද හොරුත්, අනාගතයේ හොරුත් යන සියලුම හොරුන්ට නීතිය ක්‍රියාත්මක වෙනවාය කියන කාරණය ගැන හැඟීමක් ලබාදෙන්න පුළුවන්කම ලැබුණාය කියන සතුට අපට තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා. කරුණාකර නිශ්ශබ්ද වන්න. ඊට පෙර කවුරුන් හෝ මන්ත්‍රීවරයෙක් ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
"ගරු මුජිබුර් රහුමාන් මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. MUJIBUR RAHUMAN *took the Chair.*

[பி.ப. 3.25]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2017ஆம் ஆண்டின் உண்ணாட்டரசிறைச் சட்டமூலமானது அரசிறைச் சட்டங்களிலுள்ள குறைபாடுகளைத் திருத்துவதற்கும் இறைவரித் திணைக்களத்தின் செயற்பாடுகளின் வினைத்திறனைக் கூட்டுவதற்கும் வரி ஏய்ப்புக்களைத் தவிர்ப்பதற்கும் வரி வருமானத்தை அதிகரித்து, பொருளாதாரச் சமநிலையை ஏற்படுத்துவதற்கும் வகைசெய்யுமுகமாகக் கொண்டுவரப்பட்டமை வரவேற்கத்தக்கதாகும். இவ்வரசிறைச் சட்டமூலம் தொடர்பாக உயர் நீதிமன்றத்தினால் அளிக்கப்பட்ட தீர்ப்புகளின் அடிப்படையில் திருத்தங்கள் செய்யப்படுவதை நாங்கள் பரிபூரணமாக ஏற்றுக்கொள்கிறோம். நிதி அமைச்சரால் சமர்ப்பிக்கப்பட்டுள்ள இச்சட்டமூலத்தைத் திருத்துவதற்காக கிட்டத்தட்ட 200 திருத்தங்களைப் பிரேரிக்கவுள்ளதாக அமைச்சர் அவர்கள் ஊடகங்கள் ஊடாக அறிவித்துள்ளார். கூட்டாட்சி அரசாங்கத்தின் மிக முக்கியமான கொள்கையில் ஒன்றாக, எதிர்வரும் 2020ஆம் ஆண்டளவில் நிதிப் பற்றாக்குறையை மொத்தத் தேசிய உற்பத்தியின் 3.5 சதவீதமாகக் குறைக்க உத்தேசிக்கப்பட்டுள்ளதால், இச்சட்டமூலத்தில் குறிப்பிடப்பட்டுள்ளவாறு புதிய அரசிறைச் சட்டத்தைச் சரியான முறையில் முகாமைத்துவம் செய்வது முக்கியமானதாகும். நாட்டின் கடன் சுமையைக் குறைப்பதற்கு அதிகரித்த வருமானம் பங்களிப்புச் செய்யும் என்பது நாம் அறிந்ததே! அந்த வகையில், தேக்கநிலையிலுள்ள பொருளாதாரத்தை மேம்படுத்த இச்சட்டத்தின் ஏற்பாடுகள் ஊக்கியாகத் தொழிற்பட்டு, வரி வருமானத்தை அதிகரிக்கச் செய்யுமென நம்புகின்றேன்.

கடந்த இரண்டு வருடங்களுக்கும் மேலாக இலங்கையில் ஏற்பட்ட வரட்சி, திடீர் வெள்ளப்பெருக்கு, சூழல் மாசடைவின் தாக்கங்கள் என்பவற்றால் ஏற்பட்ட பாதிப்பிலிருந்து மீள்வதற்கும் நிலைபேறான அபிவிருத்தியை உருவாக்குவதற்கும் பொதுப்படுகடனை மீளச் செலுத்துவதற்கும் பொருளாதாரம் சார்ந்த அபிவிருத்தித் துறைகளுக்கு மட்டுமல்லாது கல்வி, சுகாதாரம், தொழில் வாய்ப்பு போன்ற துறைகளுக்கான செலவினங்களுக்கும் ஏற்றவகையில் நிதி ஒதுக்கீடு செய்யப்பட வேண்டும். இயற்கையின் தாக்கங்களால் பாதிக்கப்பட்டுள்ள சமுர்த்திப் பயனாளிகளுக்கு அரசினால் வழங்கப்படும் தொகையானது, தற்போதைய பணவீக்கத்தின் காரணமாக அவர்களது அத்தியாவசியத் தேவைகளைப் பூர்த்தி செய்வதற்கே போதாமல் இருக்கிறது. எனவே, சமுர்த்திப் பயனாளிகளுக்கு வழங்கப்படும் கொடுப்பனவை, பண வீக்கத்தின் தாக்கத்தைச் சமாளிக்கக்கூடிய வகையில் அதிகரித்து வழங்குவதற்குத் தேவையான நிதி ஒதுக்கீட்டைச் செய்யவேண்டும். பிரேரிக்கப்பட்டுள்ள வரிச் சீர்திருத்தங்களின்மூலம் ஏழைகளுக்கும் செல்வந்தர்களுக்கும் இடையிலான வருமான இடைவெளியைக் குறைப்பதற்கும் முடியுமென்று நான் நம்புகின்றேன்.

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

கடந்த ஆண்டில் ஏற்பட்ட நிதிப்பற்றாக்குறையை, 5.4 வீதமாகக் குறைப்பதற்கு எடுத்த நடவடிக்கைகள் இந்தக் கூட்டாட்சி அரசாங்கத்தின் சாதனை என்றே குறிப்பிட வேண்டும். இதே வினைத்திறனைத் தற்போதைய நிதியமைச்சரும் தொடர்ச்சியாகக் கடைப்பிடித்து, புதிய இறைவரித் திட்டத்தை வினைத்திறன் வாய்ந்த வகையில் பயன்படுத்திக்கொண்டால், 2020ஆம் ஆண்டளவில் நிதிப்பற்றாக்குறையை மொத்தத் தேசிய உற்பத்தியில் 3.5 வீதமாகக் குறைப்பது சாத்தியப்படும் என்று நம்புகின்றேன். இந்த இலக்கை அடைவதற்கு இப்பொழுதிருந்தே அரசிறை வருமானத்தை அதிகரிப்பது மட்டுமல்லாமல், கல்வி மற்றும் சமூக பொருளாதார அபிவிருத்திகளுக்கான முதலீட்டுச் செலவினங்களையும் அதிகரிக்க வேண்டும். அதேவேளை இலங்கையில் சமநிலையான பொருளாதார வளர்ச்சியை ஏற்படுத்துவதற்கு வடக்கு, கிழக்கு மாகாணங்களில் யுத்தத்தால் பாதிக்கப்பட்ட பொருளாதார மற்றும் சமூகக் கட்டமைப்புக்களைச் சீர்செய்வதற்கு மேலதிக நிதி ஒதுக்கீடுகள் செய்யப்பட வேண்டும் என்றும் நிதி அமைச்சர் அவர்களைக் கேட்டுக்கொள்கின்றேன்.

நமது நாட்டின் மிக முக்கியமான கடந்தகாலப் பிரச்சனைகளில் ஒன்று, அரச வருமானமானது மிகப் பலவீனமாக இருப்பதாகும். பாதீடுகளைத் தயார் செய்து சமர்ப்பிக்கும்போதுகூட அதனைப் பூர்த்தி செய்துகொள்ளக்கூடிய விதத்தில் தேவையானளவு வருமானத்தை அரசு பெற்றுக்கொள்ளவில்லை. தற்போதைய அரசின் பாரிய பிரச்சினையானது அதனது செலவினங்களுக்கு மட்டுமல்லாது கடன்களை மீளச் செலுத்துவதற்கான வருமானத்தையும் கொண்டிராத நிலைமையே ஆகும். இந்நிலைமையை நாம் கட்டுப்படுத்தாவிடில் நாடு வங்குரோத்து நிலைமைக்குத் தள்ளப்படக்கூடும். நமது பிராந்தியத்திலுள்ள நாடுகளுடன் ஒப்பிடுமிடத்து இலங்கைதான் அரசிறை வருமான சேர்ப்பில் பின்தங்கிய நிலையிலுள்ளதாகத் தெரியவருகின்றது.

தற்போதைய பொருளாதார நிலையை நாம் கணக்கில் எடுத்தால், மொத்தத் தேசிய உற்பத்தியில் குறைந்தது 20 சதவீதமான வருமானம், வரி சேகரிப்பின்மூலம் பெறப்பட வேண்டும். ஆனால், நாங்கள் இந்த நிலையை இன்னமும் அடையவில்லை. மொத்த வரி வருமானத்தில் மறைமுக வரியின் அளவு அதிகமாக உள்ளமையே தற்போதைய வரி முறையிலுள்ள முக்கியமான குறைபாடாகும். இதை வேறு விதமாகச் சொல்லப்போனால், மொத்த அரசாங்க வரி வருமானத்தில் 80 சதவீதம் மறைமுக வரியாகவே உள்ளது. இதன் தாற்பரியம் என்னவென்றால், இலங்கையின் ஒட்டுமொத்த வரி வருமானத்தில் பெரும்பகுதி நுகர்வோர் வழியாகப் பெறப்படுவதால், வருமானம் குறைந்த மக்கள் மிக அதிக அளவில் பாதிக்கப்படுவதே ஆகும். இந்நிலைமையானது யுத்தத்தால் பாதிக்கப்பட்ட மக்களின் வாழ்வியலில் அதிக பாதிப்புக்களை ஏற்படுத்துவதாகவே அமைந்துள்ளது. இதன் விளைவு, அதிக வருமானம் உழைப்போர் வருமான வரியைக் கட்டுவதிலிருந்து தப்பித்துக்கொள்கின்ற அதேவேளை, வருமானம் குறைந்த மக்கள் தமக்குத் தேவையான அத்தியாவசியப் பொருட்களை வாங்கும்பொழுதுகூட வரிப்பொறிமுறைக்குள் சிக்கிக்கொள்வதாகும். இப்பிரச்சினைக்குப் புதிய அரசிறைச் சட்டம் பரிகாரம் காணும் என்று நான் நம்புகின்றேன்.

எனவே, மறைமுக வரியை 60 சதவீதமாகக் குறைப்பது வருமானம் குறைந்த மக்களுடைய வரிச்சுமையைக் குறைக்க ஏதுவாக அமையும். அரசாங்கம் மறைமுக வரிமூலம் வரி சேர்ப்பதற்கான காரணம் மறைமுக வரியை மிக இலகுவாகச் சேகரிக்கக் கூடியதாக உள்ளதனாலாகும். வரி ஏய்ப்பு மற்றும் வரி செலுத்தாமல் தப்பிக்கும் அளவானது நேரடி வரியைப் பார்க்கிலும் மறைமுக வரியில் மிகக் குறைவாகும். அரசாங்கத்துக்கு நேரடி வரியைத் திரட்ட ஆகும் நிர்வாகச் செலவானது மிக அதிகமாகும். இச்செலவைத் தவிர்ப்பதற்காகவும் இலகுவாக வரியைத் திரட்டுவதற்காகவும் மறைமுக வரி பயன்படுத்தப்படுகின்றது. இவற்றையெல்லாம் கணக்கிலெடுத்து புதிய அரசிறைச் சட்டம் நேரடி வரியின்மூலம் அதிக வருமானத்தைப் பெறும் வகையில் கட்டமைக்கப்பட்டுள்ளமையால், மத்தியதர மற்றும் வருமானம் குறைந்தவர்களின் வரிச்சுமையை இச்சட்டம் குறைக்கும் என்று நாம் நம்புகின்றோம். புதிய அரசிறைச் சட்டத்தில் செய்யப்படவுள்ள ஏற்பாடுகள்மூலம் தற்போது நடைமுறையிலுள்ள சட்டங்கள் திருத்தப்படுவதுடன், புதிய சட்டங்களை நடைமுறைக்குக் கொண்டுவரவும் உத்தேசிக்கப்பட்டுள்ளது.

இச்சட்ட ஏற்பாடுகள் வடக்கு, கிழக்கில் மீளக்குடியமர்த்தப்பட்டு புதிய தொழில் முயற்சிகளை ஆரம்பித்துப் பொருளாதாரத்திற்குப் பங்களிப்புச் செய்பவர்களையும் வெளிநாட்டு முதலீடுகளை வடக்கு, கிழக்குக்குக் கொண்டுவந்து முதலீடு செய்பவர்களையும் பாதிக்கச்செய்யாமல் இருப்பதுடன், ஊக்குவிக்கவும் வேண்டும். எனவே, கௌரவ நிதி அமைச்சர் அவர்கள் நான் இங்கு கூறியவற்றைக் கவனத்திற்கொண்டு, புதிய தொழில்முயற்சியாளர்களுக்கும் வடக்கு, கிழக்கில் வெளிநாட்டு முதலீடுகளைச் செய்துள்ளவர்களுக்கும் ஏற்படக்கூடிய பாதிப்புக்களுக்கு நிவாரணம் வழங்க 2018ஆம் நிதியாண்டிலாவது வழிவகை செய்யவேண்டும். இது தவிரவும் இச்சட்டத்தைச் செயற்படுத்தும்பொழுது, அது தொடர்பான விழிப்புணர்வூட்டலை மக்கள் மத்தியில் ஏற்படுத்துவதற்குத் தேவையான வசதிகளை உள்நாட்டு இறைவரித் திணைக்களத்தைச் சேர்ந்த அதிகாரிகளுக்குச் செய்துகொடுக்க வேண்டும் என்றும் கேட்டுக்கொள்கின்றேன்.

வரி கட்டக்கூடிய மக்கள், வரி கட்டுவதைச் சட்டத்தின் தேவையைத் திருப்தி செய்வதற்காக மட்டும் அல்லாமல், தாய்நாட்டுக்கான ஒரு சேவையாக முன்வந்து கட்டவேண்டும். அவ்வாறு முன்வந்து கட்டுபவர்களைக் கௌரவிக்குமுகமாக உள்நாட்டு இறைவரித் திணைக்களம் அவர்களுக்கு விசுவாச அட்டைகளை - Loyalty Card - வழங்குவதுடன், அவ்வாறானவர்களுக்கு ஊக்குவிப்புச் சலுகைகளையும் வழங்கவேண்டும். உதாரணமாக, காலந்தவறாது வரி கட்டுபவர்களுக்கு உள்நாட்டு வணக்க வழிபாடுகளுக்கும் சுற்றுலா செல்வதற்கும் பல்வேறு விதத்தில் ஊக்குவித்து உதவிபுரியலாம். அவ்வாறான ஊக்குவிப்புகளால் உள்நாட்டு இறைவரித் திணைக்களத்தை மக்கள்நேய திணைக்களமாகப் புனர்ஜீவனமளிக்கலாம். இறைவரித் திணைக்கள அதிகாரிகள் மக்களைச் சந்தேக நபர்களாக நடத்தாமல், மக்களின் நம்பிக்கையை வென்று வரி முகாமைத்துவத்தை வினைத்திறனுடன் செய்து வரி சேகரிப்பைச் செய்யவேண்டும். எனது அபிப்பிராயத்தில் வரி முகாமைத்துவமும் வரி சேகரிப்பும் ஒரு நாணயத்தின் இரு பக்கங்களைப் போன்றதாகும்.

யுத்தத்தால் எல்லா வகையிலும் அழிவடைந்த வடக்கு, கிழக்கு மாகாணங்களின் கட்டமைப்புக்களை விருத்தி செய்வதற்கும் வணிக முயற்சிகளைக் கூட்டுவதற்கும் சுயதொழில் வாய்ப்புக்களையும் ஏனைய தொழில்

வாய்ப்புக்களையும் எமது பிரதேச மக்களுக்கு ஏற்படுத்திக் கொடுப்பதற்கும் கௌரவ நிதி அமைச்சர் அவர்கள் அவருடைய பதவிக் காலத்தில் விசேட திட்டங்களை வகுத்துச் செயற்படுத்தவேண்டும். வடக்கு, கிழக்கில் பெயரளவில் தொழில் பேட்டைகளுக்கான நிலங்கள் ஒதுக்கப்பட்டுள்ளனவே தவிர, செயற்பாடற்ற தொழில் பேட்டைகளே அங்கு இருக்கின்றன. அத்தகைய தொழில் பேட்டைகளைப் பயனுள்ளவகையில் இயக்குவதற்கும் வடக்கு, கிழக்கு மாகாணங்களில் காணப்படும் வளங்களைப் பயன்படுத்தி உற்பத்தித் தொழில்துறைகளை மேம்படுத்துவதற்கு முயற்சிக்கும் இளைஞர், யுவதிகளுக்குக் கடன் வசதிகளையும் வரிச் சலுகைகளையும் வழங்குவதனூடாக எமது நாட்டின் பொருளாதாரத்தை அதிகரிக்க நடவடிக்கைகளை முன்னெடுக்கவேண்டும் என்றும் இச்சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
எனக்கு பத்து நிமிடங்கள் ஒதுக்கப்பட்டிருந்தது. தற்போது ஒன்பது நிமிடங்களும் 30 செக்கன்களும்தான் சென்றிருக்கிறது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
நீங்கள் உங்களுடைய உரையை பி.ப. 3.25 மணிக்கு ஆரம்பித்தீர்கள்.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
நான் இன்னும் ஒரு நிமிடத்தில் என்னுடைய உரையை முடித்துக்கொள்கின்றேன்.

எமது நாட்டு மக்கள் அண்மையில் உள்ளூராட்சித் தேர்தல்களை எதிர்கொள்ள இருக்கின்றபடியினால், அது சம்பந்தமான சில கருத்துக்களையும் நான் கூறவிரும்புகின்றேன். யாழ்ப்பாணத்தில் 1989ஆம் ஆண்டுக்கு முன்னர் சங்கானை, சுன்னாகம், காங்கேசன்துறை, நெல்லியடி, பண்டத்தரிப்பு, உரும்பிராய், மானிப்பாய், ஊர்காவற்றுறை மற்றும் கிளிநொச்சி, முல்லைத்தீவு ஆகிய பட்டின சபைகள், 1989ஆம் ஆண்டின் உள்ளூராட்சி மன்றத் தேர்தல் சட்டத்துடன் பட்டின சபைகள் என்ற அந்தஸ்தை இழந்து பிரதேச சபைகளாக மாற்றம் பெற்றன. கடந்த 25 வருட காலப்பகுதியில் குறிப்பிட்ட பத்து பிரதேசங்களில் சுன்னாகம், சங்கானை, நெல்லியடி, மானிப்பாய் ஆகிய பிரதேசங்கள் பாரிய நகரங்களாக வளர்ச்சி பெற்றிருக்கின்றன. ஆகவே, இந்த நகரங்களின் வளர்ச்சியைக் கவனத்தில் எடுத்து அச்சபைகளை நகர சபைகளாகத் தரமுயர்த்தி அவற்றுக்குரிய அந்தஸ்து கொடுக்கப்பட வேண்டும். அடுத்து, கிளிநொச்சி மாவட்டத்தின் தலைநகராகவும் கல்வி, வர்த்தகம், விவசாயம், கைத்தொழில் மையங்கள் போன்ற செயற்பாடுகளின் மையமாகவும் கிளிநொச்சி நகரம் வளர்ச்சி பெற்றிருப்பதால், கிளிநொச்சி பிரதேச சபையை நகர சபையாகத் தரமுயர்த்த வேண்டும். நகர சபையாகத் தரமுயர்த்தினால்தான் அச்சபையின் நிர்வாகத்தையும் முகாமைத்துவத்தையும் சிறப்பாகச் செய்யமுடியும்இ அதுபோலவே முல்லைத்தீவு மாவட்டத்தின் வளர்ச்சியையும் அபிவிருத்தியையும் கவனத்திற்கொண்டு, முல்லைத்தீவு பிரதேச சபையையும் நகர சபையாகத் தரமுயர்த்தி, நகரில் வாழும் மக்களுக்கு அச்சபை சிறப்பான சேவையை வழங்க வழிவகை செய்யப்பட வேண்டும்.

இதைத் தவிர, வட மாகாணத்தில் நான்கு பிரதேசங்களில் பிரதேச செயலகங்கள் அமையப்பெற்றுள்ளபோதும், பிரதேச சபைக் கட்டமைப்பு உருவாக்கப்படாமல் இருக்கின்றது. யாழ்ப்பாணம் வடமராட்சியில் மருதங்கேணி, கிளிநொச்சியில் கண்டாவளை, முல்லைத்தீவில் ஒட்டுசுட்டான், மன்னாரில் மடு என்பனவே அந்தப் பிரதேச செயலகங்களாகும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
தயவுசெய்து, இன்னும் அரை நிமிடம் தாருங்கள்!

இந்த நான்கு பிரதேசங்களுக்கும் தனியான பிரதேச சபைக் கட்டமைப்பு இன்மையால் அப்பிரதேசத்தில் அடிமட்ட கிராமிய அபிவிருத்தியைக்கூட முன்னெடுப்பது கடினமான காரியமாக இருக்கின்றது. பிரதேச சபைக் கட்டமைப்பு இல்லாத காரணத்தினால் இப்பிரதேசங்கள் பின்தங்கிய நிலையில் காணப்படுகின்றன. எனவே, இந்த நான்கு பிரதேசங்களுக்கும் பிரதேச சபைக் கட்டமைப்பு ஏற்படுத்தப்பட வேண்டும். இந்தக் குறைபாடுகள் உள்ளூராட்சிச் சபைகளுக்கான தேர்தல் நடைபெறுவதற்கான ஏற்பாடுகள் பூர்த்தியாக்கப்படுவதற்கு முன்னர் நிவர்த்திக்கப்பட வேண்டும் என்று கேட்டுக்கொண்டு, சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

[අ.භා. 3.38]

ගරු එස්.බී. දිසානායක මහතා (සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Social Empowerment and Welfare and Kandyan Heritage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2006 වර්ෂයේදී අපේ රටේ සම්මත කරපු දේශීය ආදායම් පනතත්, ඊට පසුව ඒ පනතට ගෙනා සංශෝධන 6ත් සමඟ මේ රටේ බදු ප්‍රතිපත්තිය පිළිබඳ ගැටලු තිබුණා. හිටපු ගමන් බදු වෙනස් කරනවා. හිටපු ගමන් පුද්ගලයන්ට බදු නිදහස දෙනවා. හිටපු ගමන් සමහර දේවලට බදු වැඩිපුර පනවනවා. මේ වාගේ ගැටලු, ප්‍රශ්න අවිනිශ්චිතතා පැවතුණා. රටක ආයෝජකයන් ධෛර්යවත් කරන්න, රටක නිෂ්පාදකයන් ධෛර්යවත් කරන්න, රටේ ආදායම වැඩි කරන්න එය හොඳ තත්ත්වයක් නොවෙයි. අපගේ දින 100 අය වැය ලේඛනයේත්, ඒ වාගේම 2016 සහ 2017 වසරවල අය වැය ලේඛනවලත් බදු යෝජනා හුඟක් ගැසට් කරගන්න අපට බැරි වුණා. ඒ පිළිබඳව ගැටලුවක් තිබුණා. දැන් මට පෙනෙන්නේ ගරු මංගල සමරවීර අමාත්‍යතුමා එතුමාට හුරු පුරුදු විධියටම, එතුමාගේ අතීත අමාත්‍යාංශවල එතුමා තීන්දු තීරණ ගත් විධියටම බොහොම එඩිතරව, නොසැලී මේවා ශුද්ධ පවිත්‍ර කරමින් ඉස්සරහට යන්න වැඩ කරන බවකුයි. අපි එතුමාට සුබ පතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ යම් රටක ඉහළ ආර්ථික සංවර්ධනයක් තිබෙනවා නම්, ඒ රටේ ජාතික ආදායම,

[ගරු එස්.බී. දිසානායක මහතා]

දළ දේශීය නිෂ්පාදනය ඉතාම ඉහළ තලයක තිබෙනවා නම්, ඒක පුද්ගල ආදායම ඉතාම ඉහළ තලයක තිබෙනවා නම්, ඒ හැම රටකම ඍජු බදු ආදායම ඉතා ඉහළ මට්ටමක තිබෙනවා. එක්කෝ සියයට 50න් උඩ තිබෙනවා. එය ඉතා හොඳ තත්ත්වයක්. එහෙම නැත්නම් එය සියයට 50 ආසන්නයට ඇවිත් තිබෙනවා. එය හැම සංවර්ධිත රටකම දකින්න තිබෙන දෙයක්. ඒ නිසා මේ බදු පනතින් ප්‍රධාන වශයෙන් මතු කරන, මුදල් අමාත්‍යතුමාගේ ඉලක්කය, එනම් ඍජු බදු ආදායම අද තිබෙන තත්ත්වයෙන් සියයට 40 දක්වා ගෙන යෑමේ සහ වක්‍ර බදු ආදායම සියයට 80 සිට සියයට 60 දක්වා ගෙන ඒමේ ඉලක්කය රටටත්, රටේ පොදු ජනතාවටත් ඉතාම යහපත් කියන එක මා කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හුස්ම ගන්නා හැම කෙනාටම බදු ගහන්න ලැහැස්ති වෙනවා කියා ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් කිව්වත්, එතුමන්ලා එසේ දැක්කත් එය සාධාරණ නැහැ. කලාකාරයකුට වුණත් තමා කරන කලා කටයුත්තෙන් ලාභයක් ලැබෙනවා නම් එයින් පොඩි බද්දක් අය කිරීම රටකට අවශ්‍ය දෙයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටට ආදායමක් නැත්නම්, රටේ රාජ්‍ය ආදායම වැඩි කරගත්තේ නැත්නම් අප කොහොමද මේ රට ගෙන යන්නේ? අමතක කරන්න එපා, ලෝකයේ කොහේවත් නැති විධියට අප අපේ රටේ අධ්‍යාපනය අද නොමිලයේ ලබා දෙන බව. අද එය ලෝකයෙන් ඈත් වෙමින් යන්නේ. සමාජවාදී රටවල පවා අද නොමිලේ දෙන අධ්‍යාපනය නැහැ. අමතක කරන්න හොඳ නැහැ, අද උසස් අධ්‍යාපනය නොමිලයේ ලබා දෙන රටවල් ඇත්තේම නැති තරම්ය කියා. කියුබාවේ නම් දෙනවා. නමුත් වෙනත් රටක් ඇත්තේම නැති තරම්. හැබැයි අපි උසස් අධ්‍යාපනයත් නොමිලයේ ලබාදෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය රජය කාලයේ රුපියල් මිලියන 14ක් ලෙස තිබුණු සමෘද්ධි සහනාධාරය දැන් රුපියල් මිලියන 42ක් වී තිබෙනවා. මේ තරම් මහා විශාල සහනාධාර වැඩ පිළිවෙළක් ඇති, සෞඛ්‍ය සහ අධ්‍යාපනය නොමිලේ දෙන - එමඟින් අපට විශාල වාසිදායක තත්ත්වයන් ලැබී තිබෙනවා- අපේ රටේ ඍජු ආදායම් බදු ප්‍රමාණය වැඩි කිරීමට උත්සාහ දැරීම ඉතාම පලදායක දෙයක් කියායි මා හිතන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වක්‍ර බදු ගෙවන්නේ කවුද? පාරේ සිඟමන් යදින පුද්ගලයාත් වක්‍ර බදු ගෙවනවා. සමෘද්ධි සහනාධාර ලබන දාහතරලක්ෂයක් -සමෘද්ධිලාභි පවුල්වල සියලු දෙනා- පරිප්පුවලට, ලුණුවලට, සීනිවලට ඒ වක්‍ර බද්ද ගෙවනවා. ඒ නිසා ඍජු බදු ආදායම වැඩි කරගෙන ඒ හරහා වක්‍ර බදු සහන දෙන්න අපට පුළුවන්කම තිබෙනවා නම් හොඳයි. සමහර බදු සහනත්, සමහර භාණ්ඩවලට ලබා දී තිබෙන බදු සහනත් වැඩි කරගන්න අපට පුළුවන් වේවි, අපේ ඍජු බදු ආදායම වැඩි කර ගත්තොත්. මිලියන 1.2ක් පමණ වන පොහොසත්ම පන්තියේ ආදායම් බදු ෆයිල් ප්‍රමාණය ගෙන බලන කොට පෙනෙනවා, ඒ අයවත් හරියාකාරව එම බද්ද ගෙවා නැහැ කියා. මේ රටේ ආදායම් බදු ගෙවන අයගෙන් නියමිත වෙලාවට, නිවැරදිව එම බද්ද ගෙවන අය, තමන්ගේ රාජකාරියක් හැටියට සලකා ගෙවල් කුලී, විදුලිය බිල, වතුර බිල ගෙවනවා වාගේ මේ බද්ද ගෙවන අය ලංකාවේ තවමත් ඉන්නේ සියයට 30යි. ඇත්තටම එම බද්ද ගෙවන එක අපේ වගකීමක්. එය අපේ යුතුකමක්; අප කළ යුතු දෙයක්.

අපි අපේ ගෙදර වතුර බිල ගෙවනවා; ලයිට් බිල ගෙවනවා; ගෙවල් කුලිය ගෙවනවා. ලැබෙන ආදායමින් කිසියම් මුදලක් අපි රජයේ වියදම්වලට ගෙවනවා. රජයේ වියදම් කියලා කිව්වාම අපි නැවත නැවත මතක් කළ යුතු දේ තමයි අපේ නිදහස් අධ්‍යාපනය, දෙන සහනාධාර සහ නිදහස් සෞඛ්‍ය සේවාව. මේවා නඩත්තු කර ගැනීම සඳහා රජයේ ආදායම වැඩි කර ගන්න ඕනෑයි කියන එක සම්බන්ධයෙන් අපේ ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාම එකඟ වන බව අපි දන්නවා. නාස්තිය අඩු කර ගන්නත් ඕනෑ. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා මගේ දිහා බලන කොටම මා දන්නවා, එතුමා කියන්නේ ඒක බව. අනිවාර්යයෙන්ම නාස්තිය අඩු කර ගන්න ඕනෑ. හැබැයි, රජයේ ආදායම වැඩි කර ගැනීමත් අත්‍යවශ්‍යයි.

මේ පනත් කෙටුම්පතට සංශෝධන දෙසිය ගණනක් ඉදිරිපත් වෙලා තිබෙනවා. මා ඒ ගැන ඉතාම සතුටු වෙනවා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාත් සංශෝධන හැටගණනක් ඉදිරිපත් කර තිබෙනවා. මට පෙනෙන විධියට මේ බදු පනත් කෙටුම්පත ශුද්ධ කරලා, හම ගහලා, ඇටත් ගලවලායි තිබෙන්නේ. වෘත්තියවේදීන්ගේ අදහස් විමසා, විශේෂඥයන්ගේ අදහස් දැනගෙන, මේ බදුවලට පාදක වන ව්‍යාපාරිකයන්ගේ, කර්මාන්තකරුවන්ගේ අදහස් විමසා සහ අපේ දේශපාලන පක්ෂවල නියෝජිතයන්ගේත් අදහස් විමසා සංශෝධන හරහා මේ පනත් කෙටුම්පත ශුද්ධ පවිත්‍ර කර ගන්න ගත්ත තීරණය පිළිබඳවත් මා ඉතාම සතුටු වෙනවා. ඒක හරිම දුෂ්කර වැඩක්. නමුත්, දුෂ්කර වුණත් ඒ කාරණය කිරීම ඉතාම අවශ්‍යයි. මොකද, අපේ ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේක තවත් අය වැයක් තරමටම වැදගත් දෙයක්. අපේ රටේ රාජ්‍ය ආදායම තීන්දු කරන ප්‍රධාන නීතිමය කෙටුම්පතයි මේ සකස් කර තිබෙන්නේ. ඒ නිසා ඒකත් එක්ක විහිළු කරන එක, ඒක ගැන උඩින් පල්ලෙන් හිතන එක හොඳ නැහැ. අපේ ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරපු බොහෝ කාරණා ගරු මංගල සමරවීර මුදල් අමාත්‍යතුමාගේ සංශෝධනවලින් නිවැරදි වේවි කියලා මගේ ලොකු විශ්වාසයක් තිබෙනවා.

අපි බදු වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන කොට එය ඉතා සරල වීම ඉතාම අවශ්‍ය කාරණයක්. අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කිව්ව විධියට බදු සහනාධාර තුන්සිය ගණනක් තිබුණු එක 25ට අඩු කරලායි කියන කාරණය සාධාරණ නැහැ. මොකද, එහෙම 300ක්, 400ක්, 500ක් කියන්නේ නැතිව එතැන නිදහස්, මෙතැන නිදහස් කියන්නේ නැතිව මේවා සියල්ල එකට එකතු කරලා නිදහස් බදු යෝජනා 03ක් නැත්නම් 04කින් මේක ඉවර කරන එක දියුණු රටක බද්දක තිබිය යුතු ඉතා හොඳ ලක්ෂණයක්. ඒ නිසා එය ඉතාම සරල වෙන්න ඕනෑ; ඉතා ලෙහෙසියෙන් මිනිස්සුන්ට තේරුම් ගන්න පුළුවන් වෙන්න ඕනෑ. මිනිස්සු තුළ ඒ බද්ද පිළිබඳව විශ්වාසයක් තියෙන්න ඕනෑ, ඒ බද්ද මඟ හරින්න මිනිස්සුන්ට තිබෙන ඉඩ කඩ නැති වෙන්න ඕනෑ, ඒ බද්ද ලෙහෙසියෙන් අය කර ගන්න පුළුවන් වෙන්න ඕනෑ. ඒ නිසා මේ කාරණා පිළිබඳව ඉතාම ප්‍රවේසමෙන් හිතා බලා මේ බදු යෝජනාව, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම පිළිබඳව අපි සතුටු වන අතර, ඒ හරහා රාජ්‍ය ආදායම වැඩි කර ගන්නත්, බද්දෙන් මඟ හරින අයට ඒ සඳහා ඉඩ කඩ නොතැබීමටත් කටයුතු කරන්න අප බලාපොරොත්තු වනවා. ඇත්තටම අපි සියලු දෙනාම දන්නවා, හුඟක් ආදායම් තිබෙන අයගේ, ඉතාම ඍජුව ලක්ෂ ගණන් දිනපතා හම්බ කරන අයගේ බදු files අරගෙන බැලුවොත් ඒ අය ඉතාම පොඩි මුදලයි ගෙවන්නේ කියලා. ඒ නිසා ඒ අයගේ වග කීම ඒ අයට දැනෙන එක හොඳයි. අපි හම්බ කර ගන්න ආදායමින් පොඩි මුදලක් රජයේ වියදම් සඳහා ගෙවන එක අපේ වගකීමක්. අපි පාරවල්වල යනවා. ඒවා නඩත්තු කරන්නේ රජය.

අපි පාරේ යන කොට ලයිට් දාලා තිබෙනවා. මේවා නඩත්තු කරන්නේ රජය. පුද්ගලයෙක් රජයත් එක්ක තිබෙන බැඳීම කොච්චර අඩු වුණත්, ඔවුන් මේ බිමේ ජීවත් වෙනවා. ඔහු දවල්ට, රෑට පාරක ඇවිදිනවා නම්, ඔහු වාහනයක ගමන් කරනවා නම්

ඔහුට වග කීමක් තිබෙනවා, රජයට ඒ සඳහා කිසියම් මුදලක් ගෙවන්න. ඉතාම සරල විධියට, ඉතාම හොඳින් තේරුම් ගන්න පුළුවන් විධියට, ඉතාම ඍජු විධියට බදු යෝජනා ක්‍රම සරල කරලා, පුංචි කරලා, කෙටි කරලා, අඩු කරලා මේ පනත් කෙටුම්පත නිර්මාණය කරලා තිබීම හරහා මගේ විශ්වාසයක් තිබෙනවා, බදු ගෙවිය යුත්තන්ට කිසියම් හැඟීමක් ඇති කරවන්න අපට ලෙහෙසි වෙයි කියලා. මේක අපේ යුතුකමක් හා වගකීමක් කියන කාරණය මතක තබා ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට සියයට 20ක් තිබෙන ඍජු බදු ආදායම 2020 වන විට සියයට 40කට ගෙන යන්නයි අපි උත්සාහ කරන්නේ. ඒ වාගේම දැනට සියයට 80ක් තිබෙන වක්‍ර බදු ආදායම 2020 වන විට සියයට 60කට ගෙනෙන්නත් අපි උත්සාහ කරනවා. දැනට සියයට 80ක්ව තිබෙන වක්‍ර බදු ආදායම සියයට 60 වීම හරහා මේ රටේ ඉතාම පහළ ආදායම් ලබන ඍජු බදු නොගෙවන අහිංසක අඩු ආදායම්ලාභී මිනිසුන් සඳහා කිසියම් වූ සහනයක් ඒ හරහා ලැබෙන බව මේ බදු විද්‍යාව දිහා බලපුවාම ඉතාම හොඳින් පෙනෙනවා. ඒ නිසා සියයට 80ක් හැටියට තිබෙන වක්‍ර බදු ආදායම සියයට 60ක් වීම මේ රටේ සාමාන්‍ය ජනතාවට ඉතාම වාසිදායක කාරණයක් කියන එක අපි අමතක කරන්න හොඳ නැහැ.

කුඩා, ක්ෂුද්‍ර, මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන්ගේ ආදායම් බදු ගෙවිය යුතු සීමාව ඉහළට ගෙනියලා තිබෙනවා. ඒ නිසා ඔවුන් රුපියල් 100,000ක්, රුපියල් 75,000ක්, 90,000ක්, 125,000 දක්වා ලාභ ලැබුවත් බද්දෙන් නිදහස් වෙලා ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු, ඔවුන්ගේ කර්මාන්ත, ඔවුන්ගේ නිෂ්පාදන, ඔවුන්ගේ සේවා ඉස්සරහට කරගෙන යෑමේ පහසුකම ලැබෙනවා. ඒ අනුව, මේ රටේ ඉතා කුඩා පරිමාණ, මධ්‍යම පරිමාණ සහ ක්ෂුද්‍ර පරිමාණ ආයෝජකයන්, නිෂ්පාදකයන්, කර්මාන්තකරුවන් හා සේවා සපයන්නන් ධෛර්යවත් කිරීම මේ රටේ සංවර්ධනයට හරිම තීරණාත්මකයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමාට නියමිත කාලය දැන් අවසානයි.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව අවසන් කරනවා.

ලංකාවේ ව්‍යවසායකයන් ගත්තොත්, සියයට 93ක්ම ඉන්නේ මේ මම කියන විධියේ පුංචි අය. එක්කෝ, ක්ෂුද්‍ර පරිමාණ, එක්කෝ, සුළු පරිමාණ, එහෙම නැත්නම්, මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන්. මේ ක්ෂුද්‍ර හා සුළු කියන අයට ව්‍යාපාරයක් කරන්න ඇපකරුවන් සොයා ගන්න අමාරුයි. ඔවුන්ට ඇත්තටම ඇප විධියට තියන්න දේපොළ වත්කම් නැහැ. ඒ නිසා මේ වාගේ අය පුළුවන් තරම් බද්දෙන් නිදහස් කරලා, ප්‍රාග්ධන ශක්තිය දීලා, ඔවුන් ඔසවා තැබීම සඳහා අපේ ආදායම් බදු පනත ශක්තියක් වෙයි කියලා මම හිතනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 3.50]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා ලියපු "බදු දඩයම" කියන පොත මම ඊයේ කියෙව්වා. "බදු දඩයම" කියන පොත කියවද්දී මට තේරුණා, අපේ මේ නව බදු පනත තමයි ෆොටෝ කොපි ගහලා එතුමාත් පිටු කිහිපයක් එකතු කරලා, නමක් දාලා, කවරයක් දාලා නිකුත් කරලා තිබෙන්නේ කියලා. ඒ පොතේ පිටු 280ක් තිබෙනවා. මේ පිටු 280න් 192ක්ම උපුටා ගැනීම් තිබෙන්නේ. පිටු 35ක් විතර තමයි මෙතුමා ලියලා තිබෙන්නේ. බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා දැන් මේ ගරු සභාවේ නැතත් මම එතුමාට කියනවා, මේ "බදු දඩයම" කියන පොතට "බදු පනතින් උපුටා ගැනීම" කියලා නම දැම්මා නම් ඊට වඩා හොඳයි කියලා. ඒ වාගේ වැඩක් තමයි බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කරලා තිබෙන්නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒකටත් tax එකක් ගහන්න ඕනෑ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා tax ගැන කියනවා. ඇත්තටම ඔබතුමන්ලා පිළිගන්නවා ද, අද රටේ සිටින අහිංසක දුප්පත් වැඩ කරන මිනිස්සු තමයි වැඩියෙන් බදු ගෙවන්නේ කියලා? ඒ ක්‍රමය වෙනස් කරන්න තමයි ගරු මුදල් ඇමතිතුමා, ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමා මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ. අපේ බදු ආදායමෙන් සියයට 80ක් වක්‍ර බදු. ඒ නිසා අඩු වැටුප් ලබන පිරිසට, දෛනික කුලී වැඩ කරන පිරිසට, සමෘද්ධිලාභීන්ට අසාමාන්‍ය බරක් දැරීමට සිද්ධ වෙලා තිබෙනවා මේ රට ගෙන යන්න. අපේ බදු ආදායමෙන් සියයට 80ක් වක්‍ර බදු. අපේ කම්කරුවා පරිප්පුවලට, සීනිවලට ගෙවන බද්දට සමාන බද්දක් තමයි කෝටිපතියාත් පරිප්පුවලට, සීනිවලට ගෙවන්නේ. මේක සාධාරණ ක්‍රමයක් ද? කවුරු හරි කියනවා නම් මේ ක්‍රමය වෙනස් කිරීම අවශ්‍ය නැහැ කියලා, මම හිතන්නේ ඒක මුලාවක් කියලායි. අපට මේ ක්‍රියාදාමය එක පාරටම කරන්න බැරි වෙයි. මේ නව පනත් කෙටුම්පත මඟින් ආරම්භයේදීම අඩුම ගණනේ සියයට 5කවත් වෙනසක් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

අපට ක්‍රමක්‍රමයෙන් මේ අනුපාතය 60:40 සීමාවටවත් ගෙනෙන්න පුළුවන් වුණොත්, වැඩ කරන සමස්ත දුප්පත් අහිංසක මිනිසුන්ට ලොකු සහනයක් වෙනවා. රටක් දියුණු කරන්න බදු අවශ්‍යයි. අපි බදු අය කර ගැනීමේදී ඇති තැනින් තමයි ගන්න ඕනෑ. මේ නව පනත ඒකට ලොකු පිටුවහලක් වෙයි කියලා බලාපොරොත්තු වනවා.

විශේෂයෙන්ම දෙමව්පියන්ගෙන් දරුවන්ට දේපළ පැවරීමේදී බදු අය කිරීමක් ගැන කථා වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දරුවන් හතරදෙනෙක් ඉන්නවා නම්, ඒ දරුවන්ගේ පියාට ගෙවල් හතරක් තිබෙනවා නම්, ඒ දරුවන් හතර දෙනාට එක නිවස ගණනේ දෙනකොට බද්දක් අය වෙන්නේ නැහැ. එහෙම නිවාස තිබෙන අයත් අද සමාජයේ ඉතාම අඩුයි. හැබැයි, අපි දන්නවා පසුගිය කාලයේ කෝටි ගණන් වටිනා ගෙවල් හදපු අය මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා කියලා. එක එක "ඇඩ්‍රස්" වල ගෙවල්

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

දෙක, තුන, හතර, පහ තියෙන අය ගැන පසුගිය කාලයේ අපට හෙළි වුණා. සමහරුන්ගේ බිරින්දෑවරුම කිව්වා, තමන්ගේ ස්වාමිපුරුෂයාට අරහේ ගෙයක් තිබෙනවා, මෙහේ ගෙයක් තිබෙනවා, අර "ඇඩ්රස්" එකේ ගෙයක් තිබෙනවා, මේ "ඇඩ්රස්" එකේ ගෙයක් තිබෙනවා කියලා. ඒ වාගේ අසාධාරණ විධියට ගෙවල් තියෙන අයගෙන් බදු අය කර ගත්තාට තිබෙන වරද මොකක්ද? සමහරුන්ට තිබෙන දේපළ පිළිබඳව අපි ඊයේ පෙරේදා දැන ගත්තා. අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ කථාවේදී අපි අහගත්තා හිටපු රජ පවුල්වලට තිබෙන දේපළ ගැන. එතකොට ඒවා තව කෙනෙකුට පවරද්දී බද්දක් ගැහුවාම මොකක්ද තිබෙන අසාධාරණය? ඩේසි ආච්චිගේ මැණික් මල්ලෙන් ගත්ත ගෙවල් තිබෙනවා. ඒවා කාට හරි පවරද්දී බදු අය කර ගත්තාම මොකක්ද තිබෙන අසාධාරණය?

ගරු මංගල සමරවීර ඇමතිතුමා පොළොවේ පය ගහලා ඉන්න ඇමතිවරයකු විධියට, ප්‍රායෝගික ඇමතිවරයකු විධියට, ඒ වාගේම, එතුමාත් එක්ක එකතුවෙලා වැඩ කරන ආර්ථික විශේෂඥයකු වන අපේ ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා සමඟ මේ හදලා තියෙන්නේ රටේ ඉදිරි ගමන තීන්දු කරන, ඉදිරි අනාගතයේ අපේ දරුවන්ගේ ආර්ථිකය, රටේ ආර්ථිකය තීන්දු කරන ඉතා වැදගත් පනත් කෙටුම්පතක්. විශේෂයෙන්ම අද අපට ඉදිරියට යන්න නම්, වේගවත් ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීම අරමුණුකොටගෙන ආයෝජන දිරි ගැන්වීම සඳහා අනුබල දෙන වැඩ පිළිවෙළක් තියෙන්න ඕනෑ. අපේ රටට ආයෝජකයන් ආකර්ෂණය වන වැඩ පිළිවෙළක් තියෙන්න ඕනෑ.

අපි දන්නවා, අපේ රටට පැමිණෙන ආයෝජකයන් මුහුණ පාන ගැටලු පිළිබඳව. අපේ රටට එන සමහර ආයෝජකයන් මේ රටේදී වන ප්‍රමාද දැක්කාම එක සතියකින් ආපසු හැරිලා යනවා. අපේ රට තියෙන්නේ ඉතාම වැදගත් ආර්ථික මර්මස්ථානයක. ලෝක ජනගහනයෙන් තුනෙන් එකක් වාසය කරන්නේ අපේ කලාපයේ. ඉන්දියාව, චීනය, ඉන්දුනීසියාව, මැලේසියාව වාගේ රටවල් තිබෙන මේ කලාපයේ තමයි අද වැඩිම ජනගහනයක් ඉන්නේ. මේ රට හොඳ වෙළඳ පොළක් හදන්න පුළුවන් තැනක්. ඒක වර්ධනය කරන්න නම් අපි ආයෝජකයන් දිරිමත් කරන්න ඕනෑ. අද අපේ රටට එන ආයෝජකයන් හැරිලා ගිහිල්ලා බංග්ලාදේශයේ ආයෝජනය කරනවා; මියන්මාරයේ, වියට්නාමයේ, ලාඕසයේ ආයෝජන කරනවා. අපි ඒ ආයෝජකයන් දිරිමත් කරන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළේ නැත්නම් ඉදිරියේදී මේ රට තවදුරටත් ඉස්සරහට නොවෙයි, පස්සට තමයි යන්නේ. අපි දැනටත් අවුරුදු විස්සක තිහක පසුගමනක ඉන්නේ. අපි වෙනත් රටවලට වඩා පිටු පසින් ඉන්නේ. අපි මෙතැන ඉන්න ඕනෑ රටක් නොවෙයි. අපි මීට වඩා තව ගව් ගණනක් ඉදිරියෙන් ඉන්න තිබුණු රටක්. ඉතින් දැන්වත්, ඒ රට නිවැරදි මාවතක් වෙත තල්ලු කරගෙන යන්න අවශ්‍ය ගාමක බලයක් දෙන්න තමයි මේ පනත් කෙටුම්පත ගෙනැත් තිබෙන්නේ. ඒ නිසා මෙය වැරැදි විධියට දකින්න එපා. මේ ගැන සුබවාදීව දකින්න. අපට ඕනෑ නැහැ, අහිංසක දුප්පත් මිනිසුන් තළා පෙළා බදු ගන්න. බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තිබෙනවා, කොහොමද බදු අය කර ගන්න ඕනෑ කියන කාරණය. ඒ නිසා අපි මල නොතලා රොන් ගන්නවා වාගේ ධනපතියෙකුට වුණත් දැනෙන්නේ නැති විධියට බදු අය කර ගන්න ඕනෑ. අද ධනපතියන්ගෙන් නොවෙයි නේ බදු ගන්නේ. සියයට 80ක්ම බදු ගන්නේ අහිංසක දුප්පත් මිනිසුන්ගෙන් නේ. ඒ නිසා සාර්ථක බදු ක්‍රමයක් ක්‍රියාත්මක කරන්න පුළුවන් හොඳ පනත් කෙටුම්පතක් විධියට මම මේ පනත් කෙටුම්පත හඳුන්වන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට බොහොම ස්තුතියි.

[பி.ப. 3.56]

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உள்நாட்டு இறைவரிச் சட்டமூலம் தொடர்பான இன்றைய விவாதத்திலே பேசுவதற்கு எனக்கும் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். ஒரு நாட்டின் சட்டவிதிகளின்படி ஒவ்வொரு குடிமகனும் ஒவ்வொரு நிறுவனமும் வருமான வரி செலுத்தவேண்டும் என்பது கட்டாயமாகும். அதிக வருமானம் ஈட்டுபவர் அதிக வரியையும் குறைந்த வருமானம் ஈட்டுபவர் குறைந்த வரியையும் செலுத்துவதுதான் நியாயமானது. ஆனால், இலங்கையைப் பொறுத்தவரையில் அவ்வாறான ஒரு நிலை காணப்படுகின்றதா? என ஆராய்ந்து பார்க்கும்போது, 2016ஆம் ஆண்டிலே இலங்கையின் மொத்த வரி வருமானத்தில் நேர்வரியின் பங்களிப்பானது 17.7 வீதமாகவும் நேரில் வரியின் பங்களிப்பானது 82.3 வீதமாகவும் காணப்பட்டது. இந்த நிலைமையானது முற்றிலுமாக மாற்றமடைய வேண்டும். நேரில் வரியானது பொருட்கள், சேவைகள் மற்றும் விற்பனைகள்மீது வரி விதிப்பதன்மூலம் பெற்றுக்கொள்ளப்படுவதாகும். இதனால், குறைந்த வருமானம் பெறுபவர்கள் பொருட்கள், சேவைகள் ஊடாக அரசுக்கு அதிக வரியினைச் செலுத்துகின்றனர். இந்நிலைமையானது நாட்டில் மென்மேலும் வருமான ஏற்றத்தாழ்வினை அதிகரிக்கச் செய்வதுடன் பணவீக்கம், வறுமை என்பவற்றையும் அதிகரிக்கக்கூடிய ஒரு சந்தர்ப்பத்தை ஏற்படுத்திக் கொண்டிருக்கின்றது.

சிறந்த வரிக்கொள்கை நாட்டில் அறிமுகப்படுத்தப்பட வேண்டுமாயின், அரசாங்கமானது நேரில் வரியில் தங்கியிருக்காது நேர்வரிமூலம் வருமானத்தை அதிகரிக்கக்கூடிய வகையில் தமது கொள்கைகளை அமைத்துக்கொள்ள வேண்டும். அந்தவகையிலே, நிதியமைச்சர் அவர்கள் உள்நாட்டு இறைவரித் திருத்தச் சட்டத்தினூடாக, 80 வீதமாக இருக்கின்ற நேரில் வரியினை 60 வீதமாகக் குறைப்பதற்கு நடவடிக்கை எடுத்திருப்பதையிட்டு நான் எனது பாராட்டினைத் தெரிவித்துக்கொள்கின்றேன். ஆனாலும், ஏற்கெனவே இங்கு பலர் குறிப்பிட்டதைப் போன்று இந்த வரிகளை அறவீடு செய்கின்றபோது, இலங்கையிலுள்ள சகல பிரஜைகளும் ஒரே மட்டத்திலே மதிக்கப்படுவதுதான் மிகவும் பொருத்தமற்ற ஒரு நிலையாகக் காணப்படுகின்றது.

இறைவரித் திணைக்கள இணையத்தளத்தின் முன்பக்கத்தில், "பெருமைகொள்ளக்கூடிய பிரஜையாக விளங்குதல்; தங்கள் சம்பாத்தியத்தின் ஒருசிறு பகுதியினை எதிர்காலத் தலைமுறைகளுக்கான தேசத்தைக் கட்டியெழுப்புவதற்காகப் பங்களிப்புச் செய்தல்" என்று விளம்பரம் செய்யப்பட்டிருக்கின்றது. தனது சம்பாத்தியத்தின்மூலம் எதிர்காலச் சந்ததிக்கு ஒரு பிரஜை பங்களிப்புச் செய்வது என்பது எவ்வளவுதூரம் இந்த நாட்டிலுள்ள சகலருக்கும் பொருந்தும் என்பதை இங்கு ஒரு கேள்வியாக முன்வைக்க விரும்புகின்றேன். இதிலும் குறிப்பாக, இலங்கையைப் பொறுத்தவரையில், இன்று 30 வருட கால யுத்தத்திலிருந்து மீண்டிருக்கின்ற வடக்கு, கிழக்கு மாகாணப் பிரஜைகளையும் ஏனையவர்களையும் ஒரே பிரஜைகளாகக் கருதி, அவர்களிடமும் இந்த நேரில் வரியை அறவீடு செய்வது என்பது பொருத்தமானதாக இருக்கின்றதா? என்பதும் ஒரு கேள்விக்குறியாகும். அந்த மக்கள் இறுதி யுத்தத்திலே தங்களுடைய சொத்துக்களை இழந்திருக்கின்றார்கள்.

குறிப்பாக அவர்களின் அசையும் சொத்துக்களான பெறுமதிவாய்ந்த நகைகள் மற்றும் வாகனங்கள் என்பன தென்பகுதிக்கு அள்ளி வரப்பட்டிருக்கின்றன. இவ்வாறு கொண்டுவரப்பட்ட பொருட்கள் மற்றும் சொத்துக்கள் திரும்ப வழங்கப்படாதது மட்டுமல்ல, அதற்கான நஷ்ட ஈடுகள்கூட வழங்கப்படாத நிலை காணப்படுகின்றது. இவ்வாறு கையறு நிலையில் இருக்கின்ற மக்களிடமும் இந்த வரியை அறவீடு செய்வது என்பது பொருத்தமானதா?

யுத்த காலத்தில் அந்த மக்கள் தங்களுடைய பணத்தினை வங்கியில் வைப்பு செய்ததற்கான ஆவணங்களை வைத்திருக்கின்றார்கள். அதுமட்டுமல்ல, அரச வங்கிகளில் நகைகளை அடகு வைத்ததற்கான ஆவணங்களை இன்றும் வைத்திருக்கின்றார்கள். ஆனால், இவர்களுக்கான கொடுப்பனவுகள் இதுவரை வழங்கப்படவில்லை. இவ்வாறான நிலையில், யுத்தத்திலே நொந்துபோயிருக்கின்ற, சொத்துக்களை இழந்திருக்கின்ற மக்களிடமும் இந்த வரிகளைத் தொடர்ந்து அறவீடு செய்துகொண்டிருப்பது மிகவும் வேதனைக்குரிய விடயமாகும். இதற்கும் மேலாக யுத்தத்தில் அநியாயமாகப் படுகொலை செய்யப்பட்ட, உழைக்கின்ற வயதுடைய திறன்வாய்ந்த இளைஞர்களை இழந்துவிட்டுத் தாய் தந்தையர் நிர்க்கதியாகி இருக்கின்றார்கள். இன்று அங்கு புள்ளியிடல் திட்டத்தினூடாக வீடுகள் வழங்கப்படுகின்றபோது, தமது பிள்ளைகளை இழந்ததால் குறித்த புள்ளிகளைப் பெற முடியாதுள்ளார்கள். இதனால் யுத்தம் முடிவடைந்து ஒன்பது வருட காலமாகியபோதிலும் தகரக் கொட்டில்களிலும் தற்காலிகக் கொட்டகைகளிலும் வாழ்ந்து வருகின்றார்கள். ஆனால், இவர்களிடமும் நேரில் வரி தொடர்ந்து அறவீடு செய்யப்பட்டு வருகின்றது.

யுத்தத்திலே இறந்தவர்கள், காயமடைந்தவர்களுக்கான நட்ட ஈடுகளைக் கொடுப்பதற்கான பல சட்டங்கள் அல்லது பல கொள்கைகள் இருந்தும் அவை அனைத்தும் அவர்களுக்கு வழங்கப்படாத நிலைமைதான் காணப்படுகின்றது. எமது மக்கள் தொடர்ந்தும் அதற்கான நட்டஈடுகளைக் கோரும் விண்ணபங்களின் மூலமாகச் சம்பந்தப்பட்ட அமைச்சுக்களுக்கு விண்ணப்பித்திருந்தும், அவை வழங்கப்படாமல் இருக்கின்றன. வடக்கு, கிழக்குப் பகுதியிலே இவ்வாறு நஷ்டஈடுகளைப் பெற்றுக்கொள்ள முடியாமலும் வருமானத்தை ஈட்டிக்கொள்ள முடியாமலும் வாழ்ந்து வருகின்ற மக்களிடமும் இந்த வரிகளைத் தொடர்ந்து அறவிடுவதற்கான நிலைமை காணப்படுகின்றது. வெறுமனே அதிவேகப் பாதைகளை அமைப்பதனூடாகவோ, மின்சாரத்தை வழங்குவதனூடாகவோ, வானைத் தொடும் கட்டிடங்களை அமைப்பதனூடாகவோ அபிவிருத்தியை எட்டித் தொட்டுவிட்டதாகப் பொருள் கொள்ள முடியாது. ஏ-9 வீதியினூடாகப் பயணிக்கின்றபொழுது அபிவிருத்தியடைந்து காணப்படுவதாகக் கோலமிடப்பட்டிருக்கின்ற கிளிநொச்சி மாவட்டத்தையும் அதைக் கடந்துசென்று யாழ்ப்பாண மாவட்டத்தின் நகர்ப் பகுதிகளையும் பார்ப்பவர்கள், வட பகுதியானது யுத்தத்திலிருந்து மீண்டதன் பின்னர் அபிவிருத்தியை எட்டிவிட்டதென்று நினைக்கின்ற வகையிலே அங்கு பொருளாதாரக் கட்டமைப்புக்கள், உட்கட்டமைப்பு வசதிகள் ஆரம்பிக்கப்பட்டிருக்கின்றன. அப்பகுதிகள் அபிவிருத்தி செய்யப்பட்டு வருகின்றன. ஆனால், அங்கு வாழ்கின்ற மக்களது வருமானத்தை அதிகரிப்பதற்கு என்ன நடவடிக்கை எடுக்கப்பட்டிருக்கின்றது? என்பதை ஒரு கணம் சிந்தித்துப் பார்க்க வேண்டும்.

அங்குள்ள கைவிடப்பட்ட தொழிற்சாலைகள் இதுவரை மீளவும் அங்கு ஆரம்பிக்கப்படவில்லை. பரந்தன் இரசாயனத் தொழிற்சாலை, ஆனையிறவு உப்பளம், முல்லைத்தீவு மாவட்டத்தில் ஒட்டுசுட்டானிலுள்ள ஓட்டுத் தொழிற்சாலை போன்றவைகளை மீள ஆரம்பிப்பதற்கான ஆக்கபூர்வமான நடவடிக்கைகள் இதுவரை எடுக்கப்படவில்லை. கடந்த வரவு செலவுத்திட்டத்திலே ஒட்டுசுட்டான் ஓட்டுத் தொழிற்சாலையை மீள ஆரம்பிப்பதெற்கென நிதி ஒதுக்கீடு செய்யப்பட்டது. அதற்குரிய செலவுகளும் அந்த அறிக்கையிலே காட்டப்பட்டிருந்தது. ஆனால், அங்கு ஆக்கபூர்வமான செயற்பாடுகள் நடைபெற்றிருக்கின்றனவா என்றால், அது கேள்விக்குறியாகவே காணப்படுகிறது. இந்த ஓட்டுத் தொழிற்சாலை மீளஆரம்பிக்கப்பட்டிருக்குமாக இருந்தால், அங்கு வேலையற்றிருக்கின்றவர்களுக்கு வேலைவாய்ப்புக் களை வழங்கியிருக்க முடியும்; அத்தோடு, மீள்குடியேற்றத் திற்காக வட பகுதியிலே கட்டப்பட்ட வீடுகளுக்கான ஓட்டுத் தேவையையும் பூர்த்தி செய்திருக்க முடியும்; தென்பகுதியிலிருந்து கொண்டுவருகின்ற ஓடுகளுக்காகப் பெருமளவு பணத்தைச் செலவழிக்க வேண்டிய அவசியம் எமது மக்களுக்கு ஏற்பட்டிருக்காது. அந்த வகையில், வேலைவாய் ப்பை வழங்கக்கூடிய ஒரு சூழலை உருவாக்குவதை விடுத்து, வரி அறவீட்டில் எதுவித மாற்றத்தையும் மேற்கொள்ளாது இலங்கையிலே ஏனைய பிரசைகளிடம் அறவிடுவதுபோல் வடக்கு, கிழக்குப் பகுதியிலே யுத்தத்தினால் பாதிக்கப்பட்ட மக்களிடமும் தொடர்ந்து வரி அறவிடுவது வேதனைக்குரியதாகும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ உறுப்பினர் சுமந்திரன் அவர்களுக்குரிய நேரமும் எனக்கு வழங்கப்பட்டிருக்கின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
உங்களுக்கு 10 நிமிடங்கள் ஒதுக்கப்பட்டிருந்தன. அந்த நேரம் முடிவடைந்துவிட்டது.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)
ஒரு நிமிடம் தாருங்கள்!

எனவே, வடக்கு, கிழக்குப் பகுதிகளில் வாழ்கின்ற யுத்தத்திலே பாதிக்கப்பட்ட மக்களை விசேடமானவர்களாகக் கருதி, அவர்களுக்கான வருமானத்தை ஈட்டக்கூடிய வகையிலே தொழில் வாய்ப்புக்களை ஏற்படுத்தி, இந்த வரியை அறவீடு செய்வதற்கு நடவடிக்கை எடுக்கவேண்டுமென்று தயவுடன் கேட்டுக்கொள்கின்றேன். நன்றி.

[අ.භා. 4.06]

ගරු එස්. ප්‍රේමරත්න මහතා
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මංගල සමරවීර මැතිතුමාගේ -අපේ දිස්ත්‍රික්කයේ හිටපු නායකයාගේ-

[ගරු එස්. ප්‍රේමරත්න මහතා]

අමාත්‍යාංශයට අදාළ දේශීය ආදායම් පනත් කෙටුම්පත දෙවැනිවර කියැවීමේ විවාදය පැවැත්වෙන මේ මොහොතේ ඒ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව අමතන්න ලැබීම පිළිබඳව මා ඉතාම සතුටට පත් වනවා. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේත් මමත් මේ පාර්ලිමේන්තුවට මෙවර ආවේ එකම දිස්ත්‍රික්කයකින් බව මා මුලින්ම මතක් කරන්න කැමතියි. අප දෙදෙනාගේම මනාප ගොඩ ඇතුළේ තිබුණේ මාතර දිස්ත්‍රික්කයේ මිනිසුන්ගේ කරගැටවලින් -අත්වලින්- වැදිච්ච මනාප. මාතර දිස්ත්‍රික්කයේ මිනිසුන්ගේ පපුවේ හිටියේ "මංගල මහත්තයා". තමුන්නාන්සේ හොරෙක් නොවීම ගැන තවමත් මාතර මිනිසුන් ගෞරවයෙන් කථා කරනවා. හැබැයි, ගරු ඇමතිතුමනි මා දන්නා සත්‍ය මේකයි. මිනිසුන් ආදරය කරපු මංගල මහත්තයා මේ වනකොට තමුන්නාන්සේගේම කණ්ඩායම විසින් පස් යට දමා අවසානයි.

ගරු ඇමතිතුමනි, කොහොම වුණත් මේ පනත් කෙටුම්පතට අදාළව සංශෝධන සියයකට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න එනකොට නඩු හයක් උසාවිය සඳහා ඉදිරිපත් කළා. උසාවිය විසින් දෙන ලද සමහර නියෝග සහ යම් යම් උපදෙස් පිළිපැදලාද, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ කියලා මා මුලින්ම ඔබතුමාගෙන් දැනගන්න කැමතියි, ගරු ඇමතිතුමනි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
සංශෝධන සියල්ල ඇතුළත් කර තිබෙනවා.

ගරු එස්. ප්‍රේමරත්න මහතා
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)
ගරු ඇමතිතුමනි, "සාධාරණ බවේ සංකේතය" කියායි සමහර වෙලාවට සෘජු බදු හඳුන්වන්නේ. අද දවස පුරා කථා කළ ගරු මැති -ඇමතිවරුන් විසින් බොහොම දාර්ශනික අදහස් ඉදිරිපත් වුණා. බදු ගැන, ආර්ථිකය ගැන, ආර්ථික විද්‍යාව ගැන විවිධ අදහස් මතු වුණා. හැබැයි, ආණ්ඩුවක් විධියට මේ රටේ මිනිසුන්ට අප කොයි තරම් සාධාරණයක් ඉටු කරනවාද කියන කාරණය පිළිබඳව අප අවසානයේදී බලන්න ඕනෑ, ගරු ඇමතිතුමනි.

බදු ගැන කථා කරන්න කලින් තමුන්නාන්සේට මා මේ කාරණය කියන්න කැමැතියි. පාසල් යා යුතු වයසේ ඉන්න එහෙත් පාසල් නොයන දරුවන් 461,000ක් මේ වනකොට අපේ රටේ ජීවත් වනවා, ගරු ඇමතිතුමනි. ඒ 461,000 අතුරින් දරුවන් 52,000ක් ජීවිතයේ කවදාවත් පාසල් ගිහිල්ලා නැහැ. පාසල් යා යුතු වයසේ ඉන්න දරුවන්ගෙන් සියයට 9.9ක් දරුවන් අද වනවිට පාසල් යන්නේ නැහැ. එවැනි රටක් තමයි අද වනවිට අපි මේ ජීවත් වන ලංකාව. මේ රටේ සියයට 9.9ක් පමණ දරුවන් ප්‍රමාණයක් අද වනවිට පාසල් යන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, මා මේ සංඛ්‍යා ලේඛන තමුන්නාන්සේට ඉදිරිපත් කරන්න කැමැතියි. කම්කරු අමාත්‍යාංශය මඟින් කරන ලද සමීක්ෂණයක් අනුවයි මා මේ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කළේ. වෘත්තීය පුහුණු අමාත්‍යාංශය විසින් තොරතුරු ඉල්ලනවා, රටේ තරුණයන් කොයි වාගේද, රටේ දරුවන් කොයි විධියටද ඉන්නේ කියලා. ඒ වාර්තාවට අනුව අද වනවිට අපේ රටේ පාසල් යා යුතු වයසේ ඉන්න දරුවන්ගෙන් 461,000ක් දරුවන් පාසල් යන්නේ නැහැ. ඒ එක්කම ගරු ඇමතිතුමනි, අද වනවිට අපේ රටේ දසලක්ෂයකට වැඩි මිනිසුන් ප්‍රමාණයක් දවසේ එක වේලක් විතරක් කාලා ජීවත් වනවා. දවසේ එක වේලක් විතරක් කාලා දසලක්ෂයකට වැඩි පිරිසක් අද වනවිට මේ රටේ ජීවත් වනවා.

හැබැයි, අවසානයේ අපට අහන්න තිබෙන ප්‍රශ්නය මේකයි. දසලක්ෂයක් මිනිස්සු එක වේලක් කාලා ජීවත් වනකොට, 461,000කට වැඩි දරුවන් පිරිසක් පාසල් නොයා ඉන්න කොට මේ ඉන්න නායකයෝ, අපට නායකයන් විධියට දකින්න පුළුවන්ද, ගරු ඇමතිතුමනි? මේ ඉන්න නායකයන්, නායකයෝද? මේ ඉන්න නායකයන් පොරොන්දු දෙන්නේ කාටද? ගරු ඇමතිතුමනි, 461,000ක් වාගේම දසලක්ෂයක් වාගේ පිරිසක් ඒ විධියට දුක්ඛ දෝමනස්සයන්ට මුහුණ දෙමින් සිටියදී පසුගිය දවස් කීපය ඇතුළේ අපේ රට ෆොන්ටෙරා සමාගමට දුන්නු බදු සහනය කොයි තරම්ද කියලා මා ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමතියි. එමෙන්ම බියර් සමාගම්වලට තමුන්නාන්සේලා දුන්නු බදු සහනය කොයි තරම්ද කියාත් මා දැනගන්න කැමැතියි. තමුන්නාන්සේලා රිංගන්න පුළුවන් හැම තැනටම රිංගුවා. රිංගන්න පුළුවන් හැම තැනටම රිංගලා බදු ගැහුවා. බදු ගහන්න ඕනෑ පනත් කෙටුම්පත හැදුවා. පන්සලට, කෝවිලට, පල්ලියට, මරණාධාර සමිතියට, වෛද්‍ය සභාවට බදු ගහනවා. ගහන්න පුළුවන් හැම තැනටම රිංගලා බදු ගහනවා. හැබැයි, හැම කෙනෙකුටම බදු ගහලා බදු ගහලා තමුන්නාන්සේලාගේ හෙංචයියන්ට, තමුන්නාන්සේලාගේ අනුගාමිකයන්ට දෙන්න පුළුවන් උපරිම බදු සහන තමුන්නාන්සේලාගේ ආණ්ඩුව විසින් ලබා දෙනවා. මා උදාහරණ සහිතව මේ කාරණය පිළිබඳව කියන්න කැමතියි, ගරු ඇමතිතුමනි.

තමුන්නාන්සේලාගේ ආණ්ඩුව මේ වනවිට මේ රටේ මිනිසුන්ට දුන්නු බලාපොරොත්තු සුන් කරලා, කඩා ඉඹිරවා දමා අවසානයි. ජනවාරි මාසයේ 08වැනිදා තමුන්නාන්සේලා ජනතාවට ලබා දුන්නේ මේ සිහින ලෝකය නොවෙයි. ජනවාරි මාසයේ 08 වැනිදා පෙන්වපු සිහින ලෝකයට අහු වුණු මේ රටේ 62,000කට වැඩි මිනිසුන් ප්‍රමාණයක් අදටත් බලාගෙන ඉන්නවා, ඊළඟ කතිරයෙන් තමුන්නාන්සේලාට කරපු වරද නිවැරදි කරන්න, ගරු ඇමතිතුමනි.

ගරු මුදල් ඇමතිතුමනි, මේ පනත් කෙටුම්පත හරහා වෘත්තිකයන්ට බදු ගහනවා. කවුරුන් හෝ වෘත්තිකයෙක් මේ රටට ඇවිල්ලා සේවයක් කළාම ඔහුගේ මුදල බදුවලින් නිදහස් කරනවා. නමුත් වෙනත් රටක සේවයක් කරලා, වෘත්තියක් කරලා මේ රටට මුදල් අරගෙන එන විට ඒක බද්දට යටත් වෙනවා. ගරු ඇමතිතුමනි, මේ කරන්න හදන්නේ වෙන මොනවත් නොවෙයි මේ රටේ සිටින වෘත්තිකයන්ට වෘත්තිය එපා කරවීම. ගරු ඇමතිතුමනි, අනෙක් පැත්තෙන් අපට හැඟෙන දේ තමයි අපේ රටේ වෘත්තිකයන්ට වෘත්තිය එපා වෙන කොට තමුන්නාන්සේලාගේ ඉන්දියන් කොලනියේ ඉන්න වෘත්තිකයන්ට මෙහාට රිංගන්නට ලෙහෙසියි. ඒ අවශ්‍යතාව මේ රට තුළ හැදෙනවා. මේ රට තුළ හැදෙනවා. මේ රටේ වෛද්‍යවරයා කලකිරිලා තමන්ගේ වෘත්තිය අතහැරලා වෙන රටකට යන විට රට තුළ හැදෙන හිඩසට තමුන්නාන්සේලාගේ ඉන්දියානු කොලනියේ වෛද්‍යවරුන්ට එන්නට ඉඩ තිබෙනවා, වෘත්තිකයන්ට එන්නට ඉඩ තිබෙනවා. ඒ ඉඩ තමයි තමුන්නාන්සේලා මේ පනත් කෙටුම්පත් තුළ සුරක්ෂිත කරලා තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, උදැල්ලට වැඳලා, කැත්තට වැඳලා, දෑ කැත්තට වැඳලා කුඹුරට බැහැපු, හාල් මල්ලට වැඳලා, කුරුණියට වැඳලා අන්තිමට බත ලිපේ තියන විට බතටත් වැන්ද රටක් අපි. බතටත් වැන්ද රටක්. මේ රට හැදුණේ සංස්කෘතියක් ඇතුළේ. ඒ සංස්කෘතිය තුළ හැදුණු රටේ මිනිසුන්ගේ ජීවනෝපාය වුණු කෘෂිකර්මය මේ වන විට වළපල්ලට ගිහිල්ලා ඉවරයි. වළපල්ලට ගිහිල්ලා ඉවරයි.

ගරු ඇමතිතුමනි, අපි මාතර දිස්ත්‍රික්කයේ ජීවත් වෙන්නේ. මාතර මිනිසුන්ගේ ප්‍රධාන භව භෝගය වෙන්නේ තේ

කර්මාන්තය. නමුත් 2015 ජනවාරි 08වෙනි දා වන විට තේ පොහොර මිටියක මිල තිබුණේ රුපියල් 1,200යි, තේ දළු කිලෝවක් සඳහා ලැබුණු මිල රුපියල් 95යි. අද තේ පොහොර මිටියක මිල රුපියල් 3,200යි. නමුත් තේ දළු කිලෝවක් සඳහා ලැබෙන්නේ රුපියල් 95යි. පොහොර මිටිය රුපියල් 1,200ට තියන විටත් තේ දළු කිලෝවකට ලැබෙන්නේ රුපියල් 95යි, රුපියල් 3,200ක් දීලා පොහොර ටික අරගෙන ඉඩමට දාලා ගන්න දළු කිලෝවකට ලැබෙන්නෙත් රුපියල් 95යි. මාතර දිස්ත්‍රික්කයේ සමහර තැන්වල මිනිසුන්ට කඩෙන් ණයට බඩු දෙන්නේ නැහැ. තේ දළු සල්ලි ලැබුණාම බිල ගෙවනවා කිව්වාට කඩේකින් බඩු ටිකක් දෙන්නේ නැහැ. ඒ තරම් අසරණ භාවයට පත් වෙලා ඉවරයි.

ගරු ඇමතිතුමනි, ඒ එක්කම තමුන්නාන්සේලා එක පැත්තකින් කෘෂිකර්මය විනාශ කරලා දාන විට අනෙක් පැත්තෙන් මොකක්ද කළේ? තමුන්නාන්සේලා ප්‍රීමා සමාගමට දෙන්න පුළුවන් උපරිම සහන ටික දුන්නා. තමුන්නාන්සේලා පසුගිය අවුරුදු දෙකේ විතරක් ප්‍රීමා සමාගමට රුපියල් කෝටි 3,000ක සහනයක් දුන්නා. ප්‍රීමා සමාගමට කෝටි 3,000ක සහනයක් දුන්නා. මම අහන්නට කැමැතියි, මේ රටේ මිනිස්සු මේ ආණ්ඩුවෙන් බලාපොරොත්තු වුණේ මේකද කියලා. මේ රටේ මිනිස්සු බලාපොරොත්තු වුණේ මේකද?

ගරු ඇමතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ ඉන්න බොහෝ ඇමතිවරු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

නමුත් ඔවුන් ගියේ මේ රටේ තිබෙන කීර්තිමත් විද්‍යාලවලට. කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රධාන පෙළේ_පාසල්වලට ගියේ. හැබැයි ඒ කිසිම පාසලක දිසාපාමොක් කෙනෙක් ඒ මිනිසුන්ට අවංකකමයි, මනුස්සකමයි උගන්වලා නැහැ. ඒක තමයි ඇත්ත. ඒ මිනිසුන්ගේ දරුවන් හෙට දවසේ ඒ මිනිසුන්ගෙන් මොකක් හෝ ප්‍රශ්නයක් ඇහුවොත් සාධාරණ උත්තරයක්, නිශ්චිත උත්තරයක් දෙන්නට බැරි වෙනවා. ඒ නිසා ඒ මිනිසුන්ගේ දරුවෝත් හෙට දවසේ හොරුන් වෙනවා හැරෙන්නට සාධාරණ මිනිස්සු විධියට මේ සමාජයට එන්නේ නැහැ. ඒක තමයි ඇත්ත. තමුන්නාන්සේලා බදු ගහලා බදු ගහලා මේ රටේ මිනිසුන් දාන්න පුළුවන් යටම තැනට දාලා ඉවරයි.

මම ආරාධනා කරනවා තමුන්නාන්සේලාට පුළුවන් නම් ගිහින් මහරගම පිළිකා රෝහල බලන්න කියලා. මහරගම පිළිකා රෝහලට ගිහින් බලන්න. "දෙරණ" නාලිකාව අහිංසක මිනිසුන් සමඟ එකතු වෙලා පිළිකා රෝහලට යන්ත්‍රයක් ගෙනාවා. මම සෞඛ්‍ය ඇමතිවරයාගෙන් අහන්නට කැමැතියි, -සෞඛ්‍ය ඇමතිවරයාට ප්‍රශ්නයක් නැහැ. එතුමා යන්නේ සිංගප්පූරුවේ නිසා- කෝ ඒ යන්ත්‍රය කියලා. යන්ත්‍රයේ මුදල් සොයා ගත්තත් ගොඩනැඟිල්ල හදා ගන්න බැරි පජාත ආණ්ඩුවක් මේක. මිනිස්සු දහස් ගණනක් මැරෙනවා. මිනිස්සු දහස් ගණනක් මැරෙනවා. මිනිස්සු දහස් ගණනක් මැරෙද්දී මැරෙන්න ඉන්න මිනිහාට ගේන බෙහෙත් ටිකටත් බදු ගහලා, ඒ බෙහෙත් ටිකෙන් කොමිස් අරගෙන ඒ මිනිසුන් නොමරා මරාගෙන කන ආණ්ඩුවක් බවට මේක පත් වෙලා ඉවරයි.

මහත්වරුනි, මම අවසාන වශයෙන් එක දෙයක් කියන්නට කැමැතියි. මේ ගතවන දශකය තමුන්නාන්සේලාගේ ජඩ, තමුන්නාන්සේලාගේ පර, තමුන්නාන්සේලාගේ විජාතික සහ තමුන්නාන්සේලාගේ ජරාජීර්ණ දේශපාලනයේ අවසාන දශකයයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු එස්. ප්‍රේමරත්න මහතා
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට එක විනාඩියක් දෙන්න. දැස් පේන්නේ නැති මිනිහෙකුට වැරහැල්ලක් අන්දලා හරිම ලස්සනයි කියලා අපි කවුරුත් කිව්වොත් ඒ මනුස්සයාත් හිතනවා, ඔව්, මට ඇන්දුවේ ලස්සන ඇඳුමක් කියලා. ඒ මිනිහා සතුටු වෙනවා, ඒ මිනිහාට පේන්නේ නැති නිසා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මිනිස්සුත් ඒ වාගේ තමයි. මේ රටේ මිනිසුන්ටත් ඇස් පෙන්නේ නැති නිසා වැරහැල්ලක් අන්දලා "ලස්සනයි, ලස්සනයි, ලස්සනයි" කියලා හැමෝම කිව්වාම ඒක ලස්සනයි කියලා පිළිගන්නවා වාගේ තමයි කටයුතු කරන්නේ. මේ රටේ දේශපාලනඥයාට ඕනෑ මෝඩ ජනතාවක් සිටින රටක්. එවැනි මිනිස්සු මේ රටේ නිර්මාණය වෙනවා. මිනිස්සු නොකා නොබී හරි ක්‍රිකට් බැලුවා. ඒ නිසා තමයි ක්‍රිකට් බලන මිනිස්සු-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

ගරු එස්. ප්‍රේමරත්න මහතා
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)
ක්‍රිකට් ක්‍රීඩාවක් නැති තැනට ගෙනාවා. අවසානයේ මිනිසුන්ට විඳින්නට දෙයක් නැහැ, මිනිසුන්ට කන්න දෙයක් නැහැ. සතුටක් නැති රටක් බවට මේ රට පත් වෙලා ඉවරයි. අවසාන වශයෙන් මම කියනවා, බොහෝම කෙටි කාලයකින් මේ රටේ මිනිසුන් කතිරයෙන් තමුන්නාන්සේලාට-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සෑහෙන වේලාවක් දුන්නා ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

මීළඟට, ගරු සරත් අමුණුගම අමාත්‍යතුමා.

[අ.භා. 4.15]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (විශේෂ කාර්යභාර අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம- விசேட பணிப்பொறுப்புகளுக்கான அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of Special Assignment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රූපවාහිනිය තුළින් අපේ විවාද පෙන්වීමේ නරක ලකුණක් තමයි තර්ක විතර්ක ඉදිරිපත් කරන්නේ නැතිව නරඹන්නන්ට නොයෙක් කරුණු එළිදැක්වීම.

ඒ අයට ආස්වාදයක් දෙනවා මිසක්, අපේ සභාවේ බුද්ධිමත් තීරණ ගැනීමට කිසි විධියකින් ඒවා ප්‍රයෝජනවත් වෙයි කියලා මම කල්පනා කරන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම මෙය ඉතාම වැදගත් පනත් කෙටුම්පතක්. එම පනත් කෙටුම්පතේ එක එක විශේෂාංග අරගෙන අඩු පාඩු පෙන්වන්නට පුළුවන්. සමහරු ඒවා අඩු පාඩු හැටියට සලකනවා. සමහර අය ඒවා අවශ්‍ය වෙනස්කම්

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

හැටියට සලකනවා. නමුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට අපේ යුතුකම වන්නේ මෙම නීති-රීතිවල සම්පූර්ණ කරුණු සලකා බලා එක්තරා විග්‍රහයක් ඉදිරිපත් කිරීමයි. එම නිසා අද මම බලාපොරොත්තු වෙනවා, මෙම පනත් කෙටුම්පත තුළින් ඇත්ත වශයෙන් අපි බලාපොරොත්තු වෙන්නේ මොකක්ද කියලා පැහැදිලිව කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක ආර්ථිකයක් පවත්වාගෙන යනකොට, අවශ්‍ය දේ තමයි ආදායම. සමහරු අහනවා, "සල්ලි අච්චු ගසා බෙදන්න බැරි ඇයි?"කියලා. එතකොට ඕනෑ ඕනෑ අයට ඒවා බෙදා දෙන්න පුළුවන්. මම හිතන විධියට සමහර මන්ත්‍රීවරුන් වෙන වෙන වෘත්තීයවල යෙදෙන අවස්ථාවලදී ඒ වාගේ දේවල් තමයි කියන්නේ. "ආණ්ඩුවලට සල්ලි අච්චු ගසා බෙදා දෙන්න බැරි ඇයි?, ඔක්කෝම සතුටු කරන්න බැරි ඇයි?" වාගේ ප්‍රශ්න අහනවා. නමුත් යථා තත්ත්වය නම් යම් කිසි රටකට මොන විධියකින් හෝ එම ආදායම ලබා ගන්න බැරි වුණොත්, අපි හොඳයි කියලා හිතන ඒ සුබසාධන කටයුතු, සංවර්ධන කටයුතු අපට කරන්න බැහැ බැරි වෙන එකයි. ඒ නිසා අපි සුබසාධනය ගැන කථා කරනවා නම් ඒ කියන්නේ අධ්‍යාපනය ගැන කථා කරනවා නම්, සෞඛ්‍ය ගැන කථා කරනවා නම්, සමාජ සාධාරණය ගැන කථා කරනවා නම් ඒත් එක්කම අපිට කල්පනා කරන්නත්, කථා කරන්නත් වෙනවා මේ ඉතාම හොඳ දේවල් සඳහා අපි සල්ලි උපයන්නේ කොහොමද කියන එක. ඒ ප්‍රශ්නයටත් අපි වගකීමෙන් උත්තර දෙන්න සිද්ධ වෙනවා. හැම රජයක්ම කැමැතියි, මහ ජනයාට නොයෙක් දේවල් -සීනි බෝල- දෙන්න, නොයෙක් විධියේ පහසුකම් දෙන්න. ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයෙන් බලයට එන රජයන් අකමැති වෙන්නේ නැහැ, වැඩි වැඩියෙන් පහසුකම් දෙන්න.

දැන් ටිකකට ඉස්සෙල්ලා සඳහන් කළා වාගේ පාර්ලිමේන්තු මැතිවරණ පවත්වනවා. මහ ජනයා ඉදිරියට යනවා. ඒ නිසා රජය කැමැතියි, ඒවා දෙන්න. නමුත් එසේ දෙන්න පුළුවන් ආදායමක් ඒ රජයට තිබෙනවාද කියන එක තමයි ප්‍රශ්නය. ඒ අතින් බැලුවාම, අපේ රටේ බදු තුළින් එක්කාසු කරගෙන තිබෙන ආදායම තුලනාත්මකව බැලුවොත් ඉතාම සුළු ප්‍රමාණයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මගේ අතේ තිබෙන්නේ ඇමෙරිකාවේ බදු ආදායම සහ දළ දේශීය නිෂ්පාදනය අතර තිබෙන සම්බන්ධය දැක්වෙන වාර්තාවක්. දැන් බලන්න ඇමෙරිකා එක්සත් ජනපදයේ GDP එකට සියයට 26.4ක් එන්නේ බදුවලින්. එංගලන්තයේ සියයට 32.5ක්, ස්විට්සර්ලන්තයේ සියයට 27.9ක්, කැනඩාවේ සියයට 31.9ක්, ඉතාලියේ සියයට 43.3ක්. මේ සල්ලි ඔක්කෝම රජයට ලබා ගන්නේ බදු සල්ලි හැටියට. නමුත් අපි ලංකාව දිහා බැලුවොත් කොහොමද? 1990 වර්ෂයේ ලංකාවේ බදු ආදායම දළ දේශීය නිෂ්පාදනයත් එක්ක සංසන්දනය කළාම, සියයට 19.02යි. 2000 වර්ෂය වෙනකොට, ඒක සියයට 14.5ට බැස්සා. 2014 වර්ෂය වෙනකොට, සියයට 10.1ට බැස්සා. 2015 වර්ෂය වෙනකොට, සියයට 12.3යි. ඒ නිසා අපි ලෝකයේ අනෙක් රටවල් එක්ක බැලුවාම, මේ රටේ බදු අය කිරීම -ඒ කියන්නේ මේ රටේ සංවර්ධන වැඩවලට, සුබසාධන වැඩවලට දේශීය වශයෙන් රටක් හැටියට අපි ලබා ගන්නා ආදායම තුලනාත්මකව බැලුවාම- ඉතාම අඩුයි.

ඒ විතරක් නොවෙයි, මෙහි තවත් ස්වරූපයක් තිබෙනවා. අපේ රටේ බදු ආදායමෙන් සියයට 20යි අපි කෙළින්ම බදු හැටියට අය කරන්නේ. සියයට 80ක් වක්‍ර බදු හැටියට නොව වෙනත් වෙනත් බදු ක්‍රමවලින්, විශේෂයෙන්ම ජනතාවට ලැබෙන පළල් බදු ක්‍රම හැටියට තමයි මේ රටේ සල්ලි එකතු වන්නේ. ඒ නිසා නව පනත් කෙටුම්පතේ එක් ඉතාම වැදගත් අරමුණක් තමයි සියයට 20යි - සියයට 80යි අතර තිබෙන පරතරය වැඩි වැඩි වශයෙන් කෙළින්ම අය කරන බදු ප්‍රමාණය වැඩි කරලා වක්‍ර නොවන බදු ප්‍රමාණය අඩු කරන එක. ඒ අනුව මේක සහනදායී ක්‍රමයක්. කෙළින්ම බදු ගහන්නේ මේ රටේ ධනපති පන්තියට; කොම්පැනිවලට; විශාල වශයෙන් මුදල් තිබෙන අයට. VAT එක හරහා වෙන්න පුළුවන්, වෙන වෙන බදු අනුව වෙන්න පුළුවන් වක්‍ර නොවන බදු ගෙවන්නේ දුප්පත් මිනිස්සු. ඒ නිසා අපි මතක තබා ගත යුතු ප්‍රධාන දෙයක් තමයි මේ නව යෝජනා ක්‍රමය තුළින් බලාපොරොත්තු වන්නේ මේ අනුපාතය වඩ වඩාත් කෙළින්ම ගහන බදුවලට යොමු කරන්නයි කියන එක. ඒක හොඳ සමාජ පරිසරයකින් එන නීතියක් නොවෙයිද? අපි ඒක කල්පනා කරලා බලන්න ඕනෑ.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඍජු බදු ආවාම වක්‍ර බදු අඩු වෙනවාද? වැට් එක-

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔව්, ඔව්. අනුපාතයක් හැටියට අනිවාර්යයෙන්-[බාධා කිරීමක්] ඔබතුමා කලබල වෙන්නේ නැතිව ඉන්න. මම ඒක කියන්නම්. එකක් අනුපාත වශයෙන් අඩු වෙනවා; අනුපාත වශයෙන් ඒක වෙනස් වෙනවා.

[බාධා කිරීමක්] නැහැ, නැහැ. ඉන්න, අනෙක් එකත් කියන්නම්. කරුණාකර ලබන අය වැය එන තෙක් ඉන්න. කොයි විධියේ සහන ලැබෙනවාද කියලා එතකොට පෙනේවි. ඒ ගහන බදු මේකට ඇතුළත් කරන්න බැහැ නේ, ගරු මන්ත්‍රීතුමනි. සාමාන්‍යයෙන් අය වැයකින් ඒක එනවා. මෙතැන අරමුණ, ඒ අනුපාතය වෙනස් කිරීම බවයි අපි කියන්නේ. ඇත්ත වශයෙන්ම බැලුවාම ඒක ඉතාමත්ම ප්‍රගතිශීලී පියවරක් කියලා තමුන්නාන්සේලාත් පිළිගනීවි. වක්‍ර නොවන බදු අඩු වන්නේ කොහොමද කියලා අපට අය වැයෙන් බලා ගන්න පුළුවන්.

දෙවැනි කාරණාවට මම එන්න කැමැතියි. ඒ කාරණාව තමයි අපේ රටේ නව තාක්ෂණයට යන්න ඕනෑය කියන එක. අද මේ රටේ බදු අය කරන ක්‍රම, රටට ආදායම ලබා ගන්නා ක්‍රම හුඟාක්ම පැරණි නීති - රීති යටතේ ක්‍රියාත්මක වන දේවල්. ඒ විතරක් නොවෙයි, හොඳට මතක තියා ගන්න මේ රටේ දූෂණයට හුඟාක් දුරට මුල, දේශපාලන ව්‍යුහය වෙනස් කරන තරමට දූෂණය එන්නේ මෙන්න මේ වාගේ මූලස්ථාන හරහායි. මේ යෝජනාවල එකක් තමයි ඇමතිවරයාගේ බලතල සීමා වීම. ඒ වාගේම තවත් එකක් තිබෙනවා. දැන් හුඟ දෙනෙක් විවේචන කරනවා - මම හිතන්නේ මේ සභාව තුළත් ඒක ඇහෙන්න ඇති.- හැම එක්කෙනාටම බෙදෙන විධියට මේ files බලන්න ඉඩ දෙනවාද නැද්ද කියන එක ගැන. ඒක හොඳ දෙයක්ද? හැම දෙනාටම තීන්දු ගන්න ඉඩ දෙන එක හරිද? නැත්නම් ඒ ප්‍රධානීන්ට මේ ගැන දැඩි තීරණයක් ගන්න අවස්ථාව සැලසෙන එක වැරදි වෙන්නේ කොහොමද? අධීක්ෂණයක් තියෙන්න ඕනෑ. අද අපේ රටේ තිබෙන ලොකු ප්‍රශ්නයක් තමයි බදු අංශවල ප්‍රධානීන්ට මේවා හසුරුවා ගන්න බැරි වීම. පහළ මට්ටමේ ඉන්න අය ඒ අයට ඕනෑ ඕනෑ විධියට වැඩ කරනවා. රේගුව වෙන්න පුළුවන්, සුරාබදු වෙන්න පුළුවන්, ආදායම් බදු වෙන්න පුළුවන්. ඒවායේ එක්තරා ව්‍යුහයක් තියෙන්න ඕනෑ. එක එක්කෙනාට ඕනෑ, ඕනෑ විධියට නීති - රීති වෙනස් කර ගන්න පුළුවන් නම්, නවත්න පුළුවන් නම් ඒක තමයි දූෂණයට මුල. ඒ නිසා එක්තරා ව්‍යුහයක් අනුව මේ රටට ආදායම ලැබිය යුතුයි. මම දැනටමත් පෙන්වලා තිබෙනවා සංසන්දනාත්මකව බැලුවාම ඉතාම සුළු ප්‍රමාණයක් තමයි මේ රටට බදු හැටියට ලබා ගන්න සිද්ධ වන්නේ.

මේ සභාවේ අපි නිතර සාකච්ඡා කරන එක කාරණයක් මම කියන්න ඕනෑ. විදේශ ණය ගන්නවා; වෙන වෙන විකල්ප මාර්ගවලින් ආදායම ගන්නවාය කියා නොයෙක් විධියේ විවේචන එල්ල වෙනවා. ඇයි, අපි විකල්ප මාර්ගවලට ගිහිල්ලා ණය ගන්නේ? ඒ, දේශීය ඉතිරි කිරීම් අඩු නිසායි. දේශීය වශයෙන් අපට ලබා ගන්න පුළුවන් ආදායම වැඩි වුණොත්, එහෙම නම් අපට ණය ගන්න ප්‍රමාණය අඩු කර ගන්න පුළුවන්. ඒක සාමාන්‍ය බුද්ධිමත් ඕනෑම කෙනෙකුට තේරෙන දෙයක්. දේශීය වශයෙන් මුදල් එක්කාසු කර ගන්න බැරි වුණොත්, අපට පිට රටින් හෝ ඒ මුදල් ගන්න වෙනවා. ඒක මූල්‍ය කළමනාකරණයේ අඩු පාඩුවක්. දැන් බලන්න, දිනේෂ් ගුණවර්ධන මගේ හිතවත් මන්ත්‍රීතුමා හොඳට දන්නවා, -පසු ගිය රජය කාලයේ තමයි ඒක හොඳට කළේ,- පසුගිය කාලයේ විදේශ ණය ගන්නවා වෙනුවට, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

අපේ බැංකුවලින් ණය ගත්තා, දේශීය වශයෙන් ණය ගත්තා. දේශීය වශයෙන් නේද, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා? දේශීය වශයෙන් දේශීය බැංකුවලින් ගත්ත ණය ප්‍රමාණය අනුව අපට විදේශ ණය අඩු කර ගන්න පුළුවන් වුණා. නමුත් එක දෙයක් මම කියන්න ඕනෑ. ඒක අපි අවංකව මේ ගරු සභාවේදී සාකච්ඡා කරන්න ඕනෑ. මම නම් හිතන්නේ නැහැ, මේ දේශීය ණය ක්‍රමය තුළින් පමණක් අපේ ආර්ථික ප්‍රශ්න විසඳන්න පුළුවන් කියලා. බදු අය කර ගැනීමෙන් විතරක් අපට ප්‍රශ්න විසඳන්න බැහැ. එහෙම නැත්නම් අපට කියන්න වෙනවා, "පටි තද කර ගන්න" කියලා. ඒකෙනුත් ප්‍රශ්න විසඳන්න බැහැ. එහෙම නම් මේකට නියම විසඳුම මොකක්ද? නියම විසඳුම තමයි, මේ රටේ තිබෙන ආයතන, අපේ තිබෙන සියලුම කර්මාන්තශාලා, සියලුම නිෂ්පාදන ක්‍රමවලට ඒවා දියුණු කරන්න ඕනෑ. ඒවායින් වඩාත් හොඳ ප්‍රතිලාභයක් මේ රටට ගන්න ඕනෑ. එහෙම නැතිව මිනිසුන්ගෙන් බදු අය කරලා සංස්ථා ටික පාඩු කරනවා නම්, එහෙමත් නැත්නම් පෞද්ගලික අංශයට ඕනෑ විධියට නටන්න ඉඩ දෙනවා නම් අපට ඒ ප්‍රශ්නයට මුහුණ දෙන්න බැහැ. දැන් සමහරු අහනවා, "මොකද, මේ සමූහ ව්‍යාපාරවලට යන්නේ? මොකද, මේවා බදු දෙන්නේ?" කියලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා, ඊයේ BBC එකේ ප්‍රවෘත්ති බැලුවාද? කියුබාවේ සියලුම ඛනිජ සම්පත් නෝර්වේ රටත් එක්ක joint venture එකක් ගහලා -JV එකක් ගහලා- සම්පූර්ණයෙන් භාර දීලා ඉවරයි. එතකොට කියුබාව විකුණලාද? [බාධා කිරීම්] ඒක ප්‍රශ්නයක් නොවෙයි. ඒ නිසා කරුණාකර මතක තියා ගන්න, අද හැම තැනම,- [බාධා කිරීමක්] මොකක් හෝ එකක් කියනවා. මොකක් හෝ කියන කොට මොකක් හෝ දෙයක් තිබෙන්න ඕනෑ. නමුත්, වැඩේ පල් වෙන කොට තර්ක සියල්ලම වරදිනවා. තර්ක වරදින කොට වෙන මොකක් හෝ කැල්ලක් කියනවා. [බාධා කිරීම්] කරුණාකර කියන්න, අනූනව අවුරුදු- [බාධා කිරීමක්] ඉතින් මොකද වෙන්නේ? එක එක ව්‍යාපෘතියට ප්‍රතිශතය වෙනස් වෙනවා. ප්‍රතිශතය වෙනස් වුණේ නැද්ද, තමුන්නාන්සේලාගේ කාලයේ? [බාධා කිරීමක්] ප්‍රතිශතය වෙනස් වුණා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඒක නිකම් පොඩි 'ටොයිස්' වැඩක්. [බාධා කිරීමක්] තව ඉන්න. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා ඇහුවාද, රාහුල් කස්ත්‍රෝගේ කථාව? එතුමා මොකක්ද කිව්වේ? මේ පටන් ගත්තා විතරයි. ඕවා කියන කොට බොහොම අමාරුයි. ඕවා කියන කොට නිකම්ම නළියනවා. ඕවා හංගා ගෙන ඉඳලා, ඕවා කියන කොට නළියනවා. ඒ නිසා කරුණාකර අඩු ගණනේ පිට රට සභරාවක් කියවන්න, වෙන්නේ මොනවාද කියලා බලන්න. [බාධා කිරීමක්] බොහොම අමාරුයි මේවා කියන කොට. [බාධා කිරීමක්] මේවා එළිවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක තිබෙන සම්පත් ඒ රටේ පොළොව යට තිබෙන සම්පත් වෙන්න පුළුවන්; පොළොව උඩ තිබෙන සම්පත් වෙන්න පුළුවන්; මානුෂික සම්පත් වෙන්න පුළුවන්. ඒවා සංවර්ධනය කරලා රටට ලොකු ආදායමක් ගැනීම තමයි රටක තිබෙන හදිසි අවශ්‍යතාව. ඒකට කොයි විධියේ උපක්‍රම යොදනවාද, කොයි විධියේ ගිවිසුම් ගහනවාද කියන එක නොවෙයි ප්‍රශ්නය. මේ රටේ තිබෙන ඒ සම්පත් උපරිම විධියට ප්‍රයෝජනයට ගැනීම තමයි ආර්ථික අභියෝගය. ඒ නිසා කැමැති නැත්නම්, ඒකට තමුන්නාන්සේලාගේ වෙනත් මතයක් තිබෙනවා නම් ඒ මතය දරන්න. නමුත්, අපේ මතය වෙනස්. අපි කියන්නේ, මේ රටේ තිබෙන සම්පත් ටික කොයි විධියට හරි ආයෝජනය කරලා, මේ රටේ දුප්පත් මිනිසුන්ගේ ආදායම වැඩි කරන්න ඕනෑ කියන එකයි. එහෙම කළොත් විතරයි සුබසාධනය සඳහා ආදායමක් දෙන්න අපට පුළුවන් වන්නේ.

අධ්‍යාපනය සඳහා සඳහා කවුද වියදම් කරන්නේ? [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඩෙන් ෂියාඕ පින්ග් වාගේ ද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
More than Deng Xiaoping. ඩෙන් ෂියාඕ පින්ග් මොකද කළේ? චීනයට ගිහින් බලන්න. අද කවුද චීනයේ ආයෝජනය කර තිබෙන්නේ? චීනයේ ආයෝජන නීති බලන්න. අද වියට්නාමයේ ආයෝජන නීති බලන්න. අද ආයෝජකයෝ ලංකාවට ආවාම මොනවාද කියන්නේ? "ඔයගොල්ලන්ගෙන් ලැබෙනවාට වඩා අපට ලාභ, නීති වියට්නාමයේ තිබෙනවා; චීනයේ තිබෙනවා" කියලායි. ඕනෑ නම් ඒවා අනුගමනය කරන්නය කියා තමයි අපට කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා ප්‍රධාන දෙය මෙයයි. මේ බදුවලින් වෙන්න පුළුවන්, වෙනත් විධියෙන් වෙන්න පුළුවන්, මේ රටේ නිෂ්පාදනය වැඩි කරන්නයි අවශ්‍ය; මේ රටේ ලබා ගන්න පුළුවන් ආදායම වැඩි කර ගන්නයි අවශ්‍ය. ඒ සඳහා මුදල් අවශ්‍යයි. දේශිය වශයෙන් මුදල් වැඩි කළාට ඒ ප්‍රමාණය මදි. තමුන්නාන්සේලාගේ විසඳුම වුණේ මේවා දියුණු කිරීම නොවෙයි; ණය ගැනීමයි. ඒකටත් දැන් සීමාවක් ඇවිත් තිබෙනවා. එම නිසා අපි වෙන ක්‍රම තුළින් ඒ ආයෝජනය කිරීම අවශ්‍යයි කියන අතර, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 4.32]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දේශීය ආදායම් පනත් කෙටුම්පත දෙවන වර කියැවීමේ විවාදයේදී ගරු මන්ත්‍රීතුමන්ලා නොයෙකුත් කරුණු ඉදිරිපත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පළමුවෙන්ම මතක් කරන්නට ඕනෑ, මෙම දේශීය ආදායම් පනත් කෙටුම්පත ජූලි මාසයේ 05 වන දා ඉදිරිපත් කර, අද - සැප්තැම්බර් 07 වන දා- තමයි දෙවන වර, තුන්වන වර කියවා සම්මත කර ගන්නේ. කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කරන සංශෝධනවලට කැබිනට් අනුමතිය ලබා ගෙන ඉදිරිපත් කරන බව නැවතත් මතක් කරනවා. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මෙම පනත් කෙටුම්පත සෝදිසි කර නියෝගයක් දුන්නා. සංශෝධනය කළ යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නියෝග දෙන ලද වගන්ති සියල්ලක්ම සංශෝධනය කර මේ පනත් කෙටුම්පත මේ ගරු සභාවට ඉදිරිපත් කරන ලද බවත් කියන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ ජනතාවට මේ පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කරන්නට අවස්ථාවක් ලැබුණා. ඇමති මණ්ඩලයෙන්, මන්ත්‍රීවරුන්ගෙන්, ව්‍යාපාරික සංගම්වලින් - business chambersවලින් - යෝජනා ආවා. ආර්ථික ක්ෂේත්‍රවල, වෘත්තියවේදීන්, නොයෙකුත් සංශෝධන ඉදිරිපත් කළා. මේ සියලුම සංශෝධන රජය වශයෙන් අපි සලකා බලා, එකඟ වෙන්නට පුළුවන් සංශෝධන අපි එකතු කර තිබෙනවා. මේක අපි බොහොම විනිවිදභාවයෙන් කර තිබෙන ක්‍රියාදාමයක්.

මේ පනත් කෙටුම්පතෙන් ගරු ඇමතිතුමාට තීරණ ගැනීම සම්බන්ධයෙන් තිබෙන අවකාශය අඩු කර තිබෙනවා. නමුත් අද විවාදයේදී සඳහන් කළා, අමාත්‍යවරයාට දෙපාර්තමේන්තුවේ ලිපිගොනු ලබා ගෙන තොරතුරු ගැනීමට අවකාශය තිබෙනවා, ඒක අයින් කරන්නට පුළුවන්ද, සීමා කරන්නට පුළුවන්ද කියා. ඇත්තටම මේ වගන්තියත් ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් වුණා. ඒ ගැන ශ්‍රේෂ්ඨාධිකරණයේ තර්ක කළා. තර්ක කළාට ශ්‍රේෂ්ඨාධිකරණය කිව්වා, දැනට තිබෙන පනතේ 100 වන වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි නොවන බව. ඉහත වගන්තිය අනුව අමාත්‍යවරයා තොරතුරු ලබා ගත්තොත් ඒ ලබා ගන්නේ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කටයුතු සඳහා පමණයි කියන එක මම මෙහිදී සඳහන් කරන්නට ඕනෑ. එහෙම කළේ නැත්නම් මෙම පනත් කෙටුම්පතේ 191 වගන්තිය අනුව රුපියල් මිලියනයකට නොඉක්මවනු ලබන දඩයකට, හෝ අවුරුද්දක් නොඉක්මවනු ලබන කාලයක සිර දඬුවමකට ඇමතිතුමාත් ලක්වෙනවාය කියන එක සඳහන් කරන්නට ඕනෑ. එම නිසා ගරු ඇමතිතුමාගේ බලතල මේ පනත් කෙටුම්පත හරහා සීමා කර තිබෙනවා; අඩු කර තිබෙනවා කියන එකත් සඳහන් කරන්නට ඕනෑ.

තවදුරටත් සඳහන් කළා, දෙපාර්තමේන්තුවෙන් කොහේ හෝ කාර්යාලයකට රහසිගතව ගිහින්, පැනලා තොරතුරු ගන්නට පුළුවන්ය කියා. නමුත් පනතේ සඳහන් කරලා තිබෙනවා, එහෙම යන්න බැහැයි කියලා. යනවා නම්, මහෙස්ත්‍රාත් නියෝගයක් අරගෙන යන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් දෙපැත්තටම තර්ක කරන්න පුළුවන්. එක විධියකට කිව්වොත් මේකේ බලතල දීලා තිබෙන්නේ අධිකරණයට; නිලධාරීන්ට නොවෙයි. අනික් විධියට තර්ක කරලා කියන්න පුළුවන්, "නැහැ, මේක නිලධාරීන්ට දෙන්න තිබුණා. මහෙස්ත්‍රාත්වරයාගේ නියෝගයක් ඕනෑ නැහැ" යි කියලා. මම මේ කරුණු සඳහන් කළේ අපි මේ තීරණයට ආවේ කොහොමද කියන එක පෙන්වන්නයි. මේ පනතේ තිබෙන මූලික සාධකයක් වන්නේ නීතිමය පදනමට අනුව ක්‍රියාත්මක වීම, to have a rules-based system of taxation, not a discretionary system of taxation.

බදු හා සම්බන්ධ පනතක් ගේන්නේ බදු එකතු කරන්න තමයි. දැනටම බදු ගෙවන අයගේ පීඩනය වැඩි කරන්න පමණක් නොවෙයි, බදු ගෙවිය යුතු නමුත් නොගෙවන අයත් දැන් මේ පනත් කෙටුම්පත හරහා බදු ගෙවන්නන් බවට පත් කරනවා. මොකද, බදු ගෙවන්න පුළුවන් සියලු දෙනාම බදු ගෙව්වාම තමයි සමාජ සාධාරණත්වය ඇති වන්නේ කියලා අපි විශ්වාස කරනවා.

පසුගිය කාලයේ මේ රටේ ආදායම බොහොම අඩු මට්ටමකට වැටිලා තිබුණේ. දළ දේශීය නිෂ්පාදනය සියයට 11.6 දක්වා පහත වැටිලා තිබුණේ. පසුගිය වසර දෙක තුළදී දළ දේශීය නිෂ්පාදනය සියයට 14.3 දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඉස්සර බදු නිදහස ගැන කථා කරන කොට ඇත්තටම මේ රටේ සාමාන්‍ය ජනතාවට "බදු නිදහස" කියලා එකක් ලැබුණේ නැහැ. සාමාන්‍යයෙන් මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට තමයි "බදු නිදහස" කියන වචනය භාවිත කළේ. ඒ බදු නිදහස ඔවුන්ට ලැබුණේ BOI එක හරහා වන්න පුළුවන්. නැත්නම් මේ සම්බන්ධයෙන් පසු ගිය රජය ගෙනා අලුත් පනත හරහා වන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ඔව්, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත හරහා වන්න පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

අනතුරුව ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. MUJIBUR RAHUMAN *left the Chair and* THE HON. SPEAKER *took the Chair.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කථා කරන්න, ගරු රාජ්‍ය ඇමතිතුමා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

මේ පනත් කෙටුම්පතින් තිබෙනවාට වැඩිය සමාජ සාධාරණත්වයක් ඇති වනවාය කියලා මම තර්ක කරනවා. බදු එකතු කරන්නේ මේ රටේ පොදු ජනතාවට ලබා දෙන්න තිබෙන සේවාවන් ලබා දීම සඳහායි. එනම්, ආරක්ෂාව, නීතිය හා සාමය, අධිකරණ පද්ධති, අධ්‍යාපනය, සෞඛ්‍ය, සමාජ සුබසාධනය වැනි දේවල්වලට ආයෝජනය කිරීමටයි.

පුද්ගල ආදායම පිළිබඳව අපි බලමු. මේ පනත් කෙටුම්පත අනුව බද්දක් නැතිව මාසයකට රුපියල් ලක්ෂයක පුද්ගල ආදායමක් ලබා ගන්න පුළුවන්. ඒ අනුව එක පවුලක දෙදෙනෙක් වැඩ කළොත් ආදායම රුපියල් ලක්ෂ දෙකක් වනවා. එතකොට ඒ පවුලේ ආදායම රුපියල් ලක්ෂ දෙක නම්, ඒ මුදලට බද්දක් ගෙවන්න අවශ්‍ය වන්නේ නැහැ. ඊට පස්සේ වෙනත් මාර්ගවලින් උපයන ආදායමට තමයි සියයට 4, 8, 12 දක්වා බදු ප්‍රතිශතය වැඩි වෙලා ඉහළම බදු ප්‍රතිශතය සියයට 26යි කියලා එන්නේ.

අපි ලෝකයේ අනෙක් රටවල් එක්ක සැසඳුවොත් ලංකාවේ පුද්ගල ආදායම් බදු ප්‍රතිශතය සියයට 24යි, බංග්ලාදේශයේ සියයට 30යි, බ්‍රසීලයේ සියයට 27.5යි, ඒ වාගේම ඉන්දියාවේ සියයට 35යි, මැලේසියාවේ සියයට 28යි, මෙක්සිකෝවේ සියයට 35යි, දකුණු අප්‍රිකාවේ සියයට 45යි, තායිලන්තයේ, තුර්කියේ සහ වියට්නාමයේ සියයට 35යි. ලංකාවේ පුද්ගල ආදායම් බදු ප්‍රතිශතය මා මේ කියපු රටවලට වඩා අඩුයි කියලා සඳහන් කරන්න ඕනෑ. නමුත්, ව්‍යාපාරික බදු ප්‍රතිශතය ලංකාවේ සියයට 28යි; බංග්ලාදේශයේ සියයට 35යි; බ්‍රසීලයේ සියයට 34යි; ඉන්දියාවේ සියයට 30යි. මැලේසියාවේ, තායිලන්තයේ, තුර්කියේ සහ වියට්නාමයේ ව්‍යාපාරික බදු ප්‍රතිශතය අපට වඩා අඩුයි. මෙක්සිකෝවේ සියයට 30යි, දකුණු අප්‍රිකාවේ සියයට 26යි. මැලේසියාවේ, තායිලන්තයේ තුර්කියේ සහ වියට්නාමයේ ව්‍යාපාරික බද්ද අඩු වුණාට පුද්ගල බද්ද අපට වැඩිය හුඟක් වැඩියි, මේ බදු ප්‍රතිශත අනුව. අපි මේවා ඔක්කෝම අධ්‍යයනය කරලා සාධාරණ විධියට තමයි පුද්ගල බද්දයි, ව්‍යාපාරික බද්දයි ගණනය කර තිබෙන්නේ කියන එක මම සඳහන් කරන්න ඕනෑ. අඩුම ව්‍යාපාරික බදු ප්‍රමාණය සියයට 14යි, වැඩිම බදු ප්‍රමාණය සියයට 28යි.

මේ පනත් කෙටුම්පතේ තිබෙන හොඳ දෙයක් තමයි, හැමෝම එක හා සමානව ඒ අයගේ ක්‍රියාවලියෙන් හඳුනා ගැනීම. "හිඟන්නාගෙනුත් බදු ගන්නවා" කියා අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වාය කියා කථාවක් තිබුණා. ඒකට මුදල් ඇමතිතුමා දුන්න පිළිතුර වුණේ, හිඟන්නාගෙන් බදු ගන්නේ නැහැ, නමුත් හිඟන්නා ව්‍යාපාරයක් කරනවා නම් ඒ ව්‍යාපාරයෙන් බදු ගන්න ඕනෑය කියන එකයි. ඒ කථාවේ හරය මේකයි. එක එක්කෙනාගේ label එක අනුව නොවෙයි, එක එක්කෙනා කරන ක්‍රියාවලිය අනුව තමයි බදු ගහන්න ඕනෑ. ඒකට ක්‍රියා කරන්න තමයි මෙතැනදී අප වෑයම් කර තිබෙන්නේ. කවුරු හෝ ව්‍යාපාරිකයෙක් ආයෝජනය කරනවා නම්, වැඩිම බද්ද සියයට 28ක් වුණාට ඒ ව්‍යාපාරික බද්ද අප අය කරන්නේ කොහොමද? ඒ ව්‍යාපාරිකයා රුපියල් 100ක් ආයෝජනය කළොත්, එතකොට එයාගේ ආදායම තිබෙනවා; වියදම තිබෙනවා; බදුවලට ප්‍රථමයෙන් ලාභය තිබෙනවා; බදු ප්‍රතිශතය දමනවා. ඊට පස්සේ බදුවලට පසුව ලාභය බලලා, ඒ ලාභය සියයට 20ක් වෙනවා නම්, ඒ ලාභයෙන් අප බදු ගහන්නේ නැහැ. ඒ ඇයි? අර සියය පියවනතුරුයි. ඒ සියය පියවන තුරු අවුරුදු 5කට වුණත් "ප්‍රාග්ධන නිදහස" කියා එකක් අප මේ බදු පනත් කෙටුම්පතට එකතු කර තිබෙනවා. මේක දෙන්නේ, on top of the depreciation that somebody would normally receive when they are accounting for their profits. So, in addition to that, we will allow them to take the capital. There is a capital allowance that will be given so that they can recover the whole capital invested within a specified period of time. That is to encourage investors.

කෙළින්ම අවුරුදු 10කට, 15කට, 20කට බදු නිදහසක් දීලා, අද ඒ ගැන දන්නෙත් නැහැ. නිදහස දුන්න අයගේ නිදහසත් ඉවරයි. නමුත් අදත් ඒ අය ගෙවන්නේ නැහැ. මේ ක්‍රමය නතර වෙන්න ඕනෑ. ආයෝජනයට තමයි අප ඒ නිදහස දීලා තිබෙන්නේ කියන කාරණය මා සඳහන් කරන්න ඕනෑ.

සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයන්ට පිරිවැය රුපියල් මිලියන 500ක් වන තුරු ව්‍යාපාරික බද්ද සියයට 14යි. ඔවුන්ට බදු දෙකයි තිබෙන්නේ. එක්කෝ සියයට 14යි. නැත්නම් සියයට 28යි. මීට පසුව ඇමතිතුමාගේ කාමරය අසළට ඇවිත් බදු නිදහස් ප්‍රතිශත වෙනස් කරගන්නත් බැහැ. ඒ ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසියි. සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයාට අප ඒ නිදහස -සියයට දහහතරේ අඩු බද්ද- දෙනවා. අපනයනය කරනවා නම් ඒ අපනයනයටත් දෙන්නේ සියයට දහහතරේ අඩු බදු ප්‍රමාණයයි. නමුත්, අපනයනය කරන සමහර ව්‍යාපාර රට තුළත් යම්කිසි වෙළෙඳාමක් කරනවා. ඒ අය රට තුළ වෙළෙඳාමක් කරනවා නම්, අපනයනය කරන ප්‍රමාණය සියයට 80ක් වෙනවා නම්, ඒ අයගේ මුළු ලාභයටම සියයට 14ක බද්දක් තමයි අප අය කරන්නේ. We are allowing a concessionary tax rate of 14 per cent for exports. If an export company is selling locally, but is predominantly exporting 80 per cent of its complete turnover, the lower tax rate of 14 per cent is what is going to be applicable to it. ඒ විතරක් නෙමෙයි, if it is a deemed export, then it will be classified as an export and the lower tax rate will apply to it.

බොහෝ වෙලාවට අපනයනය කරන්නේ මේ රටේ විශාල සමාගම්. නමුත්, අපේ අරමුණ වන්නේ මේ රටේ සිටින සුළු පරිමාණයේ නිෂ්පාදකයෝත් ඒ අපනයන සැපයුම් ජාලයට එකතු කිරීමයි. එතකොට තමන් අපනයනයට සම්බන්ධයි කියා ඒ අයට පෙන්වන්න පුළුවන් නම්, අප ඒ ව්‍යාපාරවලටත් දහහතරේ අඩු බදු ප්‍රතිශතය තමයි දෙන්නේ.

මොකද, අපට ඕනෑ මේ රටේ කුඩා ව්‍යාපාරිකයා නඟා සිටුවන්න විතරක් නොවෙයි, ඔවුන් ජාත්‍යන්තර වෙළෙඳ පොළට අරගෙන යන්නයි. මේ රටේ ආර්ථික ශක්තිය මේ රටේ විශාල ව්‍යාපාර නොවෙයි කියලා අපි විශ්වාස කරනවා. හුඟක් වෙලාවට බදු ප්‍රතිපත්ති හැදුවේ විශාල ව්‍යාපාර දිහා බලලායි. අපේ අරමුණ වන්නේ, කුඩා ව්‍යාපාරිකයා ශක්තිමත් කිරීමයි. ඔවුන්ට අප්‍රිකාවට යන්න බැහැ. ඔවුන්ට ආසියාවේ සමහර රටවලට යන්න බැහැ. ඔවුන් වෙළෙඳ පොළ හඳුනන්නේ නැහැ. ඔවුන් ඒ රටවල තිබෙන අවදානම, sovereign risk and country risk දන්නේ නැහැ. A small businessman cannot really quantify it and take it. Therefore, we are going to lower the tax rate, so that they could actually enter the export chain. I think, there will be more concessions announced during Hon. Mangala Samaraweera's Budget later in the year to encourage this process.

ඉතින්, අද මේ ගැන කථා කරනකොට "inheritance taxes" ගැන කිව්වා. පියෙකු දරුවාට නිවසක් දෙනවා නම් ඒකට බදු ගහනවාද කියලා ඇහුවා. දරුවෝ තුන් දෙනෙක් ඉන්නවා නම්, නිවාස තුනක් තිබෙනවා නම්, ඒ එක දරුවෙකුට එක නිවාසය බැගින් හැම දරුවෙකුටම නිවාසයක් දෙන්න පුළුවන්. අපි මේ බදු ප්‍රතිපත්තිය හදනකොට සමහර අය කිව්වා, මේ යෝජනා සානාවෙන් ගෙනැල්ලා, IMF එකෙන් ගෙනැල්ලා, නොයෙකුත් තැන්වලින් ගෙනැල්ලා කියලා. ඇත්තටම මේ රාමුව හදලා තිබෙන්නේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ විශේෂඥයන්. ඇත්තටම අපට ඒ ගැන කිසිම ගැටලුවක්, ප්‍රශ්නයක් නැහැ. අද අපි සියලු දෙනාම පාර්ලිමේන්තුවට ආවේ වාහනයකින්. අපි ආපු වාහනය ඉන්දියාවේ හැදුවා ද, ජපානයේ හැදුවා ද, ජර්මනියේ හැදුවා ද, කොහේද හැදුවේ කියලා අපි අහන්නේ නැහැ. අපි වාහනයකින් මෙතැනට ආවා. ඒක ලෝකයේ කොහේ හැදුවත් අපට කමක් නැහැ. ඒ විධියට ලෝකයේ ක්‍රියාත්මක වන හොඳම දේවල් -best practices- අපේ ලාංකික ව්‍යාපාරවලට, අපේ ලාංකික කළමනාකාරිත්වයට, අපේ නීති පද්ධතියට අවශ්‍ය නම්, අපි ඒවා

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

ඉගෙන ගෙන, ඊටත් වඩා දියුණු කරලා අපට සුදුසු ආකාරයට භාවිත කරන බව කියන්න අවශ්‍යයි. අපි ඒ ආකාරයට තමයි මේ යෝජනා හදලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, පවුලේ අයට පරිත්‍යාග කරන එක අපේ සංස්කෘතියේ කොටසක් වනවා. ඒ නිසා බද්දක් නැතිව දරුවාට දේපළ දෙන්න පුළුවන්. නමුත් මම මේ කරුණ අහන්න කැමැතියි. දරුවෝ තුන් දෙනෙක් ඉන්නවා; ඒ අයට නිවාස තුනක් දුන්නා. තවත් නිවාස තිබෙනවා නම් ඒ ඉතිරි නිවාසවලට බදු ගහන එක සාධාරණ නැද්ද කියන එක මම අහන්න කැමැතියි. මේ රටේ නිවාස නැති කොච්චර පිරිසක් ඉන්නවාද? මේ රටේ නිවාස නැති විශාල පිරිසක් ඉන්නවා. මේ බදු පනත හරහා සමාජ සාධාරණත්වය ගැන අපි කල්පනා කළා. මුදලක්, ධනයක්, නිවසක් එක පරම්පරාවකින් තව පරම්පරාවකට යනවා නම්, එතැනත් යම් කිසි සාධාරණත්වයක් තිබෙන්න ඕනෑ. වැඩිපුර තිබෙනවා නම් ඒ වැඩි ප්‍රමාණයෙන් තමයි බදු ගන්නේ. තවම ඒවාට සියයට 10ක පමණ බොහොම පොඩි බද්දක් තමයි ගහන්නේ. අපි ඒ දේපළට, ඒ capital gain එකට සියයට 10 බද්දක් පනවනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එක ළමයෙක් හිටියොත්.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
එක ළමයෙක් හිටියොත් ඒ ළමයාට ඉන්න පුළුවන් එක ගෙදරක නේ. එක ඇඳේනේ නිදා ගන්න පුළුවන්. ගෙවල් දෙකක ඉන්න බැහැ නේ. ඇඳන් දෙකක නිදා ගන්න බැහැ නේ. අනෙක් ඇඳ, ඇඳක් නැති දරුවෙකුට දෙන්න ඕනෑය කියන එක තමයි අපේ මතය. [බාධා කිරීමක්] කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ආවා මේ රටේ වෘත්තීයවේදීන් තවත් රටකට ගිහිල්ලා සේවය කරනවා නම්, ඒ අය දිරි ගන්වන්න. ඒ අය ලබා ගන්නා විදේශ ආදායමට යම් කිසි නිදහසක් ඇති කරන්න කියලා යෝජනාවක් ආවා. ඒකත් අපේ සංශෝධනවල තිබෙනවා. ඒ කියන්නේ, ඩොලර් ලක්ෂයක් දක්වා ඒ ඒ වෘත්තීයවේදීන්ට බදු නිදහස දීලා තිබෙනවා.

කවුද කිව්වා, බුද්ධි ගලනයක් ඇති වෙන්න යනවා කියලා. කිසිම බුද්ධි ගලනයක් ඇති වෙන්නේ නැහැ. අපි මේ රටේ ඉන්න වෘත්තීයවේදීන්ට තව දෙයක් කියන්න ඕනෑ. කවුරු හරි හිතනවා නම් බුද්ධි ගලනයක් ඇති වෙන්න යනවා කියලා, අපි අනිවාර්යයෙන්ම ඒ වෘත්තිය ගැන සොයා බලා, ඒ සඳහා අවස්ථාව වැඩි කරනවාය කියලා ඒ අයට කියන්න කැමැතියි. අපි මේ රටේ අධ්‍යාපනයක් නැති දරුවන්ට අධ්‍යාපනයක් ලබා දෙන්න කටයුතු කරනවා. බුද්ධි ගලනයක් ඇති වෙනවාය කියලා කියන ඒවාට බය වෙලා අපි අපේ ප්‍රතිපත්ති වෙනස් කරන්නේ නැහැ. අපි ඒ අයට වැඩියෙන් අලුත් අවස්ථා ලබා දෙනවා. හොඳට ලකුණු ලබන, හොඳ Z- score එකක් ලබන, එහෙත් විශ්වවිද්‍යාලවලට ඇතුළු වෙන්න බැරි දරුවන්ට විශ්වවිද්‍යාලවලට ඇතුළු වෙන්න අපි අවස්ථාව සලසා දෙනවාය කියන එකත් මම කියන්න ඕනෑ.

තවත් ප්‍රචාරයක් අරගෙන ගියා, පුණ්‍ය ආයතනවලට පරිත්‍යාග කරන මුදල්වලට අපි බදු ගහනවා කියලා. පෙරහැර පැවැත්වීමට ලැබෙන මුදල්වලට, ඒ වාගේම පන්සලට, පල්ලියට, කෝවිලට ලැබෙන පඬුරුවලට, පිං කැටේට වැටෙන මුදල්වලට අපි බදු ගහනවා කියලා කිව්වා. නමුත් එහෙම කිසි දෙයක් වෙන්නේ නැහැ. දැන් පවතින ක්‍රමයටම තමයි ඒ කටයුතු සිද්ධ වෙන්නේ. පුණ්‍ය ආයතන -පන්සල්, පල්ලි, කෝවිල්- ලබන මුදලට අපි කිසිම බද්දක් අය කරන්නේ නැහැ කියන එක මම සඳහන් කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, සුද්දන් රාජකීය නියෝගවලින් පන්සල්වලට දීපු බදු නිදහස ඒ ආකාරයෙන්ම මේ පනත් කෙටුම්පත තුළත් ආරක්ෂා වෙලා තිබෙනවාය කියන එකත් මම සඳහන් කරන්නට ඕනෑ.

සමහර මන්ත්‍රීවරුන් කිව්වා, කලාකරුවන්ට එක එක විධියට බදු නිදහස දීලා තිබුණා කියලා. ඔබතුමන්ලා කියපු එක ගැන කිසිම වාදයක් නැහැ. පොතක් -ග්‍රන්ථයක්- ලියුවොත්, චිත්‍රපටයක් හැදුවොත් යම් කිසි නිදහසක් තිබෙනවාය කියලා ලියා තිබෙනවා. නමුත් ඇත්ත කථාව මේකයි. හරියට කේක් එකක් අයිසිං කරනවා වාගේ තමයි එදා හිටපු මුදල් ඇමතිතුමා ඒ ගැන කටයුතු කළේ. ඒ විධියටම නැති වුණත් - [බාධා කිරීම්] ඔව්. නාට්‍යයත් ඇතුළත්. ඔබතුමා ළඟම ඔබතුමාගේ මිත්‍රයා ඉන්නවා නේ. දැන් එතුමා පොතකුත් ලියලා. අපි මේ සාධාරණත්වය ගැනයි කරන්නේ. ඒක ව්‍යාපාරයක් හැටියට සලකනවා නම්, ඒකට ව්‍යාපාරික බද්ද පැනවෙනවා. ඒක පුද්ගල ආදායමක් හැටියට සැලකෙනවා නම්, ඒ පුද්ගල ආදායමට බදු නිදහසක් තිබෙනවා නේ. එතකොට ඒ නිදහස ලැබෙනවා. නමුත් පුද්ගලයෙක් චිත්‍රපටයක් හදනවා නම්, ඒක ව්‍යාපාරයක් ලෙස ලියා පදිංචි කරලා නැතුව හෝ ව්‍යාපාරයක් ලෙස සලකනවා නම් හෝ එතකොට බදු අය කරන ක්‍රම දෙකක් තිබෙනවා. ඒ ආදායමට බදු නිදහස තිබෙනවා. ලක්ෂයක ආදායමක් ලැබෙනවා නම් මාසයකට, ලක්ෂ දොළහක් ලැබෙනවා අවුරුද්දකට. ලක්ෂ පහක ලාභයක් ලැබෙන තෙක් ඒකට බදු නිදහසක් තිබෙනවා. ඒ ආදායම ගන්නවා; වියදම ගන්නවා. ඒ වියදම ඇතුළේත් පුද්ගලයන්ට ආදායම් තිබෙනවා. ඒ ආදායම් අඩු කළාට පස්සේ තමයි ලාභය ලබන්නේ. ඒ ලාභයෙන් පස්සේ තමයි බදු ගහන්නේ. තවත් විධියකට කිව්වොත්, අපි බදු ගන්නේ ලාභ නැති අයගෙන් නොවෙයි. ලාභ ලබනවා නම් විතරයි බදු ගන්නේ. ලාභ නැති අයගෙන් බදු ගන්නේ නැහැ. [බාධා කිරීම්] මම මේ පැහැදිලි කිරීමක් කරන්නේ. ඊට අමතරව මම කියන්න ඕනෑ,-

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Point of Order එකක් ඕනෑ නැහැ, කියන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පැහැදිලි කිරීමක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා අවස්ථාව දෙනවාද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
අවස්ථාව දෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට මම මෙය නැවත මතක් කරනවා. මම මගේ කථාවේදීත් මේ ගැන කිව්වා. රුපියල් ලක්ෂ පහක් කියන්නේ බොහොම කුඩා මුදලක්.

බලන්න, අද මේ රටේ වේදිකා නාට්‍යකරුවන් ගැන. ඒ අය බොහොම අමාරුවෙන් අද වේදිකා නාට්‍යයක් නිෂ්පාදනය කරන්නේ. අද වේදිකා නාට්‍යයක් බලන්න කෙනෙක් එන්නෙ නැහැ. බොහොම අමාරුවෙන් තමයි ඒ වේදිකා නාට්‍යකරුවන් ආරක්ෂා වෙලා ඉන්නේ. මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ, කරුණාකර මේකට වැඩ පිළිවෙළක් හදන්න කියලායි. මේක ලොකු ප්‍රශ්නයක්.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

හොඳයි. ගරු කථානායකතුමනි, කොටස් වෙළෙඳ පොළ ගැනත් මම වචනයක් කියන්නට ඕනෑ. කොටස් වෙළෙඳ පොළේ ප්‍රාග්ධන බදු ගහයිද කියලා යම් කිසි අනුමානයක් තිබුණා. කොටස් වෙළෙඳ පොළේ "share transaction levy" කියලා තිබෙනවා. ඒ share transaction levy එක කිසි වෙනසක් නැතිව අදට තිබෙන ආකාරයටම කොටස් වෙළෙඳ පොළේ තිබෙනවා. කොටස් වෙළෙඳ පොළේ ගනු-දෙනුවට වෙනසක් නැහැ. ලාභය ලබන එක කොම්පැනිය අනුව වෙනම ක්‍රියාත්මක වෙන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, අද මුදල් ඇමතිතුමා කිව්වා "තිබෙන හැම එක්කෙනාම බදු ගෙවන එක හොඳයි" කියලා. නමුත්, ආදායමක් නැත්නම් බදු ගෙවන්න ඕනෑ නැහැ. එම නිසා එතුමා සඳහන් කළා, රටේ ඉන්න හැම එක්කෙනාටම universal tax file එකක් තිබෙනවා නම් හොඳයි කියලා. ඔබතුමන්ලා ඒකට විරුද්ධ වෙනවා නම්, අපි ඒකට සංවේදියි. නමුත්, මේකේ දෙපැත්තක් තිබෙනවා. අපි දන්නවා, අද හුභාක් අඩු ආදායම්ලාභීන් සිටින බව. අද හුභාක් වෙලාවට සමාජ සුබසාධනය ක්‍රියාත්මක කරන විට ඒ ලබා දෙන දේවල් සුදුසුම පුද්ගලයන්ට යන්නෙත් නැහැ. ඒක සමහර අඩු ආදායම්ලාභීන්ට යනවා. නමුත් අපි තැනින් තැනට යනකොට එක එක විධියට චෝදනා එනවා, "මේ අයට වාහන තිබෙනවා, නිවාස තිබෙනවා නමුත් සුබ සාධනය ලැබෙනවා" කියලා. ඉතින් මම කියන්න හදන්නේ මේකයි. කොයි විධියට බැලුවත් අපිට ඒක තාක්ෂණය හරහා එකතු කරන්න පුළුවන්. ඒක එච්චර අමාරු දෙයක් නොවෙයි. නමුත් මේවා දේශීය ආදායම් පනත් කෙටුම්පතේ සඳහන් වෙන්නේ නැහැ. මේවා පනත් කෙටුම්පතෙන් පිට මුදල් ඇමතිතුමා කරපු යෝජනාවන්. අපි ඒ යෝජනාවන් පිළිබඳව සංවේදීව ඒ ගැන කථා කරමු. නමුත්, එතුමා කියපු වැදගත් දේ මේකයි. ගෞරවනීය රටක් හදන්නට නම්, ගෞරවනීය පුරවැසියෙක් හදන්නට ඕනෑ. ඒ නිසා පුද්ගලයාගේ නිදහස ආරක්ෂා වෙන අතරේම පුද්ගලයාටත් වගකීමක් තිබෙනවා, රජයට වගකියන ආකාරයට ක්‍රියා කරන්න; විනිවිදභාවයෙන් ක්‍රියා කරන්න. මෙහි සමතුලිතතාවය ගැන සමහර වෙලාවට ගැටලු; ප්‍රශ්න තිබෙන්න පුළුවන්. නමුත් අපි එතැනට යන්න ඕනෑ.

ඊළඟට මම කියන්නට ඕනෑ, මෙම දේශීය ආදායම් බදු පනත ක්‍රියාත්මක කරන්නේ කවදාද කියලා විශාල වාද විවාදයක් පැවතුණා. පසුගිය අය වැයේ දී කථා කරනකොට බලාපොරොත්තු වුණේ, 2017අප්‍රේල් මාසයේ පළමුවෙනිදා ඉඳලා ක්‍රියාත්මක් කරන්නයි. නමුත්, අපි මේ සංශෝධන සියල්ලත් සලකා බලා, ඊළඟට ව්‍යාපාරිකයන්ගේ ප්‍රායෝගික ප්‍රශ්න ගැනත් සලකා බලන්න ඕනෑ. ඒ අයගේ ව්‍යාපාරවලට අළෙවි සැලසුම් හදලා අවුරුද්දකට budget කරලා තිබෙනවා. එතකොට ඒ අයගේ මෘදුකාංග වෙනස් කරන්න සිදු වෙනවා. එම ව්‍යාපාර පිළිබඳව තිබෙන කොටස්, ආදායම් බදු පිළිබඳව යනාදී සියල්ලම සලකා බලා 2018 අප්‍රේල් මාසයේ පළමුවෙනිදා ඉඳලා ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි ක්‍රියාත්මක සැලැස්මක් ඒකට හදලා තිබෙනවා. අපි පුද්ගල ආදායම් බදු අය කර ගැනීම ක්‍රියාත්මක කරන්නත් බලාපොරොත්තු වෙනවා. මෙම දේශීය ආදායම් පනත් කෙටුම්පත නීතිගත වුණු දවසේ ඉඳලා ඒවා ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ කියන්නේ ඔක්තෝම්බර් මාසයේ පළමුවෙනිදා සිට. අපි ලබන අවුරුද්දේ අප්‍රේල් මාසයේ පළමුවෙනිදා ඉඳලා ව්‍යාපාර සමඟ සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟත්, පුහුණු කිරීම හා ඒ අයගේ කළමනාකාරීත්වය සමඟත්, ඒ අයගේ මෘදුකාංග ගැනත්; ICT ක්‍රියාවලිය ගැනත් සාකච්ඡා කරමින් පවතිනවා, ලොකු ප්‍රශ්නයක් නොමැතිව අපි කොහොමද මේක ක්‍රියාත්මක කරගෙන යන්නේ කියන එක ගැන.

ගරු කථානායකතුමනි, අපි මේ හදාගෙන යන්නේ නීති රාමුවක්. නීති රාමුව හදන්න ආදායම් බදු පනත් කෙටුම්පත තමයි අපි අරගෙන ආවේ. නමුත්, අද මුදල් ඇමතිතුමා සඳහන් කළා, නව රේගු පනතකුත් කෙටුම්පත් කර ගෙනෙන්න ඕනෑ කියලා. අපි දන්නවා, මීට පෙර නව රේගු පනත් කෙටුම්පතක් ගෙනෙන්න යන කොට- [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒක හැදුවේ කවුද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ප්‍රශ්නය තිබෙන්නේ, කවුද හැදුවේ කියන එකයි. නව රේගු පනත් කෙටුම්පතක් ගෙනෙන්න යන කොට ඒකට විරෝධයක් ආවා. නමුත්, පවතින රේගු ආඥාපනත ඉදිරිපත් කර අවුරුදු 150කටත් වැඩියි. ඇත්තටම එය අදට ඔබින පනතක් නෙවෙයි. අපි මේක ප්‍රසිද්ධියේ සඳහන් කරන්නේ, මේවා හොරෙන් කෙටුම්පත් කරලා පාර්ලිමේන්තුවට ගෙනෙන්න අදහසක් නැති නිසායි. නව රේගු පනත් කෙටුම්පත පිළිබඳව මේ සාකච්ඡාව අද ඉඳලා අපි ඉදිරියට ගෙන යනවා. ඒ සම්බන්ධව මහ ජනතාවගේත්, ව්‍යාපාරිකයන්ගේත්, ආර්ථික ක්ෂේත්‍රය ඇතුළු අනෙකුත් ක්ෂේත්‍රවල උදවියගේත්, ඒ වාගේම පාර්ලිමේන්තුවේ දේශපාලන පක්ෂවලත් අදහස් අපි දැන ගන්නට කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, නියමිත වේලාව අවසානයි. ඔබතුමා තවදුරටත් කථා කරනවාද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

මා මේ කාරණය කියලා අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, we can give 10 more minutes.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Okay. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට තව වේලාව ලබා දුන්නා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු කථානායකතුමනි, මෙම විවාදයේදී ඇහුවා "දේශීය ආදායම් පනත් කෙටුම්පත සම්මත වීමෙන් පසු ආදායම් බදු ඉහළට යනවාද?" කියලා. පනත් කෙටුම්පත සම්මත වූ පළියටම ආදායම් බදු ඉහළට යන්නේ නැහැ. ආදායම් ප්‍රතිශතය ඉහළට යන කොට ආදායම් බදු ඉහළට යනවා. නමුත්, සමහර බදු ප්‍රතිශත ඉහළට යන කොට සමහර ඒවායේ ප්‍රතිශතය පහළට යනවා. අය වැයෙන් අය වැයට ඒ ප්‍රතිශත මාරු වෙමින් තිබෙනවා. රජයකට ආදායම් ලැබෙන්නේ, ආදායම් බද්දෙන් විතරක් නොවෙයි. ආදායම් බදුවලට අමතරව, සුරා බදු දෙපාර්තමේන්තුවෙන් ලැබෙනවා; රේගු දෙපාර්තමේන්තුවෙන් ලැබෙනවා. අපි ඒ නීති රාමුවත් හදන්න ඕනෑ. ගරු කථානායකතුමනි, ඇත්තටම තිබෙන විශාලම ප්‍රශ්නය පනත පිළිබඳ ප්‍රශ්නය නොවෙයි; නීතිය පිළිබඳ ප්‍රශ්නය නොවෙයි. මේ රටේ හුඟක් පනත් තිබෙනවා; නීති හුඟක් තිබෙනවා. නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව තමයි මෙතැන තිබෙන ගැටලුව, ප්‍රශ්නය. එම නිසා මුදල් ඇමතිතුමා කිව්වා වාගේ, අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන සෑම දෙපාර්තමේන්තුවකම නිලධාරින් එක්ක සාකච්ඡා කරලා ඒ අයගේ අදහස් විමසලා, ඒ අයගේ යෝජනාත් ලබා ගන්නවා. ආදායම් බදු වැඩි කර ගන්නේ කොහොමද කියලා අපි ඒ අය එක්ක එකතු වෙලා සාකච්ඡා කර කටයුතු කරන බවත් මම සඳහන් කරන්න කැමැතියි. අපි දැනටමත් ඒ අයගේ අදහස් විමසා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අදහස් දක්වන්න මට ලබා දුන් කාලය පිළිබඳව ස්තුතිවන්ත වෙමින්, මා නවතිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. දේශීය ආදායම් පනත් කෙටුම්පත දෙවන වර කියවීම. සභාව එකඟද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, බෙදීමක් අවශ්‍යයි. ඊට කලින් ගරු ඇමතිතුමාට මා මේ කාරණය පිළිබඳව කිව යුතුයි.

ගරු ඇමතිතුමාගෙන් මේ ක්‍රමවේදය මොකක්ද කියලා මම කලිනුත් විමසුවා. ගරු කථානායකතුමනි, දේශීය ආදායම් පනත් කෙටුම්පත සම්බන්ධව අපි උපදේශක කාරක සභාවේදී සාකච්ඡා කළේ නැහැ. මොකද, උපදේශක කාරක සභා නැති නිසා. දැන් අප විසින් ඉදිරිපත් කරපු සංශෝධන ගණනාවක් තිබෙනවා. අපට පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා දැනුම් දීලා තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152. ව්‍යවස්ථාවට අනුව මුදල් හා බැඳී තිබෙන සංශෝධන ඉදිරිපත් කරන්න අපට අවස්ථාවක් නැහැ කියලා. එතකොට අපි දවසම සාකච්ඡා කළත් මුදල් හා සම්බන්ධ වුණු සංශෝධන කිසිවක් අපට කාරක සභා අවස්ථාවේ දී ඉදිරිපත් කරන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. එම නිසා ගරු මුදල් ඇමතිතුමාගෙන් මා දැන ගන්න කැමැතියි, මුදල් හා සම්බන්ධ සංශෝධනයක් - උදාහරණයක් හැටියට EPF එකේ බද්ද සියයට 10-14 දක්වා වැඩි කරනවා. අපි ඒ බද්ද තිබුණු ස්ථානයේම තියන්න කියනවා නම්, ඒක සංශෝධනයක් හැටියට ඉදිරිපත් කරන්න බැහැ. මොකද, ඒක මුදල් එක්ක ගැටගැසී තිබෙන නිසා. චිත්‍රපට හා කලාකරුවන් පිළිබඳව මතු කළ ප්‍රශ්නයත් අපි සංශෝධනයක් හැටියට ඉදිරිපත් කළාට, ඒක සංශෝධනයක් හැටියට ගන්න බැහැ. මොකද, ඒක මුදල් හා බැඳිලා තිබෙන නිසා.

ගරු ඇමතිතුමනි, එතකොට දැන් පැන නඟින ප්‍රශ්නය තමයි එවැනි සංශෝධන සම්බන්ධයෙන් ගන්නා පියවර මොකක්ද කියන එක. ඔබතුමා පසුව හෝ සාකච්ඡා කර, කෙටි කාලයක් ඇතුළත නැවත සංශෝධන ඉදිරිපත් කරන්න අවස්ථාවක් දෙනවාද, නැත්නම් කාරක සභා අවස්ථාව ඊළඟ රැස්වීම් වාරයට යොදා ගෙන, සාකච්ඡා කරලා ඉතුරු සංශෝධන ටික ගන්න අපි උත්සාහයක් දරනවාද? ඔබතුමා සංශෝධන සම්බන්ධයෙන් මොකක්ද කරන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මුදල් ඇමැතිතුමා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ විසින්, විශේෂයෙන්ම සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා විසින් සංශෝධන කිහිපයක්ම භාර දීලා තිබෙනවා. එම සංශෝධනවලින් සමහර ඒවා ආණ්ඩුව හැටියට අපි ඇතුළත් කරපු සංශෝධන. එම නිසා ඔබතුමන්ලාට ඒ ගැන ප්‍රශ්නයක් ඇති නොවෙන්න පුළුවන්. නමුත්, අනෙක් සංශෝධන සම්බන්ධයෙන් මම මීට පෙර කිව්වා වාගේ ඉදිරියේදී අපට සාකච්ඡා කරන්න වෙයි. මේ පනත තවත් ශක්තිමත් වෙන, වඩාත් අර්ථවත් වෙන සංශෝධන තිබෙනවා නම් අපට ඉදිරියේදී වුණත් ඒ සංශෝධන ගෙනෙන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

අද අපි සම්මත කරන්නේ නැතිව ඊළඟ සතියේ එක දිනයක කාරක සභා අවස්ථාව කැඳවලා-

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

එහෙම කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා. අපි අද මේක සම්මත කරමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මොකද දන්නවාද? මම කියන්නේ මෙහෙමයි. අපි දැන් සංශෝධන සම්මත කළොත් නැවත සංශෝධන ගෙනෙන්න වෙන්නේ ක්‍රියා පටිපාටියකට අනුරූපීවයි. ඒ කියන්නේ ආයේත් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න ඕනෑ, ආයේත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

සතියකින් කොහොමත් අමාරුයි. මොකද, ඉතිරි සංශෝධන සම්බන්ධයෙන් අපට දවසින් දෙකෙන් කථා කරන්නත් බැහැ. එම නිසා අපි සාකච්ඡා කරලා ඒවා අපි පිළිගන්නවා නම් හැකිතාක් ඉක්මනින් ඒ සම්බන්ධයෙන් ප්‍රතිඋත්තරයක් ලබා දෙන්නම්. මොකද, මම කලින් කිව්වා වාගේ අතුරුදන් වූවන් පිළිබඳ සොයා බැලීමේ කාර්යාලය පිහිටුවීමේ පනත් කෙටුම්පත සම්මත කරන අවස්ථාවේත් අපි ඔබතුමන්ලාට යම් පොරොන්දුවක් ලබා දුන්නා. ඒ පොරොන්දුව ඒ ආකාරයටම ක්‍රියාත්මක වුණා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒකට අවුරුද්දක් ගත වුණා. නමුත් මෙය ඔක්තෝබර් 01වැනි දින සිට ක්‍රියාත්මක වෙනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

ඔබතුමන්ලා කියූ වැදගත්ම, බරපතළම කරුණු හැම දෙයක්ම වාගේ අපි ආණ්ඩුවක් හැටියට මේ වන විට ඇතුළත් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම හොඳයි. ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් මමත්, සිසිර ජයකොඩි මන්ත්‍රීතුමාත් මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් පෙත්සම්කරුවන් ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයටත් ඉදිරිපත් වුණා. ඒ අවස්ථාවේදී ශ්‍රේෂ්ඨාධිකරණය සමහර වගන්ති වෙනස් කරන්න තුනෙන් දෙකක ඡන්දයක් අවශ්‍ය බවටත්, සමහර ඒවා වෙනස් නොකළොත් ජනමත විචාරණයකට යා යුතු බවටත් තීන්දුවක් ලබා දුන්නා. ඊට පසුව ඒකාබද්ධ විපක්ෂයේ නායක දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත්, මමත්, ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමාත්, සිසිර ජයකොඩි මන්ත්‍රීතුමාත්, ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමාත්, ගරු ඇමතිතුමාත්, නිලධාරි මහත්වරුත් සමඟ මේ පිළිබඳ සාකච්ඡාවක් පැවැත්වුවා. පසුගිය සිකුරාදා ඒ සාකච්ඡාවට යන අවස්ථාවේදී අපි ඔබතුමාගේ ලේකම්තුමාට ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් සංශෝධන 31ක් භාර දුන්නා. ඒ සංශෝධන 31ම ගරු මුදල් අමාත්‍යතුමා සමඟ පැවැති සාකච්ඡාවේදී ඔබතුමාගේ නිලධාරින්ට පාර්ලිමේන්තුව විසින් යවලා තිබුණා. ඒකාබද්ධ විපක්ෂය සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබා දීමට එකඟ වීම ගැන අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. නමුත්, ඒ එකඟ වුණු ඒවායින් ඉතා සුළු කොටසක් පමණයි ඔබතුමාගේ සංශෝධන ලෙස දැන් අපට ලැබිලා තිබෙන්නේ. උදාහරණයක් වශයෙන් සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ආපසු ලැබෙන විට ඒ ලැබෙන ප්‍රතිලාභ බද්දෙන් නිදහස් කියලා තිබෙනවා. නමුත් සියයට 10 සිට සියයට 14 තෙක් සියයට 4ක් වැඩි වීම පිළිබඳ කිසිම වෙනසක් කරලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැන් ගරු මුදල් ඇමැතිතුමාට අවස්ථාව දෙන්න.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මේ සම්බන්ධයෙන් අපි වාද විවාද කළ යුතු නැහැ. එතුමා EPF, ETF ප්‍රශ්නයේදී සියයට 10, සියයට 14 කියන එක ගැන කථා කළත්, එතුමා ඇත්ත වශයෙන්ම කියන්නේ නැහැ - අපි අලුතෙන් යෝජනා කරලා තිබෙන පනත් කෙටුම්පත තුළ සියයට 14 කියන්නේ concessionary rate එක. පහළම rate එක දීලා තිබෙන්නේ. සියයට 10, සියයට 14 කළාට අද තිබෙන තත්ත්වය යටතේ පහළම මට්ටමට දමලා තිබෙන්නේ. එම නිසා ඒ ගැන ඊට වඩා වෙනසක් කරන්න බැහැ. ඔබතුමන්ලා කියපු දේවල්වලින් පිළිගන්න පුළුවන් හැම දෙයක්ම පිළිගෙන තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ආයෝජනය කළත් ඔහුට ලාභය වශයෙන් සියයට 14ක් ලැබෙන්නේ නැහැ. ඔහු රුපියල් මිලියනයක් ආයෝජනය කළොත් මිලියන 140ක ලාභයක් ලැබෙන්නේ නැහැ. ඔබතුමන්ලා ලාභයට සියයට 10ක් බදු ගහනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමැතිතුමා, මොකක්ද ඔබතුමා යෝජනා කරන්නේ?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

ගරු කථානායකතුමනි, සංශෝධන එකසිය ගණනක් තිබෙනවා. එම නිසා අපි දැන් එකින් එක ගනිමු.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

තුනෙන් දෙකක ඡන්දයෙන් ගන්න කියලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබාදුන් තීන්දුව වෙනස් කරලා තිබෙනවාද?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

ඒ තීන්දුව වෙනස් කරලා නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණයට ගියාට පස්සේ ලබාදුන් තීන්දුවට අනුකූලව තමයි අපි මේකේ හැම දෙයක්ම සකස් කර තිබෙන්නේ. විශේෂයෙන්ම තුනෙන් දෙකක කැමැත්ත අවශ්‍යයි කියපු කරුණු, එහෙම නැත්නම් ජනමත විචාරණයක් අවශ්‍යයි කියපු කරුණු අපි සම්පූර්ණයෙන් ඉවත් කර තිබෙනවා. සාමාන්‍යයෙන් simple majority එකෙන් සම්මත කරන්න පුළුවන් දේවල් 4ක් තිබුණා. අපි ඒ 4 ඒ ආකාරයෙන්ම සංශෝධනය කළා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, අපි දැන් ගරු ඇමතිතුමාට කියන්නේ, අපි ඉදිරිපත් කර තිබෙන සංශෝධන පිළිනොගත්තත්, ඒ පිළිබඳව සාකච්ඡා කරලා, තමුන්නාන්සේ හා රජය දරන මතය කියලා ඒක reject කරන්න; නමුත් අපට අපේ සංශෝධන ඉදිරිපත් කරන්න දෙන්න කියන එකයි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

ඔබතුමන්ලාගේ අදහස් පිළිබඳව විශේෂයෙන්ම සලකා බලනවා. 2018 වර්ෂය සඳහා වන අය වැය නොවැම්බර් මාසයේ 9වැනිදා ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එතැනදී ඔබතුමන්ලා කොයි තරම් කඩාකප්පල්කාරී විධියට කටයුතු කළත්, ඔබතුමන්ලාගේ හොඳ දේවල් අපි අගය කරනවා. Budget එක පිළිබඳවත් අපි ඔබතුමන්ලා එක්ක සාකච්ඡා කරන්නම්. ඔබතුමන්ලා සියලු දෙනා එක්ක අපි සාකච්ඡා කරනවා. ඇත්ත වශයෙන්ම කියනවා නම්, හෙට උදේ 9.00ට පාර්ලිමේන්තුව තුළ අපේ මන්ත්‍රීවරුන්ගේ යෝජනා හා අදහස් ගැනීමේ සාකච්ඡාවක් තිබෙනවා. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රී කණ්ඩායමටත් මම ඒ සඳහා ආරාධනා කරනවා. හෙට එන්න. [බාධා කිරීම්]

බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -
பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -
At the conclusion of the division bell -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාම වාඩිවෙන්න. කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙකුට ඡන්දය දීමේ අපහසුතාවක් තිබෙනවා නම් කරුණාකර අත උස්සන්න. දැන් ඡන්දය දීමට හැකියි. Voting starts.

මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது)
(At this stage, the Voting commenced.)

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාම ඡන්ද ප්‍රකාශ කර අවසානද? ඡන්දය ප්‍රකාශ කරන්න නොහැකි මන්ත්‍රීවරු ඉන්නවා නම් අත උස්සන්න. ඡන්දය ප්‍රකාශ කරන්න නොහැකි වුණු මන්ත්‍රීවරු 6දෙනෙක් ඉන්නවා නේද? ඡන්දය දෙන්න නොහැකි වුණු මන්ත්‍රීවරුන්ට අපි වෙනම අවස්ථාව ලබාදෙනවා. ඡන්දය දෙන්න නොහැකි වුණු මන්ත්‍රීතුමන්ලා දැන් කියන්න, ඔබතුමන්ලාගේ ඡන්දය පක්ෂවද, විපක්ෂවද කියලා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා, පක්ෂවද, විපක්ෂවද ඡන්දය දෙන්නේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
විරුද්ධයි.

ගරු සාලින්ද දිසානායක මහතා
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க)
(The Hon. Salinda Dissanayake)
විරුද්ධයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා.

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා
(மாண்புமிகு ஜனக பண்டார தென்னகோன்)
(The Hon. Janaka Bandara Tennakoon)
විරුද්ධයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
පක්ෂයි.

ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා (ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி - தேசிய ஒருமைப்பாடு மற்றும் நல்லிணக்க இராஜாங்க அமைச்சர்)
(The Hon. A.H.M. Fowzie - State Minister of National Integration and Reconciliation)
පක්ෂයි.

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව-
வாக்கெடுப்பின் பின் -
On conclusion of the Voting-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! ගරු මන්ත්‍රීවරුනි, දැන් ඔබතුමන්ලාගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය අවසානයි. දැන් ඡන්ද ප්‍රතිඵල ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය වෙයි.

මේ අවස්ථාවේ පහත සඳහන් නම් සහා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.
(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)
(At this stage, the following names appeared on the digital screen in the Chamber.)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 98: විරුද්ධව 38 : වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.
இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 98; எதிராக 38; விலகியிருந்தோர் 0.
According to Electronic Voting, Parliament divided: Ayes 98: Noes 38: Abstain 0.

G 001. Hon. Mangala Samaraweera	Yes
G 002. Hon. S.B. Dissanayake	Yes
G 004. Hon. Gamini Jayawickrama	Yes
G 005. Hon. John Amaratunga	Yes
G 006. Hon. Lakshman Kiriella	Yes
G 007. Hon. Ranil Wickramasinghe	Yes
G 009. Hon. Gayantha Karunatilleka	Yes
G 010. Hon. W.D.J. Senewiratne	Yes
G 012. Hon. Rauff Hakeem	Yes
G 014. Hon. Risad Badhiuththeen	Yes
G 015. Hon. Kabeer Hashim	Yes
G 017. Hon. Malik Samarawickrama	Yes
G 019. Hon. Anura P. Yapa	Yes
G 022. Hon. A.D. Susil Premajayantha	Yes
G 023. Hon. Tilak Marapana	Yes
G 025. Hon. Vajira Abeywardena	Yes
G 026. Hon. S.B. Nawinna	Yes
G 028. Hon. Champika Ranawaka	Yes
G 029. Hon. Mahinda Amaraweera	Yes
G 030. Hon. Navin Dissanayake	Yes
G 032. Hon. Duminda Dissanayake	Yes
G 033. Hon. Gamini Wijith Wijithamuni	Yes
G 037. Hon. Palany Thigambaram	Yes
G 039. Hon. (Mrs.) Thalatha Athukorala	Yes
G 040. Hon. Akila Viraj Kariyawasam	Yes
G 041. Hon. D.M. Swaminadan	Yes
G 042. Hon. Abdul Haleem	Yes
G 044. Hon. Sagala Ratnayake	Yes
G 045. Hon. Dayasiri Jayasekara	Yes
G 046. Hon. Harin Fernando	Yes
G 054. Hon. Ravindra Samaraweera	Yes
G 057. Hon. Dilip Wedaarachchi	Yes
G 058. Hon. Niroshan Perera	Yes
G 059. Hon. Ruwan Wijewardene	Yes
G 060. Hon. M.L.A.M. Hisbullah	Yes
G 061. Hon. Mohan Lal Grero	Yes
G 062. Hon. A.D. Premadasa Champika	Yes
G 063. Hon. (Mrs.) Vijayakala Maheswaran	Yes
G 065. Hon. Wasantha Senanayake	Yes
G 066. Hon. Wasantha Aluvihare	Yes
G 067. Hon. (Mrs.) Sudarshini Fernandopulle	Yes
G 068. Hon. Eran Wickramaratne	Yes
G 069. Hon. (Mrs.) Sumedha G. Jayasena	Yes
G 071. Hon. Ameer Ali Shibabdeen	Yes
G 072. Hon. Lasantha Alagiyawanna	Yes
G 074. Hon. Faizal Cassim	Yes
G 078. Hon. Dunesh Gankanda	Yes
G 080. Hon. Harsha De Silva	Yes
G 081. Hon. Ajith P. Perera	Yes
G 082. Hon. Ranjan Ramanayake	Yes
G 083. Hon. Ashok Abeysinghe	Yes
G 085. Hon. Tharanath Basnayake	Yes
G 087. Hon. Karunarathna Paranawithana	Yes
G 090. Hon. H.R. Sarathie Dushmantha	Yes
G 091. Hon. Palitha Tewarapperuma	Yes
G 094. Hon. Lucky Jayawardana	Yes
G 095. Hon. Vadivel Suresh	Yes
G 097. Hon. M.S. Thowfeek	Yes
G 098. Hon. J.M. Ananda Kumarasiri	Yes
G 101. Hon. Ranjith Aluvihare	Yes
G 102. Hon. Abdullah Mahrooff	Yes
G 103. Hon. Sirinal De Mel	Yes
G 104. Hon. Anura Sidney Jayarathne	Yes
G 105. Hon. K.K. Piyadasa	Yes
G 106. Hon. Lakshman Ananda	Yes

G 108. Hon. Ravi Karunanayake	Yes
G 109. Hon. Buddhika Pathirana	Yes
G 110. Hon. Ajith Mannapperuma	Yes
G 111. Hon. Nalin Bandara Jayamaha	Yes
G 112. Hon. Hector Appuhamy	Yes
G 114. Hon. Thushara Indunil Amarasena	Yes
G 115. Hon. Aravinda Kumara	Yes
O 001. Hon. Douglas Devananda	Yes
O 003. Hon. Anura Dissanayaka	No
O 004. Hon. K. Thurairetnasingam	Yes
O 010. Hon. Chamal Rajapakse	No
O 015. Hon. Bandula Gunawardane	No
O 017. Hon. C.B. Ratnayake	No
O 020. Hon. Vasudeva Nanayakkara	No
O 021. Hon. A. Adaikkalanathan	Yes
O 022. Hon. Nihal Galappathi	No
O 023. Hon. Sunil Handunnetti	No
O 024. Hon. Seeniththamby Yoheswaran	Yes
O 027. Hon. M.A. Sumanthiran	Yes
O 029. Hon. Gamini Lokuge	No
O 030. Hon. Mahinda Yapa Abeywardena	No
O 031. Hon. Keheliya Rambukwella	No
O 032 Hon. Kumara Welgama	No
O 033. Hon. Dullas Alahapperuma	No
O 035. Hon. Chandrasiri Gajadeera	No
O 037. Hon. Mahindananda Aluthgamage	No
O 038. Hon. U. Piyankara Jayarathna	No
O 041. Hon. Bimal Rathnayake	No
O 050. Hon. Weerakumara Dissanayake	No
O 052. Hon. Wimalaweera Dissanayake	No
O 053. Hon. Jayantha Samaraweera	No
O 054. Hon. Udaya Shantha Gunasekara	No
O 056. Hon. Mohan Priyadarshana	No
O 057. Hon. T. Ranjith De Soysa	No
O 058. Hon. Ramesh Pathirana	No
O 059. Hon. Vijitha Berugoda	No
O 061. Hon. Ashoka Priyantha	Yes
O 064. Hon. Chandima Gamage	Yes
O 065. Hon. Kavinda Heshan Jayawardana	Yes
O 070. Hon. Namal Rajapaksa	No
O 071. Hon. Janaka Wakkumbura	No
O 073. Hon. (Mrs.) Sriyani Wijewickrama	No
O 075. Hon. Shehan Semasinghe	No
O 076. Hon. Kanaka Herath	No
O 079. Hon. D.V. Chanaka	No
O 081. Hon. Sujith Sanjaya Perera	Yes
O 083. Hon. Bandulal Bandarigoda	Yes
O 084. Hon. Mohammad Ibrahim Mohammad Mansoor	Yes
O 085. Hon. S.M. Marikkar	Yes
O 086. Hon. Imaran Maharoof	Yes
O 087. Hon. Ashu Marasinghe	Yes
O 088. Hon. Ishak Rahuman	Yes
O 090. Hon. Piyal Nishanta De Silva	No
O 091. Hon. Sanath Nishantha Perera	No
O 092. Hon. S. Premarathne	No
O 093. Hon. Tharaka Balasuriya	No
O 094. Hon. Cader Kader Masthan	Yes
O 095. Hon. Prasanna Ranatunge	No
O 096. Hon. Prasanna Ranaweera	No
O 097. Hon. Angajan Ramanathan	Yes
O 098. Hon. Kanchana Wijesekara	No
O 099. Hon. Indika Anurudda Herath	No
O 101. Hon. Mujibur Rahuman	Yes
O 102. Hon. Harshana Rajakaruna	Yes
O 103. Hon. Jayampathy Wickramaratne	Yes
O 104. Hon. (Mrs.) Thusita Wijemanne	Yes
O 106. Hon. Chaminda Wijesiri	Yes
O 108. Hon. Sandith Samarasinghe	Yes
O 109. Hon. M.H.M. Salman	Yes
O 110. Hon. Chathura Senaratne	Yes
O 111. Hon. Wijepala Hettiarachchi	Yes

Electronic Voting Result:

YES	98
NO	38
ABSTAIN	00

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විද්‍යුත් ඡන්ද විමසීම් අනුව පක්ෂව 98; නැඟීසිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 02; පක්ෂව මුළු ඡන්ද සංඛ්‍යාව 100; විරුද්ධව 38; නැඟීසිට විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 03; විරුද්ධව මුළු ඡන්ද සංඛ්‍යාව 41. [බාධා කිරීමක්] ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ ඡන්දයත් එයට ඇතුළත්වෙලා තිබෙනවා.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' -[ගරු මංගල සමරවීර මහතා]

தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு மங்கள சமரவீர]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Mangala Samaraweera]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[THE HON. SPEAKER *in the Chair.]*

1 වන වගන්තිය.- (ලුහුඬු නාමය)
வாசகம் 1.- (சுருக்கப் பெயர்.)
CLAUSE 1.- *(Short title.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Sir, I move,

"In page 1, immediately after line 4, insert:

'Effective date of the Act	The provisions of this Act shall be effective from April 1, 2018' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

1 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 1, as amended, ordered to stand part of the Bill.

2 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
2ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 2 ordered to stand part of the Bill.

3 වන වගන්තිය.- (බදු අයකළ හැකි ආදායම)

வாசகம் 3.- (வரி விதிக்கப்படற்பாலதான வருமானம்.)

CLAUSE 3.- *(Taxable income.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

Sir, I move,

"In page 2, leave out all words in line 20 and insert:

'(3) The taxable income of each person and the assessable income from each';"

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 3, as amended, ordered to stand part of the Bill.

4 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

4ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 4 ordered to stand part of the Bill.

5 වන වගන්තිය.- (සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම)

வாசகம் 5.- (ஊழிய வருமானம்.)

CLAUSE 5.- *(Employment income.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

Sir, I move,

(1) "In page 3, leave out all words in line 10 and insert:

'an employment for a year of assessment the following amounts received or derived by the individual during the year of assessment from the employment shall';"

(2) "In page 3, leave out all words in line 25 and insert:

'(f) subject to paragraph (f) of subsection (3), retirement contributions';"

(3) "In page 4, leave out all words in line 28 and insert:

'share scheme (referred to in paragraph (j) of ';"

(4) "In page 5, leave out all words in lines 4 to 6 (both inclusive) and insert:

'provident or savings fund or savings society approved by the Commissioner-General.';"

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

5ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 5, as amended, ordered to stand part of the Bill.

6 වන වගන්තිය.- (ව්‍යාපාර ආදායම.)

வாசகம் 6.- (வியாபார வருமானம்.)

CLAUSE 6.- *(Business income.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

Sir, I move,

"In page 5, leave out all words in line 11 and insert:

'conducting a business for a year of assessment the following amounts derived by the person during the year of assessment from the business'; "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 6, as amended, ordered to stand part of the Bill.

7 වන වගන්තිය.- (ආයෝජන ආදායම.)

வாசகம் 7.- (முதலீட்டு வருமானம்.)

CLAUSE 7.- *(Investment income.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

Sir, I move,

"In page 6, leave out all words in line 15 and insert:

'the following amounts received or derived by the person during the year of assessment from the investment shall be included :-'; "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

7 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

7ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 7, as amended, ordered to stand part of the Bill.

8 සිට 14 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

8ஆம் வாசகத்திலிருந்து 14ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 8 to 14 ordered to stand part of the Bill.

15 වන වගන්තිය.- (පර්යේෂණ හා සංවර්ධන වියදම් සහ කෘෂිකාර්මික කටයුතු ආරම්භ කිරීමේ වියදම්.)

வாசகம் 15.- (ஆராய்ச்சியும் அபிவிருத்திச் செலவுகளும் கமத்தொழிற்சார் ஆயத்தநிலைச் செலவுகளும்.)

CLAUSE 15.- *(Research and development expenses and agricultural start up expenses.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Sir, I move,

"In page 12, leave out all words in line 3 and insert:

'(c) the purchase of livestock or poultry to be'; "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

15 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
15ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 15, as amended, ordered to stand part of the Bill.

16 සහ 17 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
16ஆம், 17ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 16 and 17 ordered to stand part of the Bill.

18 වන වගන්තිය.- (මූල්‍ය පිරිවැයෙහි අඩු කළ හැකි මුදල.)

வாசகம் 18.- (நிதிசார் ஆகுசெலவின் கழிக்கத்தக்க தொகை.)

CLAUSE 18.- *(Deductible amount of financial cost.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Sir, I move,

"In page 14, leave out all words in lines 11 to 13 (both inclusive) and insert:

'calculating an entity's income, other than a financial institution from conducting'; "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

18 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
18ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 18, as amended, ordered to stand part of the Bill.

19 වන වගන්තිය.- (ව්‍යාපාර හෝ ආයෝජන පාඩු.)

வாசகம் 19.- (வியாபார அல்லது முதலீட்டு நட்டங்கள்.)

CLAUSE 19.- *(Business or investment losses.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Sir, I move,

"In page 16, leave out all words in line 9 and insert:
'an investment asset shall not be reduced by any loss on the'; "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

19 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
19ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 19, as amended, ordered to stand part of the Bill.

20 සිට 30 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
20ஆம் வாசகத்திலிருந்து 30ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 20 to 30 ordered to stand part of the Bill.

31 වන වගන්තිය.- (වාර්ෂික ගෙවීම්, වාරික විකිණීම් හා මූල්‍ය කල්බදු.)

வாசகம் 31.- (ஆண்டுத்தொகைகள், தவணைப்பண விற்பனைகள் மற்றும் நிதிக் குத்தகைகள்.)

CLAUSE 31.- *(Annuities, instalment sales and finance leases.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Sir, I move,

"In page 26, leave out all words in lines 7 and 8 and insert:

'(5) The Commissioner-General may specify any other forms of financing that relates to interest substitutes.'; "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

31 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
31ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 31, as amended, ordered to stand part of the Bill.

32 සිට 45 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
32ஆம் வாசகத்திலிருந்து 45ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 32 to 45 ordered to stand part of the Bill.

[ගරු මංගල සමරවීර මහතා]

46 වන වගන්තිය.- (යම් ආශ්‍රිතයකු වෙත වත්කම් පැවරීම හෝ කිසිදු ප්‍රතිෂ්ඨාවක් නොමැතිව වත්කම් පැවරීම.)

வாசகம் 46.- (ஓர் இணையாளருக்கு அல்லது பிரதிபயன் எதுவுமின்றி சொத்தைக் கைமாற்றுதல்.)

CLAUSE 46.- *(Transfer of asset to an associate or for no consideration.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Sir, I move,

(1) "In page 38, leave out all words in line 28 and insert:

'or a charitable institution and the requirements of subsection (3) are met-'; "

(2) "In page 39, leave out all words in line 1and insert:

'(b) the associate or the charitable institution shall be treated as incurring';

(3) "In page 39, leave out all words in lines 5 to 13 (both inclusive) and insert:

'(a) in the case of a transfer to an associate-

(i) the associate in relation to the individual is the individual's child by marriage or adoption, spouse, parent, grandparent, grandchild, sibling, aunt, uncle, nephew, niece or first cousin; and

(ii) the asset is an interest in land or a building situated in Sri Lanka; or

(b) in the case of a transfer to a charitable institution, the transfer occurs by way of gift.'; "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

46 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
46ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 46, as amended, ordered to stand part of the Bill.

47 සිට 49 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
47ஆம் வாசகத்திலிருந்து 49ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 47 to 49 ordered to stand part of the Bill.

50 වන වගන්තිය.- (ප්‍රාග්ධන වත්කම් පැවරීම ලියාපදිංචි කිරීම.)

வாசகம் 50.- (மூலதனச் சொத்துக்களின் கைமாற்றுகையைப் பதிவுசெய்தல்.)

CLAUSE 50.- *(Registration of transfer of capital assets.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Sir, I move,

"In page 42, leave out all words in lines 17 to 22 (both inclusive) and insert:

'Payment of tax on gains from realization of an asset.	50. The manner and the procedure relating to the payment of tax on the gain from realization of an asset may be specified by the Commissioner General'; "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

50 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
50ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 50, as amended, ordered to stand part of the Bill.

51 සිට 54 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
51ஆம் வாசகத்திலிருந்து 54ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 51 to 54 ordered to stand part of the Bill.

55 වන වගන්තිය.- (හවුල්කරුවන්ගෙන් බදු අය කිරීම.)

வாசகம் 55.- (பங்காளர்களுக்கான வரிவிதிப்பு.)

CLAUSE 55.- *(Taxation of partners.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Sir, I move,

"In page 46, leave out all words in line 17 and insert:
'paragraph (b) of subsection (3).'; "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

55 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
55ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 55, as amended, ordered to stand part of the Bill.

56 සිට 61 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
56ஆம் வாசகத்திலிருந்து 61ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 56 to 61 ordered to stand part of the Bill.

62 වන වගන්තිය.- (බද්ද ප්‍රේෂණය කිරීම.)

வாசகம் 62.- (வரியனுப்புகை.)

CLAUSE 62.- *(Remittance of tax.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Sir, I move,

"In page 51, leave out all words in line 20 and insert:

"In page 51, leave out all words in line 20 and insert:

'Act on or before the thirtieth day succeeding the date of making such remittances.'; "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

62 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
62ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 62, as amended, ordered to stand part of the Bill.

63 සිට 66 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
63ஆம் வாசகத்திலிருந்து 66ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 63 to 66 ordered to stand part of the Bill.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු සභාපතිතුමනි, අපි ගරු ඇමතිතුමා සමඟ එකඟතාවකට පැමිණ පුණ්‍ය ආයතන සම්බන්ධයෙන් තිබෙන 68 වන වගන්තියට සංශෝධනයක් ඉදිරිපත් කළා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, අපි තවම 68 වන වගන්තියට ආවේ නැහැ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හොඳයි.

67 වන වගන්තිය.- (රක්ෂණ ව්‍යාපාර.)
வாசகம் 67.- (காப்புறுதித் தொழில் வியாபாரம்.)
CLAUSE 67.- *(Insurance business.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Sir, I move,

(1) "In page 55, leave out all words in lines 8 to 33 (both inclusive) and insert:

'Insurance Business.

'67. (1) In the case of a person engaged in the business of life insurance, whether mutual or proprietary, the gains and profits from the business on which tax is payable shall be ascertained by taking the aggregate of -

(a) the surplus distributed to share holders from the life insurance policy holders fund as certified by the Appointed Actuary functioning within the Regulation of the Insurance Industry Act, No. 43 of 2000; and

(b) the investment income of the share holder fund less any expenses incurred in the production of such income,

subject to the deductions claimable under Section 19 in arriving at the income from the business.

(2) For the purpose of subsection (1), the surplus distributed to a life insurance policy holder who shares the profits of a person engaged in the business of life insurance in a given year, as provided in the Regulation of Insurance Industry Act, No. 43 of 2000, shall be deemed as gains and profits of that person from the business and subject to tax accordingly.'; "

(2) "In page 56, leave out all words in lines 1 to 9 (both inclusive) and insert:

'(3) The profits of a non-resident company whether mutual'; "

(3) "In page 56, leave out all words in line 27 and insert:

'(4) Where the Commissioner-General is satisfied that by'; "

(4) "In page 57, leave out all words in lines 4 to 20 (both inclusive)."

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

67 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
67ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 67, as amended, ordered to stand part of the Bill.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඊළඟට, 68වන වගන්තිය.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු සභාපතිතුමනි, අපි 68වන වගන්තිය සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කළා. පුණ්‍ය ආයතන පිළිබඳ කොටසයි එහි තිබෙන්නේ. පුණ්‍ය ආයතනවල 1815 මාර්තු 02වන දාට පෙර රාජකීය ප්‍රදානයන් මඟින් ලැබුණු දේපළවල ආදායම්, ලාභ බද්දෙන් නිදහස් වීම පිළිබඳ වගන්තිය ඔබතුමා ඇතුළත් කරනවා කියා කිව්වා, ගරු අමාත්‍යතුමනි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඇතුළත් කරනවා කියා මම කිව්වේ නැහැ. ඒ හැම එකක්ම සලකා බලනවා කියා කිව්වා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
එය දැන් සලකා බලන්නේ නැද්ද කියායි මා අහන්නේ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
එම සංශෝධනය අපට පිළිගන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
එය නොපිළිගැනීමෙන් වෙන්නේ ඒ පැවැති අයිතිය නැති වන එකයි, ගරු අමාත්‍යතුමනි. ආගමික ස්ථාන -[බාධා කිරීම්]

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඇත්ත වශයෙන්ම පුණ්‍ය ආයතනවලට කිසිම අසාධාරණයක් වන්නේ නැහැ. ඒ අයිතිය තිබුණු විධියටම තිබෙනවා. Withholding Tax එක විතරක් සියයට 2.5 සිට සියයට 5 දක්වා වැඩි වනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු අමාත්‍යතුමනි, පුණ්‍ය ආයතනවල -පල්ලි, පන්සල්, දේවාල ඇතුළු ආගමික ස්ථාන ඇතුළු සියල්ලෙහි- යම්කිසි ආගමික කටයුතුවල ප්‍රවර්ධනය වෙනුවෙන්ම ලබන ලාභ, ආදායම් බද්දට යටත් කිරීම ගැනයි කියන්නේ. පොලිය ගැන නොවෙයි කියන්නේ. ඒ ආයතන එවැනි ව්‍යාපාර කරන්නේ ඒ පුණ්‍ය කටයුත්තේම ප්‍රයෝජනය සඳහා යොදවන්නයි. එයින් ලැබෙන ලාභ ආදායම යොදවන්නේ එයටයි. පුද්ගලික ප්‍රයෝජනයකට ගන්නා එකක් ගැන නොවෙයි කියන්නේ. ඒ නිසා තමයි අප කියන්නේ එය නිදහස් කරන්න කියා. එය පහසුවෙන් එකඟ වන්න පුළුවන් එකක්.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඇත්ත වශයෙන්ම, විශ්වවිද්‍යාල සහ "Government-assisted schools" කියන දෙකම මෙමඟින් exempt කරලායි තිබෙන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු සභාපතිතුමනි, එම සංශෝධනය නොපිළිගන්න බැහැ නේ. ඔබතුමන්ලා කාටත් පාර්ලිමේන්තුව වශයෙන් එය පිළිගන්න පුළුවන් නේ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු මන්ත්‍රීතුමා, තුන්වන උපලේඛනය - Third Schedule එක - බලන්න. ඒ කියන ඔක්කෝම එහි සඳහන් වෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නැහැ, නැහැ. මෙහි නිශ්චිත වශයෙන් සඳහන් වන්නේ නැහැ. බ්‍රිතාන්‍ය අවධියේදීවත් රාජකීය ප්‍රදානයන්-

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
නිදහස් කිරීම් සම්බන්ධයෙන් තුන්වන උපලේඛනය බලන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
එහෙම නම්, තුන්වන උපලේඛනය බලන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
නිදහස් කිරීම් සියල්ල අපි සඳහන් කරලායි තිබෙන්නේ. ඊට අනුව universities and Government-assisted schools are also exempted.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ආගමික ස්ථාන කියා සඳහන් කර නැහැ නේ. ඔබතුමා universities ගැන කියනවා. කොහේද ආගමික ස්ථාන කියා සඳහන් කර තිබෙන්නේ? තිබෙනවා නම් ඒ කොතැනද? පුණ්‍ය ආයතන-

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ආගමික ස්ථාන කියා සඳහන් කරන්න අපට බැහැ. මා වේලාසනින් කියපු විධියටම, පුණ්‍ය ආයතනයක් නම් එය පුණ්‍ය ආයතනයක් ම වෙන්න ඕනෑ. පුණ්‍ය ආයතනයක් ලාභ ලබනවා නම්, එය පුණ්‍ය ආයතනයක් වුණත් -[බාධා කිරීමක්] තුන්වන උපලේඛනයේ ඔබතුමා කියන හැම එකම තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. පුණ්‍ය ආයතනයක් ලාභ ලබනවා නම් ඒ අයත් බදු ගෙවන්න ඕනෑ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
පුණ්‍ය ආයතනයක් විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක ලාභ හුදෙක් ඒ පුණ්‍ය ආයතනයේ කාර්යය සඳහා යොදවන්නේ නම් -[බාධා කිරීමක්]

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
එය ඇතුළත් වෙලා තිබෙනවා ලු, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු සභාපතිතුමනි, තුන්වන උපලේඛනයේ සඳහන්ව තිබෙනවා-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු දයාසිරි ජයසේකර අමාත්‍යතුමනි, එය සඳහන්ව තිබෙනවාද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු සභාපතිතුමනි, එහි (ඩ) යටතේ සඳහන්ව තිබෙනවා, "1815 මාර්තු මස 2 වන දිනට පෙරාතුව රාජකීය හෝ වෙනත් ප්‍රදානයක් මඟින්, පුණ්‍ය ආයතනයක් විසින් පරිපාලනය කරනු ලබන යම් පොදු පූජනීය ස්ථානයකට පරිත්‍යාග කරන ලද යම් දේපළකින් ලැබෙන ලාභ සහ ආදායම, එම ලාභ සහ ආදායම එම ප්‍රදානය කරනු ලැබුවේ යම් කාර්ය වෙනුවෙන් ද ඒ කාර්ය සඳහා යොදා ගනු ලබන තාක් දුරට; " කියා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
එය ඇතුළත් වනවා, ගරු මන්ත්‍රීතුමා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා, ගරු දයාසිරි ජයසේකර අමාත්‍යතුමා කියපු එක හරි. In English it states, I quote:

> "(r) the profits and income from any property donated by royal or other grant before March 2, 1815, to any place of public worship administered by charitable institution, insofar as such profits and income are applied to the purposes for which such grant was made;".

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
එය ඇතුළත් වෙලා තිබෙනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
පුණ්‍ය කටයුතු සඳහා ඒවා පාවිච්චි කරන්න ඕනෑ. [බාධා කිරීම්] Business කරනවා නම් බදු ගෙවන්න ඕනෑ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)
ගරු මන්ත්‍රීතුමා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අග්‍රාමාත්‍යතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු මන්ත්‍රීතුමා, රජ කාලයේ තිබුණු ඒවා ඔක්කෝම අප exempt කරලායි තිබෙන්නේ. "මහරජ" කාලයේ ඒවාට නම් බදු ගෙවන්න වෙනවා. [බාධා කිරීම්]

68 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
68ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 68 ordered to stand part of the Bill.

69 වන වගන්තිය.- (වාසික තැනැත්තන්.)
வாசகம் 69.- (வதிவுள்ள ஆட்கள்.)
CLAUSE 69.- *(Resident persons.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Sir, I move,

(1) "In page 58, leave out all words in lines 29 and 30"; and

(2) "In page 59, leave out all words in lines 1 and 2."

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

69 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
69ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 69, as amended, ordered to stand part of the Bill.

70 සිට 73 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
70ஆம் வாசகத்திலிருந்து 73ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 70 to 73 ordered to stand part of the Bill.

74 වන වගන්තිය.- (විදේශීය මූලාශ්‍ර.)
வாசகம் 74.- (வெளிநாட்டு மூலம்.)
CLAUSE 74.- *(Foreign Source.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Sir, I move,

"In page 66, leave out all words in line 7 and insert:

> 'Division II: Double Taxation Agreements And Mutual Administrative Assistance Agreements'; "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

[ගරු මංගල සමරවීර මහතා]

74 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
74ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 74, as amended, ordered to stand part of the Bill.

75 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
75ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 75 ordered to stand part of the Bill.

76 වන වගන්තිය.- (ආශ්‍රිතයන් අතර වන ජාත්‍යන්තර ගනුදෙනුවලින් ඇතිවන ලාභ සහ ආදායම් හෝ අලාභ.)

வாசகம் 76.- (இணையாளர்களுக்கு இடையேயான சர்வதேசக் கொடுக்கல்வாங்கல்களில் இருந்தான இலாபங்களும் வருமானமும் அல்லது நட்டமும்.)

CLAUSE 76.- *(Profits and income or loss from international transactions between associates.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

Sir, I move,

(1) "In page 67, leave out all words in lines 13 and 14 and insert:

'or accruing from, or any loss incurred by any person in Sri Lanka engaged in any international' ";

(2) "In page 67, leave out all words in lines 20 and 21 and insert:

'be a person for the ascertainment of income, gains or profits arising in or derived from or any loss incurred in Sri Lanka from such' ";

(3) "In page 69, leave out all words in line 2 and insert:

'person, either one is non-resident, other' ";

(4) "In page 69, leave out all words in line 7 and insert:

'enterprises and other person and, by which' ";

(5) "In page 69, leave out all words in line 9 and insert:

'between such enterprises and other person' ";

(6) "In page 69, leave out all words in line 22 and insert:

'course of his audit that the income, gain or profits or the loss' ";

(7) "In page 69, leave out all words in lines 30 and 31 and insert:

'Pricing Officer may in writing addressed to the person referred to in subsection (1) require him to prove' ";

(8) "In page 70, leave out all words in line 28";

(9) "In page 70, leave out all words in line 29 and insert:

'(i) A person, who is dissatisfied' ";

(10) "In page 71, leave out all words in lines 6 and 7 and insert:

'provisions of section 135, assess the amount of income, gain or profits and issue assessment in accordance with the final' ";

(11) "In page 71, immediately after line 9, at end add:

'(*l*) Such person or partner of a partnership who is aggrieved by such assessment made based on the final order, may within thirty days of the notice of assessment make an appeal to the Commissioner-General under Chapter XIII.' ";

(12) "In page 71, leave out all words in line 21 and insert:

'income, gain or profits by which the total income, gain or profits' ";

(13) "In page 71, leave out all words in line 23 and insert:

'computation of income, gain or profits under this section and in accordance' ";

(14) "In page 71, leave out all words in line 26 and insert:

'between any person' ".

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

76 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
76ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 76, as amended, ordered to stand part of the Bill.

77 වන වගන්තිය.- (ආශ්‍රිතයන් අතර වන ගනුදෙනුවලින් ලැබෙන ලාභ සහ ආදායම් හෝ අලාභ.)

வாசகம் 77.- (இணையாளர்களுக்கிடையேயான கொடுக்கல்வாங்கல்களிலிருந்தான இலாபங்கள் மற்றும் வருமானங்கள் அல்லது நட்டம்.)

CLAUSE 77.- *(Profits and income or loss from transactions between associates.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

Sir, I move,

(1) "In page 72, leave out all words in lines 2 and 3 and insert:

'or accruing from, or any loss incurred in by any person in Sri Lanka engaged in any transaction, other' ";

(2) "In page 72, leave out all words in lines 8 and 9 and insert:

'in the course of his audit, the income, gains or profits or the loss referred to in subsection (1),' ";

(3) "In page 72, leave out all words in line 15 and insert:

'to the person, referred to in' ";

(4) "In page 73, leave out all words in line 16 and insert:

'(*h*) A person, who is' ";

(5) "In page 73, leave out all words in line 22 and insert:

'(*i*) where a person has' ";

(6) "In page 74, leave out all words in line 1and insert:

'(*k*) if such person who is' ";

(7) "In page 74, leave out all words in line 7 and insert:

'Where the computation of income, gain or profits under subsection (2) has' ";

(8) "In page 74, leave out all words in lines 17 and 18 and insert:

'profits by which the total income, gain or profits of the associated enterprises is increased after the computation of income, gain or profits' ";

(9) "In page 74, leave out all words in line 24 and insert:

'(a) 'a person'-' ";

(10) "In page 74, leave out all words in lines 26 and 27 and insert:

'another enterprise, if one person participates directly or' ";

(11) "In page 74, leave out all words in lines 30 and 31 and insert:

'control or capital of the other person or' ";

(12) "In page 74, leave out all words in line 33 and insert:

'enterprise of another person' ";

(13) "In page 75, leave out all words in line 1 and insert:

'if one person' "

(14) "In page 75, leave out all words in line 7 and insert:

'(b) a person referred to in above' "

(15) "In page 75, leave out all words in line 17 and insert:

'transfer price declared by a person' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

77 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
77ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 77, as amended, ordered to stand part of the Bill.

78 සිට 83 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
78ஆம் வாசகத்திலிருந்து 83ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 78 to 83 ordered to stand part of the Bill.

84 වන වගන්තිය.- (ආයෝජන ප්‍රතිලාභවලින් බද්ද රඳවා ගැනීම.)

வாசகம் 84.- (முதலீட்டுத் திரும்பல்களிலிருந்தான பிடித்துவைத்தல்.)

CLAUSE 84.- *(Withholding from investment returns.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Sir, I move,

(1) "In page 79, leave out all words in line 20 and insert:

'84. (1) Subject to subsection (3), a person shall' "

(2) "In page 80, immediately after line 6 insert:

'(2) The National Gem and Jewelry Authority established by the National Gem and Jewelry Authority Act, No. 50 of 1993 shall withhold tax at the rate provided in paragraph 10 of the First Schedule, from the sale price of any gem sold at an auction conducted by it, from the sum payable to the seller of such gem and at the time of such sum is paid to the seller.'"

(3) "In page 80, leave out all words in line 12 and insert:

'(c) interest paid to a financial institution on the ordinary loans and advances provided by it' "

(4) "In page 80, leave out all words in lines 14 and 15 and insert:

'(d) interest or discount paid to any person on Security or Treasury Bond under the Registered Stocks and Securities Ordinance (Chapter 420) or Treasury Bill under the Local Treasury Bills Ordinance (Chapter 417): or

(e) payments or allocations that are exempt amounts under section 9.'"

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

84 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
84ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 84, as amended, ordered to stand part of the Bill.

85 වන වගන්තිය.- (සේවා ගාස්තුවලින් සහ කොන්ත්‍රාත් ගෙවීම්වලින් රඳවා ගැනීම.)

வாசகம் 85.- (சேவைக் கட்டணங்களில் இருந்தும் ஒப்பந்தக் கொடுப்பனவுகளில் இருந்துமான பிடித்துவைத்தல்.)

CLAUSE 85.- *(Withholding from services fees and contract payments.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Sir, I move,

"In page 80, leave out all words in line 16 and insert:

'85. (1) subject to subsection (3), a person shall ' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

85 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
85ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 85, as amended, ordered to stand part of the Bill.

86 සහ 87 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
86ஆம், 87ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 86 and 87 ordered to stand part of the Bill.

88 වන වගන්තිය.- (අවසාන රඳවා ගැනීමේ ගෙවීම්.)

வாசகம் 88.- (இறுதி பிடித்துவைத்தற் செலுத்துகைகள்.)

CLAUSE 88.- *(Final withholding payments.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Sir, I move,

[ගරු මංගල සමරවීර මහතා]

"In page 84, leave out all words lines 17 to 24 (both inclusive) and insert:

'(ii) a charitable institution:' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

88 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

88ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 88, as amended, ordered to stand part of the Bill.

89 වන වගන්තිය.- (අවසාන රඳවා ගැනීමේ බදු නොවන බදු සඳහා වූ බදු බැර.)

வாசகம் 89.- (இறுதியானதற்ற பிடித்துவைத்தல் வரிக்கான வரவு.)

CLAUSE 89.- *(Credit for non-final withholding tax.)*

ගරු මංගල සමරවීර මහතා

(மாண்புமிகு மங்கள சமரவீர)

(The Hon. Mangala Samaraweera)

Sir, I move,

(1) "In page 85, leave out all words in line 27 and insert:

'(2) A withholdee shall be'"

(2) "In page 86, leave out all words in lines 1 to 6."

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

89 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

89ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 89, as amended, ordered to stand part of the Bill.

90 සිට 96 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

90ஆம் வாசகத்திலிருந்து 96ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 90 to 96 ordered to stand part of the Bill.

97 වන වගන්තිය.- (නිලධරයෝ.)

வாசகம் 97.- (அலுவலர்கள்.)

CLAUSE 97.- *(Officers.)*

ගරු මංගල සමරවීර මහතා

(மாண்புமிகு மங்கள சமரவீர)

(The Hon. Mangala Samaraweera)

97 වන වගන්තියට ඒකාබද්ධ විපක්ෂයත්, ජනතා විමුක්ති පෙරමුණත් සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා. ඒවා අපේ සංශෝධනවල දැනටමත් තිබෙනවා.

ගරු සභාපතිතුමා

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, අපි 98 වන වගන්තියටයි සංශෝධන ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු සභාපතිතුමා

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

97 වන වගන්තියේ සංශෝධන දෙකක් තිබෙනවා. 98 වන වගන්තියේත් සංශෝධන තිබෙනවා.

ගරු මංගල සමරවීර මහතා

(மாண்புமிகு மங்கள சமரவீர)

(The Hon. Mangala Samaraweera)

97 වන වගන්තියටත් සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. 98 වන වගන්තියටත් සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. තවම අපි ඉන්නේ 97 වන වගන්තියේයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

I have moved an amendment to Clause 98.

ගරු මංගල සමරවීර මහතා

(மாண்புமிகு மங்கள சமரவீர)

(The Hon. Mangala Samaraweera)

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, 98වන වගන්තියට කලින් 97 වන වගන්තියේ සංශෝධන තිබෙනවා.

ගරු සභාපතිතුමා

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

We are on Clause 97. 97 වන වගන්තියට ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ගෙනෙන සංශෝධන ඉදිරිපත් කරන්න තිබෙනවා.

ඊට පෙර, ගරු ඇමතිතුමාගේ සංශෝධන ඉදිරිපත් කරන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)

(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ සංශෝධන ඉදිරිපත් කළොත්, අපට බලන්න පුළුවන් අපේ සංශෝධනය කොයි ආකාරයෙන්ද ඇතුළත් වෙලා තිබෙන්නේ කියලා.

ගරු සභාපතිතුමා

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

ගරු මන්ත්‍රීතුමනි, ඇමතිතුමා දැන් ඒ සංශෝධනය කියවනවා. ඔබතුමාගේ සහ ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමාගේ සංශෝධන දැන් කියවනවා. ගරු ඇමතිතුමා කියවනවා ඔබතුමන්ලා අහගෙන ඉන්න. Hon. Minister will now move the amendment. ඊට පස්සේ ඔබතුමන්ලා කථා කරන්න.

ගරු මංගල සමරවීර මහතා

(மாண்புமிகு மங்கள சமரவீர)

(The Hon. Mangala Samaraweera)

Sir, I move,

(1) "In page 93, leave out all words in lines 28 to 30 and insert:

'(1) For the purposes of this Act, there shall be appointed a Commissioner-General of Inland Revenue, such

number of Deputy Commissioner-Generals of Inland Revenue, Senior Commissioners of Inland Revenue, Commissioners of Inland Revenue, Senior Deputy Commissioners of Inland Revenue, Deputy Commissioners of Inland Revenue and Assistant Commissioners of Inland Revenue'"

ඒක තමයි, first amendment එක. ගරු මන්ත්‍රීතුමනි, අපි Clause 97වල lines දෙක සහ තුන delete කරනවා; we will delete all words in lines 2 and 3 on page 94.

(2) "In page 94, leave out all words in lines 2 and 3."

(3) "In page 94, leave out all words in lines 11 and 12 and insert:

'(3) The Commissioner-General or an officer of the Department authorized by the'"

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමා සංශෝධන ඉදිරිපත් කරන්න.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු සභාපතිතුමනි, 97වන වගන්තිය අපි පිළිගෙන තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු සභාපතිතුමනි, 97වන වගන්තිය පිළිගන්නවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
If there is any difference, let me know.

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

97වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
97ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 97, as amended, ordered to stand part of the Bill.

98 වන වගන්තිය.- (බලතල පැවරීම.)

வாசகம் 98.- (தத்துவங்களைக் கையளித்தல்.)

CLAUSE 98. - (*Delegation of powers.*)

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු සභාපතිතුමනි, 98වන වගන්තිය මම කියවන්නද?

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමා 98 වගන්තිය කියෙව්වාට පසුව බලන්න, ඒකට එකඟ ද කියලා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
I move,

(1) "In page 94, leave out all words in lines 20 to 23 (both inclusive) and insert:

'98. (1) The Commissioner-General may delegate to a tax official of the Department a power or duty conferred or imposed on him by this Act.' "

(2) "In page 94, leave out all words in lines 25 and 26 and insert:

'duty to a specific individual tax official within the Department.' "

(3) "In page 94, leave out all words in line 31 and insert:

'to tax officials as the Commissioner-General may' "

(4) "In page 95, leave out all words in lines 10 and 11 and insert:

'(6) A tax official exercising or performing or discharging any power, duty or function conferred or imposed on or assigned to the Commissioner-General by any provision of this Act, shall be deemed for all purposes to be authorised to exercise, perform or discharge that power, duty or function until the contrary is proved.

(7) A Commissioner and Senior Deputy Commissioner may exercise any power conferred on any Deputy Commissioner or Assistant Commissioner by any provision of this Act' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, 98 වන වගන්තියේ (1) වන වගන්තියේ 4 වෙනි පේළියේ "නිලධරයකු" යන වචනය ඉවත් කර, ඒ වෙනුවට "බදු නිලධරයකු" කියන වචනය යෙදිය යුතුයි කියා අපි ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමා සමඟ අපි මේ ගැන සාකච්ඡා කළා. මේ බලය වෙනත් සමාගම්වලට දීම වැළැක්වීම සඳහා සමස්ත දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට ඉල්ලා සිටින දෙයක්.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු සභාපතිතුමනි, අනිවාර්යෙන්ම-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Hon. Minister, just give me a minute.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ගරු සභාපතිතුමනි, ඊළඟට, 98 වන වගන්තියේ (2) වන උප වගන්තියේ දෙවන පේළියේ,

"...හෝ දෙපාර්තමේන්තුවේ යම් නිශ්චිත තනතුරක් උසුලන්නකුට" යන වචන ඉවත් කරන ලෙසත්,

98 වන වගන්තියේ (3) වන උප වගන්තියේ පස්වෙනි පේළියේ,

"...වෙනත් යම් තැනැත්තකුට" යන වචන ඉවත් කර, ඒ වෙනුවට "බදු නිලධරයකුට" කියන වචනය ඇතුළු කරන ලෙසත් ඉල්ලා සිටිනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු සභාපතිතුමනි, "A tax official" කියලා යොදා තිබෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මොකද, මේක බරපතළ ප්‍රශ්නයක්. ඔබතුමා ඒක නිවැරදි කරන්න එකඟ නම් ඉතාම හොඳයි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔබතුමා බොහොම හොඳ යෝජනාවක් ගෙනාවේ. ඔබතුමන්ලාත් ඒ යෝජනාව ගෙනාවා. අපිත් ගෙනාවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නිලධාරින් සහ සේවකයන් ඉල්ලා සිටියා මේ සංශෝධනය ඇතුළු කරන ලෙස.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන ආකාරයට, 98 වන වගන්තියේ (3) වන උප වගන්තියේ "...කොමසාරිස් ජනරාල්වරයා විසින් නම් කරනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තකුට" කියන වචන වෙනුවට "බදු නිලධරයකුට" කියන වචන ඇතුළත් වෙලා සංශෝධනය වෙලා තිබෙනවා. ඒක හරි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
"A tax official" කියලා තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඊළඟට, 98 වගන්තියේ (6) වන උප වගන්තියයේ මෙසේ සඳහන් වනවා:

"කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ වගන්තිය යටතේ සිදු කරන ලද පැවරීමක් ඕනෑම වේලාවක ලිඛිතව සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීම කරනු ලැබිය හැකිය."

ගරු සභාපතිතුමනි, ඒ කොටස ඉවත් කරන්න ඕනෑ. ඒකෙන් අදහස් වෙන්නේ මේකයි. කොමසාරිස් ජනරාල්වරයා බදු නිලධරයකුට බලයක් පැවරුවාට පසු, ඔහුට ඕනෑම වෙලාවක ඒකාධිපති ස්වරූපයකින් කටයුතු කරලා ඒ පැවරූ බලයම ඉවත් කරන්න පුළුවන්. එතකොට, කොමසාරිස් ජනරාල්වරයා විතරයි නේ ඉතිරි වෙන්නේ. බදු නිලධාරින්ගේ අයිතිවාසිකම සම්පූර්ණයෙන් අහෝසි වෙනවා නේ. එම නිසා අපි කියන්නේ පහත සඳහන් 98 වන වගන්තියේ (6) වන උප වගන්තිය ඉවත් කරන ලෙසයි;

"කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ වගන්තිය යටතේ සිදු කරන ලද පැවරීමක් ඕනෑම වේලාවක ලිඛිතව සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීම කරනු ලැබිය හැකිය."

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු මන්ත්‍රීතුමනි, ".. until the contrary is proved." කියලා තිබෙන්නෙ. ඇත්ත වශයෙන්ම තමන් පවරන රාජකාරිය හරිහැටි නොකළොත් ඒ රාජකාරියෙන් ඒ නිලධාරියා ඉවත් කිරීමේ බලය ඕනෑම ආයතනයක ප්‍රධානියෙකුට තිබෙන්න ඕනෑ. මේක ඒකාධිපති බලයක් නොවෙයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු සභාපතිතුමනි, බදු නිලධාරියෙක් යම් පුද්ගලයෙක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ගෙන යනවාය කියලා හිතමු. ඇලෝසියස් මහත්තයා වාගේ කෙනෙක් සම්බන්ධයෙන් කියලා අපි හිතමු. ඒ නිලධාරියා ඉතාම අවංකව ඒ කටයුත්ත කරගෙන යද්දී, කොමසාරිස් ජනරාල්වරයාට ඕනෑ නම් ඒ නිලධාරියාගේ ක්‍රියාවලිය නතර කරන්න පුළුවන්.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඒ වාගේ දේවල් වෙනකොට, ඒවා ගැන කටයුතු කරන්න ඇමතිවරයා ඉන්නවා; ඊට ඉහත නිලධාරියා ඉන්නවා; පාර්ලිමේන්තුව තිබෙනවා; ජනතා විමුක්ති පෙරමුණත් ඉන්නවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නැහැ, මෙතැනදී ඇමතිවරයාට මොකුත් කරන්න බැහැ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ජනතා විමුක්ති පෙරමුණත් ඉන්නවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නැහැ. නැහැ. අපට මොකුත් කරන්න බැහැ. එතකොට ඒක වෙනත් ක්‍රමයක්. ඔබතුමා මෙම විවාදයේදී කිව්වා, "ඇමතිවරයාට ඇඟිලි ගහන්න බැහැ" කියලා. ඒක හොඳයි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
අනෙක් එක, Fundamental Rights case එකක් දාන්නත් පුළුවන්. ඒ වාගේම, නිලධාරියා වරදක් කළොත් මෙතුමාට නැහැ,-

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නිලධාරියා වරදක් කළොත් එයි වෙන ඕනෑ තරම් විධිවිධාන.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මම නම් කියන්නේ, අපි මේ වචන තියමු කියලායි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු සභාපතිතුමනි, මේ වචන තිබ්බොත් වෙන්නේ සර්ව බලධාරියා බවට කොමසාරිස් ජනරාල්වරයා පත් වීමයි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මේ බලය මෙතැනින් ගත්තොත් ඊටත් වඩා අවුලක් ඇති වෙනවා. ඒ වාගේ නිලධාරීන් ඉන්නවා නම්, තමුන්නාන්සේලාත්, අපිත් දන්නවා ඒ අය ගැන ක්‍රියාත්මක වෙන හැටි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, අඩුම තරමින් මේ "පැවරීමක්" කියන එක ඕනෑම වෙලාවක ඉවත් කරන්න පුළුවන් විධියේ අභිමත බලයක් දෙන්න එපා. ඔබතුමන්ලා මෙවැනි බලයක් කොමසාරිස් ජනරාල්ට දෙනවා නම් ඔබතුමන්ලා විසින්ම විශාල වැරැද්දක් කරනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මෙම දේශීය ආදායම් පනත් කෙටුම්පතේ වචන යොදා තිබෙන්නේ කොමසාරිස් ජනරාල්වරයාට වුවමනා විධියට අයින් කරන්න පුළුවන් වන විධියට නොවෙයි. මෙහි සඳහන් කර තිබෙනවා, "..shall be deemed for all purposes to be authorised to exercise, perform or discharge that power, duty or function until the contrary is proved." කියලා. නිලධාරියා කාගේ හරි file එකක් හංගන්න ගියාය කියලා, ඊට ඉහළ ඉන්න පුද්ගලයා upset වුණ පළියටම ඒ නිලධාරියා ඉවත් කරන්න බැහැ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමනි, මොකක්ද ඔබතුමාගේ තීරණය?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
අපි 98 වන වගන්තියේ (6) වන උප වගන්තිය මේ විධියටම තියමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, පොදු බලයක් දෙනවා නේ. නියෝජ්‍ය කොමසාරිස්වරුන්ට කොමසාරිස්තුමා විසින් බලය පවරනවා. සහකාර කොමසාරිස්වරුන්ට බලය පවරනවා. ඒ ඒ නිලයට අදාළ බලය පරවනවා. ඒක පොදු බලයක්. ඒවා ලබා ගැනීම හෝ නොගැනීම පොදු ක්‍රියාවලියක්.

හැබැයි, ඒකේදී නියෝජ්‍ය කොමසාරිස්වරුන්ට මුළුමනින්ම පවරා තිබෙන බලය තනි කොමසාරිස්වරයෙකුගෙන් නැවත පවරා ගන්නවා නම් තමයි මේ ප්‍රශ්නය පැන නඟින්නේ. ඒ කියන්නේ නියෝජ්‍ය කොමසාරිස්වරු සියලු දෙනාට බලය පවරා තිබෙනවා. නමුත් එක් කොමසාරිස්වරයෙකුගෙන් ඒ බලය ලබා ගන්න බැහැ. එතැන තමයි ප්‍රශ්නය පැන නඟින්නේ. අර නිලධාරියෙක් වැරැද්දක් කරනවා නම්, ඒකට අදාළ ක්‍රියාපටිපාටිය පනත් කෙටුම්පතේ වෙනම තිබෙනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
සිංහල භාෂාවෙන් සඳහන් වෙලා තිබෙන්නේත් ඒකයි. මේ කාරණය ඔය කියන තරම් බය වෙන්න ඕනෑ කාරණයක් නොවෙයි. එය සිංහලෙන් සඳහන් කර තිබෙනවා,

"(6) මේ පනතේ යම් විධිවිධානයක් මඟින් කොමසාරිස් ජනරාල්වරයා වෙත භාර කොට ඇති හෝ පනවා ඇති හෝ පවරා ඇති යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කරන හෝ ඉටු කරන බඳු නිලධරයකු, පටහැනිතාවයක් ඔප්පු කරනු ලබන තෙක් - until proven otherwise - සියලු කාර්ය සඳහා එම බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට බලය පවරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය" කියලා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
සිංහල භාෂාවෙන් ඉදිරිපත් කරනු ලබන සංශෝධනවල එහෙම තිබෙනවා නම්, 98(6) උප වගන්තියේ මෙසේ සඳහන් වන්නේ ඇයි? "කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ වගන්තිය යටතේ සිදුකරන ලද පැවරීමක් ඕනෑම වේලාවක.... "

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඔබතුමා කියවන්නේ මොකකින්ද?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මේ පනත් කෙටුම්පතේ 106වැනි පිටුවේ තිබෙන්නේ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
අපි මේ amendment එක කියවන්නේ. ඔබතුමා කියවන්නේ පනත් කෙටුම්පතෙන්. අපි දැන් කියවන්නේ amendment එක.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Amendmentsවල 98 වගන්තියේ (6)හි තිබෙන්නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම කියවූ කොටස සංශෝධනය වෙනවාද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඔව්, සංශෝධනය කළා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
සංශෝධනය කළා.

98වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
98ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 98, as amended, ordered to stand part of the Bill.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
99 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු මංගල සමරවීර අමාත්‍යතුමා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
එතැනදීත් පාර්ශ්ව දෙකෙන්ම සංශෝධන දීලා තිබෙනවා. හැබැයි,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
99 වන වගන්තිය නොවෙයි, ඒ සංශෝධන දීලා තිබෙන්නේ 100 වන වගන්තියට.

99වන වගන්තිය.- (දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදල.)

වாசகம் 99.- (உண்ணாட்டரசிறை ஊக்குவிப்பு நிதியம்.)
CLAUSE 99. - *(Inland Revenue Incentive Fund.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
I move,

"In page 95, leave out all words in line 28 and insert:

'(4) The Commissioner-General or any tax official specially authorised by him in that behalf, shall administer the Fund' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

99 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
99ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 99, as amended, ordered to stand part of the Bill.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
100 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු අමාත්‍යතුමා. ඊට අමතරව තව යෝජනා දෙකක් තිබෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Minister will read out the Government Amendments that and then, you can come out with your amendment. ගරු අමාත්‍යතුමා 100 වන වගන්තියේ සංශෝධන කියවන්න.

100වන වගන්තිය.- (විශ්වාස්යභාවය.)

வாசகம் 100.- (அந்தரங்கத் தன்மை.)
CLAUSE 100. - *(Confidentiality.)*

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
I move,

(1) "In page 96, leave out all words in line 8 and insert:

'(a) the employees of the Department and' "

(2) "In page 96, leave out all words in lines 20 to 22 (both inclusive) and insert:

'(e) the Attorney-General for the purpose of any criminal proceedings or civil proceedings where actions are instituted by the State or actions filed against the State or where the opinion or advice of the Attorney-General has been sought in writing by the Department of Inland Revenue;' "

සංශෝධනපිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

100 වගන්තියේ (අ) හි සඳහන් වන "ස්වකීය කාර්ය ඉටු කිරීමේ ක්‍රියාවලියෙහි දී සහ එකී කාර්ය ඉටු කිරීමේ කාර්ය සඳහා, දෙපාර්තමේන්තුවේ සහ රේගු දෙපාර්තමේන්තුවේ අනෙකුත් නියෝජිතයන් සහ සේවා නියුක්තිකයන්ට;" යන කොටසේ "අනෙකුත් නියෝජිතයන් සහ" යන වචන ඉවත් කළ යුතුයි කියා අපි යෝජනා කරනවා. මොකද, අනෙකුත් කිව්වාම දෙපාර්තමේන්තුවෙන් පිට. I think you can agree to that. The Department was in agreement. Shall I read it in English?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Hon.Gunawardena, yes, we have agreed with you and it has been removed. Do not go by the Bill. You have to look at the Amendments which we have brought in.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු සභාපතිතුමනි, පහත සඳහන් සංශෝධනය මා ඉදිරිපත් කරන්න කැමැතියි.

100 වන වගන්තියට මාගේ සංශෝධනයක් තිබෙනවා. 108 පිටුවේ පහත සඳහන් කොටස ඉවත් කළ යුතුය:

"(ආ) දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය සිදු කිරීමේ ක්‍රියාවලියක දී සහ එකී අධීක්ෂණය සිදු කරගෙන යාමේ කාර්යය සඳහා මූල්‍ය විෂයය භාර අමාත්‍යවරයාට,"

ගරු සභාපතිතුමනි, 100 වන වගන්තියේ (1) (අ) හි සඳහන්ව තිබෙනවා, "පහත සඳහන් තැනැත්තන්ට පමණක් එම තොරතුරු අනාවරණය කළ හැකි ය" කියලා. මේ කාරණාව අනුව ගත්තොත්, විෂය භාර අමාත්‍යවරයා හැටියට මුදල් අමාත්‍යවරයාට මේ තොරතුරු ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. මම මේ කියන්නේ මංගල සමරවීර අමාත්‍යතුමා කියලා නොවෙයි. විෂය භාර මුදල් අමාත්‍යවරයාට. එතකොට ඒ මුදල් අමාත්‍යවරයාට තමන්ට එදිරිවාදී කණ්ඩායමක හෝ තමන්ගේ වෙනත් පාර්ශ්වයක බදු files ලබා ගන්න පුළුවන්. එතකොට විවෘතව බදු ප්‍රකාශ කරන ඕනෑම අයෙකුට මේ පනත අනුව මුදල් අමාත්‍යවරයා මේ තොරතුරු ලබාගැනීම පිළිබඳ ගැටලුවක් පැන නඟිනවා. විෂය භාර අමාත්‍යවරයා තොරතුරු ලබා ගැනීමේ ක්‍රියාවලිය කියන කටයුත්තේ දී මේ තොරතුරු ලබා ගැනීමට ඉඩ තැබීම ගැටලු සහගතයි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
හැබැයි, ගරු මන්ත්‍රීතුමා මම හිතන්නේ ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට කිහිප දෙනෙක් ගියා. මෙම 100 වන වගන්තිය ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අනුව සංශෝධනය කරලා තිබෙනවා. ඒ අධිකරණය කියපු විධියටයි මේ වගන්තිය සංශෝධනය කළේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, මීට කලින් කිසිදු බදු පනතක, දේශීය ආදායම් පනතක විෂය භාර අමාත්‍යවරයා හැටියට මුදල් ඇමතිවරයාට බදු file එකක තොරතුරු ලබා ගන්න ඉඩක් තිබුණේ නැහැ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔබතුමා කියපු තර්කය ඉදිරිපත් කරලා කීප දෙනෙක්ම ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට ගියා. නමුත් අවසානයේ දී අපි ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවට අනුකූලවයි මේ කැල්ල සම්පූර්ණයෙන්,-

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මේ ගැන තීන්දුවක් කිව්වේ නැහැ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කියනවාද, මේකම තියන්න කියලා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔව්. මේ සංශෝධනය තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව අනුවයි. මොකද, අනෙක් ඒවා ඒගොල්ලන් reject කළා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මේ තීරණය ගත්තාද නැද්ද කියන එක අපට අදාළ නැහැ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
උසාවි තීන්දුවේ තවත් එකක් තිබෙනවා, "ඇමතිවරයාට අධීක්ෂණය කිරීමට බලය තිබුණත්, 191 වන වගන්තිය අනුව මෙම තොරතුරු වැරැදි ලෙස පාවිච්චි කළොත් රුපියල් මිලියනයකට නොඅඩු දඩයක් හෝ වසරකට නොඅඩු සිර දඬුවමක් නියම වනවා"ය කියලා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
හොඳයි, බොහොම ස්තුතියි. 100 වන වගන්තියට ගරු ඇමතිතුමාගේ යෝජනාව අනුව එකඟද?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු සභාපතිතුමනි, 100 වන වගන්තියට තවත් සංශෝධනයක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
100 වන වගන්තියට තවත් සංශෝධනයක් ඉදිරිපත් කරන්න තිබෙනවාද?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
100. (1) (ඇ) යන්නට සංශෝධනයක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
100 වන වගන්තියට අදාළ සංශෝධන ඔක්කොම අප ඉදිරිපත් කළා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
100. (1) (ඈ) යන්නට සංශෝධනයක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"108 වන පිටුවේ, 8 සහ 9 පේළි ඉවත් කරන්න:-

'යම් නිශ්චිත අධිකාරියක් සමඟ ඇතුළත් වූ ජාත්‍යන්තර ගිවිසුමකට අනුකූලව විදේශ රටක බඳු අධිකාරීන්ට;' "

විදේශ රටක බදු අධිකාරියකට අපේ බදු තොරතුරු ලබා දෙන්න ඉඩක් දෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මෙහෙම කිව්වාද කියලා මා දන්නේ නැහැ. අපේ සමාගමක වෙන්න පුළුවන්; අපේ ව්‍යාපාරවල වෙන්න පුළුවන්, බදු තොරතුරු මොකටද විදේශ බදු අධිකාරියකට දෙන්නේ? මේ තොරතුරු ඉල්ලන එක හරි. ඔබතුමා කලින් කිව්වා, රුපියල් මිලියනයක් දඩ ගහන්නයි, අවුරුද්දක් හිරේ දමන්නයි පුළුවන් කියලා 191 වන වගන්තියේද කොහේද තිබෙනවා කියා. පිට රටක බදු අධිකාරියක් මේ තොරතුරු වැරදි විධියට පාවිච්චි කළොත් අපි ඒගොල්ලන් ගෙනැල්ලා හිරේ දමනවාද? අපි ඒගොල්ලන්ට දඩයක් ගහනවාද? ඒ නිසා කරුණාකරලා,-

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු මන්ත්‍රීතුමා, යම්කිසි අවබෝධතා ගිවිසුමක් -agreement එකක්- තිබෙන රටවලින් තමයි ඒ ප්‍රශ්නය ඇති වන්නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එහෙම එකක් මේකේ නැහැ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මොකද, දැනටමත් මේ ආකාරයට තොරතුරු හුවමාරු කිරීමක් සිදු වනවා. ඇත්ත වශයෙන්ම -මේ මොහොතේදී වුණත්- අපේ මේ පරීක්ෂණවලදී වුණත් විදේශ රටවලින් උදවු ලබා ගන්න අපට සිදු වෙලා තිබෙනවා. ලංකාවෙන් හොරකම් කරපු කෝටි - ප්‍රකෝටි ගණනක මුදල් අද විදේශ රටවල හංගලා තිබෙනවා. ඒ නිසා අපට ඒ රටවල්වලිනුත් මේ වාගේම තොරතුරු ලබා ගන්න අවස්ථාවන් ලැබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපට ඒ රටවලින් වැඩිපුර තොරතුරු ඕනෑ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඒ වගන්තිය මා හිතන්නේ එහෙමම තිබෙන්න ඕනෑ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ප්‍රශ්නය තිබෙන්නේ මේකයි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Do you want to go ahead with this or-

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
අපේ මන්ත්‍රීතුමා අදහස් ඉදිරිපත් කළාට පස්සේ,-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
"යම් නිශ්චිත අධිකාරියක් සමඟ ඇතුළත් වූ ජාත්‍යන්තර ගිවිසුමකට අනුකූලව විදේශ රටක බදු අධිකාරීන්ට" කියා තමයි 100 වන වගන්තියේ (1) (ඈ) යටතේ තිබෙන්නේ. ඔබතුමා කියන ආකාරයට නිශ්චිත කිරීමකට ලක් කරලා තිබෙනවා නම් ප්‍රශ්නයක් නැහැ. එහෙම කරලා නැහැ නේ. මේක විවෘත කරලා තිබෙන්නේ. අපි ගිවිසුමකට එළැඹිලා තිබෙනවා, ඒ රටේ යම් නඩු කටයුත්තකදී හෝ වෙනත් පරීක්ෂණයකට හෝ අවශ්‍ය වන තොරතුරු අප ලබා දෙන්න බැඳී හිටිනවා කියලා. කවරක්ද කියන එක නොවෙයි. අපි විවෘත කරලා තිබෙනවා. ඒ නිසා කුමක් ඉල්ලුවත් අපි දෙන්න ඕනෑ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
නැහැ, නැහැ. එහෙම නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේකේ සීමාවන් හදලා නැහැ නේ. එහෙනම් ඔබතුමා මේකේ සීමාවන් හදන්න ඕනෑ, මෙන්න මේ සීමාවලට යටත්ව තමයි,-

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
No. It states, "in accordance with an international agreement" ඉල්ලන හැම එකක්ම දෙන්න අප බැඳිලා බැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මෙතැන තිබෙන්නේ "යම් නිශ්චිත අධිකාරියක් සමඟ ඇතුළත් වූ ජාත්‍යන්තර ගිවිසුමකට අනුකූලව විදෙස් රටක බදු අධිකාරීන්ට" කියායි. ඒ අනුව අපි ගිවිසුමකට එළැඹී තිබෙනවා නම්, ඔබතුමා කියන පරිදි ඒ රටේ සිදු වන පරීක්ෂණයක දී හෝ ඒ රටේ උසාවියක් විසින් කරන විමසීමක දී හෝ අපි කරුණු ඉදිරිපත් කරන එක ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මේකේ සීමා කිරීමකට ලක් කරලා නැහැ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Agreement කියන එක,-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එක එක agreements තිබෙනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු මන්ත්‍රීතුමා, agreements අනුව ඒක තමයි සීමාව. Agreement එකට අනුකූලව තමයි,-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Agreementsවලට අනුව අප වෙළෙඳ ගිවිසුම්වලට යනවා; විවිධ දේවල්වලට යනවා. එහෙම නොවෙයි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Double taxation කියලා තිබෙනවා. විවිධාකාරයේ ගිවිසුම් තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒවාට නේ අප යන්නේ. ඒක වෙනයි.

නමුත් මම කියන්නේ මෙයයි, සාධාරණව ගත්තොත් මෙහෙමයි. විදේශීය රටක සමාගමක් අපේ රටට ආයෝජනයක් කිරීම සඳහා එනවා කියලා හිතමු. ඒ ආයෝජනය කරන ක්ෂේත්‍රයටම අදාළව අපේ රටේ ව්‍යාපාරිකයන් ඉන්නවා. අපි හිතමු, අපේ රටේ බිස්කට් කර්මාන්ත තුනක් තිබෙනවා කියලා. කවුරුන් හෝ බිස්කට් කර්මාන්තයක් සඳහා අපේ රටට එන්න හදනවා කියලා හිතමු. අපි, අපේ රටේ බිස්කට් කර්මාන්තකරුවන්ගේ තොරතුරු එම බිස්කට් කර්මාන්තකරුවන්ට ලැබෙනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
නැහැ. කවදාවත් එහෙම දෙන්නේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේ වගන්තිය අනුව ඒ හැකියාව තිබෙනවා. එම නිසා ඔබතුමා මේකේ සීමාවන් හදන්නට ඕනෑ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ජාත්‍යන්තරයට, රටකට එහෙම ඉල්ලන්න බැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගිවිසුමකට එළැඹිය හැකි සීමාවන් මේකේ සඳහන් කරලා නැහැ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Agreement එකක ඒවා ගැන තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. එම නිසා අපි ඊළඟ වගන්තියට යමු, මේ වගන්තිය මේ විධියට තිබෙන්නට අරිමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අපි ඒකට එකඟ නැහැ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
අපි ඔබතුමාට සහතික වෙන්නම්, ලංකාවේ කිසිම බිස්නස්කාරයෙකුගේ තොරතුරු පිට රටට දෙන්න ඉඩ තියන්නේ නැහැයි කියලා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පුරවැසියෙකුටවත් දෙන්න බැහැ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
There is a point of Order being raised by the Hon. Bandula Gunawardane.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු සභාපතිතුමනි, මෙම වගන්තියේම (ඉ) කොටස පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කිරීමට කැමතියි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Is that Clause 100 (e), which states, "the Attorney-General for the purpose any ...."?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
Yes.

ගරු සභාපතිතුමනි,මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

> "108 වන පිටුවේ, 100 (1) (ඉ) වගන්තිය (108 වන පිටුවේ 10 සිට 12 දක්වා පේළි) ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් සංශෝධනය ආදේශ කරන්න:-
>
> 'රජය විසින් හෝ රජයට එරෙහිව පවරන ලද යම් අපරාධ හෝ සිවිල් නීති කෘත්‍ය සඳහා හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලිඛිතව නීතිපතිවරයාගේ මතය හෝ උපදේශය විමසා සිටි අවස්ථාවක දී නීතිපතිවරයා ට;' "

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

මොකද, රජයේ කටයුත්තක් සම්බන්ධයෙන් වන දෙයකට පමණයි නීතිපතිවරයාගෙන් මේ උපදේශය ලබා සිටිය යුත්තේ. "අනෙක් ඕනෑම දෙයකට නීතිපතිවරයාගේ" කියන එක සාධාරණ වෙන්නේ නැහැයි කියන එක තමයි බදු විශේෂඥයන්ගේ මතය වන්නේ. එම නිසා ඔබතුමාට පුළුවන් නම්,"රජයට අවශ්‍ය විට" කියන වචන ටික ඇතුළත් කිරීම පිළිගන්න.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
අපි ඉදිරිපත් කළ සංශෝධනය දැනට පිළිගෙන, මේ පිළිබඳව පසුව සලකා බලමු.

100වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
100ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 100, as amended, ordered to stand part of the Bill.

101 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
101ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 101 ordered to stand part of the Bill.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
දැන් 100 වන වගන්තිය සංශෝධනය කළා. 100 වන වගන්තිය සහ 101 වන වගන්තිය දැන් සම්මත කළා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
102 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීමට ගරු එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමා. Do you want to move your Amendments first, Hon. Minister?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
No, I do not have Amendments for that Clause, Sir.

102 වන වගන්තිය.- (ලියාපදිංචිය.)
வாசகம் 102.- (பதிவு.)
CLAUSE 102. - (*Registration.*)

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, there is a Sub-clause to be added after Clause 102 (1). I move,

> "In page 98, immediately after line 12, insert:
>
> "Every person who reaches the age of 18 years, within one year, shall register with the Commissioner-General on or before 31st day of March of the following year."

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Do you accept that amendment, Hon. Minister?

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
